

# සඳ කැදූර නුඹයි

නිකිණි නේත්‍රාංජලී බණ්ඩාර

Scanned by CamScanner

# 01

උදෑසන කඩිමුඩියේ අවදි වූ දිනකරයාණෝ මිහිලිය හැඳ සිටි සුදෝ සුදු මිහිඳුම් සේලය උදුරා වලාකුලේ සැඟවූයේ දියමන්ති කැටයම් ලෙසින් තණඟ විසිතුරු කළ පිනි බිඳු සිපගන්නට ය.

''චූ.... ටී..... චූ..... ටී....''

රතු පැහැගත් ලොවි ගෙඩි අතින් කටින් එල්ලාගත් ලොවි අත්තක දනි පනි ගා දෙපා ඇනගත් පැණි කුරුල්ලා පියපත් කැහැපොට ගත්වාගෙන උදෙන් ම කාට නමුත් අමතත්තේ ය.

සීත රැයක් පුරාවට වසා සිටි නෙතුපියන් හැර ජනේලය අවදිවූයේ ය. කිරි.... කිරී.... කිරිස්.... නිදිගැට හැර පියන් පත් දෙපසට විහිදවී ය. මුළුමනින් ම නිරුවත්වූ ජනේලය පිටුපසින් පෙනුණේ සමන් මලක රුව වරුණගත් හිමායාගේ සොඳුරු මුහුණයි.

ලොවි අත්තේ වාඩිවූ පැණිකුරුල්ලාගේ කුරුලු හඬ හිමායාගේ දෙසවනට ද හිමිවිය. කටහඬ උපදින ලොවි ගසට දෑස් යොමු වීමට වැඩි වෙලාවක් ගත නොවුණි.

''ආ....... සුබ උදෑසනක්! ඔයා ඕතන ඔහොම ම ඉන්න.''

එලෙසින් පැවසීමට හිමායාට සිතුණද වචන පිටවීමට දෙතොළ අවසර නොදුන් බැවින් නිහඬ සිනාව අහිංසක මුහුණ පුරා වැතිර ගත්තේ ය.



Scanned by CamScanner

ජනේලය අභියසින් නොපෙනී ගිය හිමායාගේ මුහුණ නැවත පෙනෙන්නට විය. දෑතෙහි රැඳුණ කැමරාව බෙල්ල දිගුකර ලොවි ගෙඩි අතර වූ පැණි කුරුල්ලාගේ රුව සටහන් කර ගත්තේ ය. කිසිවක් නොදත් පැණි කුරුල්ලා සුපුරුදු හඬ විසිකරමින් ලොවි අත්තේ ම සිටියේ ය.

නිල්පාට අහසේ සුදු පුළුං වලාකුළු විසිතුරු සිතුවම් ඇඳ ඇත. හිමායාගේ දෑස් අහසේ ඒ මේ අත ඇවිදිමින් විසිතුරු නරඹන්නට විය. හෙලිකොප්ටර් සිහිගන්වමින් ජනේලය ළඟින් ඉගිලෙන බත්කූරු මිතුරන් මෙන්ම දුර ගමන් යන ගිරා රැන් ද ඇසට හසුවන්නේ ය. පාට පාට තටු ඉහල ගත් සමනලුන් රවුම් රවුම් කැරකි කැරකි රස්තියාදු වන්නේ උතුරා යන සොම්නසිනි. නිල් අහසේ හිමායාගේ දෑස්වලට සැඟවී කිසිවකුට යානොහැකිය. හිමායාගේ දෑසින් අහුලණ දසුන් කැමරා කාචය සැණෙකින් පිටපත් කරගන්නේ ය.

"සුදු දෝණි ............ ඔයා නැගිට්ටද?" උදෑසන තේ කෝප්පය අතැතිව නිමාලි හිමායාගේ කාමරයේ උළුවස්ස පසුකරමින් විමසුවා ය.

"ඔව් අම්මා ...."

යැයි පැවසිය යුතුව තිබුණත් හිමායා නිහඬ ය. ජනේලයෙන් පිටතට යොමුකර ගෙන සිටි දෙනෙත් අම්මා වෙත යොමුකළ අතර නාදළු දෙතොල් ඈත් මෑත් වී කැකිරි ඇටවන් දත් පෙළට ඉඩ ලබාදුනි. නිමාලි එයින් සෑහීමට පත්වූවා ය.

"දෝණි... තේ එක.... නිවෙන්න කලින් බොන්න... නැත්නම් රසනෑ.."

නිමාලි හිමායා ළඟින්ම වාඩිවූයේ මව් සෙනෙහසේ උණුසුම දෙන්නට මෙනි. සිනිඳුවට හිස පිරිමදිමින් නිමාලි හදවතෙහි නිධන්වූ ආදරය බිඳෙන් බිඳ හිමායාට ලබාදුන්නා ය. ඉන් පසුව හැකිළුණු ඇඳ ඇතිරිලි නවා පසෙකින් තැබුවා ය. ජනෙල් පියන අසල සිට වටපිට බලමින්ම හිමායා කිරිවිදුරුව හිස් කළා ය. පුංචි සුළං රැළි කීපයක් විත් හිමායාගෙ මුහුණ සිඹ පිටව ගියේ ය.





හිමායා නොදරුවෙකු මෙන් මව් සෙනෙහසේ සුව විඳිමින් තමා දවල් දවසේ කළ කී දෑ අම්මාට පෙන්වූවා ය. සියලු දෑ නිමාලි උනන්දුවෙන් අගය කළේ හිමායාගේ හදවතට යෝධ ශක්තියක් දෙමිනි. මෙවන් සිදුවීම්වලින් මවත් දියණියත් අතර බැඳි සෙනෙහසේ පාලම තවත් ශක්තිමත් විය.

මොහොතක් දියණිය ළඟ ගත කළ නිමාලිට අකමැත්තෙන් වුවද ඇඳෙන් නැගිට යන්නට සිදුවුණි. ඔරලෝසු කටු තම තමන්ට හැකි උපරිම වේගයෙන් දිව යන්නට වුණි. පැය කටුව 9 ඉලක්කම පසුකර යෑමට පෙර නිමාලි නිවසින් බැහැරව යා යුත්තේ රජයේ ආයතන 9 ට රාජකාරි ආරම්භ කරන බැවිනි.

"සුදු දෝණි...... මම ගිහින් එන්නම් පරිස්සමෙන් ඉන්න.."

ඇඟිලි තුඩගින් හිස පිරිමැද හිස සහ දෙකොපුල් සිප නිමාලි පිටව ගියා ය. සුපුරුදු පරිදි දෙතොලට නගාගත් සිනාවෙන් හා පිපුණු දෙනුවන්වලින් හිමායා පිළිතුරු කියා පෑවා ය.

වෙනදාමෙන් අම්මා කාර්යාලයට යෑමට සූදානම් ය. පිනිබර හිමිදිරියේ සිට අහස පොළොව, ගහ කොළ, සතා සීපාවාගේ සුන්දරත්වය නැරඹීමට හිමායා ඇගේ ලෝකය වූ ජනේලය අසලට පැමිණියා ය.

ගේට්ටුව කම්මැලිකමෙන් නිදිගැට හරිමින් විවරවන හඬ හිමායාගේ නෙත ගේට්ටුව දෙසට කැඳෙව්වේ ය. නිමාලිගේ වාහනය ගේට්ටුව අසල ය. සුපුරුදු පරිදි ගේට්ටුවෙන් නික්මීමට පෙර ඇය රිය කවුළුවෙන් එබී බලා අතවැනුවා ය. දෙතොලේ සිනා පුරවගත් හිමායා ද අතවනා සමුදුන්නා ය. ගේට්ටුවෙන් හෙමින් එළියට ඇදුණු මෝටර් රථය පාර දිගේ වේගයෙන් නොපෙනී ගියේ ය.

කැකුළු මල් පිපෙන මොහොතේ නිවසින් පිටව යන අම්මා ආපසු ගේට්ටුවෙන් පැමිණෙන්නේ පිපුන මල් පරවී වැටෙන හැන්දෑවේ ය. සුදු ආච්චිඅම්මා පමණක් නිවසේ සිටියද හිමායාට වැඩි පාළුවක් කම්මැලිකමක් නොදැනෙන්නේ ඇයට මුලුදවසේ ම කරන්නට බොහෝ වැඩ තිබෙන බැවිනි.



Scanned by CamScanner

සීමාවක් නැති අහසේ පියාසර කරන කුරුල්ලන් සමනලුන්, සුළඟේ නටන ගස්වැල්, අහසේ සිතුවම් මවන වලාකුළු පසුපස දැසින් ඇවිද යෑම හිමායාගේ දෛනික කාර්යයන් අතර ප්‍රධාන ය.

ඇසට මිහිරි සිතුවම් කැමරා කාචයට ළං කරගැනීම මෙන්ම පැන්සලින් පින්සලින් සුදු කඩදාසි මත සිතුවම් කරන්නටත් හිමායා කැමති ය. මෙ අතර සිතට දැනෙන සිතුවිලි පෑන් තුඩින් අමුණා තැබීම ද සිරිතකි. මෙතරම් රාජකාරි හිමි හිමායාට දවසේ පැය විසිහතර ද මදි බැවින් ඇයට තනිකමක් පාළුවක් දැනෙන්නට වෙලාවක් නොමැත.

හිමායාගෙ වයසෙ අනිත් ළමයි පාසල් යද්දි හිමායා ඒ ලෝකයෙන් ඈත්වී සඳළුතලේ ජනෙල් කවුළුවෙන් දකින එයාගෙම ලෝකයක ජීවත්වන්නී ය. ඇස් මායිමට අවසර නැතුවම ඇතුළුවන ස්වභා දහමෙ සොඳුරු දෑ හිමායා ආදරෙන් වැළඳගත්තා ය.

හිමායාගේ කාමරේ උළුවස්ස හැඳසිටි මල් මල් රෙදි තිරය ඒ මෙ අත සෙමින් වැනෙන්නට විය. කුස්සියේ වළං පිඟන් හඬන හඬ කියන්නේ සුදු ආච්චි අම්මා කුස්සියේ සිටින බව ය. අම්මා ගේට්ටුවෙන් නොපෙනී ගියේ හිමායා බලා සිටිය දීම ය. එසේනම් දොර තිරය ළඟ හැංගිමුත්තං කරන්නා කවුද? හිමායා නෙතු ඉවතට නොගෙන ඒ දෙස එදෙස බලා සිටියා ය.

දෑස් ඇහිපිය නොහෙලා සැකය පිළිබඳ කේලම් සොයන්නට විය. වැඩි වෙහෙසක් නොදීම දොර තිරය කෙළවරින් ලොම් පිරුණු කළුපාට කොටුවක් මතුවිය.

''ඤා........ව්.......ඤා.....ව්..... මියැව්...''

මෙතෙක් වෙලා හැංගිමුත්තං කළ සුදු බිංදු දොර තිරය අතරින් අඟර දඟර කරමින් කළු වලිගය ඒ මේ අත වනමින් පූස් ගමන් ලතාවෙන් පැමිනෙන්නට විය. අඩකටත් වැඩියෙන් නිරුවත පෙනෙන නවීන පන්නයේ ඇඳුමක් අන්දවා ගත්තේ නම් සුදු බිංදු ද සම්මාන ලැබීමට තරම් සුදුසු මෝස්තර නිරූපිකාවකි.





විමසිල්ලෙන් දොර තිරය දෙස බලා සිටි හිමායාගේ දෙනෙත් දෙතොල් සුළුමයට පාත්‍ර ඉරියව් පෙන්නුම් කරන්නට වූ අතර සිහින් සිනාවක් ද දෙතොලට නැඟුණි.

''පුරු පුරු පුරු'' හඬ නිකුත් කරමින් සිසිත් නොදන්නා ලෙස සුදු බිංදු හිමායා ළඟ දුවෙන්නට වූයේ දිග වලිගය ඒ මේ අත ලෙලවමිනි.

මහල් දෙකකින් යුතු හිමායාගේ ගෙදර දහවල් දවසේ සිටින්නේ හිමායා, සුදු බිංදු සහ සුදු ආච්චි අම්මා ය. එහෙත් මෙහෙත් හැංගිමුත්තන් කරමින් ඇඳ යට බිත්තිය දිගේ දුවන හූනෙක්, රටා වියන මකුළුවෙක්, බැරිතර අතින් කටින් අරන් බිම ඇවිදින කුහුම්බො.... අනෙක් සාමාජිකයෝ වූහ. අම්මාගේ කටහඬ ඇසෙන්නේ ඉර අහසින් බැසගිය පසුව ය. මාසයක සිට එම වෙලාවට තව පැයක් පමණ ප්‍රමාද වන්නට විය. ඒ ඇයට තමා සේවය කළ බැංකු ශාඛාවේ කළමනාකරු තනතුරට උසස් වීම නිසාවෙනි.

දොර රෙද්ද අසල හැංගිමුත්තන් කෙළිය අවසන් කරමින් හිමායාගේ කාමරයට පිවිසුණු සුදු බිංදු ආදරබර දෑවීම හමාරකර පසෙකටවී නිදන්නට වූ නමුදු පුරු පුරුව නොනැවතුණි. සුදු බිංදුගෙන් නෙත් සිත් ඉවතටගත් හිමායා ජනේලය ළඟට පැමිණියා ය.

තාප්පය පාමුලින් නගරය බලා දිවෙන පාර දිගේ සුදෝ සුදු වතින් සැරසුණු සුදු හා පොව්වන් සදිසි ළමයින් අකුරට යන අයුරු හිමායාගේ දෑස් මෙන්ම හදවතද විදුලි සරින් රිදවන්නට සමත් ය. ඒ ළමයින් අතර හිමායාගේ මිතුරු මිතුරියන්ගේ මුහුණු ද ඇත.

හිමායා අවසන් වතාවට මිතුරන් සමඟ එකට වාඩිවී අකුරු කළේ දහයේ පන්තියේදී ය. එනම් අවුරුදු තුනකට පෙර ය. ඒ දවස හිමායාගේ ජීවිතය මුළුමනින්ම වෙනස් කළේ ය.

දිනය නොවැම්බර් මස පස්වෙනි සඳුදා ය. එදින හිමායා තාත්තා සමඟ පාසල අවසන්වී මෝටර් රථයෙන් ගෙදර පැමිණි අවසන් දවසයි. ඉන්පසු දවස් ගණනක රෝහල්ගත වීමකින් හිමායා ගෙදර පැමිණිද තාත්තා අද වෙනතුරු නිවසට නොපැමිණියේ ය. එදා සිට



Scanned by CamScanner

හිමායාගේ පාසල් ගමන කෙළවර වුවා පමණක් නොව ඇගේ මිහිරි කටහඬ සදාකාලිකව නිහඬවූයේ ය.

අකුරට යන යාළුවෝ දකින හිමායගෙ ඇස්වල කඳුළු ඇහිපිල්ලම් මායිම් නොකර දුවන්නට විය. එවිට අහසේ සෙමින් පාවෙන සුදු වලාකුළු දෙසට ඇස් හරවන හිමායා පිදුන සිතට සැනසුම සොයන්නී ය. නිල් අහසෙ රටා මවමින් පාවෙන වලාකුළු හිමායගෙ සිතට සැනසීමක් ගෙන දෙන්නේ ය. සිහිල් සුළං රැළි කවුළුවෙන් විත් ඇසිපිය නෙමූ කඳුළු වියලවා යන්නට විය.

සිය දරුවන්ගේ කුස පුරවන කුරුළු මව්වරුන්, සිහින් නූල් ගෙන දැල් වියන මකුළුවන්, ඇතින් ඇතට ඉගිලෙන බත්කූරන්, සිරිපා වන්දනාවේ යන සමනලයන්, හිමායගෙ ලෝකයෙ තනිය පාළුව නැතිකළහ.

''සුදු බේබි..... සුදු බේබි....'' සුදු ආච්චිඅම්මාගේ කාරුණික කටහඬ හිමායගේ අවධානය කාමරය තුළට ගැනීමට සමත්විය.

පුංචි පුංචි භාජන තුළ නොයෙක් වර්ණගත් ව්‍යංජන වර්ග, සහ සකසුරුවමට බෙදන ලද බත් පිඟානක් රැගෙන විත් තිබුණි.

''සුදු බේබි.......... මම අද ඔයා කන්න කැමති ම කෑම ජාති හැදුවා... මොනව ද දන්නව ද?....''

හිමායා මේසය මතවූ සුවඳ ඉහිරෙන කෑම බඳුන් දෙස ප්‍රීතියෙන් හැරී බැලුවේ සුදු ආච්චිඅම්මාට කෘතගුණ සැලකීමක් ලෙසිනි.

''සුදු බේබි.... කන්න. මම උණුවතුර ලිපේ තියලා ආවේ.''

සුදු ආච්චිඅම්මා බිම් මහලේ වූ මුළුතැන්ගෙට ගියා ය. වයස අවු 65 වුවද ප්‍රාණවත් අඟ පසඟකින් යුතු ඇය දුටුවන් තුළ ප්‍රිය උපදවන සුළු වියපත් පෙනුමක් විය. හිසෙහි කළු කෙස් ගස් එකක් දෙකක්වත් ඇත්දැයි සැකසහිත ය. සුදු පුළුන් කොණ්ඩය පිටුපසට පීරා දොඩම් ගෙඩියක් තරම් කොණ්ඩ ගෙඩියක් බෙල්ලට වන්නට ගැටගසා ඇත. බෝරිච්චි අත් හැට්ටය උඩුකයට අඳින ඇය සුදු පැහැයට හුරු මල් වීත්ත පමණක් අඳින්නට විය. ඈ දුටු ඕනෑම කෙනෙකුට නිතැතින් ම





සිහියට එන්නේ මීට වසර ගණනකට ඉහත අපේ කොට සැලකූ උඩරට මැණිකේ කෙනෙකි.

ඇගේ ගම කෑගල්ලේ බුලත් කොහුපිටිය ය. හිමායාගේ අම්මා මෙලොවට ඉපදීම සහ සුදු ආච්චිඅම්මා සිරිඅම්මලාගේ ගෙදරට (නිමාලිගේ මහ ගෙදරට) පැමිණීම යන සිදුවීම් දෙක ම එකම දිනක දී සිදුවූ බව හිමායගේ අම්මා ආදරයෙන් මතක් කරන්නනී. ඒ මීට අවුරුදු 45 කට පමණ ඉහත දී ය. එදින සිට ඇය මේ ගෙදර මෙහෙකාරියක් නොව, ගෙදර සාමාජිකයෙකි. නිමාලිට සුදු අම්මා වූ ඇය හිමායාට සුදු ආච්චිඅම්මා ය.

හිමායා සුපුරුදු පරිදි සුදු බත් අහුරක් ජනේලය අසල වූ කාම ලෑල්ල මත තැබුවා ය. එයට මුලින්ම ළං වන්නේ කුඹින් ය. පසුව ලේනුන් හා කුරුල්ලන් හෙමින් හෙමින් ළං වන්නේ වටපිට සෝදිසි කරමිනි. මේ හැමදෙනාගෙම පින්තූර හිමායා කැමරාවට නඟාකරගෙන ඇති බව ඔවුන් නොදනී. තමන්ට වඩා වැඩි බර ඔසවාගෙන යන කුඹින්ගෙ ඡායාරූප ද ඒ අතර වුණි.

මෙලෙස එකතුවන දුලබ ඡායාරූපවලින් සහ පින්සලෙන් හැඩවෙන සිතුවම්වලින් බිම් මහලෙහි විසිත්ත කාමරය කලාගාරයක් බවට පත්වුණි. මකුළුවන් හූනන් වැටුප් නොලබාම බිත්ති දිගේ දුවඇවිදිමින් එම සිතුවම් මුරකරන්නට විය. විශේෂ ලී කැටයම් රැඳවුමක විශාල ප්‍රමාණයේ තාත්තාගේ පින්තූරයක් තබා තිබූ අතර සුදුමල් දමක් පළඳා තිබුණි.



Scanned by CamScanner

# 02

**රැයක්** පුරා කළුවර සළුවට මුවාවී නිශාචරයන් සමඟ කෙළිදෙලෙන් පසුවී පාන්දර නින්දට වැටුණු ගහකොළ නමැති දරුවන් ඇහැරවන්නට ආලෝකය නමැති යෂ්ටි ගෙන හිරු නමැති තාත්තා අහස නමැති ගෙට පැමිණි ලෙසින් හිරු නැගෙනහිරින් පායා ආවේ ය.

ලෝකෙම නින්දෙන් ඇහැරවද්දී හිමායගෙ ජනේලයටත් ඉර එළිය තට්ටු කලේ ය. කලින් අවදිවුණ විහඟුන් හිමිදිරි ගී ගායනා පරිසරයට මුදා හරිමින් පැවතුණි. මකුළු හාමිනේ ඒ අත්තට මේ අත්තට පනිමින් සිහින් නූල්වලින් රටාදමූ දැලක් වියන්නට වූවා ය.

සසල පරිසරයෙ හඬින් හිමායගෙ කාමරේ ජනෙල් පියන්පත් ද අවදිවූයේ ය. ඒ සමඟම ජනේලය ළඟට සඳවන් හිමායගෙ මුහුණ ද පායා ආවේ ය. පසළොස්වක දාට පායන හඳ අමතකවීමකින් උදෑසන පායාවින් ඇති සෙයකි. ජනේලය ළඟ එකින් එක පැටලෙමින් ගෙතෙන මකුළු සේලය හිමාගෙ කැමරාවට හසුවුණි. මකුළු හාමිනේ විසිතුරු රටාවෙන් නිමවුණු සේලය වියා නිමවී පසෙකට වී සැනසුම් සුසුම හෙලන තුරු හිමායා ද ඒ වෙතින් දෑස් ඉවතට නොගත්තා ය.

''සුදූ දෝණී......... සුදූ දෝණී.........'' අම්මාගේ අතැගිලිවල සුපුරුදු උණුසුම දැනුන හිමායා හෙමින් සීරුවෙන් අම්මා දෙස හැරී බැලුවා ය.





''මොකක් දිහාද පුතේ ඔයා බලාගෙන හිටියේ.......''

හිමායා අතදිගුකරමින් මකුළු දැළ පෙන්වූවා ය. නිමාලි හිමායාගේ ඇස්මට්ටමට පහත්වී ඒ දෙස විමසිල්ලෙන් බැලූවා ය.

''ආ........ ලස්සන මකුළු දැලක්... බලන්නකො සත්තුන්ගෙ ලෝකෙ කොච්චර ලස්සනයි ද?'' නිමාලි හිමායා සමඟ එකතු වී මකුළු දැලේ අලංකාරය විඳින්නට විය.

කතාබහ අතරතුරේ ම හෙමින් සැරේ පනාව කෙස් අතරින් යවමින් නිමාලි හිමායාගේ දිගු කොණ්ඩය පීරා අවසන් කළා ය.

''සුදූ දෝණී........ මම අද ටිකක් කලින් යන්න ඕන.... තව ටිකකින් යනවා. සුදූ ආච්චිඅම්මට ඕන දෙයක් තිබුණොත් කියන්න. පරිස්සමෙන් ඉන්න.........'' කියමින් අම්මා හිමායාගේ හිස සිප කාමරයෙන් පිටව ගියා ය. නිවසේ දී හිමායාගේ මව පිය චරිත දෙකට ම පණ පොවන ඇ රාජකාරී ආයතනයේ දී ප්‍රධානියා ලෙස තෙවැනි චරිතය නිරූපනය කළා ය.

පිටුපා යනු අම්මා දෙස බලා සිට ඇ දිගු සුසුමක් පිටකර නැවතත් ජනෙල් පියන වෙත දෙනෙත් දුන්නා ය.

පිටතින් පැමිණි සීත සුළං හිමායාගේ මුණ සිඹිමින් කාමරය තුළට අනවසරෙන් පැනගත්තේ කෙස් කැරලි කීපයක් අවුස්සගෙන ය. දොර රෙද්දෙ හැපීගෙන ගිය කලබලයේ තරමට මේවන විටත් වෙනත් කවුළුවකින් පිටවී යන්නටත් ඇත. අතරමගදී කිරිඅඟුන වැලකින් උදුරගත් පුළුං මල හිමායා ළඟ හිතාමතා ම තබා ගොසිනි. වරාපුළුං මලක සිරිගත් කිරිඅඟුන පුළුං මලේ පුංචි බීජයක්ද තිබූ අතර සුමුදු පුළුං කෙඳි කුඩයක හැඩයකින් යුක්ත විය. අතට ගෙන හැඩ බැලූ හිමායා සුළඟ ගෙනා පුළුං මල ත්‍යාගයක් ලෙස සිතමින් පරිස්සමෙන් තබාගත්තා ය.

''පී......ක් පී......ක්...'' ගේට්ටුව ළඟ නැවතී හඬන රිය නලාහඬ හිමායාගේ නෙත් සිත් එදෙසට යොමු කරගත්තා ය. නිවසේ වැඩ අවසන්කර රාජකාරියට යන අම්මා රිය කවුළුවෙන් අතවනා හිමායාගෙන් සමුගත්තා ය.



Scanned by CamScanner

උඩු මහලේ සිටින හිමායාට ගේට්ටුවෙන් ඇතුළත මෙන්ම පිටතත් හොඳින් දර්ශනය වේ. එමෙන්ම දෙපස පිහිටි නිවාස දෙකේ මිදුලේ සිදුවන සියලු දේ හිමායාගේ දෙනෙත් අනායාසයෙන් ම හසුකරගනී. නිවස ඉදිරිපිට පාරට මීටර් සීයයක් පමණ දුරින් වැතිරගත් ජයන්ති වැව් කොමලියගේ ජල කඳෙන් විශාල වපසරියක් ජනෙල් කවුළුව තුළින් දකගත හැකි ය.

ඈතින් එරමිනියා ගොතාගෙන වාඩිවුණ කඳු යාය හැඳි හරිත වර්ණ තුරුලිය සළුවේ පහතින් කළ තිල්කැටයම් සිත්තමක් ලෙස වැව්දිය මැතින් පෙනෙන්නට විය. වැව්දිය කුස තුළ වැඩෙන ජලජ සතුන්ට සහ ශාකයන්ට පෝෂය දෙමින් දසදහස් ගණන් ජීවිත ජීවත් කරන්නට විය. වැව් දිය මැද බැසගත් රුස්ස ගස් තම කොළ, පොතු දියවනතුරු අව්ව වැස්ස නොතකමින් වැව්දිය මුරකළ නිසාදෝ අද අරටුව පමණක් ඉතිරිවී ඇත. එහෙත් තවමත් වැව්දිය මතින් විශ්‍රාම නොගෙන තවමත් අව් වැසි උසුලමින් සිටින්නේ ය. එය සමවන්නේ කෙස් සුදුවී සම රැළි වැටෙන තුරු දරුවන් උස් මහත් කොට පසුව දරුවන්ගේ දරුවන් හදන්නට වෙහෙසෙන වියපත් මව් පියවරුන් මෙනි.

අහසට දෑත් විදාගෙන තම ජීවිත කථාව නිහඬව කියන වියපත් රුක් අරටු මාළු බාන්නට පැමිණෙන පිළිහිඩුවන් සහ කොකුන් තමාට අසුන් පැනවූවා යැයි සිතා එහි වාඩිවන්නාහ. තැනක දෙකක ජලයෙන් උඩට ඉලිප්පුනු කළුගල් මුදුන් කිපය දියකාවන්ට සුව යහනාවකි. සැන්දෑකළුවර හෙමින් වැතිරෙන විට කාටත් හොරා ගලට ගොඩවෙන ඉබ්බුවන් වැව් දියේ තමන් නිතර නොදකින සිරි නරඹන්නේ ඉමහත් සතුටිනි.

දවසේ පැය විසිහතරෙන් වැඩි ම වෙලාවක් හිමායා වෙන් කරන්නේ මේ සුන්දර පරිසරයේ චමත්කාරය විඳගැනීමට ය. ජනෙල් කවුළුවෙන් ඈ සුවිශාල වපසරියක අලංකාරය විඳගන්නේ කිසිවකුට කරදරයක් නොවන ලෙසිනි. සුළඟ, අව්ව, වැස්ස, අහස, ගහ කොළ, අපා දෙපා සිව්පා ආදී මුලු මහත් පරිසරය ම හිමායාගෙ ළඟ ම නෑසියන් වී ඇත්තේ ය.





හිමායාගේ සිතුවම් කලාව හා ඡායාරූපකරණය අතරට ඇගේ නෙතගැටෙන පහන් සිතුවිලි ඈ පෑන් තුඩගින් කවි කළා ය. තම නිරුවත් හදට නැගෙන අව්‍යාජ සිතුවිලි පැන්සල පින්සල සහ කැමරා මුහුණතට වහන්වී සොඳුරු නිර්මාණ ඉපැදවූහ.

දෑහැනට සමවැදුණු යෝගාවචරයකු සේ හිමායා ඈත මානයට නෙත් යොමුකරගෙන සිටී. දොර රෙද්ද ඇත් මැත් කර කාමරයට ඇතුළු වූ සුදූ ආච්චිඅම්මා ටික වෙලාවක් නිහඬව බලා සිටියා ය. එහෙත් කාමරයට කවුරුන් හෝ පැමිණි බව හිමායා තව ම නොදත්තේ ඇගේ කල්පනා ලෝකය ඒ තරම් ම ගැඹුරුවූ බැවිනි. අවසන...

''සුදූ බේබි..... සුදූ බේබි..........සුදූ බේබි....'' සුදූ ආච්චිඅම්මා තුන්වතාවක් කතා කළද හිමායා කල්පනා ලොවින් පියවි ලොවට නොබැස්සා ය. අනතුරුව ආච්චිඅම්මා සුදූ මුහුණට එබී බැලුවා ය.

ඇහිබැම යටින් දෙපසට දිවෙන නීලනුවන් යුග්මයෙහි පිරි කඳුළු බිඳු පිටාරගලන්නට සූදානම් ය. ඇහිපිල්ලම් කඳුළු බර අමාරුවෙන් දරා සිටින්නට විය. හිමායා අච්චිඅම්මා දෙසට දෑස් යොමු කරනවාත් සමඟ ඇසට වාවාගත නොහැකි වූ කඳුළු කැට ඇහිපිය තෙමාගෙන සුදූ කම්මුල හරහා දිවයන්නට විය. මවක් නොවුන ද මව්ගුණ හඳුනන මෘදු හදක් සතු සුදූ ආච්චිඅම්මාගේ දෑස් ද කඳුලින් තෙමුණි.

''සුදූ බේබි..... අඬන්න එපා රත්තරං.........'' සුදූ ආච්චිඅම්මා දෑතින් හිමායාගේ කඳුළු බිඳු පිසලන්නට විය. ඒ අතරතුර ජනේලයෙන් පිටතට ඇස් යොමු කළා ය. වම්පස තාප්පයෙන් එහා නිවසේ හිමායාගේ වයසේ පසුවන තාරකා අම්මයි තාත්තයි සමඟ බැඩ්මින්ටන් ගසමින් සිටියා ය. එම දසුන දුටු සුදූ ආච්චිඅම්මට හිමායාගේ කඳුළු කතාව තේරුම් ගැනීමට හැකිවුණි. හඬන ඇසට ඇඟිලි නොගසන්නට තරම් නුවණක්කාරවූ ආච්චිඅම්මා හිමායාගේ සිතුවිලි වෙනත් ඉසව්වකට යොමු කරන්නට කල්පනා කළා ය.

''සුදූ බේබි.... අම්මා ඊයෙ පලතුරු කූඩයක් ම ගෙනාවා. අපි සලාදයක් හදමු. හැබැයි.. මම හදනවට වැඩිය රසට බේබිට හදන්න පුළුවන් ස්ට්‍රෝබෙරි එහෙමත් තිබුණා. යමුද බේබි අපි කුස්සියට.....ආ....''



Scanned by CamScanner

සුදු ආච්චිඅම්මා හිමායාට ළංවී පැවසුවේ ඇයට එය ප්‍රතික්ෂේප කිරීමට බැරිතරම් කාරුණික මෙන්ම ලයාන්විත අයුරිනි.

හිමායාගේ පිළිතුර වූයේ කටකොනට නැගුණු සිනාවකි. දෑස වටේ සිටගත් ඇහිපිය තවමත් කඳුළින් තෙමුණු ගමන් ය. එහෙත් දෙතොල සිනාවකින් සැරසී ගත්තේ ය.

"යමු නේද?.........." ආච්චිඅම්මා සිනාසී ඇසුවා ය.

විදුලි සෝපානය දෙදෙනා ම බිම් මහලට ගෙන ගියේ ය. තෙවන මහලේ එළිමහන් මල් උයනක් ද දෙවන මහලේ නිදන කාමර ද වූ අතර මුළුතැන්ගෙය විසිත්තකාමරය පුස්තකාලය සහ හිමායාගේ නිර්මාණ පුරවාගත් ශාලාවකින් බිම් මහල සමන්විත විය. මැදු මිදුලේ වූ දිය ඇල්ල සහිත පොකුණ නිවසෙ සුන්දරත්වය දෙගුණ කළේ ය. බිම්මහල කලාගාරයකට සමාන ය.

හිමායාගේ ඇගේ හැප්පි හැප්පි කාමරයට බලහත්කාරෙන් රිංගන අතන මෙතන ඔහේ රස්තියාදු ගහන හිතුවක්කාර සුළඟට ඕන දෙයක් රැගෙන නිදහසේ හිමායාගේ කාමරයට පනින්න අවස්ථාව උදාවී ඇත්තේ හිමායා ආච්චිඅම්මා සමඟ මුළුතැන්ගෙට ගොස් සිටි නිසාවෙනි. එළියෙ ඇති දෑ ඇතුළට ගෙනආ හැකිවුවද හිමායාගෙ වටිනාකම් එළියට ගහගෙන යෑමට සුළඟ කිසිදිනක උත්සාහ කළේ නැත.

සුදු ආච්චිඅම්මා අඛණ්ඩව කතා කරන අතර හිමායාගෙන් ලැබුවේ නිහඬ පිළිතුරු පමණි. ඇගේ මුහුණේ ඉරියව්වලින් සහ දෑතින් ලද පිළිතුරුවලින් සුදු ආච්චිඅම්මා සෑහීමකට පත්විය.

විසිත්ත කාමරයේ පුටුවක වකුටු වී නිදාසිටි සුදු බිංදු නැගිට වලිගය කෙළින් කර දෑත් දෙපා දිගහැර ඇඟමැලි කඩා පුටුවෙන් පැන ආවේ හිමායා පැමිණි බව දැනගෙන ය.

ඤාව්.....මියෑව්........ හඬින් පටන් ගත් පූස් ආදරය නොනවතින පුරු.....පුරු.....පුරු...... හඬකට පත්විය. රවුමක් දෙකක් පුටුව වටේ කැරකී දෑත් දෙක ඔසවා හිමායාගේ පුටු ඇන්දට තැබී ය. කට වටේ වූ රැවුල් ගස් ඒ මේ අත නටවා ඤෑ......ව්.....ඤෑ......ව්... යනුවෙන් ඇද





පැද යමක් පැවසූ මුත් පූස් බස හිමායාට හෝ ආච්චිඅම්මාට නොතේරුණ නිසා රවුමක් දෙකක් මුළුතැන්ගෙයි ඒ මේ අත තගුට කරේ තියාගෙන ගොස් පුටුව යටින් නිදාගන්නට විය.

දෙදෙනා එකතුව පිළියෙල කළ පලතුරු සළාදයෙහි රස මිහිර විඳීමෙන් පසුව නැවතත් ඔවුන් පහලට ගෙනා විදුලි සෝපානයට ඔවුන් ඉහල මාලයට රැගෙන යාමට සිදුවිය. හිමායා කාමරයට ඇරලූ සුදු ආච්චිඅම්මා ආපිට බිම් මහලට ගියේ පඩිපෙළ් පසුකරමිනි.

"සුදු බේබි.... මම මල් පැළවලට වතුර දාන්න යනවා......"

කාරුණික වචන හිමායාගේ දෙසවන් අතර තබා ඈ යන්න ගියා ය. ඔවුන් සමඟ පැමිණි සුදු බිංදු ද කතාවක් බහක් නොමැතිව ම ළඟ ළඟ දෙපා තබමින් සුදු ආච්චිඅම්මා ද පසුකරමින් දිවයන්නට වූයේ මල් පාත්ති දහයකට වතුර දමන්නට ඔහුට ඇති බව හඟවමිනි. බල්ලට ඇති වැඩකුත් නෑ. හෙමින් ගමනකුත් නෑ යන කියමන බල්ලන්නට පමණක් නොව පූසන්ට ද අදාළ බව සිහිවන්නේ සුදු බිංදුගේ බොරු පූස් කලබලය දකින විටය.

පැය කීපයක් තනි වූ ජනේලය හිමායා පැමිණි බව දැන පියන්පත් විවර කරගත්තේ සුළඟේ උදව්වෙනි.

"සුදු බේබි........ සුදු බේබි....... මම මෙහේ....." සුදු ආච්චිඅම්මා නොදරුවෙකුට කතා කරනවා මෙන් ගෙළයනේ සිට හිමායාට කතා කර අතවන්න්නට විය. හිමායා ලොකු වුවද ඇයට තවමත් හිමායා ළදරුවෙකි. කැත කුණු අතගාමින් ආදරයෙන් ලොකු මහත් කළ ඇය හිමායාට දයාබර මිත්තනියකි.

හිමායා ද සුදු ආච්චිඅම්මාට දෑත් වනමින් පිළිතුරු බැන්දා ය. ආච්චිව පසුකරමින් දුවන්නට වූ සුදු බිංදුගේ රාජකාරිය වූයේ පාතින් රවුම් ගහන බත්කූරන්ට උඩපැන පූස් ප්‍රහාර එල්ල කිරීම ය. තණකොළ අතර සිටින පළගැටියන් හා මැඩියන්ට කුරුමානම් අල්ලා ඉදිරිපස දෑත් දිගුකර පනින්නේ පිහිනුම් තටාකයකට ක්‍රීඩකයකු පළමුව පනින පිම්ම සිහිගන්වමිනි. මෙසේ ජන්මෙන් පැමිණි පූස්ගති පෙන්වමින් සිටින අතර කාමරංකා ගසෙහි සිටි ලේනෙකුට බද නලවා කුරුමානමක්



Scanned by CamScanner

ගෙන පිම්මේ දුවගොස් පැන්නේ ය. කුරුමානම වැරදී බිංදුගේ දෙපා රැඳුනේ දිරාගිය අත්තක ය. අත්ත කඩාගෙන සුදු බිංදු ගහමුලට ම වැටුණි. ටිං ටිං ටිං.. කියමින් ලේනා ගහ මුදුනට දිවගිය අතර සියලුම ලේනුන් සුදු බිංදුට නොනවත්තා ම ඔච්චම් කරන්නට විය. බිංදුට ලැජ්ජාව දරා ගැනීමට නොහැකි විය. වන්ඩිකම් පැත්තකින් තබා කන්දෙක අමුඩගසාගෙන නැට්ට කකුල් අතර සඟවාගෙන ගෙට දිව ගියේ පූසන්ටත් වරදින අවස්ථා ඇති බව තේරුම් ගනිමිනි.

සුදු ආච්චිඅම්මාට හරි හැටි නොතේරුන ද හැම දෙයක් ම සියුම් ලෙස දකින හිමායාගේ නෙත සිත මේ සියල්ල ග්‍රහණය කරගත්තා ය. හිමායාට වැඩි වෙලාවක් ගෙමිදුලට නෙත් සිත් කොටුකර තබා ගැනීමට නොහැකිවූයේ ගේට්ටුවට නුදුරින් නැවතුන නවීන පන්නයේ මෝටර් රථය හිමායාගේ දෙනෙත් සොරාගත් නිසාවෙනි. නිවස, තාප්පය, පාර සහ උඩුමහල අතර ලොකු දුරක් නොවී ය.

අමාරුවෙන් කිහිපවරක් ඇන්ජිම පණගැන්වීමට රියකරු උත්සාහ දැරුව ද එන්ජිමට ඇවිදීමට කිසිම උවමනාවක් නැති බවකි. හැමවතාවෙ ම කෙඳිරිගාමින් නැවතුනි. අකමැත්තෙන් වුවද රියදුරුට අසුනෙන් බසින්නට වූයේ එන්ජිම කිසිම විධානයක් භාරනොගන්නා නිසාවෙනි.

වටපිට බැලූ නමුදු කිසිවකු ඔහු නෙතට හසු නොවුනි. බොනට්ටුව ඔසවා එහි වූ කොටස් ඇර බැලීමෙන් හා තද කිරීමෙන් පසුව නැවත අසුනට ගොස් පණගැන්වීමට උත්සාහ කළද සියලු උත්සාහයන් ව්‍යර්ථ විය. බ්ලූවෝටර් ලීලී ගාර්ඩින්ස්හි සියලු නිවාසවල මේ වන විට ගේට්ටු වැසී ඇත්තේ බහුතරයක් දෙනා රැකියා සඳහා බැහැරවී ගොස් ඇති බැවිනි. පාරේ වුවද ඇවිදින අයෙකු සොයා ගැනීමත් අසීරු ය. ඉඳහිට හෝ දකින්නට ඇත්තේ. වැඩක් ඇතිවත් නැතිවත් හෙමින් ගමන් නොයන සුනඛයින් පමණි. ඔවුන් දන්නේ ද තම නෙත ගැටෙන පඳුරුවලට පා ඔසවමින් සුලුදිය පහකිරීමට හා තමාට අභියෝගයක් ඇතැයි සිතනවුන්ට බිරීමටත් හපාකෑමටත් පමණි.

නගරයෙන් තරමක් පිටිසරට වන්නට පිහිටි මෙම පෙදෙස සුපිරි නිවෙසින් යුතු වුවද මේ මාවත්වල වාහන දුවන්නේ කලාතුරකිනි.





පසුව ඔහු තම ජංගම දුරකතනය අතට ගෙන ඇමතුමක් ගන්නට විය. ඒ ඇමතුම සම්බන්ධ වන්නේ වාහන අලුත් වැඩියා කරන්නෙකු හට වියහැකි ය. ඔහු ඒ මේ අත ඇවිදිමින් ඇමතුම ලබන්නාට විස්තර කියාසිටියේ ය. දුරකතනයෙන් රුව නොපෙනෙන බව පවා ඔහුට අමතකවී ඔහු අත ඒ මේ අත යවමින් ඔහුට තොරතුරු පවසන්නට විය.

රවුම දෙකක් කරකවා කොන්දේ තබාගත් වලිගය ඇති සුනඛ ඉලන්දාරියෙකු ඒ අසලින් කව්මුඩියේ යමින් සිටියේ ය. ඔහු තම ගමන මොහොතකට පමාකර රථය වටේ හෙමින් ඉව අල්ලමින් ගමන් කර බිම සිටි තරුණයාට ද ඇතින් සිට ඉවකර බලා තමා යන්නට පැමිණි ගමන ගියේ ය.

දුරකතනය පසෙකින් තැබූ ඔහු වැඩි කලබලයකින් තොරව පසුවූයේ තම ඇමතුමින් කළ ඉල්ලීම සාර්ථක වූ නිසා වන්නට ඇත. හිතට ලද සියුම් සැනසීම නිසා දූන් ඔහුගේ දෑසට වටපිට බලන්නට හිත ඉඩදී ඇති බවකි.

වාහනයේ පෙනුම හා ඔහුගේ ආරෝහ පරිණාහ දේහය මෙන්ම හැඳ පැළඳ සිටි අයුරින් ඔහු වැදගත් රැකියාවක නියුතු අයෙකු බව දකින්නන් තුළ ඇතිවන පොදු හැඟීමකි.

කලිසම් සාක්කු තුළට දෙඅත් දමා ගත් ඔහු සැනසිල්ලෙන් වටපිට බලන්නට විය. නුදුරින් වූ තෙමහල් නිවසේ දෙවැනි මහලේ සිනාසෙන ජනෙල් පියන්පත් අසල සිටි හිමායාගේ සොඳුරු රුව වෙත ඔහුගේ දෙනෙත් ඇදීගියේ ය. ඔහුට ඒ සුන්දර දසුනින් නෙත් ඉවතට ගැනීමට ලෝබ සිතුන නිසා දෝ ඇහිපිය නොහෙලා ජනේලය වෙත ඇස් දූන්නේ ය. අකලට අහසින් බැස නොයන පුන්සඳ සේ හිමායා ද ජනේල් කවුළුව අසලින් ඉවත් නොවුවා ය.



Scanned by CamScanner

# 03

ප්‍රාට කිහිපයක් ගලපමින් නෙකවිධ රටා මවන ලද තටු ඇඳගත් සමනලයන් සුදු ආච්චිඅම්මගෙ මල්පාත්තිවලට කිට්ටු වූයේ ය. ඉන්අනතුරුව හරිත කොළ පිරිවරා ගත් රෝස පඳුරේ අලුතින් පිපුන ළපටි මල වටා කැරකෙමින් රස්තියාදු වන්නට වූයේ මුදුන්වූ හිරුගේ රශ්මිය ද නොතකා හරිමිනි.

සීමාවක් මායිමක් නැති දෑස් අවසර නැතිව ම අහුමුලු සියල්ලම නෙතින් පැහැර ගන්නේ ය. සුළගේ ගීතවත් වන ගහකොළ වෙනදාට වඩා ලයාන්විත ලෙස අතු පතර ඒ මේ අත වැනෙන්නට විය. වෙනදා දෙසවනට වැටෙන ගී නද අද මධුර මනෝහර ස්වර රටා වියන බවකි.

මෝටර් රථය අසල සිටින තරුණයාට හිමායාගේ රුව දැකීමෙන් උන්හිටි තැන් අමතකව ගොසිනි. ඔහුට වාහනයට වූ අකරතැබ්බය අමතකවීමට තරම් ය. රුව වරුණින් අසමසම වූ ඇය දෙස නොබලා සිටින්නට සජීවී අයෙකුට හැකිනම් ඔහු හදවතක් නැති අයෙකු ම විය යුතු ය. පිපුණ මුහුණින් යුතු තරුණයා දෙකකුල් පහසුවෙන් තබාගෙන මෝටර් රථයට හේත්තු වූයේ ය.

බාධාවකින් තොරව හෙලූ බැල්ම හකුලා ගැනීමට ඔහුට සිදුවූයේ දුරකතන ඇමතුම ලද ජංගම අපදා රථය පැමිණීම නිසාවෙනි. කාර්මිකයා වාහනය පණගැන්වීමට හැකි අයුරින් සකසන්නට විය. ඒ





අතරතුර කිහිප වරක් තරුණයාගේ අකීකරු දෑස් ජනේල් පියන් පත් දෙසට යාවූයේ නිරායාසයෙනි.

හිමායා ජනේලය අසලින් මොහොතකට ඈත් වී කණ්ණාඩි මේසය වෙත ළං වූවා ය. මුහුණ ඒ පැත්තට මේ පැත්තට හරවමින් ද කෙස් රොදක් මුහුණට හෙලමින් ද කැඩපතට එබී බැලුවා ය.

''ආ... සුදු බේබි අද කොණ්ඩ මෝස්තර දාන්න හිතුන ද? කෝ බලන්ඩ...... ආ.... ලස්සනයි. මලකුත් ගහලා. ඇස්වහක් කටවහක් නෑ... දූන් නම් පුංචි සුරංගනාවියක් වගේ හරිම ලස්සනයි.''

සුදු ආච්චිඅම්මා හිමායාගේ හැඩ බලමින් පැවසුවා ය. හිමායා කම්මුල් දෙකින් දෑත් තබා සිනාසුනා ය.

''සුදු බේබි....... ඔහොම ඉන්නකො..... කෝ මට කියන්න කැමරාව කොහෙද තියෙන්නෙ කියලා..... අර එදා ගත්තා වගේ මම ගන්නම් ෆොටෝ එකක්...''

හිමායා දෑත දිගුකර කැමරාව පෙන්වූ සැනින් සුදු ආච්චිඅම්මා ප්‍රමාද නොවී හිමායාගේ රුව කැමරා මුහුණතට හසු කරගත්තා ය. වැඩි හුරු පුරුදු නොවූයෙන් ආච්චි අම්මාට ඡායාරූපය ගැනීමට වැඩි වෙලාවක් ගතවිය.

''ආ........... මට අමතක වුණා. මම පරිප්පු මාළුව ලිපේ තියෙද්දී ආවෙ......... පිච්චිලා ද දන්නෙ නෑ.....සුදු බේබිගෙ ලස්සන දැක්කම මට ඒකත් අමතක වුණා.''

ඇය රෙද්ද ලිහා ඇඳගනිමින් ඉක්මන් ගමනින් මුළුතැන් ගෙය බලා ඇවිද ගියා නොව දිව්වා ය. ඈ ගිය මග දෙස බලා සිට සැකහැර ගත් හිමායා ජනේලය අසලට ගියා ය. වෙනදා දකින වලාකුළු, වැව් දිය, ගහකොළ, කුරුල්ලන් දකින්න ඇස්වලට අමතකව ගොසිනි. තාප්පය කෙළවරින් බිම දිගේ වැතිරෙන කොන්ක්‍රීට් පාරට දෙසට දෑස් දිවයන්නට විය.

කාර්මිකයා සහ තරුණයා තවමත් මෝටර් රථය සකසමින් සිටියි. මෙතෙක් වෙලා ජනේලය ළඟ නොදුටු රුව දැකීමෙන් පසු ඔහුගෙ



Scanned by CamScanner

සිතට දනුන සතුට ඉරිතැලුණු පොළොවට වැසි වැටුණු ලෙසකි. උගුරට හොරා බෙහෙත් බොන්නාක් මෙන් හිමායා ද හොරෙන් හොරෙන් එබිකම් කරන්නට විය.

ගස්වැල් වටා දුවටෙමින් එතෙමින් හරිත පත් නළවමින් පැමිණි සුළං රැළි හිමායාගේ කෙස් අවුල් කරන්නට උත්සාහ දරුවේ ඇය සුළඟ අමතක කරාවි යැයි සිතා වන්නට ඇත. පුංචි කෙස් රොදක් ඒ මේ අත වැනි නතර විය. හිමායාගේ දෙනෙත් පාර දෙසට යොමු වී තිබියා මිස කිසිවක් නොතැකුවා ය. සුළඟ ජනෙල් කවුළුව අතරින් බලෙන් ම ගෙට රිංගා ගත්තේ ය.

මෙතෙක් වෙලා සිහිසුන්ව සිටි මෝටර් රථය පණ ලද්දාක් මෙන් තරුණයාගේ මුවගට සිනා නැගුණේ ය. කාර්මිකයා ගණුදෙනු ලැබුණු පසු පිටව ගියේ ය.

මෝටර් රථයේ දොර අභියස සිටගෙන සිටි ඔහු හිමායාගේ ජනේලය දෙසට නෙත් යොමු කළේ ය. එහෙත් මිට මොහොතකට පෙර වූ සොඳුරු රුව එහි නැත. සඳ වලාවකින් වැසීගත් බඳු ය.

පී......ප්....... පී....ප් දෙවරක් නළාව කෙඳිරුවේ ය. ජනේලය තවම නිරුවත් ය. පියකරු රුවැත්තියගේ මුව මඬලෙහි ඡායාවකුදු නොමැත. බලාපොරොත්තුව නෙත් මායිමට නොඑනා බව දැණුනු බැවින්. රිය එන්ජිම පණ ගැන්විනි. රථයේ දුක්බර හඬ කෙමෙන් කෙමෙන් තාප්පය කෙළවරින් නොපෙනී ගියේ ය.

සුදු ආච්චිඅම්මා කාමරයෙන් පිටව යන තුරු නොඉවසිල්ලෙන් සිටි හිමායා කිසිඳු ප්‍රමාදයක් නොදක්වා වහා ජනේලය අසලට ගියා ය. ඇගේ නෙත පුරා සිත පුරා ඇවිදිමින් සිටි සිහින කුමරාගේ රුව පෙනෙන්නට නොවී ය. තාප්පය සහ පාර හිස් අහස දෙස බලා සිටින්නේ කිසිවක් නොදන්නා පරිද්දෙනි. තමා මෙතෙක් වේලාවක් දුටුවේ සිහිනයක් දැයි හිමායා වරක් නොව දෙවරක් දෑස් පිසදා බැලුවා ය.

''සුදු බේබි.......... සුදු බේබි......... බීම එක බිව්වද?'' සුදු ආච්චිඅම්මා තරප්පු පෙළ අසලින් එමින්ම ආදරණීය හඬින් විමසමින් පැමිණියා ය





ඇගේ බීම වීදුරුව නොලැබෙන්නට හිමායාට සිහින කුමරු තව වරක් දක ගන්නට තිබුණි. ඇයට ජනේල අසලින් ඉවත් වීමට සිදුවූයේ සුදු ආච්චිඅම්මාගේ පැමිණීමයි. හිමායාගේ සිත තුළ සියුම් වේදනාවක් උපදින්නට විය. එහෙත් ආච්චි අම්මා කෙරෙහි කිසිඳු වෛරයක් ඇගේ සිත නොඉපදුවා ය.

''සුදු බේබි.......... මේ මොකද බීම එක තාම මෙතන....... චුට්ටක්වත් බීලා නැනෙ... ම්... රස නැද්ද?'' ඇය පුදුමයෙන් මෙන් අසන්නට විය.

පෙනී නොපෙනී ගිය සිහිනය කාගෙත් ඇස් කන්වලින් වහන්වී හිමායාගේ හිත ළඟ රස්තියාදු ගහන්නට විය. එබැවින් සුදු ආච්චිඅම්මාට වෙනදා ලැබෙන පිළිතුරු ඉරියව් කිසිවක් අද නොලැබුණේ ය. කිසින් නොදත් ඇය ඉණ රැඳි රෙදිපට ලිහා නැවත හැද හෙමින් සීරුවේ යන්නට ගියා ය. බීම වීදුරුව තවමත් මේසය මත වූ බන්දේසියේ ය. සුදු ආච්චිඅම්මාගේ පිටවීමෙන් පසු කිසිම බාධාවකින් තොරව හිමායා නැවතත් තම කල්පනා ලොව තුළ සිත්සේ කිමිදෙන්නට වූවා ය.

ලාච්චුව තුළ වූ පින්සල සහ දියසායම් පෙට්ටිය ගත් හිමායා මේසය මත වූ බීම වීදුරුව සිතුවම් කළා ය. ඊට පසුපසින් තාප්පය අසල තිබූ මෝටර් රථය සහ ආගන්තුක තරුණ රුව සිතුවමට එක් කළා ය. එහෙත් එම දර්ශනයේ බීම වීදුරුවේ හැර පිටුපස දර්ශනයේ පැහැය බොඳ කර තැබීමට ඇය අමතක නොකළා ය.

පාසලේ දී මිට වසර කිහිපයකට පෙර ද්‍රව්‍ය බලා ඇඳීමේ ලැබුණු පළපුරුද්ද ඇය උපකාරී කරගත්තා ය.

''ආ... හරිම ලස්සනයි.....'' සුදු ආච්චිඅම්මා ළඟට පැමිණි බව හිමායාට දැණුනේ ඇගේ හඬ අවදි වූ නිසාවෙනි. සිතුවමෙහි ගැඹුරක් නොසිතූ ඇය බාහිර සුන්දරත්වය වර්ණනා කරන්නට විය.

හිමායා ආච්චිඅම්මා දෙස බලා සිනාසෙන්නට වූයේ සිතෙහි වූ සිතුවිලි කඩදාසිය මත සිතුවම් කිරීමෙන් ඈ කිසියම් සහනයක් ලැබූ නිසාවෙනි. දෑසින් මැකී ගිය සිහිනය දෑස් අභිමුවෙහි සිතුවම් කරගත් ඈ බොහෝ සේ සතුටට පත්විය. කිසිවක් නොතේරුනු සුදු ආච්චිඅම්මා ඇගේ හිස පිරිමැදිමින් සිතුවම අගය කරන්නට වූවා ය.



Scanned by CamScanner

''පීප්......පීප්..........'' වාහනයක නළාවක් ගේට්ටුව දෙසින් කතාකරන්නට විය.

සිතුවමේ රැඳී තිබුණ නෙත සිත විදුලිසැරයක සැනින් අඩවන් ජනෙල් පියනෙන් ඉවතට පැන්නේ ය. අම්මාගේ වාහනය ගේට්ටුව ඉදිරියෙහි විය.

''අම්මා වෙන්න ඇති.......'' සුදු ආච්චිඅම්මා මිනිත්තුවක හෝ ප්‍රමාදයකින් තොරව උඩු මහලින් බැස ගියා ය.

දෑසේ බැල්ම ඈතට දිවගියේ ය. සුපුරුදු පරිදි වැව්දිය වෙනදාමෙන් රැළි නගමින් ඒ මේ අත ඇවිදින්නට විය. දොරගුළු දමූ සොරොව්ව තද නින්දකට වැටී සිටි බැවින් කොතරම් දඟළුව ද වැව් දිය එකතැනම ය. නිල් අහසට දුක කියන්නාක් මෙන් විටෙක දිය රැළි උඩට එසවී නැවත පතිත වෙයි. වැව් ඉවුරේ හැපෙමින් සුදු කඳුළු පෙණපිඩු නංවා ආපසු යයි.

''සුදු දෝණි...... මම ආවා......'' උදෑසන මුහුණ සිප නිවසින් බැහැරව ගිය අම්මා ඉර අහස හැරගිය පසු නැවත පැමිණ ඇත. ජනේලය ළඟින් ඉවත් වූ හිමායා ආදරණීය අම්මාගේ දයාබර කටහඬ දෙසට ළං වූවාය. සිතට දැණුන ලතැවුල් සියල්ල මව් සෙනෙහස හමුවේ වියැකී ගියාසේ හිමායාට දැණුනි. ඈ සියල්ල සිතේ ඈතට විසිකොට අම්මා වෙත ළං වූවා ය. නිමාලිගේ දෙපා සවස නිවසට ගොඩවැදුනු පසු පළමුව ගමන් කරන්නේ උඩුමහලේ හිමායාගේ කාමරය වෙත ය. කොතරම් වෙහෙසක් දැණුන ද ඒ සියල්ල දෙවැනි කොට දවල් දවසේ හිමායාගේ සිතුවම් සහ නිර්මාණ ඇගයීමට ඈ අමතක නොකළා ය.

''ඉතිං දෝණි...... ඔයා අද මොනව ද කළේ?.....'' ආදරයෙන් හිස පිරිමදිමින් නිමාලි කතාබහට මුලපිරුවා ය. දෝරගලන මව් සෙනෙහස හිමායාගේ සිතට සිසිල් දියදහරක් මෙන් විය.

සුපුරුදු පරිදි හිමායා ඉරියව්වලින් සහ අත් අකුරින් පිළිතුරු දුන්නා ය. ගතවූයේ නිමේෂයකි.

''පීප්........පීප්.........''



# 04

අඳුරු සළුපට ලිහා මිහිමතට අතහැර නිල් අහස් අඟන තරුකැට වියමනින් යහන සරසන්නට වූවා ය. පසළොස්වක පෝයදාට පුන් සඳක් විලස පායන්නට එළිය ගබඩාකරගන්නට සඳ නිවාඩු ගොසිනි. පසුපස එළි පත්තුකරගත් ජංගම කණාමැදිරි බලකායේ නිවාඩු වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා ඇත. රාජකාරි අතරතුර ලද විවේකය ගෙවා දමන්නේ කැන්ද ගස්වල ය. එවිට තම ප්‍රියතම නවාතැන් පළවල්වූ කැන්ද ගස්වල ආලෝක රූ රටා පෙනෙන්නේ තොරණ ලෙසිනි. හිමායා පැය විසිහතර පුරාම දුන් පරිසරය දකින්නේ ප්‍රීතියෙන් ඉහවහා ගිය විලාසයකිනි.

ඝන අඳුරේ අතන මෙතන රජ්තියාදු ගහන සීතල පුළඟට ගෙට එබිකම් කරන්නට නොදී පියන්පත් අගුලු ලා ගන්නා ජනේලය තවමත් අවදියෙනි. රෑ කුමාරි, සේපාලිකා, ගැටපිච්ච පුවදට හිමායා මුණගැසීමට අවස්ථාව ලැබී ඇත.

නිදිසුව විඳින තණකොළ මතට මිදුලෙ පහන් කණුවේ විදුලි බුබුළ ආලෝකය ලබා දෙන අතර මල් පඳුරුවලට වැසිගත් තැන්වල සෙවණැලි සිතුවම්වී ඇත. වැව් ඉවුරුතෙර ඉස්මත්තේ කඳු මුදුනේ ඇටෙරියාමල් ආරාමයෙ විදුලි ආලෝකය සීතල වැව් දියට බැස ඇත්තේ කළුවරේම ය.



Scanned by CamScanner

අඳුරේ වටපිට ඇවිද්ද හිමායගෙ දෑස් තාප්පය අසල වැතිර සිටින පාර ළඟින් නැවතුණි. දැන් දෙපසට විදාගත් මාවවුලකු ජනේලය ළඟින් ඉගිල ගියේ හිමායාගෙ සිතුවිලි බිඳලමිනි. ඈත ගස් මුදුනක සිට හඬන ඕ..ඕ...ඕ.... බකමූණු හඬ හිමායාගෙ සිත සනසන්නට උත්සාහ කරන්නාක් මෙනි. එහෙත් හිමායා ගැඹුරු කල්පනාවක කිමිදෙමින් අදහාගත නොහැකි යමක් සොයන බවකි.

"සුදු දෝණී......... ඔයා තව ම ජනේලෙ ඇරලා... මොනවද කල්පනා කරන්නෙ...."

නිමාලි තම දියණියගේ කාමරයට ඇතුළුවෙමින් විමසුවා ය. වෙනදා මේ වන විට සිතුවම් අඳින හිමායා තව ම ජනේලය ළඟටවී සිටින්නේ ඇයිදැයි නිමාලි කල්පනා කරන්නට විය. කිසිවක් නොවිමසූ ඇය හිමායාගේ හිස ඇඟට තුරුළුකරගෙන සෙමෙන් පිරිමැද්දා ය.

"සුදු දෝණී ඔයාට කළුවරේ ලස්සන බලන්න හිතුන ද? දවල්ට අපි දකින පරිසරය ඒ කළුවරට පෙන්නෙ තවත් විදිහකට නේ ද?....."

නිමාලි කිසිවක් නොවිමසා නෙත දකින දේ මාතෘකාවට ගෙන හිමායා හා දොඩමළුවූවා ය. හිතෙහි වූ පැටලිලි බව සිනාවට මුවාකළ හිමායා මව සමඟ එකඟ වූවා ය.

"ලොකු බේබි කෑම ලෑස්තියි." සුදු ආච්චිඅම්මා තරප්පු පෙළ තරණය කරමින් හඬ අවදිකළා ය.

"ඤාව්....ඤා........ව්." සුදු බිංදු ඇය අනුගමනය කරමින් පසුපස පැමිණියා ය. කෙලින් කරගත් දිගු වලිගය ඔසවාගෙන ඇය ද කඩිමුඩියේ ආච්චි අම්මාගේ දෙපයේ පැටලෙමින් දිව එන්නේ අත්‍යවශ්‍ය රාජකාරියක් ඉටු කිරීමට ඇතිබව හඟවමිනි.

"ලොකු බේබි කෑම ලෑස්තියි.." දෙවැනි වතාවට දුනුම් දුන්නේ කාමරයට පැමිණීමෙන් අනතුරුව ය. සුදු බිංදුට කිසිවක් කීමට අමතක වූයේ බිත්තියේ සිටි පළඟැටියෙකුගේ ඇඟට කඩා පැනීම ඊට වඩා වැදගත් වූ බැවිනි.

"හරි...... සුදු ආච්චිඅම්මෙ අපි එන්නම්......... මේ බලන්නකො සුදු දෝණී ලස්සන චිත්‍ර ගොඩාක් ඇඳලා හරිම ලස්සනයි. මේ....."





නිමාලි තමා අතෙහි වූ සිතුවම් පෙත්වූයේ දියණියගේ සිතුවම් අගය කිරීමට ය. සුදු ආච්චිඅම්මා ද මහත් ඕනෑකමින් අතෙහි වූ නෙත ගතිය ඇඳ සිටි රෙදි පොටෙහි පිසලමින් ළංවූවා ය.

"ඔව් බේබි ඔය හැම එකක් ම මම දවල් බැලුවා... හරිම ලස්සනයි. සුදු බේබි උපන් හපනනෙ..." සුදු ආච්චිඅම්මා හිමායාගේ සිතුවම් වර්ණනා කළා ය.

හිමායාගේ මුහුණ උදේ පිපුන මලක් මෙන් ප්‍රසන්න විය. සුදු අච්චිඅම්මාගේ සහ අම්මාගේ අව්‍යාජ අගයකිරීම ඇයගේ සිතට මහමෙරක් තරම් ශක්තියකි. කාමරයේ සිටි කෘමි සතුන් සැඟවුණු පසු සුදු බිංදුට කිරීමට වැඩක් නොවූයෙන් ඤාව්.....ඤාව් කියමින් දෙපා අතර පැටලෙන්නට විය.

සුදු ආච්චිඅම්මාගේ දෑතින් රසමුසු වූ රාත්‍රී ආහාරයෙ සුවඳ නාසයට බලෙන් ම රිංගා ගත්තේ ය. විදුලි බුබුලින් ලද නිල් පැහැති ආලෝකය කෑමවල වර්ණය නෙතට ගෙනදුන්නේ ය.

හිමායා අම්මා සමඟ කෑම මේසේ වාඩිවුණ ද සුදු අච්චිඅම්මාටද කෑම මේසෙ වාඩිවීමට කිසිවකුගෙන් තහංචියක් නොවුණි. එහෙත් ඇය නිමාලි සහ හිමායා සමඟ එකට වාඩිවී කෑම ගත් දිනයක් කාටවත් මතක නැත. නිමාලි ඇයට කතා කළ ද "මම පස්සෙ කන්නම් බේබිලා කන්නකො......." එය සුදු ආච්චිඅම්මාගේ සුපුරුදු පිළිතුර විය.

සුදු බිංදු ආරාධනා නොකර ම මේසය උඩම වාඩිවෙන්නට ගොස් සුදු ආච්චිඅම්මාගෙන් ගුටි නොකෑ බේරුණේ හිමායා ළඟ හිටපු නියාවෙනි.

වෙනදා සතුටු සිනා දෝරගලන හිමායාගේ මුහුණ පාළුවී ඇත, එනම් වලාකුළක පැටළුන සඳ මෙනි. හිමායගෙ වයස පනුකරපු නිමාලිත් සුදු ආච්චිඅම්මටත් වෙනසක් දනුණි.

වෙනදා ආසාවෙන් රස බලන නිබ්බටු මැල්ලුම, පොළොස් ඇඹුල පිඟානෙහි පැත්තක ය. අතනින් මෙතනින් ඇහිදගත් බත් අහුරු කීපයක් කටට ගියේද පරිස්සමෙනි, දෙතොල නොකියන දේ දෙනෙත නොව හිමායාගේ සියොළඟින් ම පෙනෙන්නට විය.



Scanned by CamScanner

"සුදු දෝණි බඩගිනි නැද්ද පුතේ....." නිමාලි කිසිවක් නොදන්නා අයුරින් විමසුවේ වමතින් හිමායාගේ හිස පිරිමදිමිනි.

සුදු බිංදුගේ කෑඞව සහ දෙපාවල පැටෙලෙමින් ඒ මේ අත දිවීම නතරවූයේ සුපුරුදු කෑම බඳුනට කෑම ලැබීමෙන් පසු ය.

"පී.ප්...... පී....ප්....." වාහනයක නළා හඬ පාර දෙසින් ඇසුනි. හිමායාගේ කට ළඟට ගිය දකුණත යළි පිඟානට පහත් විය.

"මෙහාට නෙවෙයි එහා ආන්ටිලාගෙ ගෙදරට වෙන්න ඇති." නිමාලි පිළිතුරු දුන්නේ හිමායා හඬට දක්වූ ඉරියව්ව තේරුම්ගත් නිසාවෙනි. එහෙත් ඇයට එහි විශේෂත්වයක් නොවුනි. හිමායාගේ සිත තුළ පිනුම්ගහන සිතුවිලි තවමත් අන් සිත්වලින් වසන්ව් ඇත. වෙරළට පැමිණ සිදී බිඳී විසිරෙන රළ මෙන් එකිනෙක සිතුවිලි සිත තුළ ඒ මේ අත සක්මන් කරන්නට විය. "බ්ලූ වෝටර් ලිලී ගාර්ඩන්ස්" පෙදෙස සහ නගරය යා කරමින් දිවෙන පාරදිගේ වෙනදා මෙන් කිසිදු වෙනසකින් තොරව වාහන දුවන නමුදු රිය නළාහඬක් දෙසවනට ලද පමණින් හිමායාගේ සිත සලිත වන්නට විය.

"සුදු දෝණි කාලා ඇති නම් අත හෝදලා නිදාගන්න යමු...." නිමාලි තම දියණිය අමතා කියා සිටියා ය.

පුළුං බෝලයක් වැනි බඩගෙඩිය පුරවාගත් සුදු බිංදු වෙන වැඩක් නොවූයෙන් වලිගය මිනැවට උපාවට නටව නටවා බිම නිදන්නට විය. හිමායා සහ නිමාලි අනුකරණය කරමින් නිදාසිටි සුදු බිංදු ද පසුගමන් ගියා ය. ගමන අතරතුර බිත්තියේ පහල තිරුවේ වාඩි වී සිටි මකුළුවකුට මැස්සකුට කොමල පූස්අත් පහරක් දෙන්නට වූයේ මිරාගෙන කෑමට ම නොවේ පූස් ගති අත් නොහැරිය හැකි නිසාවෙනි.

හිමායා නිදිකුම්රියට තුරුළු කොට නිමාලි කාමරයේ විදුලි බුබුල කළුවර කොට ආපසු පැමිණියා ය. හිමායා එනතුරු පාළුවෙන් ඇදටවී බලා සිටි හිම බිංදු, ටෝනි, සුමුදු, බිංකි ආදරයෙන් තුරුළු කර ගනිතැයි ඔවුන් සිතු නමුදු හිමායාට ඔවුන් අමතකව ගොසිනි. ඇඳේ පැත්තක ඔවුන් තනිවූහ. මේ යාළුවෝ හිමායට වඩා වසර එකකින් දෙකකින්





බාල වන අතර විටින් විට අම්මාගේ සහ තාත්තාගේ මිතුරන් විසින් උපන්දින තෑගි ලෙස ලැබුණි. එදා සිට හිමායාගෙ තනිකම පාළුව බෙදාහදාගත්තේ මොවුන් සමගිනි. එතරම් පැරණි මිතුරුකමද දැන් හිමායාට අමතකව ගොසිනි.

රාත්‍රී වැඩ කොටස නිමාවට පත් කළ නිමාලි දියණියගේ කාමරයට පැමිණියේ සුව නින්දක පසුවන දියණිය දැකීමේ බලාපොරොත්තුවෙනි. තරප්පු පේළිය පසුකර යෑමට නිමාලිට මග එළිකළේ බිත්තියේ එල්ලී සිටි රුමත් බිත්ති ලාම්පු ය.

දොර රෙද්ද ඈත් මෑත් කොට නිමාලි කාමරයට පය තැබුවා ය. කාමරය දැඩි අඳුරේ ගිලී තිබුණි. විදුලි බුබුළ නිදාගත් ගෙතුළ දැඩි අඳුර පැවතිය ද, සඳ නැති අහසට තනි රකින තරු එළිය බිමට ගලාවිත් තරමක් අඳුර බොඳකර ඇති නිසා නිමාලිට ජනෙල් පියන විවර කොට ඇති බව සැනෙකින් දැණුනි. විවර වූ ජනේලය අසල නිසංසලේ කළුවරට පෙම්බඳින හිමායාට අම්මාගේ දෙපා හඬ පවා නෑසුනි.

"සුදු දෝණි.......... මේ ඊ....... ඔයා තාමත් ඇහැරලා ද? නින්ද යන්නෙ නෑ.......ම්"

නිමාලි හිමායාගේ ඇගේ ගෑවෙන නොගෑවෙන තරමට ළං වෙමින් පැවසුවා ය. නිමාලිගෙ සිතට ප්‍රශ්න වැලක් ම පෙළ ගැසුන ද කිසිවක් මුවින් පිට නොකිරීමට ඇය සිතා ගත්තේ අහිංසක හිමායාගේ සිතට තවත් කරදරයක් එක්කිරීමට අකමැති වූ නිසා වන්නට ඇත.

"සුදු පුතේ............ ඔයා දැම්ම නිදාගන්නෙ නැද්ද?" නිහැඬියාව මිස නිමාලිගේ වචන භාරගත් බවට කිසිදු සලකුණක් නොවී ය.

නිමාලි තද නින්දේ පසු වූ විදුලි බුබුළ අවදිකළේ බිත්තියේ වූ ස්විචය තදකිරීමෙනි. කම්මැලි බවක් නොපෙන්වා විදුලි බුබුල එසැනින් ආලෝකය ගෙනාවේ ය.

නිමාලි හිමායා සමීපයට පැමිණ ඇඳ මත වාඩි වූවා ය. ඒ සමග ම දෙනෙත හිමායාගේ මුහුණට යොමුවිය. මදසිනා පිරුණු දෙතොලට මුවා වෙන්නට උත්සාහ කළ ද ඇහිපිල්ලම් යටකරගෙන දෝරගැලූ කඳුළු බිංදු නිමාලිගේ නෙතට හසුවිය.



Scanned by CamScanner

# 05

**අතු** අඟටවී කාලයක් තිස්සේ බලාසිටි මල්කැකුළු පිපි හිනැහෙන්නට ඉර එළියෙ අවසර ලැබෙනතුරු බලාසිටින්නේ ය. පිපුණු අලුත් මලක රුව දැකගන්නට සමනලුන් විසිතුරු පියාපත් වර්ණ ගන්වන්නට විය. මල් නොතලා රොන් ගන්නා මී මැස්සියො මැදුරෙන් පිටත් වුණි. සැම බලාපොරොත්තු ඉටු කරමින් දිනකර තවත් දිනක් ගෙන පැමිණියේ ය.

කෙළිකවට සිනා සපිරි ළදරු විය නොදැනී ම අවසන්වී මල්සර හැඟුම් නෙත සිත පුබුදන සොඳුරු යොවුන් වියට කිරිකෝඩු හිමායා ද පා තබාඇත. සිතට අහම්බෙන් විත් නතර වුණ පුංචි හීනෙක පැටලී හසරක අතරමංවූවකු මඟ සොයාන්නාක් මෙන් දිවා රෑ වෙහෙසෙන්නී ය. දෙතොල නොකියන දැසෙ ලියවුණු පුංචි කතාව ඒ වයස පහුකරපු හිමායාගෙ අම්මට දැනුණ ද හිමායගෙ පුංචි හිතට බලෙන් එබිකම් කරන්න සුදු ආච්චිඅම්මටටවත් නිමාලිටවත් හිත හදාගන්න බැරිවුණා.

පිනි බිංදු මුසු සීතල සුළඟෙ එතෙමින් අඳුරු සළුවෙ දැවටීගෙන ගහකොළ මෙන්ම සතා සී පාවා නිදිසුව විඳින්නට විය. අඳුරින් ජීවිතය සොයන මැඩියන්, පළඟැටියන්, රැහැයියන් මහ හයියෙන් ආගිය තොරතුරු හුවමාරු කරගත්තේ පරිසරයේ නිහඬබව බිඳ දැමීම ඔවුන්ට පැවරී ඇති බව සිතමින් මෙනි.





"සුදු ආච්චිඅම්මේ....... ටිකක් එන්ඩකො මෙහාට" නිමාලි මුළුතැන්ගෙයි සිටි සුදු ආච්චිඅම්මාට කතා කළා ය. කුඩා කළ සිට නිමාලි සුදු අම්මා යැයි ඇමතුවද දැන් හිමායා පවසන පරිදි ආච්චිඅම්මා යැයි කියන්නේ වැඩි ලෙන්ගතු කමකිනි.

"මම මේ රෙදිටික දාලා එන්නම් බේබි.."

සුදු ආච්චිඅම්මා පැමිණෙන තුරු නිමාලි සිතෙහි සිතුවිලි විමසුවා ය. විනාඩි කිහිපයකින් මුළුතැන්ගෙය පසුකළ සුදු ආච්චිඅම්මාගේ දෙපා සාලයේ සිටි නිමාලි අසලට පැමිණියා ය.

"මෙහෙන් වාඩි වෙන්නකො සුදු ආච්චිඅම්මෙ." නිමාලි තමා ළඟ තිබුණු වේවැල් පුටුව පෙන්වූයේ බරපතල කතාවක් සිත රඳවාගෙන ය.

නිමාලිගේ අවසරය ලැබුණ ද එම පුටුවේ වාඩි වීමට ඇති අකැමැත්ත පෙන්වමින් සුදු ආච්චිඅම්මා වටපිට බැලුවේ වෙනත් මිටි ආසනයක් ඇත්ද යන්න ය.

"සුදු ආච්චිඅම්මේ මේ හැම පුටුවක් ම තියෙන්නෙ වාඩි වෙන්න. මෙන්න මෙහෙන් වාඩිවෙන්න."

"අනේ මන්දා......" කියමින් වීත්තය සකසුරුවම් කරමින් පුටුවේ වාඩි වූවා ය.

"සුදු ආච්චිඅම්මෙ........" කියමින් නිමාලි දිගු හුස්මක් ගත්තා ය.

"ඇයි බේබි........" සුදු ආච්චිඅම්මා දෑස් සහ මුව විවරකරගත් ආකාරයෙන් ම නිමාලි දෙස බලාසිටියා ය.

"ටික දවසක ඉඳලා අපේ දෝණිගෙ වෙනසක් තේරෙනවා." නිමාලිගේ මුහුණ බැරෑරුම් විය.

"සුදු බේබි සතුටින් ඉන්නවනෙ......" නළල රැලි කරගත් සුදු ආච්චිඅම්මා කලබලෙන් මෙන් පැවසුවා ය.

"සුදු දෝණිට තිබුණෙ පුංචි ලෝකයක්, එයාගෙ ලෝකෙ හිටියෙ වලාකුළුයි, සුළඟයි, පාට පාට සමනලයොයි, ගහ කොළයි විතරයි.



Scanned by CamScanner

එත් ......" කියමින් නිමාලි කතාව මදකට නවතා සුදු ආච්චිඅම්මගෙ මුහුණ දෙස බැලුවා ය.

"මටනම් ලොකු වෙනසක් පේන්නෙ නෑ. එහා ගෙදර ළමයි අම්මයි තාත්තයි එක්ක සෙල්ලම් කරනකොට නම් දවසක් ඇස්වල කඳුළු පුරෝගෙන බලාගෙන හිටියා. ඒ ඇරෙන්ඩ සුදු බේබි දුකෙන් ඉන්නවා මට තේරුණේ නෑ."

"සුදු ආච්චිඅම්මෙ ගෙදරට කවුරුහරි ආවද?..." නිමාලි ප්‍රශ්නයක ස්වරූපයෙන් විමසුවා ය.

"අනේ නෑ බේබි. උදේ බේබිට යන්ඩ ගේට්ටුව ඇරියට පස්සෙ ආපහු ගේට්ටුව අරින්නෙ බේබිට හවසට එන්න විතරයි. මම දවස ම ගෙදර ඉන්නෙ. සුදු බේබිගෙ කාමරේට මම නිතර යනවා එනවනෙ. මම යන එන වෙලාවට එක්කො චිත්‍ර අඳිනවා නැත්තං පින්තූර ගන්නවා."

"නෑ සුදු ආච්චියෙ එයා පහුගිය ටිකේ ම ඇඳපු චිත්‍ර හරිවෙනස් ජනේලෙ ළඟට වෙලා වටපිට ලස්සන බලපු දෝණිගෙ ඇස්වල මොනවදෝ හැංගිලා තියෙනවා."

"එහෙමටම යි කියලා හේතුවක් තියෙන්න විදිහක් නැනෙ බේබි."

"ඒ අපිටනෙ.......... සුදු දෝණිගෙ හිත මොනවදෝ හොයනවා."

"වෙලාවකට නම් සුදු බේබි ජනේලෙන් එළියෙ බලාගෙන ඉන්නවා. ඒ ඉතිං කම්මැලි ඇතිනෙ......"

"කම්මැලිකමට බලාගෙන ඉන්න එකෙයි. කල්පනාවට වැටිලා බලාගෙන ඉන්න එකෙයි වෙනස මට හොඳට තේරෙනවා."

"ඉතිං ලොකු බේබි... හෙමින් සැරේ සුදු බේබිගෙන් අහන්න එපැයෙ."

"එයා අඳින පින්තූරවලින් කියවෙන කතාව හරි වෙනස් මට හිතෙන්නෙ එයාගෙ හිත කලබල කරන හේතු පින්සලෙන් ඇඳෙනවා කියලා."





"මේ අහිංසක පුංචි එකී ගැන ලොකු ලොකු දේවල් හිතන්න එපා බේබි." සුදු ආච්චිඅම්මා වේදනාත්මක ස්වරූපයෙන් පවසමින් වෙදගිල්ලේ වූ සුදු යකඩ මුද්ද වටයක් දෙකක් කරකවන්නට විය.

"අනේ මන්දා මගෙ හිතට ලොකු බයක් දැනෙනවා. සුදු දෝණිගෙ හිතට දුකක් දැනෙයි කියලා."

"කලබල වෙන්න එපා අපි හෙමින් සිරුවෙ බලමු."

"අඳුගානෙ...... මිදුලටවත්........ කවුරුවත් ආවෙ නැතේ ද?" නිමාලි වචන අතර පරතරයක් තියමින් පැවසුවා ය.

"මොනාද මේ කියන්නෙ......බේබිට විකාර ද?"

"නෑ.. සුදු ආච්චිඅම්මෙ දෝණිගෙ කාමරේ ජනෙල් හැමදා ම කළුවර වැටෙන කොට වැහිල ඉවරයි. ඒත් දැන් එහෙම නෑ..... දවස් දෙකක් මම බලනකොට ඒ කාමරේ ජනේලෙ ළඟට වෙලා එළිය බලාගෙන ඉන්නවා. ඒ වෙලාවෙ පුංචි ඇස්වල කඳුළුත් තිබුණා."

"ඈ... හැබෑට!" සුදු ආච්චිඅම්මගේ දෑස් ලොකු වූ අතර පුදුමෙන් මදක් නැගිටවිණි.

"ඔව් සුදු ආච්චිඅම්මෙ.... අහස පොළොව වටපිටාව බලබල සැහැල්ලුවෙන් හිටපු දෝණිගෙ පුංචි හිත වෙනස් වෙලා."

"බේබි හෙමින් අහන්නකො ඇයි කියලා."

"දෝණිගෙන් මම හේතු අහන්න ගිහිල්ලා එයාට දුක වැඩිවුණොත්.." නිමාලි දුක්මුසු ස්වරයෙන් පවසන විට ඇගේ දෙනෙත් සුදු ආච්චිඅම්මාගේ දෑස් හා යාවී තිබුණි.

"මම සුදු බේබිගෙන් හෙමින් සිරුවේ අහන්නද?"

"සුදු ආච්චිඅම්මෙ දෝණිගෙන් මොකවත් අහන්න එපා. අපි එයාට ආදරෙන් ළං වෙන්න ඕනෙ."

නිමාලිට වඩා සුදු අච්චිඅම්මා වියපත් මුත් නිමාලිගේ අත්දැකීම් සුදුආච්චිට වඩා වියපත් ය.



Scanned by CamScanner

"හොඳයි බේබි.."

"මම හෙට වැඩට යන්නෙ නෑ දෝණිත් එක්ක කොහේ හරි ඇවිදින්න යන්න ඕනෙ.."

"ඒක හොඳයි" සුදු ආච්චිඅම්මා නිමාලිගේ තීරණය දෙවරක් නොසිතා අනුමත කළා ය.

"මගෙ ඔළුවත් රිදෙනවා. මම නිදාගන්නවා. සුදු ආච්චිඅම්මෙ ඔයත් නිදාගන්න."

ඉණෙහි වූ මල් මල් චීත්තයෙ රෙදි පට තද කොට හැඳ සුදු ආච්චිඅම්මා කුස්සිය දෙසට ගියේ නින්දට පෙර අවසන් කරන්නට තවත් යමක් ඇත්දැයි දැනගැනීම සඳහා ය.

රාත්‍රී දහයේ පැය පටන් ගන්නවාත් සමගම සුපුරුදු පරිදි සියලු විදුලි බුබුළු නිවීගියේ ය. මැඩියන් පළගැටියන් රැහැයියන් නිදන්නන්ට නැලවිලි ගීත ගැයීමට මුළු රෑපුරාම අවදියෙන් සිටියහ.

කණාමැදිරියන්, කන්වැයන්, රැබදුල්ලන් තමහැකි පමණින් එළි දල්වා සඳ නැති අඩුව පුරවන්නට උත්සාහ ගත්හ.

ළඟ පාත කොට්ටම්බා, ඇටඹ සහ මීගස් සියල්ලම බදුගත් වවුල් පරපුර එළිවෙන තුරු කෑ කෝ ගසමින් එල රසවින්දාහ.

දවසේ බොහෝ වේලාවක් දූස් හැර සිටින හිමායගෙ ජනෙල් පියන්පත් ද මේ වනවිට තද නින්දට වැටී ඇත.



# 06

සිත තුළ පැළවෙන සිතුවිලි ළදළුපත් අතු රිකිළිවී පන්හිදේ, පින්සලේ දූවටී නිහඬ පිටු පුරා සිතුවම් ලෙසින් ද, කවිපද ලෙසින් ද, මැවෙන්නට, කටුගෑවෙන්නට විය.

කවුලු පියන් පතින් එහා ඇසට එබිකම් කරන, සිතට ලෙන්ගතු වන දෑ මෙන්ම සිත තුළ මුකුළු කරන දහසකුත් සිතුවිලි දවස පුරාවට හෙමි හෙමිහිට එළිබසින්නට විය.

ගහ කොළට, මඳනලට, වලාකුළුවලට අමතමින් හිමායා විමසන්නට වූයේ තම සිතට එබිකම් කර සිතුවිලි කැලතූ සිහින කුමරා කොහේ ඉන්නෙ ද, කාගෙ කවුරුන් ද යන්නයි.

"සුදු දෝණී..... ඔයා උදෙන් ම ලියන්න ගත්තද?" නිමාලි කාමරයට ඇතුළු වෙමින් පැවසුවා ය. අතෙහි වූ කෝප්පය භාරගත්තේ මේසයයි. එහි ඇති උණුසුම එයින් නගින දුම් කැරළි කියා සිටියේ ය.

නිමාලිගේ දෑතේ උණුසුම හිමායාගේ හිස කෙස් අතර ඇවිදින්නට විය. ඒ අතරතුර නිමාලිගේ දෑස් මේසය මත වූ කඩදාසියේ අකුරුවැල් දිගේ ඇවිද ගියේ හිමායාගේ දෙනෙතට වහන්වෙමිනි.

ගහට කොළට ලස්සන පාට කොයින් දෝ...

සමනලු තටුමත ලස්සන පැඩ කවුරු මවමින්දෝ...



Scanned by CamScanner

එවන් හිරු සමුරු සොයාන් ගෙනෙව්දෝ...
ඇසට රුව නොවලා අමත් කියව්දෝ..
හිතක රසක නොකට හිමිව වනව්දෝ
ගෙනෙන සොඳුරු විසමත් සොලොන කියව්දෝ
සඳ සැව මී සව් රස මදනල ගෙනයාදෝ....

නිමාලිගේ දෑස් අවසන් අකුරු පේළියේ මොහොතක් නතරවුණි. කඩදාසිය පුරා ඇවිදගිය ගමනේ දී, අසා දැනගැනීමට අවැසි යමක් වූ නමුදු නිමාලිගේ දෙතොලින් මෙපිටට කිසිදු වචනයක් ඒමට හිත අවසර නොදුන්නේ ය.

"දෝණි ඔයාගෙ කවිය හරිම ලස්සනයි. තව ලියන්න. පුතේ ඔයා ගොඩාක් දක්ෂ කෙනෙක්..."

නිමාලිගේ සිතට ගොඩවැදුනු සිතුවිලි හදවතේ කොනක සිරකර පදපේළි අගයන්නට වූයේ දෝණිට සතුටක් ගෙනදීමට ය.

හිමායා දෙනෙත් විවර කොට අම්මාගේ මුහුණ දෙස බැලුවේ එම වචන ඇගේ සිතට සැනසිල්ලක් ගෙනදුන් නිසා වන්නට ඇත. දෝතින් ළංකරගත් හිමායාගේ මුහුණට නිමාලිගේ මුහුණ ළංවිය.

"දඩාස්........" සුළඟට කීකරු වූ ජනෙල් කවුළුව කෑ ගසාගෙන ජනෙල් රාමුව බදාගත්තේ ය. දෙදෙනා ම ගැස්සී එදෙසට හැරුණාහ. නිමාලි ජනෙල් පියන එළියට තල්ලුකොට අගුලු දැමුවා ය. එසැනින් මල් සුවඳ රැගත් සිහිල් සුළං සුපුරුදු පරිදි හිමායා සොයා පැමිණියේ ය.

කෝප්පයේ වූ තේ විටින් විට හිමායාගේ දෙතොළ තෙමාගෙන උගුරින් බැසගියේ ය.

ජනේලය අසල වූ හිමායාගෙ දෑස් ඈත ඉමේ වැව්දිය මත ය, සිත කල්පනා ලොවේ පතුලේ ය.

පතුල පෑදීමට ඔන්න මෙන්න තේ කෝප්පය මේසය මත තැබූ හිමායා කණ්ණාඩි මේසයේ පිටපත් වූ තම රුව දෙසට නෙත් දුන්නා ය.





මොහොතක් පැවති නිසල බව බිඳිමින් නිමාලිගේ කටහඬ කාමරය පුරාම විසිරුණි.

"දෝණි...... ඔයාට මේ පරිසරයෙ පේන ලස්සන හැම දෙයක් ම අඳින්න.... ලියන්න... ඔයා ගොඩාක් දක්ෂයි. මම ඔය කවි පත්තරේකට යවන්නම්..." නිමාලි නොයෙක් උප්පරවැට්ටි යොදමින් උත්සාහ ගත්තේ හිමායාගේ සිතට ළං වීමට ය.

නිමාලිගේ අරමුණ නොදත් හිමායා නිමාලිගේ මුහුණ දෙස බලා මඳසිනාවක් එකතු කළා ය.

"දෝණි මම දැන් වැඩට යන්න ඕනෙ." වෙනදාට වැඩි කාලයක් නිමාලි තම දියණිය සමඟ ගතකර උණුසුම් සුසුමක් නළලත හිඳුවා පිටවගියා ය.

මෙතෙක් වෙලා පාපිස්සෙ රවුම්වී නිදාසිටි සුදු බිංදු නිමාලි පසුපස දුවන්නට වූයේ බොරු නින්ද කඩාගෙන ය. නිමාලිට මෙන් රාජකාරියට යෑමට සුදු බිංදුට ද පරක්කුවී ඇත්දැයි බිංදු පස්සෙන් පන්නාගොස් අසන්නට සිතෙන තරම් ය. කාමරය නිදහස් විය. හිමායා හෙමින් ජනෙල් කවුළුව වෙතට ළංවූවා ය. මෝටර් රථ, යතුරු පැදි සහ වෙනත් වාහන ඉදහිට ගම සිට නගරයටත් නගරයේ සිට ගමටත් දිවගිය මුත් දෑස බලා සිටින කොළ පැහැති මෝටර් රථය තව ම තාප්පය පසුකළේ නැත.

පළමු දින අහම්බෙන් ද දෙවැනි, තෙවැනි හා සිව්වැනි දින හිතාමතාම ද මෝටර් රථය තාප්පය අයිනේ නතරවූයේ ය. හැමදිනකම හිමායා ජනෙල් කවුළුව අසල සිට හිතට හොරෙන් එබිකම් කළා ය. ඔහුගේ දෙතොලට නැගුණු සිනා ද ජනෙල් කවුළුව ට මුවාවී ඇසටත් සිතටත් ඔබාගත්තා ය. එතැන් පටන් ගහට කොළට වැව්දියට ලෙන්ගතු වූ සිත වෙනසකට මුල පිරුවේ ය. මෙලෙස සිතට අහම්බෙන් ගොඩවැදුනු සිහිනයක හිමායා ඇවිද යන්නී ය.

"පී.........ප් පී..........ප්........" පාරේ ඇවිදින වාහන කතා කරන්නට විය. ඒ හැම හඬක් ම හිමායාගේ දෑස්, හී සර පරදමින් පාර වෙත දුවන්නේ ය.



Scanned by CamScanner

"සුදු දෝණි.........."

අම්මාගේ කටහඬ ළඟ ළඟ ම ඇසෙන්නට විය. හිමායා වහා ජනෙල් කවුළුව ළඟින් ඉවත් වූවා ය. ඉරිදා දිනයක් බැවින් නිමාලි වැඩි කලබලයකින් තොරව පැමිණියා ය. මෝටර් රථය තවමත් තාප්පය අසල ය. අම්මාගේ දෙපා හෝ දෑස් ජනේලය වෙතට යාම වැලැක්වීම පිණිස හිමායා පැන්සල ගෙන සිතුවමක් අඳින්නට පටන් ගත්තා ය.

"ආ...... මගෙ හොඳ දෝණි...... උදෙන් ම වැඩ පටන් අරන්...." නිමාලි කාමරයට පැමිණෙමින් පැවසුවා ය. හිමායා අම්මා දෙස බලා සිනාසුණේ කිසිවක් නොදන්නා ලෙසිනි. එහෙත් හිත වේගයෙන් ගැහෙන්නට වූයේ දුන් දුන් මෝටර් රථය පැමිණේවිද යන්න සහ අම්මාගේ දෙපා ජනේලය ළඟටත් දෑස් තාප්පය ළඟටත් යාවිද යි ඇති වූ තිගැස්ම නිසාවෙනි.



# 07

සිහිඳු වැලි බිම තෙමාගෙන වෙරළට දුවගෙන එන සයුරු රැළි ගල් බැම්ම සිඹගෙන නැවතත් දියඹට යන්නේ ය. විටෙක වේගෙන්විත් පොළොවෙන් උඩට මතුවී සිනාසෙන පොල්මුල්වලටත් රළු වැටකෙයියා මුල්වලටත් සෙනෙහසින් සුරත පා යන්නේ නොසිඳෙන මිතුරුබව පෙන්වීමට මෙනි.

ලා කොළපැහැති මුහුදු රළ ක්ෂිතිජයේ සිට නිල් අහසට ළංවෙවෙමින් දවස තිස්සේම රහස් කොඳුරන්නට වුණි. සුදු පුළුං වලාකුළු එකතැන නොරැඳී අහසේ ඒ මේ අත ඇවිදින්නේ මුහුදු ලිය සිය අහස් හිමිට ළංවී සිටීම පිළිබඳ අකමැත්ත පෙන්වීමට මෙනි. මින් රළ දැකගන්නට මුහුදු පැමිණි ලිහිණියන් ඒ මේ අත නොඉවසිල්ලෙන් පියඹන්නට විය.

සුදේ සුදු රළ පෙරළි පෙරළි කෙළින කෙළිය අවසන් වන බවක් නැති හැඩකි. ගල්වැටිය අයිනෙ වැටකෙයියා පඳුර දිගු කොළ නැමැති අත් සහ මුල් නැමැති දෙපා මුහුදු දියට ඔබාගෙන සිටින්නේ සතුරන්ගෙන් වෙරළ රැකගැනීමට මෙනි. පොල් අතු අතරින් පැමිණි හිරු එළිය පොල් ගස් යට සෙවණැලි ඇඳ ඇත. සෙවණැලි පැගෙන තණ ගොල්ලෙ හුදකලාවූ වියපත් ඔරු කඳකට බරදී හිමායා සහ නිමාලි නිමාවක් නොමැති මුහුදු රළ දෙස බලාසිටින්නට විය.



Scanned by CamScanner

"නෝනා.... ඇපල් ගෙඩියක්, නාරං ගෙඩියක්, මිදිමල්ලක් එහෙම, මේවා අලුත් ඒවා මේ බලන්න තාම කුල් එක ගිහිල්ලත් නෑ..... මේ බලන්න හොඳයි ගන්න නෝනා...."

පලතුරු වෙළෙන්දෙක් නිමාලි සහ හිමායා වාඩිවී සිටින ඔරු කඳ අසලට ම පැමිණ තම උරහිසේ වූ පලතුරු තට්ටුව ඔරු කඳ මත තබමින් තත්පරයක්වත් ඉවත නොදමමින් කියවන්නට විය.

කොට කලිසමක් සහ අත් කොට ටී ෂර්ට් එකක් හැඳ සිටි ඔහුගේ ඇඳුම් දුර්වර්ණවී තිබුණු අතර තැනින් තැන සුළං ඒ මේ අත දුවන කවුළු විය. මිරිවැඩි නුහුරු නිරුවත් දෙපා ආවරණයවී තිබුණේ දූවිලි තට්ටු කිහිපයකිනි. නිතර බුලත්විට හපන දත්පෙළට පැහැයක් කිව නොහැක. ඒවාද අවාරයට තනි වූ පොල් ගස් සිහිගන්වයි. කටදෙපසින් ගැලූ බුලත්විටෙහි හුණු දුම්කොළ සැර දැනී දෙතොල් කෙළවර වනවී ඇත.

ඔහු බොහෝ වෙහෙසවී නිමාලිට සහ හිමායට ඇපල් ගෙඩියක් හෝ විකිණීමට ගත් උත්සාහය අසාර්ථක විය. "මේ බලන්න තවම කුල්එක ගිහිල්ලත් නෑ. දැන් ෆ්‍රිජ් එකෙන් ගෙනාවෙ" අලුත් පලතුරු නම් ශීතකරණයේ තිබිය නොහැක. එහෙත් ඔහු පැවසූ කියමන සිනා ඉපිද වූ නමුදු ඇය දෙතොළට සිනා තහනම් කළා ය.

"අපට පලතුරු එපා. ආ..........මේක තියාගන්න." නිමාලි රුපියල් සියයේ නෝට්ටු දෙකක් ඔහුට දිගු කළා ය.

"එපා නෝනා.." එසේ කියූ ඔහු ඔරු කඳේවූ පලතුරු තට්ටුව කෙසඟ උරහිස මතට ගත්තා ය.

"කමක් නෑ මේක ගන්න........." අතෙහි වූ මුදල් නෝට්ටු දෙවැනි වතාවටත් ඔහු දෙසට දිගුකරමින් නිමාලි පැවසුවා ය.

"නෝනට වැඩි වැඩියෙන් ලැබෙන්න ඕන...." දසත් හිඟ මුව සිනාවකින් සරසාගෙන හිස මඳක් පහත් කොට පවසා යන්නට ගියේ ය. වෙරළ ඉමේ වැටකෙයියා පඳුරු අතරින් ඔහුගේ කේඩෑරි රුව මැකී ගිය පසුත් හිමායාගේ දෙනෙත් ඒ දෙසින් වෙන් නොවුණි.





"දෝණී ඒ මනුස්සයා පව් නේද? මේ ආත්මෙදි අපිට පුළුවන් විදිහට අනිත් අයට උදව් කරන්න ඕනෙ" නිමාලි හිමායගේ මුහුණ දෙස ඕනෑකමින් බලාගෙන පැවසුවා ය.

හිමායා නිමාලි දෙස කාරුණික හැඟීමෙන් යුතුව බලා සිටියේ එය අනුමත කරන්නට මෙනි.

සයුරු සුව විඳිමින් ඇවිද යන බොහෝ දෙනාගේ පා සටහන් වෙරළ ඉමේ වැලිමත පිටපත් විය. ගොඩට පෙරළෙන මුහුදු දිය විටෙක පා සටහන් මකා දැමුව ද අහිතක් නොසිතන දෙපා ඒ මතින් නැවත නැවතත් ඇවිද යයි.

"මුහුදු වැලිවල ඇවිදින කකුල්වලට සීතල දැනෙනවද දන්නෙ නෑ, මුහුදෙ මැද ඉඳලා එන රැල්ල ආපසු යන්න ඉස්සර වෙලා දුවල ගිහින් පාගන්න තියෙනවානම්. ඒත්.........." හිමායා ඇහිපිල්ලම් ගහන්නෙ නැතිව ඈත බලාගෙන කල්පනා කළා.

නිමාලි හිමායට ළංවී දොඩමළු වූවා ය. වෙනදා මුහුද වෙරළෙ දි නිමාලිගෙ සිතට දැනෙන සැහැල්ලුව අද නිමාලිට නොදැනුණි. තම කට හඬට කන්දුන්නද හිමායා යටි සිතින් සිටින්නේ වෙනතක බව නිමාලි දැනගත්තා ය.

පොළොව සිඹිමින් නැගිටිමින් බිම ඇවිදින දෙපා ඇති මිනිසුන්, දැත් විදා සයුරු දියට උඩින් රඟන මුහුදු ලිහිණියන්, දුර ඈත නිල් අහසෙ වලාකුළු මෙන්ම සුදු ඇඳුමින් සැරසුණු යෝධ දිය රැළිවලටත් පිටුපාමින් හිමායා කල්පනා කරන්නට වූවා ය. පසුව නිමාලි ඇගේ කල්පනාවට බාධා නොකළා ය. මෙලෙසින් පැය හතරක් පමණ ගෙවී ගියේ ය.

"සුදු දෝණි අපි ගෙදර යමු නේද? සුදු ආච්චිඅම්මා විතරයිනෙ ගෙදර...." හිමායගෙ ඔළුව ආදරෙන් පිරිමදිමින් නිමාලි පැවසුවා ය.

හිමායා අකමැත්තකින් තොරව අම්මාගේ ඉල්ලීමට අනුගතවූවා ය. දෙදෙනාම ආපසු යෑම සඳහා ඔරු කඳෙන් ඉවත්වීමට සූදානම් වූවා ය.



Scanned by CamScanner

දවසෙ මහන්සිය නිවාගන්නට සයුරු ඉමේ අසුන්ගෙන සිටි හිරු රතු පැහැ වලාකුළු සළුපිළි හැරදා සෙමෙන් සෙමෙන් මුහුදු දියට පාත්වූයේ ය. වටපිටාවෙ පැවති ආලෝකය අතුරුදහන් වෙන්නට පටන් ගත්තේ ය. හිරු හැරදමූ වලාකුළු සළුව කළුවර අහසේ ඒ මේ අත පාවී පාවී ගියේ ය. මුහුදු රළ කළුවරට අකමැත්තෙන් හෝ....හෝ... යැයි මහ හඬින් හඬා හැඬුවද බැස ගිය හිරු ආපසු නොපැමිණියේ ය.

පොල් ගස් යට තණකොළ පොළොවට තදකරමින් රිය සක හෙමින් ඇවිද යන්නට වූයේ ප්‍රධාන පාරට ගොඩවීමට ය.

ඉදිරිපස අසුන් දෙකේ දෙදෙනෙකු හිඳුවාගත් අඳුරු කොළ පැහැති මොටර් රථයක් වෙරළ දෙසට හෙමින් ඇදී ආවේ ය. නිමාලි වාහනයේ වේගය තවම වැඩි නොකළ නිසා හිමායාගේ ඇස් ඒ දෙසට යොමු කිරීම අසීරු නොවුණි. එහෙත් වාහනය පසුවෙද්දී හිමායා බෙල්ල ඒ දෙසට හරවමින් අසීරුවෙන් බලන්නට විය. එහි හිටියවුන් කවුරුදැයි හඳුනා ගැනීමට හිමායාගේ දෙනෙත් අපොහොසත් වුණි.

"මොනාද දෝණි ඔච්චර ආසාවෙන් බලන්නෙ"

හිමායා සිහින් සිනාවක් පාමින් නැවත අසුනේ පසුපසටවී හේත්තු වූවා ය. හිමායාගේ හදවතෙහි රිද්මය වෙනස් විය. කොඳුඇට පෙළ හිරිවැටීගෙන යන්නට විය.

"ඇයි දෝණි කවුද දැක්කෙ..." එහෙත් හිමායා කිසිවක් ඉඟි නොකළා ය.

දිවයන රිය තුළ වූ සසල බව පැන් තුඩ අකීකරු කළේ ය. එසේ වුවද ඉස්පිලි පාපිලි ඒ මේ අත දිවගිය අකුරු පේළි පේළි හිමායාගේ ඔඩොක්කුවේ වූ සටහන් පොතෙහි කටුගෑවුණි. දැන සුමුදුවට සුක්කානම මත ඇවිදින අතර නිමාලිට හිමායාගෙන් ඇසීමට ප්‍රශ්න වැලක් ම හිත දිගට පෙළගැසුණි. එනමුදු කිසිවක් මුවින් එළියට නොදුන්නා ය.

පෙරලෙන රිය සක නිසල විය. දැන් සුක්කානම මතින් බැස්සේ ය. රිය හද මොහොතක් විවේක සුව ලද්දේ ය.

සුපිරි වෙළඳ සැල අභියස රථ නැවතුමේ පෙළට හිටි වාහන අතරට නිමාලි ද වාහනය ඇතුළු කළා ය.





"දෝණි මම බඩු අරගෙන එන්නම්"

වෙළඳ සැලේ පඩි මතින් කලබලෙන් ඇවිද යන දෙපා අතරට එක්වූ අම්මාගේ දෙපා දෙස හිමායා බලාසිටියා ය.

අවටින් ගලා එමින් තිබූ අඳුර නොද කිරීමට මං මාවත් සහ ගොඩනැගිලිවල පදිංචිවූ නේක වර්ණ විදුලි බුබුළු උත්සාහ කළහ.

හිස් අතින් ඇතුළු වන සහ දෑතට බරගෙන පිටවන එකිනෙකා දෙස වුවමනාවක් නොවුව ද බලාසිටින්නට හිමායාට සිදුවුණි. දෙපා මත සිටගත් නාන්නාදුනන සිරුරු අතරින් අම්මාගේ රුව දුටු විට සිතට සතුටක් ලද්දේ ඉක්මනින් නිවසට යා හැකි බව දැනීමෙනි. දෑතෙහි වූ බර පිටුපස අසුනට පවරා දෑත් සැහැල්ලු කරගත් නිමාලි රිය අසුනට නැගුණා ය.

"වෙලාගියෙ නෑ නේද දෝණි." දිගු හුස්මක් පිටකරමින් නිමාලි පැවසුවේ ආරක්ෂක බඳපටිය පැළඳ ගනිමිනි.

වෙළඳ සැල් බිමෙහි රිය හසුරුවන සිහින් සිරුරකින් යුතු ආරක්ෂක නිලධාරියා නිමාලිට වාහනය පසුපසට ගැනීමට උදව් කළේ ය.

දුඹුරු පැහැති කලිසමක් සහ ලා පැහැයෙන් යුතු අත් කොට කමිසයක් ඇඳ සිටි ඔහු මැදි වයස පසුකර බොහෝ දුර ගිය අයෙකි. ඔහුගේ කටෙ දත් කිහිපය පෙනුනේ වචන පිට කිරීමට දෙතොල් එහා මෙහා වූ බැවිනි. ඉඟෝරයට සැදුණු පතෝල තරලක් බඳු වූ ඔහුගේ සිරුර සුළඟට ගසාගෙන යනු ඇතැයි සිතේ. හිසේ එක් පසෙක වූ කෙස් රොද ඔළුව වටේ ගොස් එළිවුණ තට්ටය වසා ගැනීමට මහත් වෙහෙසක් දරා තිබුණි. පාරිභෝගිකයන්ගේ වාහන ඇතුළුවීමේ දී සහ පිටවීමේ දී ඔහු අනාරාධිතව ම තම සේවය සලසන්නේ ය.

නිමාලි වාහනය පසු පසට ගෙන ඔහුට සිනාවකින් තුති පුදා සමු දුන්නා ය. ඒ මේ අත කඩිමුඩියේ දිව යන වාහන අතරින් නිමාලි වාහනය නිවෙස බලා ධාවනය කළා ය. හිමායා වටපිට නොබලා ඉදිරියට දෑස් දිගුකරගෙන රොබෝ කෙනෙකු මෙන් සිටියා ය.

පිටුපසින් පැමිණි රිය නළාව හඬවා පසුකරයන්නට අවසර පැතූ බැවින් නිමාලි දෙවරක් නොසිතා ම ඉඩ දුන්නා ය. සංසුන්ව අසුනට හේත්තුවී සිටි හිමායා එක්වරම කෙළින් වූවා ය.



Scanned by CamScanner

# 08

**සීතල** මඳ පුළඟ ගහකොළ සිඹිමින් යන අතර හිමායාගේ ජනෙල් කවුළුව අතරින් එබී බලා නොනැවතී ගියේ ය. ළහිරු මඬලට පාවඩ ලෙසින් සුදු වලාවෝ පෙරදිග අහසේ වැතිරෙන්නට වූහ. එසැනින්ම පිනි බර සීත උදෑසනට උණුසුම රැගෙන හිරු පායා ආවේ ය.

නිදිබර දෑස් අවදිකර උදාවූ අලුත් දවසෙ අසිරි විඳින්නට හිමායා ජනෙල් පියන්පත් ළඟට පැමිණියා ය. මව් සෙනෙහසින් උණුසුම් වුණු කොළ කැඳ වීදුරුව රැගෙන දොර රෙද්ද අතරින් මතුවෙන නිමාලිගේ දයාබර රුව හිමායාට ළං විය.

"සුදු දෝණි ......... පුතේ ඔයා දන්ද නැගිට්ටෙ." ආදරණීය සිනාවකින් මුව පුරවාගත් නිමාලි හිමායාට හදවතින් ම ළංවූවා ය. ඇඟිලි තුඩු වෙනදා මෙන් හිමායාගේ හිසකෙස් පසුකර ගෙන හිස් කබල දක්වා දිව ගියේ සුමුදු ලෙසිනි.

අම්මාගේ පුපුව මත සෙමෙන් ස්පර්ශ වුණු හිමායාගේ හිස නිමාලි දෑතින් ම පිළිගත්තා.

"දෝණි ......... පුතේ ඔයාට දවල්ට පාළුද මටත් පුතේ ගෙදර ඉන්න විදිහක් නෑනෙ......"

නිමාලි හිතේ දහසක් සිතුවිලි සඟවාගෙන හිමායා තුරුළු කරගෙන කිසිඳු වෙනසක් නොපෙන්වා පැවසුවා ය.





"සා.........ව.........සා.........ව"

දිගු වලිගය සැලුව ඔසවාගත් බිංදූ දොර රෙද්ද අතරින් පැමිණියේ අවසර ගැනීමක් ලෙසිනි.

"ආ ......සුදු බිංදූ ............" නිමාලි බිංදූට ද අමතන්නට විය. හිමායාගේ දෙනෙත් ද බිංදූගේ අහර දඟර දකින්නට කැමතිය. පුරු පුරු ආදරය දෙදෙනාට ම සමව බෙදාදෙමින් බිංදූ කාමරයේ එහෙ මෙහෙ ඇවිදින්නට වූවා පමණක් නොව නිමාලිගේත් හිමායාගේත් ප්‍රධාන මාතෘකාව ද වෙනස් කරන්නට සමත් වූවා ය.

"මේ.... දෝණි ඔයා ගිය සතියෙ පත්තරේට දුන්න කවිය ලස්සනයි කියලා ඔෆිස් එකේ හැමෝම කිව්වා. අද මම පත්තරයක් අරන් එන්නම් ඔයාට බලන්න" හිමායාගේ මුහුණ සතුටු ඉරියව්වලින් පොහොසත්ව ගියේ ය.

"මට ඊයෙ දවල් හිතුනා, ඔයාගෙ කවි පත්තරේ පළවුණා වගේ ඔයාගෙ චිත්‍රයි පින්තූරයි එකතු කරලා ප්‍රදර්ශනයක් තියන්න ඕන කියලා. පුතේ..... ඔයා තව අඳින්න........ හොඳ ඒවා තෝරලා ගමු. මම කොහොමහරි ලෑස්තිකරලා දෙන්නම්." හිමායගෙ සතුටු හිනාව නිමාලිගෙ යෝජනාව සම්මත කළා ය.

නිමාලි කතාව අවසන් කරමින් පිටුපා ගියේ රාජකාරියට යෑමට ප්‍රමාද වන බැවිණි. රවුමට ගුලිවී කෙටි නින්දක පසුවුණ සුදු බිංදූගෙ නින්ද අවසන් ය. නිමාලි ගිය පස්සෙන් සුදු බිංදූගෙ සිව්පාත් දිවයියන.

ඔරලෝසුවේ දිග සහ කෙටි කටු රවුම් දුවමින් නමයෙ ඉලක්කමට ළං වෙද්දී හිමායගෙ ඇස් පාර පැත්තට දුවන්නේ ය.

ඒ මොහොතට කිසිවකු හෝ කාමරයේ සිටීම හිමායාගෙ හිතට කරදරයකි.

නාගරික උණුසුම දැඩිව නොදැනෙන බැවින් තවමත් සතුන් නිදහසේ ඇවිදින්නේ ය. තාප්පය කෙළවරේ පාලිගේ ඉඳහිට දුවන මුගටියන්, බකල ගමනින් ඇවිද යන තලගොයින් ද දක ගැනීමට හැකි ය. මෙසේ වෙනදා මෙන් පාරදෙස බලමින් සිත රස්තියාදු වන විට

මෝටර් රථයක හඬ පළමුව ද රුව දෙවනුව ද මතු විය. සිතේ උපන් සිනාවට දෙතොලින් පිපෙන්නට ඉඩ නොදී හිමායා ආයාසයෙන් එය රැක ගත්තා ය.

මුහුණක් රිය කවුළුවෙන් එබී බලා සිනාසුණේ ය. සිනාවෙන් කතාවෙන් හිමායා පිළිතුරු නුදුන්න ද හිමායාගේ පැහැබර බැල්ම ඔහු සතුටින් බාර ගත්තේ ය.

දෙවරක් නළාව හෙමින් හඬවා රිය කවුළුව අකමැත්තෙන් වසා ඔහු තාප්පය කෙළවරින් නොපෙනී ගියේ ය. හිමායාගේ පොපියන නෙත් ඇහිපිය නොහෙලා බලාසිටියා පමණි. පසුව හිමායා බොහෝ වේලාවක් පාරදෙස බලා සිටිය ද ඒ රිය ආපසු නොපැමිණි අතර වෙනත් වාහන මුහුණට මුහුණ දෙමින් ද පිටුපාමින් ද දිව ගියහ.

ළා හිරු කිරණ වැටී හිනැහෙන ගස්වැල් සතා සිව්පාවා මෙන්ම අහසේ ඇවිදින වලාකුළු, ඈත ඉමේ පෙනෙන වැව්දිය හිමායාගේ තෙළි තුඩින් කඩදාසිවල සිත්තම් වුණේ පැවැත්වීමට නියමිත සිතුවම් දක්ම වෙනුවෙණි. ඒ අතර උඩු මහලේ ජනෙල් කවුළුව අතරින් නෙත ඇහිදගත් මෝටර් රථය සහ තරුණ රුවද සිතුවම් වුණද එය ප්‍රදර්ශනය සඳහා නොව මතකය පිණිස ය.

පාරේ දුවන රිය නළා හඬ ඇතැම්විට හිමායාගේ දෑස් සිතුවමෙන් උදුරා ගන්නට විය. දෙවතාවක් රැවටුණ ද තුන්වන නළා හඬ පසුපස ද හිමායාගේ ඇස් පාරට දුවන්නේ ය.

මසින් නහරින් සුරක්ෂිත වූ හද කුටිය තුළ කාටත් හොරා දළුලන සොඳුරු සිහිනය තෙලි තුඩේ පැටලී සිතුවම්වලට මුවාවී එළිදකින්නට වූයේ ය.

''සුදු බේබි..... සුදු බේබි......'' සුදු ආච්චිඅම්මාගේ කටහඬ ළඟ ළඟම ඇසෙන්නට වුණි.

''ආ.... ලස්සන චිත්‍ර ගොඩාක් ඇඳලා'' සුදු ආච්චිඅම්මා පැවසුවේ හදවතින්ම අගය කරමිනි.





වැඩ අවසන් කළ සිතුවම් කාමරයේ තැනින් තැන තබා තිබුණි. සුදු ආච්චිඅම්මා සිතුවම් පරිස්සම් කරන්නේ ද හිමායා පරිස්සම් කරන තරම් ආදරයෙනි. සුදු ආච්චිඅම්මා පසුපසින් පැමිණි. සුදු බිංදු දිග වලිගය ලෙලවමින්ද විටෙක සිතුවම්වල පස්ස ගාතය අතුල්ලමින් ද මුහුණ අතුල්ලමින් ද ගුණදොස් අධ්‍යයනය කරන්නට විය.

''සුදු බේබි.... අම්මා කිව්වා චිත්‍ර ප්‍රදර්ශනේ ලොකු වියදමක් ගියත් ලස්සනට කරනවා කියලා.'' හිමායා සිනාසී ඈ දෙස බැලුවා ය.

''අම්මා එන්න ටිකක් පරක්කු වෙනවා කිව්වා. පුරහඳ ද මොකක් ද කියලා සාලාවක් වෙන්කරගන්න යනවා කිව්වා. සුමාන දෙකකට කලින් වෙන්කරගන්න ඕනලු. සුදු බේබි......... ඔයාට අම්මා ගොඩාක් ආදරෙයි...... හැම දෙයක් ම කරන්නෙ ඔයා වෙනුවෙන්......''

''පී......ප්......පී.....ප්......''

''ආ...... අන්න අම්මා ඇවිත්......'' වසා තිබූ ගේට්ටු විවර කිරීමට සුදු ආච්චිඅම්මා පහළට දිවගියා ය. වැඩක් ඇතිවත් නැතිවත් හේතුවක් විස්තරයක් වගකීමක් නැතිවුවත් දුවන සුදු බිංදු පළමුව දිව්වා ය.

හිමායා පාරට යොමුකරගත් දෑස් එලෙසම තිබාගෙන සිටියා ය. සුපුරුදු පරිදි නිමාලිගෙ දෙපා පඩිපෙළ දිගේ හිමායා සොයා පැමිණියා ය.

''ඕ...... හරිම ලස්සනයි..... '' හිමායාගේ අලුත් සිතුවම් දුටු නිමාලි සතුටින් ඉපිලෙමින් පැවසුවා ය.

බිත්තිය දිගේ දිවගිය හුණා හිමායාගේ අවධානය ඒ අසල වූ ඔරලෝසුව වෙත යොමු යොමුකළේ ය.

හයේ ඉලක්කම පසු කිරීමට විනාඩි හතරක් ඉතිරිව තිබුණි. හිමායා ජනේලය ළඟ සිට පාර මුරකරන වෙලාව ළංවුණි. එහෙත් අම්මා කාමරයට පැමිණියා ය.

''දෝණී මම අද හෝල් එක වෙන්කරගන්න ගියා. එතන හොඳට ඉඩ තියෙනවා. දෝණී දන්නවා නේද..... විවේකාරාම පන්සලට එහා



Scanned by CamScanner

පැත්තෙ පුරසඳ කියලා ගොඩනැගිල්ලක් තියනවා.'' නිමාලි ඇඳෙඹි වාඩිවී කතාව පටන් ගත්තා ය.

හිමායා ඔළුව වනමින් එය දන්නා බව ඇඟවූයේ එය දන්නා නිසාම නොවේ. අම්මාගේ කතාව හැකි ඉක්මනින් කෙටිකර ගැනීම සඳහා ය. හිමායා නිමාලිට සවන් දෙන බව පෙන්වුව ද දෑස හොරෙන් හොරෙන් කිහිප වතාවක් හිතත් ඊගෙන පාර පැත්තට දිවගියා ය.

''මම හෙට පත්තර දෙක තුනකට ම දැන්වීම් කීපයක් දාන්නයි ඉන්නෙ.'' නිමාලිගේ කතාව අවසන් වන ලකුණකුදු නොවී ය. කොළ පැහැති මෝටර් රථයේ හඬ රුව දැන් දැන් තාප්පය අසලට පැමිණෙතැයි හිමායාගේ සිත කලබල කරන්නට විය.

ඔරලෝසුවේ කටු මොහොතකුදු පමානොකර එකිනෙකා පසුකරමින් ද පසුපසින් ද දුවමින් තම රාජකාරිය ඉටු කරන්නට වූයේ ය. සිතුවම් දැක්මේ විස්තර නිමාලි තවදුරටත් පවසන්නට වූවා ය.

''පී........ප්...... පී.........ප්''



# 09

**පුරසඳ** ගොඩනැගිල්ලේ පිවිසුම් දොරටුවට උඩින් සිටගත් ගොක්කොළ තොරණ ''පැහැසර සිතුවම්'' යනුවෙන් සඳහන් කර තිබුණි. නිල් මහනෙල් මලින් යුතු පුන්කලසේ තැනින් තැන පහන් සිළු සුළගේ තාලයට වැනෙන්නට විය. තැන් තැන්වල පිපුණු කුසුමින් හා අලංකාර අතු රිකිලිවලින් හැඩවුණු සැරසිලි ය.

උදෑසන සුභ මොහොතින් ප්‍රසිද්ධ කලාකරුවන්ගේ දෑස් දෙපා සිතුවම් හා සේයා රූ වෙත ඇවිද යමින් සිතුවම් දැක්ම එළිකළහ.

ඔවුන් පිටවන දොරටුවෙන් නික්ම ගියේ හිමායාගේ සිතට දැනට යෝධ ශක්තියක් තිළිණ කරමිනි.

පෙළින් පෙළට හිමායාගේ සිතුවම් කලාවේ අභිමානය කියාපාන සිතුවම් සහ ඡායාරූප නිහඬව පෙළ ගැසුනි. ඇවිදින දෙපා හිමායාගේ සිතුවම් ළඟ නතර විය. කතාකරන දෙතොල් විවේක සුව ගන්නට වූයේ සිත දැහැන් ගත වන බැවිනි.

සීලිමේ තැනින් තැන එල්ලී කැරකෙන විදුලි පංකා සිසිල උපදවා දසත විසි කළේ ය. එකිනෙකාගේ දෙපා පෑගෙන තරම්, ඇඟෙහි හැපෙන තරම් තෙරපෙන රසික පිරිසක් සිතුවම්වලට පෙම්බඳින්නට විය.

හිමායා ඇතුල්වන දොරටුව අසල වූ පිළිගැනීමේ මේසය ළඟ වාඩිවී සිටියා ය. හිමායාට යෝධ ශක්තියක් වූ අම්මා විටින් විට



Scanned by CamScanner

නැගිට ඇවිදිමින් රසිකයන් හා පිළිසඳරෙහි යෙදෙමින් ද, ඔවුන් හිමායා වෙත කැඳවාගෙන එමින් ද සිටියා ය. පුවත්පතින් හිම කුමාරි යන අන්වර්ථ නම ලද හිමායා සොයා පැමිණි බොහෝ පිරිසක් විය. රෝස පාට සාරියේ පුංචි සිතුවම් රත්වන් පැහැයෙන් ඔප දමා තිබුණි, පුරඟන රුසිරි පරදින හිමායාගේ සොඳුරු රුව ලොකු පොඩි ගැහැනු පිරිමි හැමගේ නෙතට අඳුනක් ම විය.

"හෙලෝව්..." කෑ ගැසූ දුරකතනය කනට ගත් තරුණයා පසෙකටවී ඇමතුම හා සම්බන්ධ වූයේ ය.

"ඔව් නෙතුම් තමයි කතා කරන්නෙ."

ඔහුගේ නම නෙතුම් බව ඇසෙනමානයේ සිටියවුන්ගේ දෙසවන්වලට අවශ්‍ය දෙයක් නොවුව ද ඇසුනි.

"ආ.... විනාඩි දහයක් දෙන්න මම ඉක්මනට එන්නම්." ජංගම දුරකතනය අක්‍රිය කොට කලිසන් සාක්කුවේ ඔබා ගත්තේ ය. මැණික් කටුව බඳාගත් ඔරලෝසු මුහුණත දෙස බැලුවේ ය.

උසට සරිලන මහතකින් හෙබි ඔහු, ප්‍රිය මනාප මෙන්ම පිළිවෙළට ඇඳගෙන සිටි බැවින් වැදගත් පෙනුමක් ගෙන තිබුණි. දුටුවන්ගේ නෙත් පැහැරගන්නට ඒ රුව සමත් ය.

ඔහු නැවතත් සෙනඟ අතරට එක්වෙමින් සිතුවම් වෙතට ඇස් දුන්නේ ය. ඔහු දැනුවත්ව හෝ නොදැනුවත්ව කලිසම් සාක්කුවෙන් වෙද නලාවේ කොටසක් ඉවතට විත් තිබුණි. එය ඔහු වෛද්‍යවරයෙක් බවට තොරතුරක් දුන්නේ ය.

හිමායාගේ මේසයට නුදුරින් ඇති සිතුවම් පේළිය නරඹමින් ඔහු ඉදිරියට පැමිණෙමින් සිටියේ ය. හිමායා නෙත ගැටෙනවුන්ට සිනහා තුතිපුදකරමින් මේසය අසල වාඩිවී සිටියා ය. තව නිමේශයකින් හිමායාගේ පැසසුම් හිනාව වෛද්‍ය නෙතුම්ට ද හිමිවීමට නියමිත ය. නෙතුම් කලබලයෙන් වුවද සිතුවම් දෙස ඕනෑකමින් බලන්නට විය.

සාක්කුවට ඔබා ගත් දුරකතනය නැවතත් කෑ ගසන්නට විය. ඔහු දුරකතනය අතට ගෙන අංකය බලමින් සෙනඟ අතරින් ඉවතට ගියේ ය.





"හෙලෝව්.... ඔව් ඩොක්ටර් නෙතුම් තමයි කතාකරන්නෙ.." ඔහු පැහැදිලි ස්වරයෙන් පිළිතුරු දුන්නේ ය.

"හරි..... හරි...... ඔන්න... මම දැන්ම එනවා..." ඔහු සිතුවමට කොතරම් ඇලුම් කළ ද ඔහුගේ රාජකාරිය ඊට හරස්විය. එතැන්සිට වටපිට කිසිත් නොබලා ම සිතුවම් රසවිඳීම අතරමඟ නවතා අඩියට දෙකට ඉදිරිපස දොරටුවෙන් ම නික්ම ගියේ ය. හැමෝට ම ලැබුණ හිම කුමාරියගෙ උස්සන ගිනාවත් අවසන් සිතුවම් කිහිපයක මිහිරත් විඳීමට නෙතුම්ට නොලැබුණි.

එදින ඉර යන තුරුත් නෙතුම්ගේ රුව නැවත ප්‍රදර්ශන භූමියේ දොරකඩ පසු නොකළේ ය. හෝරා කීපයකින්, වෙනදා දැනුම්දී ඇති පරිදි ම හිරුගේ රාජකාරි කාලය නිමා වී රාත්‍රී අඳුරට ඉඩ වෙන්විය. නිශාචරයින්ට සතුට අරගෙන කළුවර බිමදිගේ වැතිරුණේ ය. හිමායත් නිමාලිත් ප්‍රදර්ශනයේ දිනයක අවසානය සටහන් කරමින් නිවසට ගියහ. දොරගුළු වැටුණ පුරසඟ ගොඩනැගිල්ලේ තනිවුණ සිතුවම් බලාගැනීමට මෙන් මකුළුවන්, හූනන් බිත්ති දිගේ දුවන්ට වූහ.

මහ මඟ එහෙ මෙහෙ කලබලෙන් ධාවන දෙනෝදාහසක් දෙපා සහ රියසක අතරට නිමාලි සහ හිමායා ද එකතුවුණි. පාරෙ තැනින් තැන සිටගත් විදුලි බුබුළු අඳුර නසා ආලෝකය ගෙනදුන්හ. පාර මාරුවීමට කහඉරි ඇඳ තිබුණ ද ගැහැනු පිරිමි කවුරුත් තම සිතැඟි සෙ පාර පනින්නට විය. කලබලකාරී මාර්ගයේ නිමාලි පරිස්සමෙන් අක්කාගෙ හැසිරවීය. මවට මෙන් තමාට සිසිඳුනක වාහනයක් වාහනයක් පැදවිය නොහැකි බව සිහිවන විට හිමායාගෙ සිතට දුකක් දැනෙන්නට විය.

සුදු ආච්චිඅම්මා අඳුර පැමිණි මොහොතේ සිට නිමාලියි හිමායයි දැන් දැන් එතියි ගේට්ටුව දෙසට ඇස් කන් දීගෙන නිවස ඉදිරිපිට කුළුණු සමීපයේ වූ බැම්මේ වාඩි වී බලාසිටියා ය. කාරණාවක් නොදැන වුවද සුදු බිංදු ද සුදු ආච්චි අම්මා සමීපයේ රැඳුණා ය. හෝරා කීපයක් ගෙවී ගිය ද සුදු බිංදු සහ සුදු ආච්චි බැම්ම හැර නොගිය හ.

"පී...ප් පී.......ප්." හෝරා කීපයක බලාපොරොත්තු ඉටුකරමින් ගේට්ටුව අසල නතරවූ හිමායා නැවාගත් නිමාලිගේ මෝටර් රථය ගේට්ටුව අරින ලෙස ඉල්ලීමක් කරන ලදි. සුදු ආච්චිඅම්මා බැම්මෙන්



Scanned by CamScanner

ඉවත්වී රෝදී පොට සකසමින් ගේට්ටුව වෙත ඉක්මන් ගමනින් යන්නට විය. ඇගේ දෙපා අතර පැටලෙමින් සුදු බිංදු ද දිව්වා ය. විටෙක සුදු ආච්චිඅම්මා වැටෙන්නට ගොස් බේරුනේ අහම්බෙන් අසල වූ මල්පඳුරකට හේත්තු වීමෙනි. වෙනකෙකුට මෙය සිදුවූයේ නම් සුදු බිංදුට හොඳ ගුටි දෙක තුනක් ම කන්නට ලැබෙනු ඇත. සුදු බිංදුගේ විකාර මැද සුදු ආච්චිඅම්මා ගේට්ටුව හැර පසෙකට තල්ලු කළා ය. විදුලි ආලෝකය දල්වාගත් වාහනය හෙමින් සීරුවේ ගරාජය වෙත ගොස් නිහඬවූයේ මහන්සිය නිවාගැනීමට මෙනි.

සුදු ආච්චිඅම්මා ගේට්ටුව වසා ඉබියතුරු ලෑමෙන් පසු ගරාජයේ වූ වාහනය අසලට පැමිණියා ය. පොරකමින් ගේට්ටුව අරින්නට දිවගිය සුදු බිංදු මිදුලේ පිනි පිරුණු තණකොළ උඩින් උඩින් අඩි තියමින් ගෙවී දඩයමකට කුරුමානම් අල්ලන්නේ... කරන්නට ගිය කාරිය අමතක කොට තමාට වාසි ගෙනෙන වෙනත් කාර්යයක් කරන කපටි රජයේ සේවකයකු මෙනි.

''ආ...... සුදු බේබි මහන්සි ද? ප්‍රදර්ශනේ හොඳට තිබුණ ද? මම උදෙයි හවසයි පහන තියද්දිත් ප්‍රාර්ථනා කළා...'' සුදු ආච්චිඅම්මා පැවසුවා ය. හිමායා සතුටු මුහුණින් සුදු ආච්චිඅම්මා දෙස බලාසිටියේ ඇසූ පැනයට පිළිතුරු බඳින්නට මෙනි.

''නේද ලොකු බේබි, අපේ සුදු බේබි දක්ෂයිනේ..........'' සුදු ආච්චි අම්මා නිමාලි ද හවුල් කරගනිමින් හිමායා අගය කරන්නට විය.

''මචි සුදු ආච්චිඅම්මෙ අද ගොඩාක් සෙනඟ ආවා. හැමෝම දෝණි ළඟට ම ඇවිත් සුභපැතුවා.'' නිමාලි තම දියණියගේ හිස අතගාමින් පැවසුවේ නිහතමානී ආඩම්බරයක් විඳිමිනි.

''මම හිතුවා... අපේ සුදු බේබි හපනා..''

''මම මගේ දෝණිව ලංකාවේ ප්‍රසිද්ධ කලාකාරියක් කරනවා.''

නිමාලිගේ අභිමානනීය වචන හිමායාගේ හදවතට තදින් ම කා වැදුණි.

''අපි ගෙට යමු. දූත් මහන්සිත් ඇතිනෙ.''





මිදුලේ සිට කළ කතාබහ එතනින් අවසන් වුණි. ගෙතුළට යන අතරතුර සාලයේ මල්මාලාවක් දවටන ලද පියාගේ පින්තූරය දෙස හිමායා ඇහිපිය නොහෙලා මොහොතක් බලා සිටියා ය.

හිමායාගේ දුක්බර බැල්ම දුටු නිමාලිගේ දෙනෙත් කඳුළින් තෙත්වුණි. අම්මාගේත් දියණියගේත් පිටස්තරයකු වූ සුදු ආච්චි අම්මාගේත් හදවත් මොහොතක් නතරවූවාක් මෙනි.

''චිත්‍ර නැතුව මුළුගේ ම පාළුයි නේද බේබි.'' දෙදෙනා ගේ සිතුවිලි වෙනතකට හැරවීමට සුදු ආච්චිඅම්මා වෙනත් කතාවකට මුලපිරුවා ය.

''ම...... සුදු ආච්චිඅම්මෙ...... ඔයා කෑම ලෑස්ති කරන්නකො අපි ඇඟ සෝදගෙන එන්නං.''

''හරි... මම ලෑස්ති කරන්නං, හනික එන්න.''

ඉණ වූ රෙද්ද ලිහා රෙදිපට නැවත ඉණ හඟවමින් සුදු ආච්චිඅම්මා කඩිසරව කුස්සියට ගියා ය. සුදු බිංදු ඤා..ව්.... ඤ.......ව්.... කියමින් සුපුරුදු සේ සුදු ආච්චිඅම්මගෙ දෙපයේ පැටලෙමින් දුවන්නට විය.

සඳ නිවාඩුගත් බැවින් ඝන අඳුර, සුවසේ වැතිර ගත්තේ කිසිවකුගෙන් හෝ කරදරයක් නොවූ බැවිනි. සීතල සුළඟ කළුවරේ ම නිදි නොලබා එහෙ මෙහෙ ඇවිද යන්නේ තම සේවය අකුරට ම ඉටු කිරීමක් ලෙසිනි.

සීතල වතුරට මහන්සිය දියකළ හිමායා ජනේලය ළඟට විත්, හිතේ තැන්පත් වුණු දවසේ මතකය හෙමින් හෙමින් පෙරළන්නට පටන් ගත්තා ය. රසික රසිකාවියන්ගෙ හඬ රුව ඒ අතරින් පිළිවෙලටත් අපිළිවෙළටත් පෙළ ගැසුණි. මතුවට ඇවැසි දෑ පමණක් දින පොතේ පිටු අතරට එක් කළා ය.

ජනෙල් කවුළුවෙන් එළියට ගිය විදුලි බුබුළෙ ආලෝකයෙන් වටපිටාවෙ කළුවර යන්තමින් අඩු විය. හිමායා මඳ ආලෝකයෙන් පාර දෙස බලා සිටියෙ පුරුද්දට මෙනි. කවුළුවට දුරින්ද ළඟින්ද එළි දල්වාගෙන නැගම් යන කණාමැදිරියන් ද කළුවර අහසේ මැණික් සේ දිළෙන තාරුකාවන් ද දක්නට ලැබුණි.



Scanned by CamScanner

# 10

රෑ පුරාම නිදිවරාපු තරු කුමාරියන්ගෙ වැඩමුරය නිමාවූ බව ඈත ගම ගෙදරක කුකුල්හාමි හඬගා දනුම් දුන්නේ ය. ඉන්පසු කොණ්ඩ කුරුල්ලන්, බට්ටිච්චන් දෙවැනි තෙවැනි වතාවටත් මතක් කළහ. කළුපාට අඳුර ටිකෙන් ටික මැකීගොසින් රන් කෙඳි අහසපුරා ම එළමින් ඉර අහසේ රාජකාරි බාරගත්තේ ය.

හිමායා අවදිවූ සැනින් ජනෙල් පත් ද අවදිවන්නේ ය. වෙනදා ජනේලය ළඟටවී වටපිට ලස්සන බලන හිමායට අද ඒ සඳහා වෙලාවක් නොමැත. චිත්‍ර ප්‍රදර්ශනයේ දෙවැනි දිනයෙ වැඩ පටන් ගැනීමට යායුතු ය.

උදේම ලෑස්තිවුණු හිමායා සහ අම්මා ප්‍රදර්ශන ශාලාවට පිටත්ව ගිය පසු සුදු ආච්චිඅම්මා ගේට්ටුව වසාගත්තා ය. පෙර දිනයේ සැකසූ ගොක්කොළ තොරණ තරමක් වියලී ඇත. මල් බඳුන්වල තිබුණු නිල් මානෙල්, ඕළු, නෙළුම් මියැදී තිබුණි.. නිමාලි ඇනවුම් කළ අලුත් මල්වලින් පෝච්චි නැවත ලෑස්ති කළා ය. උදව්වට පැමිණි කීප දෙනෙක් ශාලාව පිරිසිදු කරදුන්නේ ය. හිමායා සිතුවම් සියල්ල ඒ අයුරින් ම තිබෙන බව සැකහැර දනගෙන නියමිත් මේසයට ළංවී අසුන් ගත්තා ය. හෝරාවක් පමණ යනතුරු රසිකයන් පැමිණියේ එක්කෙනා දෙන්නා බැගිනි.





"දෝණි..... ඇයි කල්පනා කරන්නෙ...." නිමාලි හිමායට ළංවී විමසුවා ය.

හිමායා ඈ දෙස බලා සිනාසීමෙන් දන්වූයේ ගැටළුවක් නොමැති බවයි. නිමාලියි හිමායයි අදහස් හුවමාරු කරගන්න අතරේ ලොකු බස් රථ දෙකක් ගේට්ටුව ළඟ නතරවූයේ ගොක් කොළ තොරණ පසුකර පැමිණීමට නොහැකි නිසාවෙනි.

සුදෝ සුදු කොකුන් රෑනක් කුඹුරකට බසින්නාක් මෙන් බස් එකෙන් පාසල් ළමයි බිමට බැස්සාහ. පේළි සැදෙමින් ඉදිරිපස දොර අසලට රැස්වන ළමයින් ඇතුළුවීමට නොඉවසිල්ලෙන් පසුවූහ. "සමුද්‍රදේවි බාලිකා" යනුවෙන් පාසල් නිල ලාංඡනය සුදු ගවුම්වල මසාතිබුණි. හිමායගෙ දෑස් කඳුළුවලින් වැසීගියා ය. වේදනාව, සතුට ඒ කඳුළු බිංදු අතර සම සමව රැඳී තිබුණි.

"මෙහෙම සුදු ගවුම ඇඳලා කොණ්ඩ කරල් දෙකක් ගොතලා ඉස්කොලෙ ගිය කාලයක් මටත් තිබුණා. ඒත් මම සපත්තු දාලා නෑ අම්මයි අප්පච්චියි මට ගෙනත් දීලත් නෑ.....මම සපත්තු මේස් දාන්න කොච්චර ආසවුණත් මට කෝ සපත්තු දාන්න ????? ......"

හිමායාගේ සිතට නැඟීමට හැකිවූයේ එපමණකි. පපුව හිරවෙන්නට මෙනි. හිමායා බිම එහෙ මෙහෙ ඇවිදින දෙපා දෙස ආශාවෙන් බලා සිටියද ඒ දසුන් සැනෙකින් දෑසින් බොඳව ගියේ කඳුළු දෑස්වසා ගත් බැවිනි.

පාසල් මිතුරන් අතරෙ දන්න අඳුනන මුහුණු බොහෝමයක් වුණි. දහය එකොළහ දොළහ දහතුන වසරවල සොයුරියන් 'හිමායා අක්කේ' යැයි මුහුණ සිපගන්නාවිට හිමායගෙ ඇස්වල කඳුළු ඇහිපිල්ලම් උඩින් ගලන්නට විය. 'පුතේ..... දෝණි......' යැයි ගුරු මව්පියවරු හිස පිරිමදිනවිට පපුව වේදනාවෙන් සහ සතුටෙන් වෙව්ලන්නට වුණි. පැමිණි හැම දෙනොලකින් ම කියවුණු සුභ පැතුම් වගේ ම ශක්තිය හිමායගෙ හදවතට සීතලක් ගෙනාව. නිමාලි ඇස්වලින් ගලන කඳුළු ලේන්සුවෙන් පිසදාගත්ත ද හිත පතුළ දවන ගිනි අඟුරු පිසදාගත නොහැකිවුණි. හිමායට සහ නිමාලිට තමාට උරුම ජීවිතවල වේදනාව



Scanned by CamScanner

පුංචි සිදුවීමකින් පවා එක ලෙසින්ම දැනෙන්නට වූයේ අම්මා සහ දියණිය වූ නිසාවෙනි.

පාසල් මිතුරන් තමාගේ සිතුවම් නරඹන අයුරු හිමායා ඈත සිට බලාසිටියා ය. නිමාලි ගුරුවරු සමඟ ඇවිදිමින් චිත්‍ර ගැන විස්තර පැවසුවා ය. තත්පරයක්වත් කට පියාගෙන සිටිය නොහැකිව කිචි, බිචි ගාමින් කෑ ගසන කුකුල් පැටව් මෙන් ලොකු පොඩි ළමයි ප්‍රදර්ශන ශාලාවෙ එහෙ මෙහෙ ඇවිදින්නට වූහ. පැයක් දෙකක් පමණ රැඳීසිටි පාසල් ළමයි තමන්ගෙ පාසලෙ ආදි ශිෂ්‍යයෙක් වුණ හිමායට සුභ පතමින් සමරුවේ සටහන් තබා පිටව ගියහ.

රසික රසිකාවියන් ද බොහෝ පිරිසක් පැමිණ සිතුවම් රසවිඳගෙන ආපසු ගියහ. ඉර අහසෙ මුදුනට ගොඩවූ අතර දවස ටිකෙන් ටික වැඩිවියට පත්වෙමින් පැවතුණි.

දවසේ පැය විසිහතර ම කලබලෙන් පසුවන රෝහලෙ සියලුදෙනාගෙ ම දෑත් දෙපා අවිවේකී ය. වෛද්‍යවරයෙක් වූ නෙතුම් තමන්ට හිමි වාට්ටුවෙ රෝගීන් පරීක්ෂා කළේ වෙනදට වැඩි කලබලයක් සහිතව ය. එයට හේතුව කළින් දිනයෙ නරඹා අවසන් කිරීමට නොහැකිවූ සිතුවම් බැලීමට යාමට අවැසි බැවිණි.

රාජකාරිය අවසන් වුණ වහාම නෙතුම් විවේක කාමරයට ගියේ රාජකාරියෙන් බැහැරවීමට නියමිත අවසන් විනාඩි කිහිපය ගෙවා දැමීමට ය.

පත්තරයක් පෙරලමින් සිටි නෙත්මි නෙතුම් පැමිණි බව දැනුන වහා ම පත්තරය බැලිම නවතා නෙතුම්ට මායම් පාන්නට වූවා ය. යමක් කියන්නට දෙතොළ නලියමින් සිටින බව නෙතුම්ට පෙනුණි.

''ඇයි.. පත්තරේ මොනව ද තිබුණෙ..''

''නෑ... අනේ මට මේ දැන් ඔයාව මතක් වුණා විතරයි... එතකොට ම තමයි දොරෙන් ආවේ. පුදුමයි... ඒ කියන්නෙ මගෙ හිතට මොනාහරි දැනෙන කොට ම ඒක ඔයාගෙ හිතටත් දැනෙනවා කියන්නෙ අපේ හිත් ගොඩාක් සමානයි කියන එකනෙ..... ''

''මිහ්..... මට නං එහෙම මොකවත් දැණුනෙ නෑ....''





''අනේ.... මොනා ද නෙතුම්, ඔයා හැමදාම මම මොනා කිව්වත් මට සවුත්තුවටමයි කතා කරන්නෙ...''

''අනේ මන්දන්නෑ නෙත්මි.. මට ඕවගෙ ගාණක් නෑ.... ඒ මගේ හැටි... කෝ.... ඔයා බලන්නෙ නැත්නං මට ඔය පත්තරේ දෙන්න.''

''ම්.. ම්....'' නෙත්මි පත්තරේ නෙතුම් ළඟට අතහැර පුප්පන්නට විය. අඟ දැවටුණු මකුළු දැලක් මී හරකෙක් ගණන් නොගන්නේ යම් සේද නෙතුම් ද කිසිවක් නෑසුන විලසින් පත්තරය පෙරළන්නට වූයේ වැදගත් යමක් ඇත්ද යන්න දැනගැනීමට ය.

නෙත්මි ඇහිපිය නොහෙලා නෙතුම් දෙස බලාසිටියා ය. නෙත්මිගේ බැල්ම නෙතුම්ගේ දෑස්වලට යාන්තමින් පෙනුන ද කිසිවක් නොදුටු ලෙස නෙතුම් ඕනෑවටත් වඩා ඕනෑකමකින් පත්තර පිටු දෙස බැලුවා ය.

සීලිමේ එල්ලීගෙන කැරකෙන විදුලි පංකාව විසිකරන සුළං වැදී පත්තර පිටුව දුවන්නට සැරසෙන විට නෙතුම්ගේ ඇඟිලි එය වැලැක්වූයේ ය.

''නෙතුම්... පත්තරේ ගෙදර අරන් ගිහින් බලන්ඩකො...''

''මට ගෙදර ගිහින් පත්තර බලන්ඩ වෙලාවක් නෑ... වැඩ කියනවා.''

''අනේ....... නෙතුම්..''

''මට ඩිස්ටර්බ් කරන්න එපා... ප්ලීස්........ නෙත්මි...''

''මොකක් ද ඔච්චර වුවමනාවෙන් බැහැගෙන බලන්නෙ..''

වාඩිවී සිටි අසුනින් වහා නැගිට ගත් නෙත්මි පත්තරේට එබිකම් කරන්න වූයේ නෙතුම්ගේ ඇඟේ ගෑවෙන නොගෑවෙන සේ ළං වෙමිනි.

''ඔක මොකක් ද ආර්ට් එක්ෂිබිෂන් එකක්නෙ... ඔයාට මට වැඩිය ඒක ලොකුයි නේද?''



Scanned by CamScanner

"ම... ඒක ඇත්ත."

"මහ්..... මගේ මූණට ම කියන ලස්සන"

"ඒක මගේ හැටි...."

"නෙතුම් හැමදාමත් වගේ අදත් ඔයා මාව මගහරින්න නේද හදන්නෙ."

"ඒක අදවත් තේරුම්ගන්නවා නං ලොකු දෙයක්"

නෙතුම් නෙත්මි කියන හැම දෙයකට නොයෙක් වචනවලින් දමා ගැසුව ද නෙත්මිගේ අඩෑඩියාව අවසන් නොවූවා ය.

"හා කමක් නෑ මම ඔයා පත්තරේ බලලා ඉවර වෙනකන් ඉන්නම් අවුරුදු තුනක් බලාගෙන හිටපු මට මේ ටික ඉන්න බැරි නැනෙ,"

"මම පත්තරේ බැලුවා. තිබ්බා. ගියා." නෙතුම් වැඩි දුර නොසිතා නෙත්මි කියූ දෙයට පිළිතුරු දුන්නේ ය.

"බලමුකො...."

නෙත්මි යමක් සිතේ සඟවාගෙන පිළිතුරු දුන් බවකි. අතීතය පවා මතක් කරමින් නෙත්මි දිගු හුස්මක් හෙලුවා ය. විදුලි පංකාව ඇගේ හුස්ම කාමරය පුරා විසිරුවා හැරියේ ය.

නෙතුම් සහ නෙත්මි මුලින් ම හමුවූයේ වෛද්‍ය විද්‍යාලයේ පළවෙනි වසරේ අවසාන මාසයේ දී පමණ ය. නම් දෙකේ සමාන බව නිසා යහළුවන්ගේ උසුළු විසුළු මිතුරුදමට අත්තිවාරමක් විය. කාලය ගෙවී යන අතර මිතුරුදම කලණ මිතුරුදමක් විය. නෙතුම් අධ්‍යයන කටයුතු සඳහා පළවෙනි දෙවැනි හා තෙවැනි තැන ද වෙන්කර තිබූ අතර අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය සියලු උදව් උපකාර දෙදෙනා හුවමාරු කරගන්නට විය. දින සති මාස ගෙවී ගොස් පස් වසරක අධ්‍යයන සීමාව අවසන් විය.

සීමාවාසික කාලය ද ගෙවී ගොස් දෙදෙනා ම එක ම රෝහලක වෛද්‍යවරුන් ලෙස පත්වීම් ලැබුණි. මේ වන විට නෙත්මිගේ සිතේ වූ සිතුවිලි වැට කඩොලු සීමා මායින් පසුකරමින් නෙතුම් වෙත දිව





යන්නට විය. අතුරක යන රා මදින්නකු සේ නෙතුම් මිතුරු දම සුරකිමින් නෙත්මිගෙ සිත නොරිදවමින් ද ඇයගේ ඇරයුම් ඉවතලමින් ද සමබර ලෙස නෙත්මි ඇසුර කළේ ය. එහෙත් දූන් නෙතුම්ගේ ඉවසීමේ සීමාව ඉක්ම යන්නට ඉතා ආසන්නවී ඇත්තේ කරදරයක් වී ඇති බැවිනි.

"හිම කුමාරිගේ කුළුදුල් පැහැසර සිතුවම් දැක්ම" යන මාතෘකාව සමඟින් සිතුවම් කිහිපයක ඡායාරූ ඇගත් වර්ණවත් දැන්වීමක් මැද පිටුවක තිබී නෙතුම් ගේ දෑස ඇද බැඳ ගත්තේ ය. තමා පෙරදින හාගෙට නරඹා පැමිණියේ මෙම ප්‍රදර්ශනය බව නෙතුම්ට මතක් විය. එසැනින් පත්තරය නවා මේසය මත තබා නැගිටටේ ය.

"ආ... ඔය යන්න ද හදන්නෙ.."

"ඔව් රාජකාරි වෙලාව ඉවරයි.."

"නෙතුම්.... නෙතුම්...."

"මට පරක්කුයි. මට එක්ෂිබිෂන් එකට යන්න තියනවා."

නෙතුම් බෑග් එක රැගෙන දොරෙන් පිටවීමට අඩියක් ඉදිරියට තබන අතර ම ආපසු හැරී පැවසුවේ ය. නෙත්මි මූණ පුම්බාගෙන කේන්තියෙන් බලා සිටියා මිස කිසිවක් නොපැවසුවා ය. නෙතුම් කිසිවක් ගණන් නොගෙන ඇතින් ඇතින් පියවර තබා පිටව ගියේ ය.

මෙතෙක් වෙලා තමා ගඟට ඉණි කැපුවා නොවේදැයි සිතූ නෙත්මිගේ සිත ඇඳුම් දෙන්නට විය. ගඟට දූ දැමූ ගඟ දිය රැගෙන ගියේ යම් සේද මෙතෙක් ගත් සෑම උත්සාහයක් ම නෙතුම්ගේ සිතෙන් විසිවිය. කුඩය සහ වතුර ස්වල්පයක් පමණක් රැඳුණු වතුර බෝතලය බෑගයට ඔබාගත් නෙත්මි ද නෙතුම් පිටවූ දොරෙන් ම පිටව ගියා ය.

ආපසු හැරී බැලීමට තරම් අවශ්‍යතාවයක් නොවූ නෙතුම් මෝටර් රථ අංගනය වෙත ගොස් රථයේ දොරට යතුර ළං කරන විට ම දුරකතනය කෑ ගසන්නට විය.

"හෙලෝ...... මෙත්තා..... ඇයි බං"



Scanned by CamScanner

"ආ... අද කොහෙද මේ කඩි මුඩියෙ දුවන්නෙ.. මම දැකලා නෑ කවදාවත් උඹට ඔය වගේ කඩිකුලප්පුවක් හැදිලා තියනවා."

"උඹ කොහෙද බං ඉන්නෙ.."

"බත් කන අත තියන පැත්ත බලපං... අනේ යකෝ.... අනිත් පැත්ත අනිත් පැත්ත... අද නං උඹට මොකක් හරි අමු පිස්සුවක් වැහිලා ඇයි බං සුරංගනාවක්වත් බලන්න ද?"

"නෑ.... නෑ...... බං.. ඉඳපං මම ඔතෙන්ඩ එන්නං"

දුරකතනය සාක්කුවට දමා මෙත්සර සිටින ස්ථානයට අඩියට දෙකට ඇවිද ගියේ ය. මෙත්සර දෙතොල් නලියමින් සිටියේ නෙතුම් ට මොකක් හෝ කියා විහිළු කිරීමට ය.

"ඈ.... බං මොකෝ...."

"මඟුලක යන්ඩ නෙවෙයි බං"

"එහෙනං"

"මම ඊයෙ ආර්ට් එක්ෂිබිෂන් එකෙ ඉන්න කොට මෙහෙන් කතා කළා මම ඒක අතඇරලා ආවා. චිත්‍ර මාර ලස්සනයි. මම මේ දූන් පත්තරේ දැක්කෙ ඇඩ් එකක් දාලා තිබුණා."

"අනිවාර්යයෙන් ලස්සන කෙල්ලෙක් වෙන්න ඇති."

"හිම කුමාරි කියලා නික් නේම් එකකින් පත්තරේට කවි නිසඳැස් ලියන පොඩි කෙල්ලෙක් ඉන්නවා. වැඩි විස්තරයක් දන්නෙ නෑ.. එයාගෙ තමයි ඒ එක්ෂිබිෂන් එක. මම දූන් දන්නෙ, තව පැයකින් ක්ලෝස් මචං."

"ආ........ පූසා මල්ලෙන් පැන්නෙ ඔඩොක්කටම"

"නෑ.... බං එහෙමමත් නෙවෙයි."

"මාත් උඹ වගේ ම උඹේ වයස ම කොල්ලෙක් කියලා අමතක කරන්න එපා. ලැජ්ජවෙන්න එපා උඹට බැරිනං මට සෙට් කරලා දීපන්."





"මේ විකාර කතා කරන්න එපා..... මම දැකලාවත් නෑ.."

"ආ... එහෙනං යමං ඔය පුංචි සින්ඩරෙල්ලා. දකින්න... ම්... ම්.... මමත් දූන් ඕං.. උඹ පලයන් මම අත්සන් පාරක් දාලා එන්නං."

"වෙලා නෑ ඉක්මනට වරෙන් මම කාර් එකට යනවා."

"ඕ...කේ........ මචං, මට වූ මිනිට්ස් දීපං"

"මම නොදන්න වූ මිනිස්ට්ස්"

"මේ..... මම ආවට කමක් නැද්ද බං, මම දුෂ්ටයා වගේ ද?" ආපසු හැරී මෙත්සර නෙතුම්ගෙන් ඇසුවේ ය.

"පිස්සුද බං වරෙන් ඉක්මනට අන්තිමේ දි මෙතන ම රෑ වෙනවා." එසේ පැවසුව ද මෙත්සර අනංගයා බව දන්නා නෙතුම් ගේ සිතේ පුංචි බියක් ද ඇතිව තිබුණි.

වෛද්‍යවරුන් වුවද තරුණ වයස මෙන්ම හැඟීම්වලට වැටකොඩොලු නොවී ය. හැඩ රුව වරුණ නොදත් සිත්තරාවිය, කිවිදිය දැක ගැනීමේ නොතිත් ආශාවෙන් නෙතුම් සහ මෙත්සර සිතුවම් දැක්මට යාමට සැරසෙන්නට විය.

රෝහලට පිවිසෙන ප්‍රධාන දොරටුව අසල වූ මාරගස මුදුනේ එකම ගෝරනාඩුවකි. උදේ සිට එහෙ මෙහෙ රස්තියාදු ගැසූ කපුටු පරම්පරාව ම අතුවල වාඩි ගෙන සිටී. ඔවුන්ගේ වසුරු ගස අවට වැටී තිබුණි. ගස යටින් යන්නවුන් දූන් දූන් හිස මතට වසුරක් පතිත වේයැ යි බියෙන් අඩි දෙකෙන් තුනෙන් මාරගස යටින් නික්ම ගියේ ය. මෙත්සර හා නෙතුම් ද යා යුත්තේ ද මේ මාර ගස යටිනි. මෝටර් රථයෙන් යන බැවින් ඔවුන්ට ආවරණයක් විය.

මෙත්සර පැමිණෙන තුරු රියට නැග සිටීම අදහස් කළ නෙතුම් වටපිට නොබලා ම ඇවිද ගොස් මෝටර් රථය අගුලු හැරියේ ය. නෙතුම්ට හැකි වූයේ රියදුරු අසුනේ වාඩිවීමට පමණි.



Scanned by CamScanner

# 11

**රෝහල්** මිදුලේ වම්පස ගේට්ටුවට නුදුරින් වාඩිවී සිටිත මහලු කාලතුවක්කු උන්ඩ ගස වයස ද අමතක කොට මල් වැල් ද රවුම් ගෙඩි ද එල්ලාගෙන බලා සිටින්නට විය. ඊට සමාන්තරව පේළියට සිටගත් නාඹර නා ගස් පේළිය මැතකදී මල්වරවී ඇත. දුටු දුටුවන්ගේ නෙත් සිත් සැණෙකින් ඇද ගන්නා මේ දසුන් දෙස බලා සිටිනවුන්ගෙන් එකෙකු වන නෙතුම්ට තම දෑස අභිසය වූ ඒ සොඳුරු දසුන නොපෙනී ගියේ ය.

''මාත් එනවා එක්ෂිබිෂන් එක බලන්ඩ යන්න''

නෙතුම්ට කර කියා ගන්නට දෙයක් නොවී ය. සිතේ කේන්තිය, අකමැත්ත එක හා සමානව පොරකන්ට විය.

''මේ මොකද? මම යං කිව්වද ඔයාට... මට එතෙන්ඩ ජෝඩු දාලා යන්ඩ බෑ.. පිස්සුද බහින්න... බහින්න''

''බෑ..... මං බහින්නෙ ම නෑ...''

''ප්ලීස් නෙත්මි... වදයක් වෙන්න එපා...''

''නෑ.... නෑ........නෑ...... මම බහින්නෙ ම නෑ...'' නෙත්මි අවුරුදු අටේ නමයේ පොඩි එකියක මෙන් කියවන්නට වූවා ය.





''කියන දේ අහන්ඩ මට පරක්කුයි දූත් මෙත්සරත් එනවා. අපේ ගෙදර කවුරුහරි දක්කොත්''

''කමක් නෑ.. මටත් ඒක ම තමයි වෙන්න ඕනෙ, ඇයි මගේ මොනව ද අඩු?''

''නෙත්මී.... මටත් ඉවසන එකේ සීමාවක් තියනවා... මම මෙච්චරකල් ඉවසගෙන හිටියෙ මනුස්සකමට නැත්තං හිතන්න එපා මම ගෑනුන්ටත් අයිති නැති පිරිමින්ටත් අයිති නැති ජාතියේ එකෙක් කියලා.. තේරුණාද? නෙත්මි... මම ආය කියන්නෑ බහින්ඩ.. ප්ලීස්...''

''මහ්... මම බහින්නං හැබැයි.. ඔය යන ගමන් මල්වඩම්කුයි පෙට්ටියකුයි ඕඩර් කරලා යන්ඩ.''

නෙත්මි කේන්තියෙන් පවසන අතර දෑස්වලින් කඳුළු වැක්කෙරෙන්නට විය. කොතරම් කේන්ති ගියද එම වචන නෙතුම්ගේ සිතට බයක් ගෙන ආවේ ය. එකදු වචනයක්වත් කීමට නොසිතූ නෙතුම් වෙනදාට වඩා දෙතුන් ගුණයක් වේගයෙන් වාහනය පස්සට ගෙන හරවා ගත්තේ ය.

මේ අතරේ ම නෙතුම්ගේ දුරකතනය කෑ ගසන්නට වූයේ සිතේ කේන්තිය තව වැඩි කරමිනි. මොහොතක් බලා සිට නැවත ගෙන බලන විට මෙත්සරගේ නම මුහුණතෙහි විය.

''ඔව් මචං....''

''හරි.. මචං මම වාහනේ පස්සෙ ගේට් එකෙන් ගත්තා.''

''ඕකේ...''

ගේට්ටුවේ වදින නොවදින සේ හරවා ගත් නෙතුම් ප්‍රධාන පාරට පිවිසියේ ය. ගේට්ටුවේ සිටි මුරකරු නෙතුම් ගිය පසු පාරට ගොස් ද බැලුවේ නෙතුම්ගේ වෙනදා නොදකින වෙනසක් දුටු නිසාවෙනි.

මොහොතකට පෙර මෙත්සර සමඟ විහිළුවෙන් කතාබහ කරමින් සැහැල්ලුවෙන් ප්‍රදර්ශණය නැරඹීමට යාමට සිතා සිටි නෙතුම්ට අවසානයේ සිදුවූයේ නෙත්මි ද නංවාගෙන කේන්තියෙන් එහි යෑමට



Scanned by CamScanner

ය. මෙත්සර තවමත් මේ කිසිවක් නොදැන සිටියේ ය. මෙත්සර පළමුව ද නෙතුම් දෙවනුව ද තම වාහන ප්‍රදර්ශන භූමියෙ දොරටුවෙන් ඇතුළු කළේ ය.

"ම්.... දැන්වත් කරුණා කරලා බැහැලා යන තුත්තුකුඩියක ගියොත් හොඳයි."

"අනේ........."

"අනේ නෙවෙයි අන්න දොර.. මට වද මලක් වෙන් නැතුව යන්න නෙත්මි.. මට දුන්න වද හොඳටෝ ම ඇති. අද තමුසෙට මම අනුකම්පා කරන අන්තිම දවස.. අන්තී.....ම දවස"

වාහනයේ එන්ජිම නතරවන විටම නෙතුම් කතාව පටන් ගත්තේ මෙතෙක්වෙලා හිතෙහි තිබුණු කේන්තිය එකවර පිටකරමිනි. නෙත්මිගේ සැර බාලවී තිබුණු අතර හුරතල් ස්වරයෙන් කතා කරන්නට වූවා ය. එහෙත් නෙතුම්ගේ සිතේ කේන්තිය ඉහවහා ගියේ ය.

"එහෙම කියන්න එපා නෙතුම්.... බලන්න මං දිහා.."

"මම කිව්වනෙ.... මම කියන්න ඕන හැම විදිහකට ම ඔයාට කියලා තියෙන්නෙ තව කියනව නං දෙව්දිහයි තියෙන්නෙ, මේ මගේ අන්තිම වතාව ආය කියන්නෙ නෑ.."

"ඇයි... ඇයි... ඇයි.... මට... මට... මට..... නෙත්මි වචන ගොතගසමින් යමක් පවසන්නට ගිය මුත් හිතේවූ වේදනාව නිසා කිසිවක් කියා ගැනීමට නොහැකි විය.

"මේ අහන්ඩ නෙත්මි... මම කවදාවත් ම ඔයාට ආදරෙයි කියලත් නෑ.. ආදරේ කරලත් නෑ.. පොරොන්දු දීලත් නෑ.. මම මොනම හේතුවක් හින්දවත් ඔයාව බඳින්නෙත් නෑ... තේරුණා ද?"

කිසිවක් නොකියා නෙතුම්ගේ මුහුණ දෙස ගිනි පුපුරු විසිවෙන තරම් කේන්තියකින් බලමින් වාහනයේ දොර හැරදා ගියේ පසුනොබලමිනි.

"ඇති යන්තං.... " නෙතුම් එසේ සිතමින් සැනසුම් සුසුමක් හෙළුවා ය.





මෙත්සර නෙතුම් සොයා පැමිණියේ සිංදුවක කොටසක් ද මුමුණමිනි.

"ඒ.. බං අර පස්ස ගස්සගෙන කඩි කැවා වගේ යන්නෙ අපේ නෙත්මියා නේද?"

"අපොයි ඒ වසංගතේ තමයි, උඹ දන්නෑ මට වෙච්ච හරිය."

"ඈ.... බං උඹ මෙච්චර කාලයක් මට කොලේ වහල හැංගිමුත්තං පැන්න නේද?"

"පිස්සුද බං මගේ ඔළුවත් රිදෙනවා."

"හා.. හා.. කියපන්කො තෙපර බාන්නෙ නැතුව"

"නෑ.... බං මට කොට්වලිගයක් වෙලා තිබුණෙ බං, මම කැමති නෑ බං, අපිත් එක්ක මෙඩිකල් කොලේජ් එකේ හිටියෙ අපි යාළුවො වගේ ආශ්‍රය කළ මෙකි මේ ළඟක දි ඉඳලා මගේ පස්සෙ එනවා බේරෙන්ඩ බෑ.."

"උඹ මට ඔය වගක් කවදාවත් කියලා නෑනෙ..."

"මම කාටවත් කිව්වෙ නෑනෙ බං.. කොච්චර වුණත් ඒකිට හොඳ නෑනෙ කියලා."

"උඹ මුලින් ඉඟිබිඟි පාන්ඩ ඇති."

"නෑ.. බං මම එහෙම එකෙක් නෙවෙයි කියලා උඹ දන්නවනෙ.. මම ඒකිට කැමති ම නෑ මචං."

"දැන් කොහොම ද සෙට් වුණේ"

"මම උඹ එක්ක කතා කරලා කාර් එකට නැග්ගා. මෙකිත් දුවගෙන ඇවිත් රිංගගත්තා මට කට උත්තර නෑ."

"නෑ....."

"නෑ නෙවෙයි බං.... උඹ මට කෝල් කරද්දිත් මෙකි වාහනේ.."

"උඹ බහින්ඩ කියන්ඩ එපැයි."



Scanned by CamScanner

"කියන්ඩ ඕන හැමවිදිහට ම කිව්වා. ඊට පස්සෙ මැරෙන්ඩ හැදුවා. මට බය හිතිලා ඉවසගෙන හිටියා. ඊට පස්සෙ බං මෙතෙන්ඩ ඇවිත් ජෝඩුදාල ඇතුළට යන්ඩ කතාව. මම කිව්වා මූණට ම කැමති නෑ කියලා. ඊට පස්සෙ අඬාගෙන දිව්වෙ ඔය... මැරෙන්ඩ බැරි නං ඕන මගුලක් කරගත්තයි. තව ඉවසුවොත් අනිත් සැරේ ඇඳුම් ටිකත් ඔතාගෙන අපේ ගෙදරට රිංග ගනී."

නෙතුම් ඉහවහාගිය කේන්තියෙන් මෙත්සරට මෙතෙක් වෙලා සිදුවූ ඇබැද්දිය විස්තර කරන්නට විය.

"යමු මෙත්තා... මේ නරිනාඩගං හින්දා මේක බලන්න තිබුණ වෙලාවත් අඩුවුණා."

"නෑ, තව වෙලාව තියනවා."

දෙදෙනා ම ඉක්මන් ගමනින් ඉදිරිපස දොරටුව වෙත ඇවිද ගියේ පෙරදින යෑමට තිබුණ ගමනක් යන ආකරයෙනි.

ගස්වැල් කඳුවැටිවලට එහායින් ඉර ඇවිද ගොස් ඇති බැවින් ගොම්මං අඳුර සක්මන් කරන්නට විය. ඉරේ උණුසුම අහලකවත් නොමැති වුවද නෙතුම්ගේ මුළු ඇඟ ම දහඩියෙන් තෙත්වී ගියේ නෙත්මිගේ ජවනිකාවේ ප්‍රධාන නළුවා වීමට අකැමැත්තෙන් හෝ සිදු වූ බැවිනි.

පිළිගැනීමේ වාහල්කඩ පසුකර නෙතුම් සිතුවම් වෙත ළඟා වූයේ ය. පිවිසුම් දොරටුව ළඟ මේසය ඉදිරියේ වූ පුටු කිසිවකුගේ බරක් ඔසවාගෙන නොසිටියහ. දෙදෙනා දෙපසකට ඇවිද යමින් සිතුවම් නරඹන්නට විය. පළමු සිතුවම දෑසට ළං වන විට ම නෙතුම්ගේ සිතෙහි වූ විස්සෝපය ගින්නට හසු වූ වෙඬරු මෙන් දියවී නිවී සැනහී ගියේ ය.

මේ අතර නෙතුම්ගේ යටි සිත ද මෙත්සරගේ සිත් දෙකම ද සිතුවම් ඇඳි දෑත හිමි සිත්තරී කවුදැයි විපරම් කරන්නට විය. තරමක් දුරින් වයසක් හරියට ම සිතා ගත නොහැකි වැදගත් පෙනුමකින් යුතු කාන්තාවක් සාරියක් ඇඳ සිටියා ය. තරුණ බව ඇය අතහැර යාමට අකමැත්තෙන් මෙන් තවමත් ඇගේ සියොළඟෙහි ම දැවටී ඇති බවකි. සිතේ සිතුවිලි නිදහසේ කැරකෙන අතරේ නෙතුම් සිතුවමින් සිතුවමට





මාරුවන්නට විය. නෙතුම් සහ මෙත්සර හැරුණු විට ශාලාව තුළ සිතුවම් නරඹන පිරිස පනහකට හැටකට වැඩි මිසක් අඩු නොවුණි.

නෙතුම්ගේ ඇසට පළමුව අසුවූ කාන්තා රුව මෙත්සරගේ නෙත්වලට ද හසුවිය.

"ආ... මෙයා ද හිම කුමාරි.. කෝ මේ නෙත්තා." යැයි සිතින් සිතූ මෙත්සර නෙතුම් සොයා සෙනඟ අතරින් පැමිණියේ මුවගට නැගී සිනහව අමාරුවෙන් දෙතොලින් හපාගනිමිනි.

නෙතුම් ද මෙත්සර දුටු වැඩිහිටි රුව දකීමෙන් පසු සිතේ තිබූ ළපටි හැඟීම් අතහැර වැදගත් කලා රසිකයන් සේ සිතුවම් නරඹන්නට වූයේ මේ වනතුරු සිතේ කිසිවක් නොතිබූ ලෙසිනි.

"නෙතුම්... මම ආවා...." නෙතුම් අසුරු සැනින් ආපස්සට හැරුණි.

"මේ... මේ...... තමුසෙ මාව මරාගෙන කන්ඩ ද හදන්නෙ.. තමුසෙ ආදරේ කරනවා තමුසෙට ආදරේ කරන මිනිහෙකුට... මම තමුසෙට ආදරේ නෑ...."

නෙතුම්ගෙ කේන්තිය ගිනිකන්දක් මෙන් නැවත මතුව ආවේ ය. වටපිට බලා කාටවත් නොඇසෙන සේ නෙත්මිට වේගවත් වචන පේළියකින් දමා ගැසුවේ දත්මිටි කමිනි. නෙත්මි ඒ කිසිවක් නොදුටු නොඇසුනු සේ බලාසිටියා ය.

"මේ තමුසෙ හදන්නෙ මට පිස්සු හදන්න ද ගෑනියේ....." නෙතුම්ගේ මුහුණේ කවදාවත් නොදුටු රකුසු පෙනුමක් දුටු නෙත්මි මොහොතක් බලා සිට පිටවගියා ය. කොතරම් සැඟවීමට උත්සාහ කළ ද සිතුවම් බලමින් සිටි කිහිප දෙනෙකුගේ ඕපදූප හොයන ඇස් කන් කිහිපයක් සියල්ල ග්‍රහණය කරගත්හ.

සෙනඟ අතරින් පැමිණි මෙත්සර මේ මොහොත වන විට නෙතුම්ට කිට්ටු වී සිටියේ ය. පිටු පසින් පැමිණි උරහිසට අතතැබුවා පමණි.

"මොහ්....." නෙතුම්ගේ ඇස් වලින් ගිණිපුපුරු විසිවන්නට තරම් කේන්තියෙන් පිරී ගොසින් ය.

"ආ.... උඹ ද?"



Scanned by CamScanner

"ඇයි බං උඹ හිටගෙන දවල් හීනයක්වත් බල බල ද හිටියෙ.."

"නෑ... බං අර මෝහිනී ආයෙත් ආවා."

"ඒ කවුද?"

"කවුද ඉතිං අර නෙත්මි..."

"කෝ දන්.. මම ඒකිට තේරුං කරලා දෙන්නං."

"ඒකිට තේරුං කරන්න උඹ නෙවෙයි උඹෙ මී මුත්තා ආවත් පුළුවං කියල මං හිතන් නෑ..... මචං මෙහෙම කෙල්ලෙක් ලෝකෙවත් නැතුව ඇති."

"ඒක තමයි නිර්මල, පිවිතුරු, අකලංක, පවිත්‍ර ප්‍රේමය කියන්නෙ."

"මේ.. උඹ මගෙන් මොකවත් අහගන්න එපා.."

"ආ.... මම කියන්න ආපු එකත් කියන්න අමතක වුණා."

"මොකක් ද?"

"අන්න උඹේ ළපටි හිම කුමාරි ඉන්නවා."

"කෝ..... කෝ....."

"අර කණුව ගාව සාරියක් ඇඳගෙන හිටගෙන ඉන්නෙ ෂේප් එකේ බලපං." මෙත්සර නෙතුම්ට පෙර දුටු කාන්තාව පෙන්වූයේ ය.

"මමත් දක්කා ඒකයි මම මේ හිත හදාගෙන පිළිවෙලට චිත්‍ර බලන්නෙ.."

"අනේ..... උඹ තමයි දවසකට හරි මිනිහා."

නැවත දෙදෙනා ම විහිලු කරමින් සිතුවම් නරඹන්නට විය. වෙලාව ඉක්මනින් ගෙවී යන බැවින් ශාලාව පුරා පිරී තිබුණු ඔළුගෙඩි ගණනින් අඩුවන්නට විය. සමහර රසිකයන් සිතුවම්වලට සමවැදී මුළු හදින් ම සිතුවමට පෙම්බඳින්නට විය.

"අපි දෙන්නට වෙච්ච වැඩේ දන්නවා නං අර ආන්ටිට දවස් ගාණක් හිනාවෙන්න තිබුණා."





"ඉඳපංකො කලබල වෙන්නෙ නැතුව, බැරිවෙලාවත් හිටියොත් තව ටිකක් වෙලා තියනවනෙ."

මෙත්සර සියල්ල සිතින් අතහැරියත් නෙතුම්ගේ සිතේ පුංචි බලාපොරොත්තුවක් තවමත් ඇඳී තිබුණි. මෙත්සර නැවත ශාලාවේ අනෙක්පස වූ සිතුවම් වෙතට ඇවිද ගියේ ය. සෙනඟ පිරී සිටි බැවින් මීට පෙර ඒ පැත්තට ළං වීමට ද නොහැකි විය.

"ප්‍රදර්ශනයේ අවසන් විනාඩි කිහිපය ගතවෙමින් තිබුණි. හාත්පස අයිතිකරගෙන රස්තියාදු ගසමින් සිටි අඳුර දොර ජනෙල් හා කවුළුවලින් ශාලාව ඇතුළට පැනීමට සූදානම් වන විට ම විදුලි බුබුළු කිහිපයක් වහලේ එල්ලීගෙන තම ආධිපත්‍යය ශාලාව ඇතුළත මෙන්ම වටපිටාවට ද පැතිරවී ය.

මිතුරන් දෙදෙනා අවසාන සිතුවම් පේළිය දෙසට ඇවිද යන්නට විය. එකින් එක සිතුවම් පසුකරමින් ගොස් පිටවීමේ දොරටුව අසලට ම ළං විය. දොරටුව අසල මේසය මත වූ විශාල සමරු පොතේ සිතුවම් ගැන යමක් ලියන්නට අදහස් කළ නෙතුම් නූල් පටක් බැඳී කාබන් පෑන අතට ගත්තේ ය.

"නෙතුම්... නෙතුම්...... මචං...."

"ඇයි ?.. මොකෝ හොල්මනක්වත් දැක්කද?"

"නෑ.... බං හොල්මනක් නං බයට හරි හිත හදාගන්න තිබුණා."

"ම්... මොකක්ද කියපං කෙකර ගාන්නෙ නැතිව."

"සිඬරෙල්ලා ඉන්නවා....මචං.."

"නෑ.... "

"නෑ.. නෙවෙයි අර එහා පැත්තෙ...." මෙත්සර තොල සපමින් හෙමින් කොඳුරන්නට විය.

නෙතුම් පුදුමයෙන් විමසන අතර අත වූ පෑන පොත මතට සෙමින් අත ඇරුණේ නොදැනුවත්වම ය.



Scanned by CamScanner

# 12

අඳුරු අහසට එළිය දෙන සරාසඳ මඬල මෙන් ද පාළු කොළ අතරට පිපී සුවඳ දෙන කුසුමක් ලෙසින් ද ගස්වැල් තෙමාගෙන හමන රළු සුළඟට සිසිලක් මෙන් ද චණ්ඩව ගලන ගඟුලට කෝමල බවක් එක්වී රුචින් ගුණයෙන් පොහොසත් වූවා මෙන්ම සිතුවමට කවියට පන්හිඳට මුවා වී අනූපම සිත්තම්වලට ජීවය දුන් පුංචි සිත්තරිය නුඹ ද?

"නෙතුම්.. අර මැද කණුව ළඟ මේසෙ දිහා හෙමින් සැරේ බලපං."

"ම්.. කෝ..... ආ.... මචං සින්ඩරෙල්ලා, සෙකන්ඩ්"

"මටත් හිතුනා."

"කෝ.. මම මෙකෙ මොකක් හරි ලියල ම එන්නං." නෙතුම් අතඇරුණු පෑන අතින් අල්ලාගෙන ලියන්නට විය. සතුට අතට ද ගොඩවී ඇති නිසා ඇඟිලි වෙව්ලන්නට විය.

"හිමකුමාරියේ ..... ඔබේ පන්හිඳෙන් කියන කතාව දහසක් හදවත් තුළ ආදරය, කරුණාව, මිනිසත් බව අවදි කරන්නේ ය. කුමරියේ ඔබ මෙලොවට අවසන නොව අවසානම දෙව්දුවකි. නුපන් හෙට දවසේ ඔබේ ලෝකය සැබැවින් ම සාර්ථක වන්නට මගෙන් සුභාසිරි, ආයු බෝවේවා ! ඔබට සදා ජය!

මම,

නෙතුම් දිල්හාර - ~~ජාතික රෝහල, කොළඹ~~





නෙතුම් තම තනතුර ලියා පසුව එය වැදගත් නොවන බව සිතා ඉරකින් කපා දැමුවේ ය. අත වෙව්ලමින් ලියූ සුභපැතුම හමාර කළ නෙතුම් මෙත්සරට යමක් ලියන සේ යෝජනා කළේ ය.

"මට නම් ලියන්න දෙයක් මතකත් නෑ.."

ඔබේ සිතුවම් ද, ඔබ ද, මා හද සොරා ගත්තේ ය. ඔබට මගේ සුභ පැතුම්

මම - මෙත්සර- 077 42 47 999

නෙතුම් විසින් ඇය දුටුවේ රන් මලක් ලෙසිනි, එහෙත් මෙත්සරට ඇය පෙනුනේ ගිනි මලක් ලෙසිනි. එම සිතුවිලි සමරු පොතේ ලියවුණු අදහස්වලින් ද පෙනුනි.

තරුණ ගෑනු ළමයෙකු දුටු අවුරුදු දහසයේ තරුණයින් දෙදෙනෙක් සේ රහසින් බැලුම් ලමින් නෙතුම් සහ මෙත්සර බැලූ පින්තූර දෙස නැවත බලමින් හිමායා සමඟ දොඩමළුවන්නට වෙලාවක් සොයන්නට වුණි.

"මෙත්තො...... මට මොකක් හරි මතකයක් තියනවා බං... මට හරියට ම මතක නෑ කොහේ දි ද කියලා. ඒත් බං හුරු පුරුදු බවක් දැනෙනවා."

"ගිය ආත්මෙද දන්නෑ... නැත්නං හොස්පිට්ල් එකේදි බෙහෙත් ගන්ඩ ආවද දන්නෑ.."

"කොහොමද කියන්ඩ දන්නෑ බං" නෙතුම් මතකය අවදිකරන්නට උත්සාහ ගත්තේ ය. එහෙත් නෙතට අසු වූයේ කොහේදීද යන්න සිත නිවැරදි තීන්දුවක් නොදුන්නේ ය.

"මේ.... කොහොම ද අපි කතාව පටන් ගන්නෙ..."

"පරිස්සමෙන් අර සාරියක් ඇඳගෙන ඉන්නෙ තිසි බලධාරියා වෙන්න ඇති. ඔව්.... පිට කෙනෙක් වෙන්න බෑ.. එකම අච්චුවේ වයස වෙනස තමයි තියෙන්නෙ.. අනිවාර්යයෙන් ම මව් දෙවඟන වෙන්න ඕනෙ."

"අපි කෝකටත් වැදගත් විදිහට කතා කරමු."



Scanned by CamScanner

හිමායා වාඩිවී සිටින මේසය දෙසට නෙතුම් සහ මෙත්සර පැමිණෙනවිට හිමායාගෙ අම්මා පිළිගැනීමේ සිනාවක් දෙතොළට නංවාගෙන පැමිණියා ය.

"වැඩේ හරියන් නෑ.. බං වැදගත් විදිහට ගිහින් වැදගත් විදිහට කතා කරලා නම්බුව බේරගෙන යන්න තමයි වෙන්නෙ. නිසි බලධාරියා පනාව දාගෙන එන්නෙ උදැල්ල දාන්ඩ."

"ඒකත් එහෙම ද? කමක් නෑ... ආපු එකේ කතා කරල යමු."

හිමායගෙ මේසෙ ළඟට යමින් සිටිය නෙතුම්ටයි මෙත්සරටයි හිමායා ලෝභ නැතිව හිනාවුණා. ඇත ඉඳල ම හිනාවෙවී ආපු හිමායගෙ අම්මත් හිමායාට දකුණු පැත්තෙන් තිබුණු පුටුවෙන් වාඩි වුණා.

"ඔය දෙන්නද මේ ලස්සන චිත්‍ර අඳින්නෙ" නෙතුම්ට කලින් මෙත්සර කතාව ආරම්භ කළේ ය. නෙතුම් සිනාවෙන් කතාවට සම්මාදන් වූයේ ය.

"මම නං නෙවෙයි දුව තමයි අඳින්නෙ..."

"ආ... මේ ආන්ටිගෙ දුවද?"

"ඔව්..... මේ මගෙ දුව නෙත්සරණි...." නිමාලි හිමායගේ නමේ දෙවැනි කොටසින් ඇයව හඳුන්වා දුන්නා ය.

"ආ.. මෙයා ද හිම කුමාරි"

"අඳුන ගන්ඩ ලැබීම සතුටක්..." දෙදෙනාම පිළිවෙලින් හිමායට අත දිගුකළහ. නෙතුම් ගෞරවාන්විතව සැහැල්ලුවෙන් අත දුන් අතර මෙත්සර කාටත් හොරෙන් හිමායගෙ අත මිරිකුවා. ඒ බව නෙතුම්ට හෝ නිමාලිට නොදැනුණි.

"අපි ගොඩාක් කැමතියි කලාවට ඒත් ආන්ටි අපේ ජොබ් එකත් එක්ක වෙලාවක් නෑනෙ." මෙත්සර එසේ පැවසුවේ තමන් කවුද යන්න දැනුවත් කිරීමට අවැසි බැවිණි.





"පුතාලා කොහෙද වැඩ කරන්නෙ.." මෙත්සරට අවශ්‍යව තිබූ දෙය නිමාලිගේ මුවින් කියවුණා ය.

"අපි ජෙනරල් හොස්පිටල් එකේ...." මෙත්සර ඉක්මනින් පිළිතුරු දුන්න ද නෙතුම් කලබල නොවී කල්පනා කරන්නට වූයේ මෙවැනිම මුහුණක් කෙදිනක හෝ හමුවී ඇතිබවයි.

"ආ.... ඩොක්ටර්ස්ල ද?" මට නිකමට හිතුණා.

"ඔව් ආන්ටි."

මෙතුවක් වචන හුවමාරු වෙද්දිත් හිමායගෙ දෙතොලින් හිනාවකට වැඩි දෙයක් පිටනොවූවා ය. හිමායගෙන් අසන දෙයකට පවා උත්තර දුන්නෙ නිමාලි විසිනි.

දෙදෙනාට ම මීට වඩා කතාකිරීමට දෙයක් ද නොවී ය. ප්‍රදර්ශනය අවසාන වීමට නියමිත වේලාව ද ඉක්මගිය අතර සිතුවම් උදව්වට සිටින පිරිසත්, හිමායත්, නිමාලිත් නෙතුම් සහ මෙත්සර දෙදෙනාත් හැරෙන්නට වෙන කිසිවෙකුත් ප්‍රදර්ශන ශාලාව තුළ නොවුණි.

"අනේ සොරි... පුතාලගෙ නම් අහන්නත් බැරිවුණා... මම නිමාලි දොඩම්ලන්ද" නිමාලි සමාව අයදිමින් වෛද්‍යවරුන් දෙපලගෙ නම් අසා සිටියේ තමාගෙ නම මුලින්ම හඳුන්වා දෙමිනි.

"මම මෙත්සර.. මෙයා නෙතුම්...." දෙදෙනාම සුහදතාව පලකළේ නිමාලිට අතට අත දෙමිනි.

"අඳුන ගන්න ලැබීම සතුටක්, පස්සෙ හම්බෙමු පුතාලා.." නිමාලි හදවතින්ම පැවසුවා ය.

"එහෙනම් අපි ගිහින් එන්නං ආන්ටි.. ආයෙත් එක්ෂිබිෂන් එකක් තිබුණොත් අපි අනිවාර්යයෙන් ම එනවා."

"හරි... බොහොම ස්තුතියි.."

"මිස් නෙත්සරණි... මේ වගේ ලස්සනට චිත්‍ර අඳින්න ඔයාට ධෛර්යය ශක්තිය ලැබෙන්න කියලා අපි සුභ පතනවා. ගුඩ් ලක්..." දෙවැනි වතාවටත් මෙත්සරට හිමායාගෙ අත රිඳවන්නට අවස්ථාවක් ලැබුණි.



Scanned by CamScanner

මෙත්සර සහ නෙතුම් හිමායට සුභ පතමින් පිටවූහ. අවසන් මොහොතේ ද හිමායා සිනාසී සුභ පැතුම් පිළිගත්ත ද කතා නොකළා ය. හිමායා කතා නොකිරීම නෙතුම්ට මෙන්ම මෙත්සරට පුදුමයක් වුණි.

"ඇ බං... ඇයි එයා වචනයක්වත් කතා කළේ නැත්තෙ"

"අපි දෙන්නා කුකුලො දෙන්නෙක් වගේ පෙනුන ද දන්නෑ.."

"මොකක් ද බං වගේ කියන්නෙ..... එහෙම ම පේන්ඩ ඇති."

"ඒකනෙ අපි ඔච්චර කතා කරලත් අම්ම විතරනෙ කතා කළේ."

"ඔව්.. අම්මා නොහිටින්ඩ අපිට නමවත් දැනගන්ඩ වෙන්නෙ නෑ.."

"අහංකාරකමට හිටියා කියන්ඩත් බෑ බං.. හිනාවෙන් ඒ වගක් පේන්නෙ නෑ..."

"සමහරවිට කතා කරන්නඩ හිතුනත් අම්මා හිටපු නිසා බය වුණා ද දන්නෑ."

"නෑ.. මේකයි වෙන්ඩ ඇත්තෙ අපි දෙන්නගෙන් කවුරු තෝරගන්න ද කියලා හිතාගන්නඩ බැරිවෙන්ඩ ඇති."

"විහිලු කරන්ඩ එපා මෙත්තො."

"නෑ.. බං මටත් හිතා ගන්ඩ බෑ මෙච්චර සුහදව කතා කරලත් ඇයි අපිත් එක්ක කතා කළේ නැත්තෙ කියලා."

"කමක් නෑ. ලද දෙයින් සතුටු වෙයන් කියනවනෙ... හොඳ හිතින් හිනාවුණානෙ ඒ මදෑ.."

"ඔන්න කෙල්ලො.. මචං ඉටි රූපෙ වගේ, බලපන්කො ලස්සන ලප නොවන් සඳ සේ...... ඇස්වහක් කටවහක් නෑ මචං දිව්‍ය අප්සරාවක් වගේ නේද?"

"ආයෙත් අහලා..... මටත් ඒ ටික ම හිතුනා."

"අද නින්ද යන එකක් නෑ බං."





"නෑ... විහිලු නෙවෙයි බං බලපංකො ලස්සන... කෙල්ලො මිනතරං දැකලා තියනවා ඒත් ඔහොම කෙල්ලෙක් මම දැකලම නෑ"

"හ්ම්... එඩ්‍රස් එක ඉල්ලගන්න බැරි වුණානෙ."

"එහෙම ඉල්ලුව නම්, අම්මා දැන ගන්නවා මේ හඳන්නෙ වටේ ගිහින් කිට්ටු වෙන්නෙ තැඹිලි පැලේට කියලා."

"යමු. දූන් එළියෙ ඉඳලා කොච්චර කතා කළත් එච්චරයි. වාසනාව තිබුණොත් අපි දෙන්නගෙන් කාටහරි හම්බෙයි"

"ඔව්.. එහෙම කියලවත් හිත හදාගමු" දෙදෙනාම සිදුවීම විහිළුවට ගත්තද විස්තර කළ නොහැකි තරම් සුමුදු හැඟීමක් හදවතට දැනුණි. නෙතුම්ගෙ හිතට වද දුන් එක් දෙයක් වූයේ හිමායා මීට කළින් දැක පුරුදු බවයි, ඒ මතකය සමග නෙතුම් නිතර ම කල්පනා කළේ හිමායා තමන්ට වැඩියෙන් අයිති බවකි. එහෙත් ඒ බව මෙත්සරට නොපැවසුවේ ය. සිත් සිතුවිලි පුරවාගෙන වෙහෙසෙන අතරේ පුන් සඳ ගස්මුදුන්වලට උඩින් පරෙස්සමින් අහසට ගොඩවෙමින් හිටියේ ය.

මෝටර් රථ දෙක පනගන්වාගත් මිතුරන් දෙදෙනා තම නිවෙස් බලා යන්නට වූයේ පිස්සු වැටුන හිත් පපුව තුළ කරනම් පිට කරනම් ගසද්දී ය.

ආදරය හමුවේ තරුණ වෛද්‍ය මිතුරන් දෙදෙනාට තත්ත්වය තරාතිරම ඊකියාව යන සියල්ලම අමතකව ගොසිනි. අනංගයා එක් මලක් නොව මල් කරත්තයක් ම හිස මත ගොඩ ගසා ඇති බවකි.

තම සිතුවම් නැරඹූ බොහෝදෙනාගෙ සුභ පැතුම් සහ අගේ කිරීම් නිසා හිමායට දැණුනෙ මේ ලොකයෙ පොහොසත් ම කෙනා තමන් බවයි. ඒවා මුදලින් මැනිය නොහැකි තරම් ය. දහසක් සුභ පැතුම් අතර අවසන් මොහොතේ සුභ පැතූ වෛද්‍යවරුන් දෙදෙනාගෙන් එක් අයෙකුවූ නෙතුම්ගේ රුව හිමායාගේ සිතේ මුල්ලකට රිංගා ගත්තේ නිරායාසයෙනි.

හිමායගෙ ලස්සන දෑසින් සොරකම් කරගෙන හදවතේ සඟවගෙන නික්මගිය නෙතුම් සහ මෙත්සර, හිමායගේ කුළුදුල්



Scanned by CamScanner

"පැහැසර" සිතුවම් දැක්මේ අවසන් රසිකයන් දෙදෙනා මෙන්ම අලුත් හිතවතුන්ද වූණි.

දින දෙකක් පුරා බොහෝ සිනා මැද සතුටින් ගතකළ හිමායා උදාවන හෙට දිනයේ සිට නැවතත් ජනෙල් කවුළුව ළඟටවී දවස ගෙවන්නට සිදුවන්නේ ය.

පෙරදින මෙන් ඈතින් පෙනෙන වැව් දියට, ජනේලෙන් ගෙට වදින මදනළට, නිල් අහස පුරා කැටයම් මවන වලාකුළුවලට, රාග තාල නැතුවත් ලස්සන සින්දු කියන කුරුල්ලන්ට, ජනේලෙ ළඟ දැල් වියන වයසක මකුළුවන්ට, ඉර යනතුරු හඳ එනතුරු මලින් මලට ඇවිද ඇවිද වැඩකරන මී මැස්සියන්ට හිමායගෙ හිතේ තනිය මකන්නට හැකිවන්නේ දැයි සැකසහිත ය.

හිමායගෙ හදවතට මැතක සිට දැනෙන සොඳුරු සිතුවිලි නොයෙක් වෙස්ගෙන ඇස් මායිමේත් හදවත පතුලේත් සැරිසරන්නට වූහ. මෙතෙක් දුටු කළුසුදු ලෝකයට වඩා වර්ණවත් ලෝකයක් හදවත හමුවේ දිගහැරෙමින් පැවතියේ ය. එය වසන්ත කාලයේ දළුලමින් මලින් හැඩවෙන තුරු ලතාවන් මෙනි.



# 13

ඈත කඳු මුදුන් පිසගෙන තුරු වදුලු තෙමාගෙන වනමල් සුවඳ අරන් එන මදනළ වැව් ඉවුරටත් නැවත දියඹටත් ඔට්ටු දුවන දිය රැළි සිඹගෙන ගස්වැල් අතරින් ඇවිද යන්නට විය. වැව් ඉවුරේ සීත සුළං සුව විඳින ගඳපාන පඳුරුවලට උඩින් ඉඟිලෙමින් පාට පාට සමනල්ලු මල්වලට රහස් කොඳුරන්නට වූහ.

ඉර ගෙනා අලුත් දිනයෙ හැඩ රුව දකින්න හිමායා ජනේලයද ඇහැරෙව්වා ය. ක්රී... ක්රීස්... නිදිසුව අතහැරීමට අකමැති වුවද හිමායගෙ සිතට සතුට දීමට ජනේලය කම්මැලි නොසිතා ඇහැරුණි. ජනේලය ළඟටවී බොහෝවේලාවක් කල්මැරූ සීතල හුළං නැඹුල් මල් සුවඳ දෝතින් ගෙන හිමායාට තෑගි කොට පිටව ගියේ ය.

"දෝණී...... ගුඩ් මෝර්නින්...." නිමාලි උදේ පාන්දර කිරි වීදුරුවත් රැගෙන හිමායාගෙ කාමරයට පැමිණියා ය.

හිමායා ජනේලෙ ළඟින් අම්මා දෙසට දෑස් හරවා සිනාසුණා ය. වචනෙන් පිළිතුරු නොලැබුණ ද සිනාවෙන් ලියවුණු විස්තරයෙන් නිමාලිට ප්‍රමාණවත් ය.

"දෝණී ඔයාට ප්‍රදර්ශනේ ගැන ගොඩාක් සතුටුයි නේද?"



Scanned by CamScanner

හිමායගෙ මුහුණ සතුටින් පිපුණා ය. අම්මාගේ ප්‍රශ්නවලට වචනයෙන් පිළිතුරු නොදුන්න ද ඇගේ සුපුරුදු ඉරියව්වලින් එකක් හෝ අතනොහැර පිළිතුරු දුන්නා ය.

ආදරය හදපතුලේ රඳවා කාමරයෙන් පිටවගිය අම්මා අඩහෝරාවකින් ගේට්ටුවෙන් ද නික්ම ගියේ දින දෙකක නිවාඩුවෙන් පසු තම රාජකාරිය ආරම්භ කිරීමට ය.

හිමායා සුපුරුදු ලෙස ජනේලය අසල වාඩිවී තාප්පය අයිනෙන් දුවන පාර දෙස බලා සිටින්නට වූයේ පෙරදින දකින ඇසෙන හඬ රුව අදත් නෙත්මායිමට කොයි මොහොතක හෝ පැමිණෙන්නේ යැයි සිතමිනි.

"සුදු බේබි..... දූන්ම කෑම ගේන්න ද?" එවිට ලද පිළිතුර සුදු ආච්චිඅම්මාට ප්‍රමාණවත් වුණි.

ඉදිකටුවට ඇමිණූ නූල සේ සුදු ආච්චිඅම්මා පසු පස්සේ නිතරම දුව ඇවිදින සුදු බිංදු කාමරේට වින් හිමායා වාඩිවී සිටින පුටුවෙ කකුල් හතරේ ඇතිලෙන්නට වූයේ ඇගේ දෙපාවල ඇතිලීමට නොහැකි දුකට මෙනි.

සුදු ආච්චිඅම්මා කාමරයෙන් පිටව ගිය පසු හිමායාගේ දෑස් නැවතත් ජනේලයෙන් එළියට ඇදුණි. සිතේ ගබඩා කළ මතක පිටු එකිනෙකින් පෙරළෙන්නට විය. ප්‍රදර්ශනයේ දෙවැනි දින අවසානයට පිටවගිය දෙන්නාගෙන් අයෙකුවූ නෙතුම් සිත් ගත් චරිතයයි. කොණ්ඩය සහ රැවුල කොට වන්නටම කපා තිබූ නෙතුම් පිළිබඳ හිමායටද යම් මතකයක් ඇතිබව දැනෙන්නට විය. හිමායගෙ දෙතොලට සිනා මතුවූයේ දෙදෙනා හොර ගල් අහුලමින් වෙහෙසවූ අයුරු සිහිවීමෙනි. හුදකලාව ජනේලය ළඟටවී සිතුවිලි මැනබලමින් සිටින හිමායාගෙ හිතට පෙර දිනක සතුට ගෙනා සුපුරුදු කොළ පැහැති මෝටර් රථය තාප්පය අයිනටවී හිටගත්තේ සියලු සිතුවිලි අමතක කරවමිනි.

වාහනයට මග කියාදුන් දෑත් සුක්කානමෙන් ඉවත් වුණි. ඒ සමගම රියදුරු අසුන ළඟ දොර විවර වන විට හිමායගෙ මුහුණෙ එක් මලක් දෙකක් නොව මල් සියයක් පිපුණ තරම් හැඩවුණි.





පෙරදින දුටු කැරලි කොණ්ඩය, දෙතොල් වටින් තිකට යටින් රැවුල තිබූ මුහුණ සිහින් මවාගත් හිමායා ඇහිපිය නොගසා ජනෙල් කවුළුවට ලංවූවා ය.

එක්වරම හිමායගෙ නළලත රැළි නැගුණි. වෙනදා දුටු කොණ්ඩය සහ රැවුල දක්නට නොවුනි. එහෙත් මේ ඔහුම ය. පෙරදිනක හැඳසිටි රෝස පැහැති කමිසය සහ කොළපාට මෝටර් රථය නොවෙනස් ය. ජනේලය පෙනෙන දුරින් නැවතීමත් සුපුරුදු දේහයත් දුටු හිමායාට මේ වෙනකෙකු නොවන බවට සැක නැත.

හිමායට අදහාගැනීමට නොහැකි පුදුමය වූයේ පෙර ස්වරූපය වෙනස්වීම නොව ප්‍රදර්ශන භූමියේදී අවසන් මොහොතේ හඳුනාගත් වෛද්‍යවරුන්ගෙන් අයෙකුගේ හැඩරුව මීට බොහෝ සමාන වීමයි.

"ඒත්......... පුදුම යි............. මට හීනයක් වගේ.... ඒ දෙන්නා කිව්වෙ නම් ඩොක්ටර්ස්ලා කියලා. ඒ මෙයා ද දන්නෑ... මේ... එදා ආපු කෙනෙක් නම්........."

හිමායගෙ පපුවේ වේගය වැඩිවූවා ය. ඒ සමගම හදවත තුළින් පටන් ගත් හැඟීම සියුම් විදුලි සැරක් මෙන් කොදු ඇට පෙළ සහ හිසේ කේශමූලයන් දක්වා දිවයන්නට වූයේ රෝම කූපයන් අවදි කරමිනි.

කලබලවූ හිමායාගේ පුදුම සහගත ඉරියව් නෙතුම්ට ඒආකාරයෙන්ම දැක ගැනීමට නොහැකි වූයේ තාප්ප ළඟ සිට සඳළුතලයට ඇති දුර නිසාවෙනි.

මෝටර් රථයට හේත්තුවී සිනාසෙමින් බලා සිටියේ කොණ්ඩය සහ රැවුල වෙනස් බැවින් ඇය වෙනකෙනෙකුයැයි රැවටෙන්නට ඇතැයි සිතූ නිසා වන්නට ඇත. හිමායා නෙතුම් හඳුනා ගත්ත ද නෙතුම්ට හිමායා හඳුනාගැනීමට නොහැකිවුණි.

නෙතුම් ජනෙල් කවුළුවෙන් දැක ඇත්තේ හිමායගෙ මුහුණ පමණි. කඩා හැලෙන කොණ්ඩය නිසා මුහුණෙ වැඩි ප්‍රමාණයක් වැසී ගොසිනි. හිමායා ප්‍රදර්ශන දිනයේ දකින විට අලංකාර කොණ්ඩ මෝස්තරයකින් සැරසී සාරියක් හැඳ සිටියා ය. එබැවින් ජනේලයෙන් දකින රුව සහ



Scanned by CamScanner

පෙරදාක දුටු රුව හාත්පසින්ම වෙනස්වුණි. එමෙන්ම මනබඳින සිතුවම් අඳින හිමකුමාරි හෙවත් නෙත්සරණි මේ යැයි නෙතුම්ගේ සිතට කිසිවිටෙක නොසිතෙනු ඇත. පෙර කිසි දිනකට වඩා ඇය තමන් දෙස බලාසිටින බව දැනුන නෙතුම්ගේ හදවත සතුටින් පිපී ගියේ ය.

හිමායා ඇසිපිය නොහෙලා බලා සිටියේ තවමත් අදහා ගැනීමට නොහැකි පුදුමයෙනි. ඒ පුදුමය නෙතුම්ගේ සවණට ඇසෙන සේ වචනයෙන් කියන්නට ඇත්නම් යැයි හිමායාගේ හදවතට දහස්වතාවක් සිතෙන්නට ඇත.

"සුදු බේබි..... සුදු බේබි........" සුදු ආච්චිඅම්මාගේ කටහඬ ඈතින් ඇසෙන්නට වුණි. හිමායට අකමැත්තෙන් වුවද දෑස් ඉවතට ගන්නට විය. කට හඬ සහ දෙපා ගැටෙන හඬ ළඟ ළඟම ඇසෙන්නේ ය. සුදු ආච්චිඅම්මා ජනේලය අසලට පැමිණියහොත් පාරේ සිටින නෙතුම් දකිනු ඇතැයි බියපත්වූ හිමායා සැණෙකින් ජනෙල් පියන් පත් වසාදැමුවා ය.

ඒ සමගම ඉදිකට්ටුවයි නූලයි බඳු සුදු ආච්චිඅම්මා සහ සුදු බිංදු කාමරය තුළට පැමිණියහ.

"ආ... ඇයි මේ ජනේලෙ වහලා. අඳුරුයිනෙ.."

පලතුරු වර්ග අසුරන ලද වේවැල් වට්ටියක් රැගෙන පැමිණි සුදු ආච්චිඅම්මා එය හිමායා අතට දෙමින් පැවසුවා ය. ඇය ජනේලය විවර කිරීමෙන් වැළැක්වීමට හිමායා පුටුව ජනේලයට ළංකරගත්තා ය.

"ඇයි සුදු බේබි ම්..."

සුදු ආච්චිඅම්මා ජනේලය විවර කිරීමට ළංවනවිට හිමායා ජනේලය නොඅරින ලෙස අතින් ඉඟි කළා ය. හේතුව කුමක් වුවද හිමායාගෙ ඉල්ලීමට එකඟවූ සුදු ආච්චිඅම්මා ජනේලය ඇරීමේ සිතුවිල්ල අතහැරියා ය. සුදු බිංදුගෙ කාමරයට පැමිණි මොහොතේ සිට පුටු කකුල් සහ මේස කකුල්වල දවටෙමින් ඤාව් ඤාව්... කියමින් දිගු වලිගය කොඩියක් කොටගෙන අංශක අනූවට සරිලන සේ ඔසවාගෙන ඇවිදින්නට විය.





"දෝණි පොඩි පිහියකුත් තියනවා.... කපාගෙන කන්න.... මම උයන අතරේ ආවෙ...."

හිමායා සුදු ආච්චිඅම්මා කාමරෙන් යෑම පිළිබඳ සතුටු වූයේ ජනෙල් පියන්පත් විවර කොට නැවතත් නෙතුම් දැකගැනීමට හැකිවන නිසාවෙනි.

"කිරි.. කිරි.. කිරිස්.." ජනේලෙ සෙමෙන් සෙමෙන් දෙපසට වුණි.

ඇරුණු පියන්පත් අතරින් හිමායා කලබලයෙන් පාර දෙස බැලුවා ය. එහෙත් තාප්පය සුපුරුදු ලෙස සිටගෙන සිටි අතර පාර බිම බදාගෙන ගොළුවෙකු මෙන් සිටියේ ය. හිමායගෙ පපුව මැදින් රිදුම් දෙන්නට විය. ඇස්වලට කඳුළු නැගුණේ ය.

"මම එයාට අකමැත්තෙන් ජනේලෙ වැහුවා කියලා හිතුවද දන්නෑ... දැන් මොකද කරන්නෙ..... සුදු ආච්චිඅම්මා එයාව දකී කියලා එහෙම කළේ කියලා මම කොහොමද කියන්නෙ.. ආය කවදාවත් එන එකක් නැති වෙයිද දන්නෑ... සුදු ආච්චිඅම්මා කාමරේට ආවෙ නැත්නං මම තවත් පාරදිහා බලාගෙන ඉන්නවා." කල්පනා කරමින් ජනේලයෙන් පාර දෙස බලා සිටියේ තමා සන්තක සියලු දේ සොරු අරන් ගියාක් මෙනි.

නිල් අහසෙ වලාකුළු තැන් තැන්වල විසිරී තිබුණු අයුරු පෙනෙන්නේ, නොදන්නා අයෙකු හෝ කම්මැලියෙකු විසින් අමදින ලද මිදුලක් මෙනි. වෙනදා සුහද කතාවෙන් අහසෙ පියඹන කුරුල්ලන් අද ගොළුවන් මෙන් ඉගිල යන්නේ ය. ලොවි ගසේ කොළ සහ අනෙත් ගස්වල කොළ නටවමින් කෝළං කරමින් තැනින් තැන ඇවිද යන සුළඟ ද අද දක්නට නොමැත. හිමායා දකින්නේ පරිසරයේ සියලු සුපුරුදු ක්‍රියා අක්‍රියවී ඇති බවකි.

හදිසියේ වැසුණු ජනෙල්පත් දෙස බලාසිටි නෙතුම් පිටව ගියේ ය. තමාගෙ සිතට මෙන්ම නෙතුම්ගෙ සිතටද වේදනාවක් දැනී ඇති බව හිමායා නොසිතුවා ය. ගණන් ගැනීමට තරම් නොවන පුංචි සිදුවීමක් වුවද ආදරයෙන් ආතුර වූ නෙතුම් රෝහලට පැමිණි මොහොතේ සිට කල්පනා කරන්නට වූයේ කෙන්ද කන්දක් ලෙස සලකමිනි.



Scanned by CamScanner

"ගුඩ් මෝර්නිං නෙතුම්...." නෙත්මි පෙර සිදුවූ සියල්ල අමතක කරමින් සුපුරුදු කෝළ හඬින් පැවසුවා ය.

"මෝර්නිං මෝර්නිං ..." හිතේ කරදර පිරුණු මොහොතේ නෙත්මිගේ කෝළ වචන කෙරෙහි ලද අප්‍රසාදය ඇඟවූයේ ය.

"නෙතුම්..... නෙතුම්.... සමාවෙන්න මෙහෙ ම අහනවට.. මම මේ අහන්නෙ අවුරුදු ගාණකට කලින් හිටපු යාළුවො විදිහට... ඇයි ඔයා කල්පනා කරන්නෙ නැත්තෙ." නෙත්මි සියල්ල අමතක කරමින් මායම් හැට හතරෙන් වැඩක් ගැනීමට උත්සාහ කළා ය.

"විකාර කියවන්න එපා නෙත්මි.. මගෙ ඔළුව අවුල් වෙලා තියන වෙලාවෙ.."

"ඔළුව අවුල් වෙලා.. ඒ මොකද? ප්‍රශ්නයක් ද?"

"නෑ... මට ටිකක් සනීප මදි වගේ.."

කෙටි පිළිතුරකින් මඟහැර යාමට කල්පනා කළ නෙතුම්ට තමා එරමිණිය අත්තක පැටළුනා මෙන් දැනුණි.

"ලැජ්ජ වෙන්න එපා නෙතුම්.... එදා මට බැන්නට ඔයා පස්සෙ පසු තැවෙයි කියලා මම හිතුවා. මම දන්නවා ඔයාට කාට නපුරු වුණත් මට නපුරුවෙන්න බෑ කියලා.. මම ඔයත් එක්ක තරහා නෑ නෙතුම්........ ඔයා කල්පනා කරන්න එපා...... මම ඔයාව තේරුම් අරන් ඉන්නෙ.. ආය මමත් කවදාවත් ඔයාගෙ හිත රිදවන්නෑ.. මටත් තේරුණා මම ඔයාට වදයක් වුණා වැඩියි කියලා. සොරි නෙතුම්....."

තමා කී කිසිවකට කෙටි පිළිතුරක් හෝ අප්‍රසාදයක් හෝ නොලැබුණ නිසාවෙන් නෙත්මි ජනේලය ළඟින් දැස් ගෙන පිටුපස හැරී බැලුවා ය. එහෙත් විවේක කාමරයේ නෙතුම් තබා වෙනකෙකුවත් දක්නට නොලැබුණි. මෙතෙක් වෙලාවක් තමා තනිවම කතා කර ඇති බව දැනගත් නෙත්මි කේන්තියෙන් දුවෙන්නට වූවා ය.

නියමිත වාට්ටුවට යාමට කොරිඩෝවේ ඇවිද යන නෙතුම් ඉදිරියට පැමිණියේ මෙත්සර ය.





"මොකෝ බං... අන්න අරකි අඩි දෙකක් විතර මූණ එල්ලගෙන ඉන්නවා."

"කෝකි ද?" මීට මොහොතකට පෙර අඬැඩියාව පටන් ගත් නෙත්මිට හොරෙන් තමා පැමිණිබව පවා නෙතුම්ට අමතකව තිබුණි. නෙතුම්ගේ හිත පුරාවට ම ඇත්තේ හිමායා පිළිබඳ කල්පනාව ය.

"ඇයි බං සත්‍ය ප්‍රේමයේ දේවතාවිය.. නෙත්මි.."

"ආ..... මොනවද දොඩවන්ඩ පටන් ගත්තා. ඒකි අහක බලාගෙන ඉන්න අතරේ මම හෙමින් මාරු, මම එද්දිත් නලවලා පද්දලා මායම් දාලා තනියම කතාව"

"නෑ........." මෙත්සර පුදුමයෙන් ඇසුවේ නෙතුම් එවැනි වැඩක් කිරීම පුදුම බැවිනි.

"පටන් ගත්ත විදිහට පැය භාගයක්වත් කියවන්න ඇති."

"අද නං සවුත්තුවක් දාන්න ම ඕන...."

"එපා බං මෝඩකමනෙ.... ඕකිට කවදා හරි ඇතිවෙයිනෙ... මොකුත් කියන්න එපා.."

"මම නං කෙල්ලෙක් පස්සෙන්වත් ඔය වගේ යන්නෑ.. දැක්ක ද ඊයෙ සිඬරෙල්ලා කොච්චර ලස්සන ද ඒත් දවසයි දෙකයි මම අද වෙද්දි අමතක කළා... මගේ තියරිය නං මේකයි මචං.... මිදි කන්ඩ එක පාරක් දෙපාරක් උඩ පනිනවා. ඒත් බැරිනං පාත තියන ජම්බුගහකින් ගෙඩියක් කාලා හිත හදාගන්නවා. නැත්නං උඩ පැනලා පස්ස බිම ඇනගන්නවා මිසක් කඩන්න බැරි මිදි තිත්තම තමයි...."

"උඹෙ කටක් නෙවෙයි වක්කඩක් තියෙන්නෙ... උඹ හිතන්නෙ උඹ හරි කියලද?" කට කියවන මෙත්සරගෙන් නෙතුම් ඇහුවෙ චෝදනාත්මක ස්වරයෙන්,

"ඒකනං බං මාත් හරියට ම දන්නෑ... ඕකි මම පස්සෙන්වත් එන්නැනෙ.. මම නං නිකං අරින් නෑ...එදා තමයි කොල්ලන්ගෙ කරේ බලෙන් එල්ලෙන්ඩ යන එකේ තරම තේරෙන්නෙ.."



Scanned by CamScanner

"මේ ඔය උඹ හිතපු දේ නෙත්මිට නෙවෙයි උඹේ හතුරෙකුටවත් කරන්න එපා. අපි අකමැති එක වෙන වැඩක් කැත වැඩ කරන්ඩ හිතන්ඩවත් එපා. ලබන ආත්මෙත් තියනවනෙ, ඊටත් වැඩිය අපිටත් කවදා හරි දුවෙක් හිටියොත් සමාජෙ ඔහොම වුණොත් කොහොමට වෙයිද? ඒ හින්දා ඒ වගේ දේවල් හිතන්ඩවත් එපා මෙත්තො...." නෙතුම් නෙත්මිට අකමැති වුවද මෙත්සරගෙ සිතුවිලි මුලුමනින්ම බැහැර කළේ ය.

"එක අතකින් උඹ කියන කතාව ඇත්ත බං.. මම ජීවිතේ හරිම සැහැල්ලුවෙන් හිතන කෙනෙක්... මම මගේ ජීවිතේ වෙනස් කරගන්න ඕනෙ... තවුසන්ඩ් තැන්ක්ස් මචන්.... තැන්ක්ස්..... උඹලා වගේ යාළුවො මේ ලෝකෙ අඩුයි නෙවෙයි මචං නෑ......"

"ඔව් ඒක මමත් දන්නවා. අපිට ලෝකෙ හදන්ඩ බෑ.. ඒ වුණාට අපි හැදුනාම ඇති."

"මේ වගේ හොඳ සිතුවිලි තියන උඹට..... මම ප්‍රාර්ථනා කරනවා. උඹ හිතන පතන හැම දෙයක් ම සාර්ථක වෙන්න කියලා. ඕන දේකට මම උඹට ඉන්නවා.."

"ඕ.කේ.... මචං.... තැන්ක්ස්.."

"ඒක නෙවෙයි මචං අද උදේ ඉඳලා උඹේ මූඩ් එක අප්සට්... මොකද බං.. නෙත්මිගෙ කරදරේ හින්දද?"

"මම නෙත්මිගෙ කන්කෙඳිරි ගණන් ගන්නෙ නෑ.. වෙන එකක්"

"ඒකනෙ මට දැනුනා... කියපං කියපං... මට පිහිට වෙන්න පුළුවන්ද මම දන් හොඳ එකෙක්නෙ බය නැතිව කේස් එක බාරදෙන්ඩ පුළුවන්"

"විහිලු නෙවෙයි මචං සීරියස් කේස් එකක්."

එහෙත් හිමායා ගැන මෙත්සරට පැවසීමට නෙතුම් තුළ දෙගිඩියාවක් ඇත. සිතුවම් දැක්මේ හිම කුමාරි කෙරෙහි මෙත්සරගේ සිත් ගිය අයුරින් සඳළු තලයේ දකින සිහින කුමාරිය කෙරෙහිද මෙත්සරගේ සිත් යනු ඇතැයි නෙතුම්ගෙ යටි සිතේ ලොබකමක් ඇතිවුණි. හිමායා ද හිම කුමාරි වූ නෙත්සරණිට නොදෙවෙනි බව නෙතුම් ඇත සිට වුවද දැක තිබුණි.





"ඒ කියන්නෙ.. කෙල්ලෙක් බූරු තිබ්බ ද? එහෙම නැත්නං හිම කුමාරි තාමත් හිතේ හොල්මං කරනව ද?"

"ඔය දෙකෙන් එකක්වත් නෙවෙයි, ඒත්..... ඒ වගේම වැඩක්......"

"මම කිව්වෙ.... මම උඳුල්ල දායි කියලා බයද?"

"ඇත්තෙන්ම කිව්වොත් ඔව්...."

"නෑ... නෑ... මම එහෙම කරන්නෙ නෑ.... අර හිම කුමාරිට ට්‍රයි කරපු නිසා උඹ බයයි නේද?.... මම එහෙම වුණාට උඹට සෙට් වුණ එකකට අහිතක් කරන්නෙ නෑ... හිම කුමාරි ඒ වෙද්දි කාටවත් අයිති නෑනෙ.. හරි හරි දැන් කියපං....."

"එහෙමට ම දෙයක් නෙවෙයි.. කෙල්ලෙක් තමයි.."

"ලස්සනයි ද?"

"හ්ම්.... ලස්සනයි.... මාර ලස්සනයි...."

"අර එදා දැක්ක සින්ඩරෙල්ලා වගේ...."

"ඔව්... ඒ වගේම ලස්සනයි..."

"අන්න අන්න වැහි වලාකුළක් පාවෙනවා... දැන් විදුලි කොටලා ගොරවලා වහින්න ගනී...."

කොරිඩෝව දිගේ ඉදිරියට එමින් සිටි නෙත්මි දුටු නෙතුම් අප්‍රසාදයෙන් පැවසුවේ ය.

"මෙත්සර මම පොඩි කෑමක් ගෙනාවා.. අපේ අම්මි ටී ටයිම් එකට කන්න කියලා දුන්නෙ...." නෙත්මි ලැසි ගමනින් පැමිණ මෙත්සරට පාර්සලයක් දුන්නා ය.

"තැන්ක්ස්.. කෝ ඉතිං තවම ටී ටයිම් අහලකවත් නැනෙ..."

"නෑ... එතකොට මට අමතක වෙයි කියලා දැන්ම ගෙනාවෙ.."

"මෙත්තො මට වැඩක් තියනවා..."

නෙතුම් නෙත්මිගේ මායම් එළිබසින්නට මත්තෙන් මඟහැර ගියේ ය. ඒ බව දැනගත් මෙත්සර මවාගත් වචනවලින් නෙත්මි සමඟ කතාවට පිවිසුණේ හිත යට අප්‍රසාදයක් තබාගනිමිනි.



Scanned by CamScanner

# 14

දවල් දවස නිම වීමට තව ඇත්තේ හෝරා කීපයක් පමණි. හිරුගේ හදවතෙහි උණුසුම අඩුවන විට උණුසුම සොයා ඉර අවරගිර දොරටුවෙන් පලායන්නේ ය නිමා වන දිවා කාලයත් සමඟ හැන්දෑව අඳුර ගෙන පැමිණීමට නියමිත ය.

සුපුරුදු කාලයට ම ගෙවෙමින් පවතින කාලය හිමායාට අවුරුද්දක් තරම් දිගු ය. පැන්සල් පින්සල් කඩදාසි සිතුවම් ඇඳීමට කම්මැලිවී ඇති බවකි. සුදූ ආච්චිඅම්මා රැගෙන ආ දිවා ආහාරය කුසට ගියේ ආච්චිඅම්මාගේ තුන්වන ඉල්ලීමත් සමඟ ය.

දෙවැනි වතාවටත් නෙතුම් සහ මෙත්සර හමුවී හිමායා පිළිබඳ කතාබහ ආරම්භ කරන්නට වූයේ සුපුරුදු කොරිඩෝවෙ සිට ය. හිමකුමාරි හෙවත් නෙත්සරණි සහ සඳළ තලේ සිටින රුවැත්තිය දෙදෙනෙකු නොව එක් අයකුම බව මේ වන තුරුත් දෙදෙනාම නොදත්හ. එය සැබෑවටම අහඹු සිදුවීමකි.

''ඉස්සරවෙලා මමත් කට ඇරගෙන විස්තරේ අහන්ඩ ලැස්තිවුණා... කොහෙද වලාකුළක් පාත්වුණානෙ...''

''දූනුත් මෙලහකට එනවද දන්නෑ...''

''දූන්වත් කියපන්කො..... මම වැඩ ඉවර කරලා ඉක්මනට ආවෙත් ඒ ගැන අහන්න''





''මම උඹට කෙටියෙන් කියන්නං.. මේකයි වැඩේ....''

''ම්......''

මෙත්සර කන් ඇරගෙන අසා සිටින අතර දෑස් අයාගෙන බලාසිටින්නට වූයේ නෙතුම් මෙතරම් අගේ කරමින් පවසන්නට යන්නේ කවුරුන් ගැනද යන්න දැනගැනීමට ය.

''මචං දූන් මාසෙකට විතර කලිං මම උදේ වැඩට එද්දි බ්ලූවෝටර් ලිලී ගාර්ඩින්ස් එක හරියෙදි වාහනෙ එන්ජං එක නැවතුනා... මම සර්විස් සෙන්ටර් එකට කතා කරල මිනිහා එනකං ඉන්න කොට අහම්බෙන් දැක්කා ජනෙල් කවුළුවකට එහායින් ලස්සන කෙල්ලෙක් ඉන්නවා.''

''හරි.. හරි කියපං.. උඹ දන්නෙ නැතිවුණාට එන්ජිං එක දූනගෙන ඉඳල තියෙනවා ඒ හරියෙ ලස්සන කෙල්ලෙක් ඉන්නවා කියලා. වාහන ඔහොම්මයි බං ලස්සන කෙල්ලො දැක්කොත් හිටිනවා. නැත්තං වේගෙ හරි අඩුවෙනවා... හා.. ඉතිං... ඉතිං...''

''විහිළු කරන්ඩ එපා බං... සීරියස්... කියන්නෙ....''

''හරි.. මම හැඳුනට මගෙ නොසණ්ඩාල කට එක පාරට හදාගන්න බෑනෙ මචං.. සොරි සොරි... ඉතිං.''

''ඉතිං.... මම වාහනේ හදනකං බලාගෙන හිටියා..... මාර ලස්සනයි බං.. ඇතට දැක්කෙ, කියලා වැඩක් නෑ..... මචං අර හිම කුමාරි වගේ ම ලස්සනයි...''

''ඒකී ද දන්නෑ...''

''උඹ විහිළු කරනවා....

''නෑ.. සමහරවිට එහෙම වෙන්න බැරිද? ඇයි බං අර ෆිල්ම්වල එහෙම තියෙන්නෙ..''

''අහපංකො.... මම වාහනේ හදන තුරුම සැරෙන් සැරේ ඇහැ දැම්මා....''

''උඹ ටෝකක් දාන්න එපැයි..''



Scanned by CamScanner

"මොන ටෝක් ද බං උඩ තට්ටුවක හිටියෙ. ඒක ලොකු ගෙයක්"

"කතා කරන්න බැරිනං ලස්සන දැක්කෙ..."

"ලස්සනයි කියලා ජේනවා.. අනිත් එක කතා කරන්න ගිහින් ගෙදර අයට ඇහුණොත්..."

"හා ඒකත් එහෙමයි කියමුකෝ..... ඉතිං දැන් මොකද වෙලා තියෙන්නෙ..."

"මම හැමදා ම උදේට වාහනේ පාරෙන් අයින් කරලා. පොඩ්ඩක් බැහැලා. හිනාවෙලා බායි කියලා අතවනලා එනවා."

"එච්චර ද?"

"නැතුව මම වැඩට එන්නත් එපැයි.."

"මේ මාසෙට ම කළේ එච්චරයි ද?"

"නැතුව..... කෙල්ල ඉන්නෙ උඩ තට්ටුවෙ, සද්දන්ත ගේට්ටුවත් හැමදාම වැහිලා. කිසි සද්දයක් බද්දයක් නෑ..."

"ෆෝන් නම්බර් එකක්වත් දෙන්න විදිහක් නැද්ද? නම මොකක් ද?"

"නමක් දන්නෑ.. කොහොම ද බං කතා කරන්න විදිහක් නෑනෙ."

"අනේ උඹ වගේ එකෙක්... මෙහෙ නොකා නොබී කල්පනා කරනවා. මාසයක් ලව් කරලා අඩුම තරමෙ නමවත් දන්නෙ නෑ... උඹ වගේ එකෙක් ලොවේ නෙවෙයි බං ලොව් ගහේ දල්ලෙවත් නැතිව ඇති.

"එතන හැටියට එහෙම කරන්න චාන්ස් එකක් නෑ... අනිත් එක වෙන කොල්ලො වගේ මට බෑනෙ.. තත්ත්වෙ රැගන්නත් එපැයි.."

"අනේ පල... උඹ තාප්පෙ අයිනෙ කාර් එක නවත්තගෙන හිනාවෙවී ඉන්න එක තත්වෙට හොඳයි ද?... ලව්වලදි තත්වයක් තරාතිරමක් බලපාන්නෙ නෑ බං... ඉස්සර කාලෙ රජවරුත් ලව් කේස් වෙනුවෙන් කොච්චර කටු කාලා තියනවද?... රජෙකුට එහෙම පාච්චල් වෙන්න පුළුවන්නම් උඹල අපි මොනුන්ද බං...





"ඉතිං අහපංකො.... මාසයක් මම හිනාවුණාට කෙල්ල මට හිනාවෙන්න ගත්තෙ ළඟදි ඉඳලා.. පහුගිය දවස් දෙකේ ජනේලෙ වහලා තිබුණා. මම හිතුවා කොහෙ හරි යන්න ඇති කියලා. ඒත් බං අද මම එද්දි නිකමට වගේ බැලුවා ජනේලෙ ඇරලා තිබුණා. මමත් කාර් එකෙන් බැස්සා. කවදාවත් නැතුව අද හොඳට හිනා වෙලා බලාගෙන හිටියා.. මටත් පුදුමයි බං.. කවදාවත් එහෙම බලාගෙන ඉඳලා නෑ.. මම අතින් කිව්වා ෆෝන් නම්බර් එකක් පල්ලෙහාට දාන්න කියලා. ඒත් එක්ක ම දඩස් ගාලා ජනේලෙ වැහුවා. මගෙ කනට ගැහුව වගේ බං.... මම විනාඩි දහයක් විතර බලාගෙන හිටියා ජනේලෙ ඇරියෙ ම නෑ.. මට මාර දුකයි බං"

"ආ. ඒකද මේ... ගණන් ගන්ඩ එපා.. උඹ හිතනවා වැඩියිනෙ.... සමහර විට කවුරුහරි එන්න ඇති..."

"නෑ... වෙනදා ගොඩාක් වෙලා බලාගෙන ඉන්නවා. කවදාවත් කවුරුවත් ඒ ජනේලෙ ළඟ ඉන්නවා දැක්කෙ නෑ..."

"උඹට ෂුවර් ද කෙල්ලෙක් කියලා.."

"ඔව්.. බං"

"උඹ හොඳටම දැක්ක ද? මෙලහකට ආච්චි කෙනෙකුටවත් රැවටිලා ද දන්නෑ.."

"නෑ බං... උඹ මාව විහිලුවට ගන්නවා."

"නෑ.... මට හිතාගන්නත් බෑ... වචනයක්වත් කතා කරලත් නෑ.. මාර ලව් එකක්නෙ..."

"හැමදාම මූණ විතරයි ජේන්නෙ.."

"ඒකනෙ.... හිටගෙන ඉන්නවා කවදාවත් ම දැකල නැද්ද?"

"එහෙම මතකයක් නං නෑ.... මූණ නං මාර ලස්සනයි... හරියට අර හිම කුමාරිගෙ කොපියක් වගේ.."

"අනේ මන්දන්නෑ.. උඹ අරවා මේවා කිය කියා මොන බර කරත්තෙකට කරගහන්න හදනව ද දන්නෑ.. ඕක මම ප්ලේස් එක විසිට්කරලම උත්තරයක් දෙන්න ඕන වැඩක්..... මට හිතාගන්ඩ බෑ....."



Scanned by CamScanner

"මගෙ ඔළුවත් රිදෙනවා..."

"කොහොමද අතින් පයින් අල්ලලා එහෙම තිබුණ නං. තව මේ හිනාවෙලා විතරක් එහෙම වුණා නං මට හිතාගන්ඩවත් බෑ.."

"නෑ... බං මට ලේසියෙන් කෙල්ලෙකුට හිත යන්නෑ... ඒ වුණාට මේ කෙල්ල නම් හිතට නෙවෙයි හම අස්සටත් රිංගලා ඉවරයි. ෂී ඊස් අ ප්‍රිටී ගර්ල්.. අයි කාන්ට් අන්ඩස්ටෑන්ඩ්.... ඕ...... සර්ටන්ලි.... ෂී ඊස් අ රියල් සින්ඩරෙල්ලා... ඉන් මයි ලයිෆ්....." නෙතුම් මෙත්සරට පැවසුවේ සිනාසෙමිනි.

"මම හිතුවට වැඩිය ගැඹුරුයි..... මරියානා ආගාධෙට ම කිට්ටුකරලා වගේ..."

"මටත් තේරෙන්නෑ.... ඇයි මම මෙච්චර බොළඳ වුණේ කියලා. හරියට සිංහයා තණකොළ කෑවා වගේ කියලා මම දන්නවා බං..මට උදේ හිතුන අපේ අයියටවත් කියලා කෙල්ලගෙ ගෙදරින් ම අහල බලන්නවත් ඕනෙ කියලා.."

"හා.. හා... ඩෝන්ට් කලබල.. නා ගන්නෙ නැතුව පොඩ්ඩක් හිටපං...."

"නෑ බං.. මට මාර.... අප්සට්..."

"ලොකු ගෙයක් කිව්වා නේද සමහරවිට ඒ කෙල්ල උඹව බයිට් එකට ගත්ත ද දන්නෑ... අද කාලෙ කෙල්ලො ඉස්සර කෙල්ලො වගේ නෙවෙයි. උන්ට කොල්ලො කියන්නෙ ඇඳුම් මාරුකරනවා වගේ වැඩක්"

"මේ කෙල්ල ගැන එහෙම ම කියන්ඩත් බෑ"

"උඹ එහෙම කියන්නෙ කාලා බැලුව ද?..."

"එහෙම කෙල්ලො ඇති.. ඒත්... මේ කෙල්ල අහිංසක පාටයි.."

"මම කියන්ඩ ද? මට අද හවස නං එන්ඩ විදිහක් නෑ.. අද අනිවාර්යයෙන් ම හය වෙද්දි ගෙදර එන්න කියලා අම්මා කිව්වා. අද උඹ නිකමට විසිට් එකක් දාපං උඹ හෙට උදේ ගෙදරින් එන්න පිටත් වෙනකොට මිස් කෝල් එකක් දීපං... අපි උදේ රවුමක්දාලා බලමු."





"ඉට්ස් ඕකේ.. මචං.."

නෙත්මි මේ දෙදෙනාගෙ සතර කන් මන්ත්‍රණේට ඇන්ටනාවක් රිංගවාගැනීමට නොහැකිව නළියන්නට විය. කිහිප වරක් පැමිණිය ද අසාර්ථක වූවා පමණක් නොව මෙත්සරගෙන් ඇනුම්පද හදවතටම වැදුණි.

"පිරිමි දෙන්නෙක් කතා කර කර ඉන්නවා නං එක්කො ගෑනු කෙනෙක් ගැන නැත්නං බිස්නස් එකක් ගැන. ඒත්..... මේ දෙන්න මම දන්න තරමින් බිස්නස් කරන්නෙ නෑ..... අනිවාර්යයෙන් ම ගෑනු පරාණයක් ගැන ඒකෙ දෙකක් නෑ.. මෙත්සර කොහොමත් අනංගයා... දෙන්නගෙන් කාටද මේ කතාව අයිති. හැබැයි වැඩියෙන් කතාකරන්නෙ නෙතුම්... මෙත්සර අහගෙන ඉන්න විදිහක් තමයි මට තේරුනෙ.. නෙතුම් මම ඔච්චර ආදරේ කරද්දිත් මට කොකා පෙන්වන්නෙ ඕක තමයි.... මම හොයා ගන්නං... අද හෙටම මම ඕක හොයා ගත්තෙ නැත්නං නෙත්මි නෙවෙයි."

නෙත්මි තරහෙන් පුපුරමින් කල්පනා කළා ය. මිනිස්සුන්ගෙ ජීවිත රැකගැනීමට සිටින දෙවිවරු යැයි වෛද්‍යවරුන් හැඳින්වුවද, නෙත්මි වෛද්‍යවරියගෙ හද යහනින් දෙවියන් සහ දේවතාවියන් මේ මොහොතේ බැස ගොසිනි.

මුහුණෙ නපුරු ඉරියව් දළුළමින් පවතින්නේ ගිනි දළු නැග එන්නාක් මෙනි. සුදුමත් නැති කළුමත් නැති මුහුණ අඳුරු පැහැයක් ගෙන තිබුණි. අබ ඇටයෙන් දහයෙන් පංගුවක් මුහුණට නොදමා ළඟින් තැබුව ද එසැනින් පිපිරීයන්නේ ය. ආදරය හමුවේ ගැහැනු මධු බඳුනක් මෙන්ම විස බඳුනක් යැයි පැරැන්නන් පවසා ඇත්තේ කට කැසිල්ලට නොවන වග නෙත්මිගේ ගිනිගන්නා මුහුණ දකින විට සිතෙන්නේ ය.

නෙතුම් සහ මෙත්සර නැවත තම තමන්ට හිමි රාජකාරි වෙත යන්නට හැරුණේ ය.

"ෂ්.. ෂ්.... මෙත්සර..... මෙත්සර...." කණුවකට මුවාවී හැංගිමුත්තං කෙළිමින් සිටි නෙත්මි මීට මොහොතක පෙර වැදුනු ඇනුම්පද පවා අමතක කරමින් මෙත්සර ඇමතුවා ය.



Scanned by CamScanner

නෙත්මිගෙ උවමනාව දැනගත් මෙත්සර සිංදුවක පේළියක් කියමින් කිසිවක දිග පළලක් නොදන්නෙකු ලෙස සිටියේ ය.

"ඇයි.. මැඩම්..... හදිස්සියක් ද? මොකෝ මේ කෝච්චියට අහු වෙච්ච රඹුටන් ලෙල්ලක් වගේ.. මොකා ද හලෝ මේ වයසේ අකුල් එකේ ඉන්න ඇපැයි අපි වගේ ආ....."

"අපෝ.... ඇති ඇති.. ඒක නෙවෙයි. මොකක් ද අනේ දෙන්නක් එක්ක මච්චර වෙලා සාකච්ඡා කළේ..."

"ආ... කෝ... ගනිං කොළේකුයි පෑනකුයි... මම ලියලා දෙන්නං උඹටත් අනුන්ගෙ පඩික්කංවලට අත දාන්නමයි ඕනෙ..."

"මොකක්ද බං අනුන්ගෙ කියන්නෙ.."

"ඇයි?.... අපි දෙන්නගෙන් කවුද උඹෙ.."

"මේ විහිළු කළා ඇති.... අනේ කියන්නකො මෙත්සර.."

"දැනගන්නම... ඕනද?"

"අනේ කියන්නකො...... ප්ලීස්.... ප්ලීස් මෙත්සර"

"ආ....... මේ නෙතුම්ලගෙ ගෙදරින් ප්‍රපෝසල් එකක් ගෙනත් ඒකට නෙතුම් කැමති නෑ කිව්වා..."

"මට බොරු කියන්න එපා මෙත්සර....."

"ඉතිං නෙතුම්ට මනමාලියක් හොයන එක ඔයාට අදාළ වෙන්නෙ කොහොම ද?"

"මිත්... කාට කාටත් බලාගන්න හැකි." කියමින් නෙත්මි මිග් ප්‍රහාරක යානයක් ගුවන් ගත කළා මෙන් පිටුපා ගියා ය.

"ලිස්සලා වැටෙයි පරිස්සමෙන්.." මෙත්සර පිටුපා යන නෙත්මිට විහිළු කළේ ය.

නෙත්මි එතැන් පටන් ඒක පුද්ගල රහස් ඔත්තු සේවාව සක්‍රිය කොට නෙතුම් පිළිබඳ තොරතුරු සොයන්නට වෙහෙසුණා ය. මේ





පිළිබඳ වැඩි තැකීමක් නොකළ නෙතුම් මෙත්සර පැවසූ පරිදි රාජකාරි නිමවී නිවසට යන අතරතුර හිමායා දැකගන්නට යෑමට තීරණය කළේ ය.

සවස කෙසේ වෙතත් හෙට උදෑසන මෙත්සර සමඟ දැන සිටියාට වඩා යමක් දැනගැනීමට හැකි වෙනු ඇතැයි සැනසිලි සිතුවිලි සිතෙහි පුරවාගත් නෙතුම් තම රාජකාරියේ දෛනික නිමාව සටහන් කිරීමට සූදානම් වූවා ය. නෙත්මිගේ සිතුවිලි සැලසුම් නොදත් නෙතුම් ජීවත් වූයේ සුන්දර තරුණිය පිළිබඳ සිතුවිල්ලෙනි. මේ අවසරෙන් උපරිම ප්‍රයෝජන ගත් නෙත්මි තම සැලසුම් සිදු කරමින් සිටියා ය.

අව්වෙ සායම කෙමෙන් කෙමෙන් සේදී යන හැන්දෑවේ විහඟුන් කැදලි සොයා යන්නට පටන් ගත්හ. ඔරලෝසුවෙ පැය විනාඩි තත්පර කටු නොනැවතීම දුවමින් රාජකාරි කාලය අවසන් කළේ ය. නෙත්මිගේ අත් ඔරලෝසුව ඔත්තු සේවාව ආරම්භ කිරීමට වෙලාව සටහන් කරමින් සිටියේ ය.

මේ පිළිබඳ කිසිවක් නොදත් හිමායා ජනේලෙ ළඟටවී පාර දෙස බලාසිටියා ය. උදේ පාන්දර ගෙඩි වර්ග, ඇට වර්ග, පලතුරු වර්ග මෙන්ම පණුවන් ඇහිඳීමට ද නිවෙස්වලින් බැහැරවී ගිය කුරුලු වැඩිහිටියො කළුවර අරගෙන නිල් අහසේ මනඃකල්පිත මාවත් ඔස්සේ ඉගිල යත්නෝ ය. දවස තිස්සේ වැව් දියෙ දිය බුං ගසමින් මාළුන් සමඟ දිය කෙළියේ යෙදී සිටි කළු දියකාවො ඒ මේ අතට පේළි පේළි සැදෙමින් ගොම්මං අහසෙ සරඹ කරන්නට පටන් ගත්තේ නිවෙස්වලට යෑමට කිසිදු කලබලයක් නොමැති ලෙසිනි. ජනේලයට නුදුරින් පෙනෙන ලොවි ගසේ මුදුනින් ගෑවී නොගෑවී ඉඟිල ගිය නියං කොට්ටෝරුවා යටිගිරියෙන් කෑ ගසාගෙන ගියේ හිමායාට යම් අසුභ පණිවිඩයක් දනුම් දෙන්නට මෙනි.

අව්ව, වැස්ස, අඳුර, එළිය පැමිණිය ද කිසිවක් නොතකා නොසෙල්වී සිටින උස් තාප්පය හිමායා පමණක් නොව තෙමහල් නිවෙස ද ආරක්ෂා කිරීමට පැය විසිහතරම සූදානමින් සිටියේ ය. තේජවන්ත තාප්පයට එපිටින් වැතිරුණු පාරේ එහා මෙහා යන



Scanned by CamScanner

නොයෙක් වාහන දෙස බලමින් ජනේලය ළඟටවී හිමායාගේ දෑස් රස්තියාදු වන්නේ කොළපැහැති මෝටර් රථය පැමිණෙන තුරු ය.

තව ප්‍රමාද වුවහොත් අම්මාගේ වාහනය ගේට්ටුවෙන් පැමිණෙන්නට නියමිත ය. එවිට අම්මා කාමරයට පැමිණෙන බැවින් හිමායාට තවදුරටත් ජනේලය ළඟට වී සිටීම කළ නොහැකි ය. එබැවින් හිත ඔරලෝසුව දෙසත් පාර දෙසත් බලමින් දුක්විඳින්නට විය.

සිතේ සිතුවිලි සුමුදුවට පිරිමදිමින් දෑතින් සුක්කානමට මග කියමින් නෙතුම් දෙනෝදහසක් දෙනා පසු කරමින් පැමිණෙන්නේ ය. තම සිත් ගත් සිහින කුමරියගේ පියකරු වත දැක ගැනීමේ නොතිත් ආසාවෙන් සිටින ඔහුට පරිසරයේ සියලු දෑ තමාට ආසිරි පතන බවක් දැනුනි. සුපුරුදු තාප්පය දකින විට වාහනයේ වේගය අඩු කළ අතර හිතේ වේගය පාලනය කරන්න බැරිතරම් ඉහල ගියේ ය.

සිතන්නට තරම් සැකයක් නොතිබූ බැවින් නෙතුම් එක් මොහොතක් හෝ ආපසු හැරී නොබැලුවේ ය. මෙතෙක් තම මෝටර් රථය පසුපස පැමිණි මෝටර් රථය ද නතර වූයේ ය.



# 15

උදේ සිට වැව් දියේ බැසගෙන පිපී වැනුණ නෙළුම් මල් පෙති නවාගත්තේ ය. ඒ නොකියාම පිටුපා ගිය හිරු කුමරු ගැන දුකෙන් මෙනි. කඳු මුදුනින් බැසගත් කළුවර කුමාරි ගස් මුදුන්වලින් බසිමින් වැව් දියට බැසීමට එමින් තිබුණි. එහෙත් කොළපැහැති මෝටර් රථය තවමත් නොපැමිණියේ මන්ද?.. අමනාප වීඇත්ද? හිමායා කල්පනා කළා ය. වැවේ ඉවුරෙ බිජු රකින කිරල ගෙදර කිරිලි අම්මා කෑ ගසමින් ඒ මේ අත ඇවිද්දා ය.

පාරෙන් අයිනටවී නතර වූ වාහනේ එන්ජිම නිහඬවන්නටත් පෙර නෙතුම් ගෙම්බෙක් සොයන කොකෙක් මෙන් බෙල්ල දිගුකර ජනේලය දෙස බැලුවේ ය.

''ඕ..... ජනේලෙ ඇරලා...... එයා ඇති....'' නෙතුම් සිතට දැනුන සතුට විඳගනු ලැබුවේ දෑස් පියාගෙන උණුසුම් සුසුමක් පිටකිරීමෙනි.

පසුපස නවතා ඇති වාහනයේ ඇති උකුසු ඇස් නෙතුම් දෙස එක එල්ලේ බලාසිටින්නට විය. වටපිට හා පසුපස ගැන වැඩි සැලකිල්ලක් නොවූ නෙතුම් සිනා පොකුරක් දෙතොලින් ගෙන බිමට බැස්සේ ය.

හිමායාගේ දෙතොළින්ද සිනා උතුරායන්නට තරම්විය. මුහුණ පිපුණ නෙළුමක් මෙන් සතුටින් පිරීගොසිනි. පෙර කිසිදිනක අතින්



Scanned by CamScanner

සංඥා කරනොමැති මුත් හිමායා පළමුවරට අතපැවා ය. නෙතුම් මෝටර් රථයේ රෝදයකට පාදයක් තබාගෙන බඳට හේත්තුවී උඩ බලාගෙන හිමායා සමග හස්ත සංඥාවෙන් කතා කරන්නට විය. මහ වැස්සකට පස්සෙ පායන සඳේ සුන්දරත්වය වැඩිවන්නේ යම් සේද උදැසන වැසුණු කවුළු පියන්පත නිසා රිඳුණු දෙසිතේම ආලෝකය වැඩිවී තිබුණි.

දෙසිතේ උපන් සතුට උදුරගන්නට වූයේ මෙතෙක් වෙලා තරමක් ඈතින් සිට කුරුමානම් අල්ලමින් සිටි නෙත්මි නමැති ගැහැණු වෛද්‍යවරයා විසිනි.

මෝටර් රථයකින් පැමිණි සාරියක් ඇඳගත් ගැහැණිය එක්වරම නෙතුම් අසලට පැමිණියා ය. සාරි පොට අතින් ගෙන ආවේගයෙන් ඇවිදගෙන පැමිණි ඈ, සිය අත නෙතුම්ගේ මුහුණේ ගෑවෙන්නට නොගෑවෙන්නට දිගු කරමින් බැණ වදින්නට පටන් ගත්තා ය. හිමායාගේ පපුව වෙව්ලන්නට පටන් ගත් අතර දෑතින් දෑස් වසාගත්තේ තව දුරටත් එය දකින්නට තරම් දෑසට ශක්තියක් නොමැති බැවිනි. දිය මත ඇඳි ඉරක් සැණෙකින් මැකී ගියේ යම් සේද හිමායා සහ නෙතුම් ඈතින් සිට ලද අපමන සතුට සැණෙකින් මැකී ගියේ ය.

හිමායාට නෙත්මිගේ අකුණ සැර පරයන වදන් නොඇසුන ද නෙතුම්ගේ දෙසවන් පසාරු කරමින් ඒ අමිහිරි හඬ ගලා ගියේ සියලු දේ උදුරාගෙන මුහුදට ගිය සුනාමි රළක් ලෙසිනි.

''නෙතුම්..... මම හිතුවා..... මම හිතුවා..... මොකක් හරි අඩච්චක් පටන් අරන් ඇති කියලා.. ආ.... එහෙනං මේකයි සෙල්ලම... මම ලේසියෙන් අරින්නෑ..'' නෙත්මි තම වෘත්තියේ ගෞරවය පවා අමතක කරමින් වට්ටි අම්මා කෙනෙකු මෙන් කෑගසා පිටව ගියා ය.

නොසිතූ මොහොතක අහස හිසමතට කඩා වැටුණා මෙන් නෙතුම්ට කිසිවක් සිතාගැනීමට නොහැකි වුණි. නෙත්මිට බැණවැදීමට වචනද මතකයට නොපැමිණියේ ය. කට මැද ඇති දිව තෙමෙන්නට කෙළ කඳුළක් කටේ නොවන තරමට සිඳීගියේ ය. මහ පොළොව තමාද රැගෙන වේගයෙන් භ්‍රමණය වන්නට විය. ලොවෙහි ඉතිරිවූ අවසන් මිනිසා මෙන් නෙතුම් අසරණව වටපිට බැලුවේ ය.





නෙතුම් පෙර කිසිදිනක නෙත්මිට ආදරයක් හෝ ඊට ගව්ගණනක් මෙපිටින් ඇති දෙයක් හෝ පවසා නොතිබුණි. නෙත්මි එවැන්නට පැමිණි හැම අවස්ථාවේදීම නෙතුම් හොඳින් මෙන්ම තරකින් ද ඇගෙන් හැකි පමණ ඈත්වී සිටියේ ය. නෙත්මි පිළිබඳව ඔහු තුළ අබමල් රේණුවකවත් කැමැත්තක් හෝ සම්බන්ධකමක් නොවූව ද නෙත්මිගෙ හැසිරීම හිමායාගෙ හිතට වැරදි වැටහීමක් දීමට ප්‍රමාණවත් ය.

හිමායා හිතාමතාම ජනෙල් පියන් වසා දැමුවා ය. නෙතුම් ගිනිගන්නා සිත නිවා දැමීමට මෙන්ම ගිනි ඇවුලුන හිමායාගේ සිතෙහි ගිනි දැල් නිවීමට මගක් නොමැති එතැනම සිට කල්පනා කළේ ය.

''ආ... නෙතුම් මහත්තයා තවමත් ඔතන ද?'' මීට මොහොතකට පෙර නොපෙනී ගිය නෙත්මි නැවතත් නෙතුම්ගේ ඇස් ඉදිරියට පැමිණියා ය.

''ආ.. උඹ ගිනිතියලා ගිහින් ආයෙත් ආවෙ ගිනි ඇවිලෙනවා බලන්ඩ ද?.... නෙත්මි........ මම උඹට හොඳින් කියන්නෙ.... පලයං මෙතනින් මගෙ දෑහැට නොපෙනී..... මම මොනා කළත් උඹට මොක ද? මට පව් නොදී පලයං යන්ඩ.. පලයං මෙතනින් ...... ''

''නෑ.. මම යන්නෑ...''

''මිනිමරු ගෑනියේ උඹට ඕන මාව මරාගෙන කන්න ද? කියපං..''

''නෑ... මට ඕන උඹව ටික ටික මරන්ඩ...... මට තමුසෙව බඳින්ඩ බැරිනං මම වෙන එකෙක්ව ගෑනි කරගන්ඩ දෙන්නෙ නෑ..'' නෙත්මි නෙතුම්ට ළං ව දත් විලිස්සාගෙන පැවසුවා ය.

''තෝ වගේ කාලකණ්ණි ගෑනියෙකුට මම ආදරේ කරලත් නෑ.... කරන්නෙත් නෑ... දැන ගනිං... උඹ ඔක්කොම විනාස කළා...''

''මට ඕන වුණෙත් ඒක කරන්න තමයි..''

''ආ... ඇත්තද.. එහෙනම් දැන් පලයං.....මම උඹට ආය වතාවක් කියන්නෑ.. පලයං... පලයං....''තෙවැනි වතාවට කියන්නට පෙර නෙත්මි මෝටර් රථයට නැගගත්තා ය.



Scanned by CamScanner

නහයට ඉහලින් දිය ගලා ගිය පසු තවත් රැකගන්නට ඇති දෙයක් නොවූ බැවින් නෙතුම් උගත්කම, රැකියාව සහ මනුස්සකම මොහොතකට පසෙකින් තබා උන් හිටි තැන් පවා නොතකමින් නෙත්මිට පිළිතුරු දුන්නේ ය.

"මොන කරුමයක් ද මේ..." නෙතුම් වාහනේ බොනට්ටුව උඩින් වැලමිට තබාගෙන වේදනාවෙන් තමාට ම කියාගත්තේ ය. කිසිවක් හරිහැටි නොදත් පාරේ යමින් එමින් සිටි කිහිප දෙනෙක් බලමින් යන්නට විය.

නෙතුම්ගෙ මුළු ඇඟ ම වෙව්ලන්නට විය. මුළු ඇඟට ම ගිනි ගෙන දැවෙන්නාක් මෙන් දැනෙන්නට විය. හිමායා මේ සියල්ලම බලා සිටින්නට ඇත. නැවත කිසිදිනක හිමායා තමා දෙස අහම්බෙන් හෝ නොබලනු ඇතැයි නෙතුම්ගෙ හදවත කීරිගැහෙන්නට විය. මේ වන විටත් බලාසිටීමට තරම් ශක්තිමත් හිතක් නොවූ හිමායා ජනෙල් පියන් වසා දමා තිබුණි.

අන්ත අසරණ වූ සිතත් ඇඟ ඇතුලේ සඟවාගෙන නෙතුම් වාහනේට ගොඩවූයේ ය.

"මේ කාලකණ්ණි ගෑනි මගේ ජීවිතේ ම කෑවා.... ඇයි මේ ගෑනි මට මෙහෙම කරන්නෙ මම මොන වරදක් කළාට ද? ඇයි තේරුං ගන්නැත්තෙ මම පස්සෙන් ඇවිත් වැඩක් නෑ කියලා. අනේ මගෙ ලස්සන කෙල්ල. මට ආය දකින්නවත් බැරිවෙයි. මම කොහොම ද එයාට මේක තේරුං කරලා දෙන්නෙ" නෙතුම්ගේ හදවත පෑරී ලේ ගලන්නට විය. ඔළුව පුපුරා දෙපලුවී ඇති තරම් වේදනා දෙන්නට විය.

නෙතුම් විඳවමින් යන අතර නෙත්මි ගෙදර යන්නට වූයේ හිතේ පිරුණු සීමාවක් නැති සතුටක් විඳිමිනි. දහවල් සිට සිතූ පැතූ අයුරින්ම සියලු සැලසුම් ක්‍රියාත්මක කරගැනීමට හැකිවීම නෙත්මිගේ හිතට සැනසීමක් ගෙනදුන්නේ ය.

"ම්... දැන් බලමු නෙතුම් දොස්තර මහත්තයෝ මොකද වෙන්නෙ කියලා. මට ආදරේ කරන්න බැරි ඔහේට වෙන කෙල්ලෙකුට ආදරේ





කරන්න දෙන්නෙත් නෑ.. ආය ඔය කෙල්ලට ලව් කරනවා බොරු. මම දන්නවා මට ඔයා ආදරේ කරන්නෙ නෑ කියලා. මේකෙන් පස්සෙ ඔහේ කොහොමත් මට වෛර කරනවා. ඒත් කමක් නෑ මම දිනුම්... දැන් හරිනෙ. ඔය පටන් ගත්තා විතරයි මම හැමදා ම පළිගන්නවා." නෙත්මි නපුරු සිතුවිලි පොකුරු පිටින් හිතේ පුරවගෙන වාහනය පදවන්නට වූවා ය.

ගොම්මන් හැන්දෑවේ තාප්පය අසලදී දුටු සිදුවීමෙන් පසුව, විවාහකයකු හෝ පෙම්වතියක් සිටින අයෙකු තමාව රවටන්නට හැදූ බව පමණක් හිමායා වටහා ගත්තා ය.

නෙත්මි සතුටු වන අතර හිමායාට ද නෙතුම්ට මෙන් දරාගත නොහැකි වේදනාවක් ශේෂ වුණි. හිරි වැටුණ හිස සහ වෙව්ලුන පපුව දරාගෙන කෙළින් සිටීමට නොහැකි වූ බැවින් ඇඳෙහි වැතිරුණා ය. තමාගේ සිතෙහි වූ සතුට තමා බලා සිටිය දී ම සොරු අරන් ගිය බව පමණක් හිමායාට මතක ය.

ජනෙල් කවුළුවෙන් අහස, පොළොව, කුරුල්ලන් දකිමින් සිටි හිමායගෙ සිතට අහම්බෙන් සිහින ගෙනා නෙතුම්ට ඒ සිහින පරිස්සම්කර දීමට නොහැකිවුණි. හිමායගෙ සිතුවිලි සුළිකුණාටුවක පැටලී ඈත අහසට ගසාගෙන ගියේ ය. දෑස් අගින් නොනවත්වා ගලන කඳුළු දිය කොට්ටය කරදරයක් සේ නොසිතා භාරගත්තේ ය. හදවත යළි පිළියම් කළ නොහැකි ලෙස ඉරිතලා ගියේ ය.

හිමායට මෙවැන්නක් මෙතරම් ගැඹුරින් දැනෙන්නට වූයේ ඇය අනිත් තරුණ ගැහැනු ළමයින්ට වඩා සුවිශේෂී කෙනෙකුවූ නිසාවෙනි. ඇය ලෝකය දකින්නේ ජනෙල් කවුළුව තුළිනි. එය නෙත්මි, නෙතුම් හෝ මෙත්සර නොදන්නා රහසකි. හිමායා යනු නෙතුම්ගේ පමණක් නොව ලෝකවාසි හැමදෙනාගේම ආදරය හිමිවිය යුතු කෙනෙකි.

"ටක්... ටක්... ටක්... සුදු බේබි...... සුදූ බේබි...." සුදූ ආච්චිඅම්මාගේ කටහඬ හිමායට යන්තමින් ඇසුණි. එහෙත් දොරගුළු හරින්නට තරම් සිහිකල්පනාවක් නොවුණි.



Scanned by CamScanner

"සුදු බේබි....... ඔයා නිදිද? ඇයි මේ දොර අගුල් දාලා." මින් පෙර කිසිදිනක දොර අගුල් නොවැටුණු දොර අගුලු වැටී ඇත්තේ මන්දැයි සුදු ආච්චිඅම්මා තුළ සැකයක් හටගැනුණි.

අඬවන්වූ දෑසින් කඳුළු ගලායන්නට හැර හිමායා බලාගත්වනම බලාගෙන සිටියා ය. දොර ජනෙල් අගුලු ලා ඇති කාමරයෙ හුදකලා වූ හිමායගේ සිහිකල්පනා පියෙන් පිය ඇය හැරදා යන්නට විය.

සුදු ආච්චිඅම්මා ඒ මේ අත දුවමින් දොරට ගසමින් හිමායාට කතා කරන්නට විය. සිදුවී ඇති කරදරයෙ දිග පළල නොදත් සුදු බිංදු අඟර දඟර කොමල ලතාවට ඇවිදින්නට විය. සුදු ආච්චිඅම්මගෙ කකුලෙ පැටලි දෙතුන් වතාවක් ගුටි නොකා බේරුණේ ය. සුදු ආච්චිඅම්මා පැය භාගයක් පමණ කකුල් රිදෙනතුරු දිව්වා ය. නිමාලිගෙ වාහනය ගේට්ටුව ඉදිරියට පැමිණ කැඟැසුවේ මෙ අතරදී ය. මීටර් සියයෙ ලෝක වර්තා පරදමින් සුදු ආච්චිඅම්මා එදෙසට දිව ගියා ය.

නිමාලි රාජකාරිය නිමාවී නිවසට පැමිණෙනවිට සියල්ල සිදුවී අවසන්ව තිබුණි. සුදු ආච්චිඅම්මා ගේට්ටුව වසා ගරාජය වෙත පිම්මේ දිවගියා ය.

"ලොකු බේබි ..... අනේ ලොකු බේබි..." සුදු ආච්චිඅම්මාට හදිස්සියට කතාකරගැනීමටද සිහිනොවුණි.

"ඇයි.... ආච්චිඅම්මෙ...... මොකද.... මොකද.. ඇයි?" සුදු ආච්චිඅම්මගෙ කවදාවත් නොදකින කලබලය දැකීමෙන් නිමාලි බියටපත් වූවා ය.

"සුදු බේබි.. සුදු බේබි... කාමරේ දොර අගුල් දාගෙන.... අර.... අර.... ජනේලෙත් වහලා..... මම දැන් පැය භාගයක් විතර කතා කරා.. දොරට තට්ටු කළා ඒත් දොර අරින්නෙ නෑ....."

සුදු ආච්චිඅම්මා හුස්මක් කටක් නොගෙන ඇහිපිල්ලමක් හෙලීමට තරම්වත් වෙලාවක් නොගෙන කියෙව්වා ය.

"ම්. ඒ මොකද?" නිමාලි පැවසුවේ එපමණකි. සාරියෙ රැළි අතින් අල්ලාගෙන සපත්තු දොර ළඟ හැරදමා පඩි පෙළ දිගේ





උඩුමහලට දිවගියා ය. හිමායට තම දරුවෙකුට මෙන් සැලකූ සුදු ආච්චිඅම්මා දෙවනුව ද බොරුවට දුවන සුදු බිංදු අන්තිමේට ද දුවන්නට විය.

"දෝණි........ දෝණි...... පුතේ........ සුදු පුතේ.... දෝණි....."

නිමාලි දොරට තට්ටුකරමින් හිමායට කතා කරන්නට විය. එහෙත් සුදු ආච්චි පැය භාගයක් තට්ටු කළාක් මෙන් නිමාලි කොතෙක් කතා කළ ද හිමායා කිසිඳු ප්‍රතිචාරයක් නොදැක්වූවා ය.

"සුදු ආච්චිඅම්මෙ..... අපි මොකද කරන්නෙ.... හවස තේ ගෙනත් දෙනකොට දෝණි මොකද කර කර හිටියෙ....."

"මම දැන් පැයකට විතර කළින් තේ දීලා ගියෙ මම ඊට පස්සෙ ආවේ කොප්පෙ ගෙනියන්ඩ... දවල් දවසෙම හොඳට හිනාවෙවී හිටියා.."

"එහෙනං..... දෝණිට නින්ද ගිහින් වෙන්ඩ බෑ.. එයාට කොච්චර නින්ද ගියත් දෙපාර කතා කරනකොට ඇහැරෙනවා. අනිත් එක එයා කවදාවත් දොර වහන්නෙ නෑ."

"අපි අගුල කඩමු. දැන් වෙන කරන්න දෙයක් නෑ."

"කමක් නෑ ලොකු බේබි....."

"ආච්චිඅම්මෙ පිහියක් ගේන්නකො.."

සුදු ආච්චිඅම්මා සමඟ එකතුවුණු නිමාලි දොර අගුල කඩා කාමරයට ඇතුළුවූයේ නොඉවසිල්ලෙනි.

"දෝ......ණි.......දෝණි......"

"සුදු බේබි...... අනේ.... සුදු බේබී......"



Scanned by CamScanner

# 16

**නැලවෙන** වැව් දියට, සෙලවෙන තුරුළියට, සිනාසෙන පාට පාට මල්වලට තවත් අලුත් දිනයක් රැගෙන ඉර පැමිණ තිබේ. නිල් අහස සුදු සාරියකින් සැරසීගෙන සිටින්නේ ය. වෙනදා උදෑසන සුභ පතන්නට කාමරට එන මල්සුවඳ හිමි සුළං රැලි හිමායා නොමැති බැවින් ඇය සොයන්නට ගෙය පුරා දිවගියේ ය.

පෙර දවසෙ සවස හිමායා ජනේලයෙන් දුටු වේදනාකාරී සිදුවීමෙන් කම්පනයට පත් හිමායා සිහිසුන්වුණි. අම්මා සහ සුදු ආච්චිඅම්මා වෙහෙසවී කළ හෙදකම් නිසා හිමායා දෑස් විවර කළා ය. එහෙත් වෙනදා ඉරියව්වලින් සහ අකුරුවලින් දෙන පිළිතුරු කිසිවක් දකගැනීමට නොවුණි.

සුදු ආච්චිඅම්මා හෝ නිමාලි නොදරුවෙකුට මෙන් රවටා බත් කවන්නේ ද ඉතා අසීරුවෙනි.

පෙර දිනයෙ තීරණය කළ අයුරින් මෙත්සර නෙතුම් ද සමඟ හිමායා දක ගන්නට පැමිණියේ ය.

''අතන උඩ තට්ටුවෙ බැල්කනි එක ළඟ ජනේලෙ ළඟ තමයි හිටියෙ.... උඹ කිව්වා වගේ ඊයෙ හවස එයා හොඳට හිනා වෙවී මට අතත් වැනුවා.. අර මෝහිනී කඩාපාත් වුණේ ඒ වෙලාවෙ.....''





''මගෙන් ඊයෙ දවල් ඔකී ඇහුවා ඔයා මට මොනවද කිව්වෙ කියලා..... මම ඔච්චර දෙයක් කරයි කියලා හිතුවෙ නෑ.. මෙකි පරමාණු බෝම්බයක්නෙ.... දුක් වෙන්න එපා නෙතුම් .... දවසක් දෙකක් යද්දි හරියයි..''

''මෙච්චර දෙයක් වෙලත් මම හිතන්නෙ නෑ මට ආය දකින්නවත් පුළුවන් වෙයි කියලා... මට තේරෙන්නෑ බං මොනා ද කරන්නෙ කියලා.''

''හරි.. හරි....... මම කරන්න පුළුවන් දෙයක් කරන්නං.... දැනුත් ටිකක් පරක්කුයි මම යන්නං..... උඹ අද ගෙදරට වෙලා රෙස්ට් කරපං මම හවස එන්නං ම්......''

''ඔකේ.... තැන්ක්ස් .... මට උඹ විතරයි ඉන්නෙ මෙත්තො.....''

''හරි..... මං එන්නං...''

මෙත්සර රෝහලට ගිය අතර නෙතුම් ආපසු ගෙදර ගියේ ය. මේ වන විට හිමායා වෛද්‍යවරයෙකුට පෙන්වීම සඳහා සුදු ආච්චිඅම්මා සහ නිමාලි ගේට්ටුවෙන් පිටවෙමින් සිටියහ. නෙතුම්ගෙ වාහනයේ රිය සක සලකුණු පමණක් තාප්පය අයිනේ විය.

දහසක් සිතුවිලි සිතේ කරනම් ගසද්දී නෙතුම් වාහනය පදවන්නට විය. බ්ලූවෝටර් ලිලී ප්ලේස් පසුකර ගොස් ප්‍රධාන පාරෙන් වමට හැරී ටික දුරක් ගොස් දකුණු පැත්තට වැතිර ගත් සූරිය මල් මාවතට රථය ඇතුළු කළ නෙතුම් වේගය මඳක් අඩු කළේ ය. තාප්පයේ දෙපස දැඩිව අල්ලාගත් ගේට්ටුව ඇස්පියා සිටියේ ය. වෙනදා එක්වරක් නළාව හඬවන නමුදු කෙටි වෙලාවක් තුළ දී තෙවරක් නළාව හැඬවී ය.

''කරා....ස් ක්‍රීස්......'' ගේට්ටුව පසෙකටවී නෙතුම්ගේ වාහනයට මිදුලට ඇතුළු වීමට ඉඩදුන්නේ ය.

''මොකද මනුස්සයො නිදාගෙන හිටියද?'' ගේට්ටුව අසල සිටගෙන සිටි හරමානිස් තක්බීර්ව් බලා සිටියේ එක් අතක් ගේට්ටුවට සහ අනෙක් අත ඉණට හේත්තු කරගෙන ය. ඔහුට නෙතුම්ගේ මෙම කතා විලාසය ආගන්තුක විය.

පසුගිය දිනක අවුරුදු හැත්තෑව හරමානිස් පසුකර ගියේ හිසකෙස් සියල්ල ම සුදු කරමින් සහ කටෙහි වූ අන්තිම දත් දෙක ද ගලවාගෙන ය. මීට වසර විසි තිස් ගණනට ඉහත දී කෙළින් තිබූ කොන්ද මෙන්ම අතපය ද ඇද කුදුවී ගොසිනි. පෘෂ්ඨීමත්ව තිබූ සම රැලි වැටී ඇඹරී තිබුණි. යටි පතුල් ඉරිගොස් කඩතොළුවී ගියේ නෙතුම්ලාගෙ වතුපිටිවල ගස්කොළන් අතරේම ය. නෙතුම් නොව නෙතුම්ගෙ අප්පච්චි පාසල් රැගෙන ගියේ ද හරමානිස් ය. එවැනි ඉතිහාසයක් ඇති හරමානිස්ට නෙතුම්ගේ අම්මා හෝ අප්පච්චි රවා බලන්නේවත් නැත. නෙතුම් මෙන්ම කැලුම් වන අයියා ද මින් පෙර කෙදිනකදීවත් හරමානිස් සීයෙ..... යැයි ආදරයෙන් ඔහු අමතනු මිස මෙවැනි ඇමතුම් කර නැත.

හරමානිස් හෙමින් ගේට්ටුව තල්ලු කරන අතරතුර නෙතුම්ගේ වාහනය දෙස ද බිමට ද නෙත් යවමින් කල්පනාවට බසින්නට විය. නෙතුම්ගේ මේ වචන වෙනකෙකුට කේන්තිය ගෙන එන නමුදු සන්සුන් බුද්ධිමත් තැනැත්තෙකු වූ හරමානිස් කලබල නොවී ය. වැස්සකටවත් පාසල් නොගිය හරමානිස් මේ හසල බුද්ධිය ලබා ගත්තේ සමාජ තක්සලාවෙනි. හරමානිස්ගේ දෙමව්පියන් කුඩා කළ සිට ඔහු අතහැර ගොස් සිටි බැවින් වයස අවුරුදු අටේ සිට නෙතුම්ලාගෙ කිරිඅම්මලාගෙ ගෙදර වැඩපලකරමින් සිටියේ ය.

''කවදාවත් පොඩි බේබි මට ඔය විදිහට කතා කරලා නෑ.. අද මොකද?....... මයෙ හිතේ මොකක් හරි හිත් අමාරුවක් වෙන්න ඕන.. මම දැක්ක ඊයෙ හැන්දෑවෙ ලොකු කල්පනාවක හිටියෙ....'' හරමානිස් කේන්තියක් වෛරයක් නොගෙන ගේට්ටුව වසා දැමුවේ ය.

වයසට ගියාට අරෝහ පරිණාහ දේහය තවමත් ඔහුට අමුතු පෙනුමක් ගෙන දුන්නේ ය. කොටු කොටු සරම සුරුවමට ඉණ රැඳවූ කළුපාට පොකට් ඉණ පටියෙ වූ කොටන ලද බුලත් විට ස්වල්පයක් අතට ගෙන මිදුලේ පැත්තක වූ බංකුව මත වාඩි වූයේ තම දෑතින් සාර සොබාවට උස් මහත්වන මල් පාත්ති දිහා බලාගෙන ය. මඟුලකට ඉලව්වකටවත් ඇඳුමක් නැඳපු අමු තිරුවත් දෙපා බිම ඇණගෙන හරමානිස් කට පුරා දුවන බුලත් විට රස බැලුවේ ය. මේ අතර





කල්පනා කරන්නට වූයේ පොඩි බේබිගෙ සිත පෑරෙන්නට හේතුවී ඇත්තේ කුමක්ද යන්නයි. අතපය හකුලගත් නෙතුම්ගෙ වාහනය ගරාජයටවී විවේක ගත්තේ ය.

''මල්ලී....... අද වැඩට නෙවෙයි ද ගියෙ.... මොකෝ ගිය පයින්ම ආවේ..'' පඩිපෙළ දිගේ ඇවිද ගෙන උඩට යන නෙතුම්ගෙන් කැලුම් ඇසුවෙ ටයි ගැටය බෙල්ලට තබා සකසන අතරේදී ය.

''නෑ අයියෙ මම වෙන වැඩකට ගියේ අද නිවාඩු...'' නෙතුම් තම ගමන තත්පරයක් හෝ නතර නොකරමින් පැවසුවේ ය.

''ඇයි පොඩ්ඩො මොකක් හරි ප්‍රශ්නයක් ද?'' තම මලණුවන්ගේ යම් වෙනසක් දුටු කැලුම් විමසුවේ ය.

''නෑ... නෑ.... මොකුත් නෑ...''

නෙතුම් දිල්හාර, කැලුම් කල්හාර යනු අක්කලා නංගිලා කිසිවකු නොමැති නිවසේ සිටින පිරිමි දරුවන් දෙදෙනා ය. නෙතුම් කායික විශේෂඥ වෛද්‍යවරයෙක්වූ අතර කැලුම් මනෝ විශේෂඥ වෛද්‍යවරයෙක් ය. අවුරුදු විසිගණන් තුළ පසුවන සොයුරන් දෙදෙනා වයසින් අසමාන වුවද රුවින් සමාන විය. මව, පියා සහ හරමානිස් සීයා සමඟ සතුටින් සාමයෙන් දිවිගෙවන්නට විය.

''කෝ... ලොකු මල්ලි වැඩට ගියා ද? කියන්නෙවත් නැතිව...'' අම්මා කැලුම්ගෙ බත් පාර්සලය රැගෙන පැමිණෙන අතර විමසුවා ය.

''නෑ.... අම්මා.. අද මල්ලි වැඩට යන්නෙ නැතිලු....''

''ඒ මොක ද?'' අම්මා කලබලවී පඩිපෙල් පසු කරමින් ඇවිද ගියා ය.

''චූටි පුතේ.....'' කතාවට පිළිතුරු නොවූ බැවින් කාමරයට ගියා ය.

උදේ ඇඳගත් ඇඳුම පිටින් ම ඇඳේ මුනින් අතට වැටී නිදාසිටියේ ය. ඇඳෙන් පහලට එල්ලෙන දෙපයේ සපත්තු ද විය. කල්පනාවේ ගැඹුර නිසා අම්මාගේ කට හඬ හෝ අඩි සද්දයද නැසුණි.

''ඇයි චූටි පුතේ..... අද වැඩට යන්නෙ නැද්ද? ''



Scanned by CamScanner

ඇඳේ වාඩිවූ අම්මා නෙතුම්ගේ පිට මත අත තබමින් ආදරෙන් ඇමතුවා ය. අම්මාගේ කාරුණික වචන නෙතුම්ගේ රිදුම් දෙන සිතට සිහින් පොද වැස්සක තෙතමනය ගෙන ආවේ ය.

"ටිකක් ඔළුව රිදෙනවා අම්මා....."

අම්මා නළලටත් බෙල්ලටත් අත තබමින් බැලුවා ය. මේ වනවිට ඉලන්දාරියෙකු මෙන්ම විශේෂඥ වෛද්‍යවරයෙකුද වූ තම පුතා ඇයට ලොක්කෙකු නොවුනි.

"ආ... තාම සපත්තු දෙකත් ගලවලා නෑ.. කෝ ඉන්ඩ" අම්මා කකුල් දෙක ළඟට ගෙන සපත්තු ගලවා සපත්තු රාක්කයේ තැබුවා ය. පසුව කමිසයේ බොත්තම් ගලවා විදුලි පංකාව ක්‍රියාත්මක කර නළලත සෙමින් සෙමින් පිරිමැද්දා ය.

"ඇති අම්මෙ දූන් අඩුයි..... අම්මට ගොඩාක් පිං..." තමාට වැළඳී ඇත්තේ හිසරදයක් නොව හිමායා පිළිබඳ වේදනාවක් බව දත් නෙතුම් අම්මාගේ දුක්ගැනීම වැළැක්වීමට පැවසුවේ ය.

"එහෙනං තව ටිකකින් පල්ලෙහාට එන්න කෑම කන්න..."

"ම්.... " නෙතුම් සිනාසී පිළිතුරු දුන්නේ ය.

"අම්මේ....... මම යනවා....." කැලුම් ඉදිරිපස දොරින් පිටවීමට සූදානම්ව පැවසුවේ ය.

"හොඳයි ලොකු තෙරුවන් සරණයි." වෙනදා මවගෙ දෙපා වැඳ නිවසින් සමුගන්නා මුත් අම්මා නෙතුම් අසල සිටි නිසා එය මඟ හැරුණි.

අම්මා කාමරයෙන් නික්ම ගිය පසු නෙතුම් නැවතත් හිමායා පිළිබඳ මතකය දිගහැරගෙන කල්පනා කරන්නට වූයේ ය.

"කවදාවත් මට ඒ ලස්සන රූපෙ දකින්ඩ බැරිවෙයි."

ඇඳෙන් බිමට බැස ටයිල් කැට දිගේ නග්න දෙපා ස්පර්ශ කරමින් ඇවිද ගිය නෙතුම්, නිදාසිටි ජනෙල් පියන්පත් දෙපසට තල්ලු





කළේ ය. සිහින් කෙඳිරිල්ලක් නගමින් නෙතුම්ගේ දෑතේ බලයට පිටුපා සිටිය නොහැකි වූ පියන් පත් තිදිගැට හැරලූයේ ය.

හරමානිස් සීයගෙ මල්පාත්ති දෙස බලමින් ද සොයන්නට වූයේ හිමායගෙ මුහුණ ය. නිල්පාට අහසෙ පාවෙන වලාකුළු දෙස බලමින් දකින්නට වූයේ ද ඇගේ රූපයයි. සීමා මායිම් නැති අහසෙ ඉගිලෙන කුරුල්ලන් අතෙහි හිමායට සියලු සත්‍ය විස්තරය සන්දේශයක් කොට යවන්නට ද සිහින මැව්වේ ය. වෛද්‍යවරයකු වූ නෙතුම් මේ වනවිට හිරිමල් වියේ යෞවනයකු මෙන් ආදර අන්දරයක පැටලී වේදනා විඳින්නේ ය. දෙවඟනක පරදන රූ සිරියෙන් යුත් හිමායා පිලිබඳ මතකයත් සීමා මායිම් නැති ආදරයත් නෙතුම්ගේ සිත ආතුර කොට ඇත්තේ ය.

නෙතුම් කාමරයේ සිට ආතුරවූ හදවත සැනසීමට මං සොයන අතරේ නිමාලි සහ පුදූ ආච්චිඅම්මා හිමායාගේ පැරුනු සිත සුවපත් කිරීමට වෛද්‍යවරුන්ගේ සහය පතමින් සිටියහ.

හිමායාගෙ සහ නෙතුම්ගෙ රිදුන සිත්වල වේදනා භාරගන්නට මෙන් පරිසරය වැහිබර අඳුරු බවක් ගෙන තිබුණි.



Scanned by CamScanner

# 17

**සීලිමේ** දෙපයින් එල්ලීගත් විදුලි පංකාව නොනැවතී කැරකෙන්නට විය. වීදුරු මුහුණතක් ඇති රවුම් මේසය මත පෑන් රඳවනයක්, කඩදාසි සහ පොත්පත් කිහිපයක් පිළිවෙලට තබා තිබුණි. මේසය අසල සිනා මුසු මුහුණින් සිටි වෛද්‍යවරයා හිමායාගේ සුව දුක් විමසා බලන්නට වූයේ ය.

''අම්මෙ... මෙයාට ළඟදි වෙන මොකුත් අසනීපයක් හැදුන ද?''

''නෑ ඩොක්ටර් අවුරුද්දකින් විතර උණක් හෙම්බිරිස්සාවක්වත් හැදුනෙ නෑ...''

''මෙයාට කිසිම ලෙඩක් නම් නෑ...''

නළාව පසෙකින් තැබූ වෛද්‍යවරයා සැහැල්ලුවෙන් පුටුවේ ඇන්දට හේත්තුවී නිමාලි සහ හිමායා දෙස බලා මොහොතක් කල්පනා කළේ ය.

''මට ටිකක් අම්මත් එක්ක කතා කරන්න පුළුවන් ද?.. අපි දරුව ටිකක් එළියට එක්ක යමුද?''

''ම්... ම්... සුදූ ආච්චිඅම්මෙ ටිකක් මෙහාට එන්න...'' නිමාලි දොරෙන් එබිලා කතා කළා.

''ආච්චි අම්මෙ මෙයා එක්ක යන්න.''





''හොඳයි ලොකු බේබි...'' සුදූ ආච්චිඅම්මා හිමායා එළියට රැගෙන ගියා ය.

''අම්මට තව දරුවො ඉන්නව ද?''

''නෑ ඩොක්ටර්... මේ මගේ එකම දුව....''

''ම්... අම්ම කොහෙද වැඩ කරන්නෙ...''

''ඩොක්ටර් මම ගවර්මන්ට් බැන්ක් එකක මැනේජර් කෙනෙක්...''

''එතකොට.... දරුවගෙ තාත්තා මොකද කරන්නෙ...''

''තාත්තා.......ඇක්සිඩන්ට් එකකින් නැතිවුණා ඩොක්ටර්....''

''සොරි...... හිත රිදුනනම්...... එතකොට අම්මා වැඩිවෙලාවක් ගෙදර ඉන්නෙ නෑ නේද?''

''ඔව් ඩොක්ටර් මම උදේ වැඩට ගියාම එද්දි හවස් වෙනවා.''

''දවල් දවසෙ මේ දරුවා තනියම ද ගෙදර ඉන්නෙ..''

''නෑ... ඩොක්ටර් සුදූ ආච්චිඅම්මා ඉන්නවා.''

''එයා කවුද මේ දරුවගෙ....''

''නෑදෑයෙක් නෙවෙයි. මම පොඩි කාලේ ඉඳලා අපේ ගෙදර හිටිය කෙනෙක්... අපි දෙන්නට අම්මා වගේ ...''

''ම්.. දරුවත් එක්ක නිතර කතාබහ කරන්න කෙනෙක් නෑ නේද?''

''ඔව් ඩොක්ටර්..... මම ගෙදර ඉන්න වෙලාවට කතා බහ කරනවා. ගෙදර වැඩ කරන අතරෙ සුදූ ආච්චිඅම්මත් කතා කරනවා. ඒ ඇරෙන්න යාළුවො නෑදෑයො කවුරුවත් නම් නෑ...''

''මේ දරුවට තියෙන්නෙ මානසික ප්‍රශ්නයක්.. මෙයාට බෙහෙත් විතරක් දීලා වැඩක් නෑ.. ෆිසිකල් ට්‍රීට්මන්ට් එකක් තමයි දෙන්න ඕනෙ..''

''ඇත්ත ද ඩොක්ටර්..'' නිමාලිගේ සිතට එක්වරම පැමිණියේ හිමායා පසුගිය දිනවල ඇඳි සිතුවම් සහ කවිවල තිබූ පැහැදිළි වෙනසයි.



Scanned by CamScanner

"දරුවගෙ වෙනසක් අඳුන ගන්න බැරිවුණා ද?"

"දෝණි තනියම ඉන්න අතරේ චිත්‍ර අඳිනවා, සිංදු ලියනවා.. ඒත්.. පසුගිය දවස්වල ඒ හැමදේකම වෙනසක් තිබුණා. නිතරම කල්පනා කළා."

"ඒකතමයි.."

"අපි දැන් මොකක් ද කරන්නෙ ඩොක්ටර්....."

"දුක්වෙන්න එපා අම්මෙ... මගෙ හොඳ යාළුවෙක් ඉන්නවා කැලුම් කල්හාර කියලා. එයා මේ සම්බන්ධව ලංකාවේ ඉන්න දක්ෂම කෙනෙක්... මම එයා අඳුන්වලා දෙන්නං."

"ඩොක්ටර් කැලුම් කල්හාර හමුවෙන්න පුළුවන් කොහෙදි ද ඩොක්ටර්...."නිමාලි උනන්දුවෙන් විමසුවා ය.

"පීපල්ස් බැන්ක් එක පහුවුණාම වම් පැත්තෙන් තියනවා පැරකුම් මාවත කියලා. ඒ පාර දිගේ මීටර් සීයක් විතර යනකොට 'මෙත් සෙවණ" කියලා ළා කොළ පාට තට්ටු තුනේ බිල්ඩින් එකක් ඇති. එයා එතන ඉන්නෙ.... උදේ නමයෙ ඉඳලා දවල් දොළහ වෙනකං විතරයි.. දැන් නම් නැතුව ඇති හෙට උදේ යන්න.."

"තැන්ක් යූ ඩොක්ටර් .... එක්ස්කියුස් මී ඩොක්ටර්... ඩොක්ටර්ගෙ නම....."

"ආ.... මම ආමන්ත ගනේපොල... කියන්නකො මම කිව්වෙ කියලා. මම කෝල් එකකුත් දෙන්නං."

"හොඳයි ඩොක්ටර්..."

දොර අසල පෝලිමේ සිටි මැදි වයසෙ කාන්තාවක් දත්මිටි කමින් වෛද්‍යවරයා දෙසත් නිමාලි දෙසත් මාරුවෙන් මාරුවට බැලුවා ය.

නිමාලි වෛද්‍යවරයාගේ කාමරයෙන් පිටත් වී හිමායාත් සුදු ආච්චිඅම්මාත් සිටි තැනට ගොස් අත් බෑගය තුළ වූ දිනපොතේ පිටුවක කැලුම් වෛද්‍යවරයාගේ ලිපිනය සහ යන මාර්ගය සටහන් කරගත්තා ය.





"දෝණිව එක්ක යන්න කිව්වා මෙත් සෙවණේ ඩොක්ටර් කැලුම් ළඟට, මේ ඩොක්ටර්ගෙ යාළුවෙක්ලු'

"දැන් යන්න පුළුවන්ද ලොකු බේබි"

"බෑ... සුදු ආච්චිඅම්මෙ දොළහ වෙනකං විතරලු ඉන්නෙ. අපි හෙට උදේ යමු."

හිමායා ඔඩොක්කුවේ හාන්සි කරගත් සුදු ආච්චිඅම්මා පිටිපසු අසුනට නැගුණ අතර නිමාලි වාහනය පැදෙව්වා ය.

ඉබ්බා කටේ එල්ලාගත් ගේට්ටුව නිවැසියන් පැමිණෙන තුරු නිවස බලාගත්තේ ය. මිදුලටවී පාළුවෙන් බලාසිටි සුදු බිංදු වාහනයෙන් බිමට පැමිණි නිමාලිගේ සහ සුදු ආච්චිඅම්මාගේ දෙපාවල ඇතිලෙමින් සෙනෙහස පාන්නට වූවා ය.

තිදෙනාගේම දෛනික දින චර්යාව වෙනස්වූ අතර නිමාලි දින පහක නිවාඩුක් ගෙන නිවසේ නතරවූවා ය.

පෙර දිනක හිමායා අඟුලුලන ලද ජනෙල් පියන්පත් ඇරීමට කිසිවකු උත්සාහ නොකළේ ය. එදින පටන් නිමාලිගෙ යහනේ ම හිමායා වෙනුවෙන් ද ඉඩක් වෙන්වුණි. හිරු ඇවිදින් ගිය ද සඳු ඇවිදින් ගියද හිමායාගේ කාමරයේ ජනෙල් අවදිවූයේ නොමැත. වැසූ පියන්පත් දැක මල් සුවඳගත් හිමිදිරි මන්ද මාරුතය ද වෙනතක ගියේ ය. හිමායා සුපුරුදු සිනාවත් සහ ලෙන්ගතු ඉරියව් අමතක කරදමා දෑසට පෙනෙන සීමාව දෙස අරමුණකින් තොරව බලා සිටියා ය.

"සුදු ආච්චිඅම්මෙ අට හමාරයි.. ඔයා ලෑස්ති ද?"

"ඔව් ලොකු බේබි.. මම මේ සාරිය පටලගන්නවා." ළඟ පාතක ගමනකට රේන්ද හැට්ටය සහ චීත්තයෙන් සැරසුනද වැදගත් ගමනක් යෑමට ඇය ලෑස්ති වන්නේ සුදු බෝරිච්චි හැට්ටයෙන් සහ ඔසරියකිනි. එවිට ඈ සිත්ගන්නා නියම ආච්චිඅම්මා කෙනෙකි.

මේ වෙන විට හිමායා ලෑස්තිකරගත් නිමාලි සාලෙ පුටුවක වාඩිවී සිටියා ය. ඈ තම ස්වාමියාගේ ජායාරූව දෙස බලමින් දියණියගේ හිස පිරිමැද්දේ අතීතය වර්තමානය අනාගතය සිහිකරමිනි.



Scanned by CamScanner

"යමු ලොකු බේබි..." සුදු ආච්චිඅම්මා සාරි පොට ඉනේ දවටමින් පැමිණියා ය.

සුදු බිංදු මිදුලට පැමිණ බලාසිටිය ද වාහනය ගේට්ටුවෙන් පිටව ගියේ ය. සෑ...ව්... සෑ..ව්..... සෑ...ව්... තම හඬට කිසිවකු නොපැමිණෙන බව දූන් ගත් ඇය නිහඬ වූවා ය.

නියමිත මංමාවත් පසුකරමින් ගමන් ගත් වාහනය මෙත් සෙවණ ඉදිරියේ නැවතුණි.

"මෙතන තමයි සුදු ආච්චිඅම්මෙ තැන... "

"ලොකු බේබි ගිහින් බලලා එනවද?"

මෙත්සෙවණ වෛද්‍ය මධ්‍යස්ථානය ඉදිරිපිට වාහනය නතර කළ නිමාලි, සුදු ආච්චිඅම්මා සහ හිමායා වාහනේ සිටිය දී පිවිසුම් දොරටුවෙන් අදාළ වෛද්‍යවරයා පැමිණ ඇත්දැයි සොයා බැලීමට පිටව ගියා ය.

මිදුලේ සිටගෙන සිටි නාගස් පේළිය බිමට අව්ව වැටීමට නොදී බොහෝ පෙදෙසක් ආවරණය කරගෙන සිටියේ ය. නා කොළවල සිලි සිලියත් පිපුණ නා මල්වලින් නික්මෙන සුගන්ධයත් වටපිටාවට අමුතු මිහිරක් එක්කරන්නට සමත්විය. නාමල් රේණු තෙලන මී මැස්සියන්ට කිසිවකුගෙන් බාධාවක් නොවී ය.

කටු ඇඳුමක් ඇඟලාගෙන හිසින් සහ දෑත් අගින් කැකුළින් ද පිපිණු මලින්ද ගත් සෙව්වන්දි මල් සමනල්ලු එනතුරු බලාසිටින්නේ ය. වෙනදා පරිසරයට ආදරය කරන හිමායාට අද ඒ කිසිවක් නොපෙනුණි.

"දොස්තර මහත්තයා ඇවිල්ල ද ලොකු බේබි.." වාහනය අසලට පැමිණි නිමාලිගෙන් සුදු ආච්චිඅම්මා විමසුවා ය.

"නෑ... තාම ඇවිත් නැතිලු... තව විනාඩි පහකින් විතර එනවා කියලා කෝල් එකක් දුන්නලු අද ටිකක් පරක්කු වෙනවා කිව්වලු."

"බලන්නකො ලොකු බේබි.... මෙතන හරිම සිරියාවයි."





"ඔව් ආච්චියෙ මේ වගේ තැන් හදන්නෙ මේ විදිහට තමයි."

"බලන්නකො හරියට පන්සලකට පල්ලියකට ගියාවගේ..."

"ඔව් මේ තැන්වල ඉන්න දොස්තරලත් හරිම කරුණාවන්තයි."

"අනේ කුණුරුවන්ගේ පිහිටෙන් සුදු බේබි සුවපත් කරලා දුන්නොත් පිං අත්වෙනවා." නිදාගෙන සිටින හිමායාගෙ හිස අතගාමින් සුදු ආච්චිඅම්මා පැවසුවා ය.

"ඔව් සුදු ආච්චිඅම්මෙ..... මම කෑ ගහල ඇඩුවෙ නැති වුණාට හිනාවක්වත් නැති දෝණි දකිනකොට පපුව පිච්චෙනවා."

හිතට කොතරම් වේදනා පැමිණිය ද හඬා වැටීමට අවසර නොවූ නිමාලි සැබැවින් ම යකඩ ගැහැණියකි. රිය අනතුරකින් ස්වාමියා මෙලොව හැරදා ගිය දින සිට වසර ගණනාවක් හිමායා වැනි දරුවෙකු හදාවඩා ගනිමින් රාජකාරී තුළින් ලබන ගැරහුම් කැපිලි කෙටිලි සියලු නොපනත්කම් තනිව ම විසඳාගනිමින් සමාජය නැමති සැඩ දිය මගෙහි හබලත් කොල්ලෑවත් නැති ඔරුවක් පදවන තොටියකු සේ නිමාලිගේ ජීවිතය ගෙවෙන්නට විය.

වැන්දඹු කාන්තාවන්ට ඉව අල්ලන මූකලන් බස්සන් දෙතුන් දෙනෙක් අනඟ රැඟුම් රඟන්නට පැමිණ කිහිප වරක් නිමාලිගෙන් ගුටි නොකා බේරුණේ අනූනමයෙනි. ඔවුන් එම අවස්ථාවලදී නිමාලි ඉදිරියේ බලු කුක්කන් සේ නගුට සඟවා පලාගිය ද නිමාලිගෙන් රාජකාරීමය වශයෙන් දිගින් දිගට ම පලිගත්තේ උසස් තනතුරු කිපයක් ම අමු අමුවේ ම ඇගෙන් මඟ හරවමිනි. හිමායා යනු එවන් කාන්තාවක ගේ දියණියකි. මුදල් තිබුණ ද දහසක් දුක්ගැහැට මැද හිමායාගේ ජීවිතය ධෛර්යයෙන් ඔසවා තබන්නට නිමාලි සියලු උත්සාහ දැරුවා ය.

සුදු ආච්චිඅම්මා සහ නිමාලි හිමායා රැගෙන ගොස් අනෙක් පිරිස අතර වාඩිවී බලා සිටියේ කැලුම් කල්හාර වෛද්‍යවරයා පැමිණෙන තුරු ය.

"මල්ලි ඔයාට පරක්කු ද?" කැලුම්ගේ වාහනයේ දෝෂයක් වූ බැවින් තම මල්ලී වූ නෙතුම් රෝහලට යන අතර ඔහු සමඟ කැලුම්

පැමිණෙමින් සිටියේ ය. නෙතුම්ගේ කොළපැහැති මෝටර් රථය ඉදිරිපස ගේට්ටුවෙන් ඇතුළට ගෙන ගොඩනැගිල්ල ඉදිරියේ වූ රවුම් නෙළුම් පොකුණ වටා අඩක් ධාවනය කර පිවිසුම් දොරටුව ආසන්නයේ නතර කළේ ය.

"මම බහිනවා පොඩ්ඩො.... පරිස්සමෙන් යන්න" කලබලෙන් බිමට බැස දොර වැසූ කැලුම් මල්ලිට සමුදුන්නේ ය.

"හරි..... ලොකු...." නෙතුම්ගේ වාහනය ඉතිරි අඩ පොකුණ වටේ ගමන්කර ගේට්ටුවෙන් පිටවී නොපෙනී ගියේ ය. මේ වන විට හිමායා ඒ අසල ම සිටි අතර දෑස් වෙනතකට යොමුවී තිබුණි.

රෝගීන් වාඩි වී සිටින පුටු පේළියට ඉදිරිපසින් වූ දිය ඇල්ල සහ එය පාමුල වූ පොකුණේ ගල් උඩට වැටී සිහින් හඬ නංවමින් බිඳු විසිරෙන ජල බිඳිති දෙස හිමායා බලාසිටියේ අවධානයකින් නොව එතනට පැමිණෙන විට සිටියේ ඒ දිසාවට බැවින් නෙත වෙනතකට ගැනීමට උමනාවක් නැතිවාක් මෙන් බලාසිටියා ය. එබැවින් නෙතුම්ගේ වාහනය දොර ළඟට ම පැමිණියත් ඇගේ නෙත් ගැටීමට අපොහොසත් වුණි.

ළඟ පාතවූ ගැහැනු කිහිප දෙනෙක් හිමායා දැක නොයෙක් දේ විමසන්නට විය. ඇතැම් කෙනෙක් සානුකම්පිතව ද තව කෙනෙක් ඕපාදූපයක් කනට රිංගවා ගැනීමට ද දොඩමළු විය. ඇතැම් ප්‍රශ්නවලට පිළිතුරු දීම නිමාලිගෙ සිතට අකුණු සැර මෙන්විය. නිමාලි කුමක් හෝ කියා ඉවත බලාගත්තේ බේරීමට නොහැකි වූ අවස්ථාවලදී ය.

දොරටුව අසල නැවැත්වූ කොළ පැහැති මෝටර් රථයෙන් බැසගත් කඩවසම් තරුණයෙකු දකුණතින් බෑගයක් රැගෙන කඩි මුඩියේ ඇතුළට ගියේ ය. ඉදිරියට හමුවන සියලු දෙනා ම "ගුඩ් මෝර්නින් සර්....." යනුවෙන් පැවසුවේ මහත් ගෞරවයෙනි. ඔහු ද ඒ සියලු දෙනාම කොතරම් කලබලයෙන් වුවද "ගුඩ් මෝර්නින්" යනුවෙන් සුබ පතන්නට අමතක නොකළේ ය. ළා පැහැති අත්දිග කමිසයක් ඇඳ ඊට ම ගැලපෙන කලිසමකින් සැරසී සිටි ඔහු කමිසයට වඩා මඳක් තද වර්ණයෙන් යුතු ටයි පටියක් හැඳ සිටියේ ය.





"මේ ඩොක්ටර් කැලුම් වෙන්න ඇති." නිමාලි සුදු ආච්චිඅම්මගෙ කණට ළංවී පැවසුවා ය.

"මටත් හිතුනා. දොස්තර මහත්තයා වෙන්න ඇති කියලා. බොහොම කරුණාවන්ත පාටයි...."

නිමාලි අසුනින් නැගිට සාත්තු සේවිකාවට වෙතට ගිය අතර සුදු ආච්චිඅම්මාගේ දෑස්ද ඒ දෙසට යොමුවිය.

"එක්ස්කියුස් මී, මිස්..... අර.....ඩොක්ටර් කැලුම් කල්හාර ද?"

"ඔව් මැඩම්........ මි.. නම්බර් එක කීයද?"

"පහ..." කියමින් නිමාලි අතෙහිවූ අංකය දෙසද බැලුවා ය.

"තව හතර දෙනෙක් ඉන්නවා නේද? ටිකක් වෙලා වාඩි වෙලා ඉන්න වෙනවා. අතන අංක කියනවා ටිකක් අහගෙන ඉන්න.."

"හා... හරි... "

නිමාලි නැවත අසුන වෙත පැමිණියේ වෛද්‍යවරයා නොපෙනුන ද ඔහු පිටව ගිය දොරටුව දෙස විමසිල්ලෙන් බලමිනි.

"මොකද කිව්වෙ ලොකු බේබි..."

"එයා තමයි ඩොක්ටර් තව හතර දෙනෙක් ඉන්නවා අපිට කළින්, මම ටිකක් එහායින් ඉන්නං"

නිමාලි සහ සුදු ආච්චිඅම්මා ඇස් කන් සීරුවට තබාගෙන සිටියේ අංක පහ යන හඬ බලාපොරොත්තුවෙනි. පැය භාගයක් පමණ ගතවීමෙන් පසු සාත්තු සේවිකාවගේ හඬ බලාපොරොත්තු ඉටු කළේ ය.

"අංක පහ."

"යමු...." හිමායා රැගෙන නිමාලි වෛද්‍යවරයා සිටින කාමරය අසල පේළියේ ගමන් කළා ය. සුදු ආච්චිඅම්මා පසු ගමන් ගියේ මිත්තනියකගේ සෙනෙහස පෙරදැරි කරගෙන ය.



Scanned by CamScanner

වෛද්‍යවරයාගේ දොරටුව අසල සිටි තරුණිය ද නිමාලිට උදව් කළා ය. හිමායගෙ රුවැති මුහුණ දකින නෙතකට නැවත වතාවක් බලන්නට සිතුණි. ඒ හැමෝගෙම හදවත් පැරුනෙ හිමායා ලස්සන වගේම විශේෂ ගැහැනු දරුවෙක් නිසා. හිමායා උපන් මොහොතේ සිට නිමාලිගෙ හදවතට ද ඒ දුක ඉපදුණි. නිමාලි තවත් දරුවකුට උපතක් නොදුන්නෙ හිමායට අඩුපාඩුවක් නොවනු පිණිස ය. හිමායා වෙනුවෙන් නිමාලි සහ හිමායගෙ තාත්තා දෙදෙනාම දිවිහිමියෙන් කැපවූහ. එහෙත් කලින් නොදන්වාම නිමාලිගෙ කරමත පවුලේ සියලු වගකීම් පවරා ඔහු මෙලොව හැරගොස් මේ වනවිට වසර ගණනාවක් ගෙවී ගොසිනි. එදින පටන් අම්මා තාත්තා යන චරිත ද්විත්වයම රඟදැක්වීමට නිමාලිට සිදුවිය. එබැවින් ඇයට කොතරම් අභියෝග දුක් කරදර පැමිණිය ද හඬා වැටීමට පසුතැවීමට මෙන්ම පලායෑමට අවසර නොමැත.

පෙර සිටි රෝගියා වෛද්‍යවරයා වෙතින් පිටව ගිය අතර නිමාලි හිමායා වෛද්‍යවරයා වෙතට රැගෙන ගියා ය.

''එන්න..... අම්මෙ...'' වෛද්‍යවරයා නිමාලිට කරුණාවෙන් කතා කළේ ය.

''ඇයි අම්මෙ..... මොකද මෙයාට''

''ඩොක්ටර්, මෙයා බලාගත්ත අත බලාගෙන ඉන්නවා. කන්න බොන්නවත් ගාණක් නෑ...''

''දැන් දවස් කීයක් වෙනවද?''

''අදත් එක්ක දවස් දෙකයි...''

''මොකුත් අසනීපයක් එහෙම තිබුණ ද?''

''නෑ.... ඩොක්ටර් මොකුත් අසනීපයක් තිබුණෙ නෑ...''

''මෙයා ගෙදර තනියම ද ඉන්නෙ.... අම්මා කොහෙද වැඩ කරන්නෙ.''

''මම ගවර්මන්ට් බැන්ක් එකක මැනේජර් කෙනෙක්...''





''ආ.... මට ඩොක්ටර් ආමන්ත කිව්වෙ ඔයාලා ගැන වෙන්න ඇති?''

''ඔව් ඩොක්ටර්.... ඊයෙ මෙයාව ඩොක්ටර් ආමන්ත ළඟට එක්ක ගියා... අපි ඩොක්ටර් ගැන දැනගත්තෙ ඒ වෙලාවෙ..''

''ආ.. මට විස්තර කිව්වා....''

''ඩොක්ටර් මෙයාට මොකක් ද කරන්න පුළුවන්..''

''මෙයා කාත් එක්කවත් වචනයක්වත් කතා කරන්නෙ නැද්ද?''

''නෑ.. ඩොක්ටර් මෙහෙමයි. මෙයා දැන් හරියට ම අවුරුදු පහකින් වචනයක්වත් කතා කළේ නෑ....''

''ආ... එහෙම ද? ඒ ඇයි....''

''ඒක ලොකු කතාවක් ඩොක්ටර්........'' නිමාලි මොහොතක් නිහඬව් හිමායා දෙස හැරී බැලුවා ය.

''ම්....... ම්... මට ඒ විස්තර පස්සෙ කියන්නකො.. මේ වගේ දරුවෙකුට ට්‍රීට්මන්ට් කරන්න කලින් මම වර්තමානය වගේ ම අතීතය ගැනත් හොඳට දැනගෙන ඉන්න ඕන... නැත්නං මට මෙයාගෙ මානසික තත්වෙ තේරුම් ගන්න බෑ... ඒ කියන්නෙ මට මෙයාව සුවපත් කරන්න බෑ.. ඒ නිසා මට ඇත්ත තොරතුරු කියන්න.''

''හොඳයි ඩොක්ටර්.....''

''වත්සලා... තව පේෂන්ට්ලා කී දෙනෙක් ඉන්නව ද?'' දොර ළඟ වූ නිල ඇඳුම් ඇඳි තරුණියගෙන් වෛද්‍යවරයා විමසා සිටියේ ය.

''තව අසූවක් දැනට ඉන්නවා ඩොක්ටර්....'' ඇය වහා පිළිතුරු දුන්නා ය.

''මෙයාගෙ නම මොකක් ද?''

''හිමායා නෙත්සරණී....''



Scanned by CamScanner

"හිමායා.... ලස්සන නමක්..."

"හිමායා...... හිමායා........ හිමායා........." වෛද්‍යවරයා හිමායාගෙ අත ගෙන කරුණාවෙන් පැවසුව ද හිමායා විශේෂ අවධානයක් නොදී බලාසිටියා ය.

"අම්මෙ මෙයාගෙ වයස කීය ද?"

"විසි එකයි..."

"මෙයාට යාළුවො ඉන්නව ද?"

"ඉස්කොලෙ යන දවස්වල නම් හිටියා.."

"ම්.... මෙයා ඉස්කෝලෙත් ගියා...ද?"

"ඔව් ඩොක්ටර්.... සමුද්‍රදේවි බාලිකාවට ගියෙ... මෙයා හැමදාම පන්තියේ පළවෙනියා."

"ඉතිං ඇයි ඉස්කොලේ ගමන නතර කළේ."

"ඒක ලොකු හේතුවක් ඩොක්ටර්... ඉස්කොලෙ ගමන නතරවුණා විතරක් නෙවෙයි හිමායගෙ තාත්තා මේ ලෝකෙන් යන්න ගියෙත්, දුව කතා කරන එක නතර කළෙත් ඒ අවාසනාවන්ත දවසෙ ඩොක්ටර්....."

දෑස්වල කඳුළු පුරවාගත් නිමාලි අමාරුවෙන් පැවසුවා ය. වෛද්‍යවරයා නිමාලිට නිවාඩුව තම හදවතේ නිදන්වූ මතකය ගොඩගන්නට දුන්නේ ය.

"මම සාමාන්‍යයෙන් ගෙවල්වලට ගිහින් ට්‍රීට්මන්ට කරන්නෙ නෑ.. මොකද අහංකාරකමකට නෙවෙයි. මට වෙලාවක් නෑ... ඒත් මට මෙච්චර දක්ෂ දරුවෙක්ගෙ අනාගතේ අඳුරු වෙන්ඩ දෙන්ඩ බෑ...."

"අනේ ඩොක්ටර් මගේ ජීවිතේ වටිනා ම දේ මගේ දෝණි... උණ හපුලුවාගෙ අම්මට පැටිය වටිනවා වගේ කොච්චර අඩුපාඩු තිබුණත් මට මගෙ දෝණි ලෝකෙ වටිනාම මැණිකටත් වැඩිය වටිනවා."





"මෙහෙම කරමු... මම ගෙදරට එන්නං මට අම්මා හෙට හවසට කෝල් එකක් දෙන්න.. මම හරියට ම ටයිම් එකක් දෙන්නම්. හරි..."

"හොඳයි ඩොක්ටර්.... මට ගාස්තුව කීයක් වුණත් කමක් නෑ ඩොක්ටර්.... ඩොක්ටර් මගෙ දුව සනීප කරලා දෙන්න ඒක ලොකු පිනක්....."

වෛද්‍යවරයාගේ කාරුණික හදවත දහසක් බලාපොරොත්තු පරිස්සමට අසුරා තබා නිමාලි හිමායා සහ සුදු ආච්චිඅම්මා නංවාගෙන ආපසු පැමිණියා ය.

ගේට්ටුවෙන් වාහනේ ඇතුළට පැමිණෙන විට ම සුදු බිංදු සදා.....ව... සද.....ව යැයි හඬමින් පැමිණියේ අහිංසක පූසියක්වූ තමන් ගෙදර තනිකර යෑමේ අවනඩුව කියාසිටීමට මෙනි. වලිගය ඔසවාගෙන වාහනයෙන් බිමට බසින දෙපාවල දවටෙන්නට වූයේ. දෙපාවලට කරදරයක් වෙමිනි.

හිමායගෙ මූණෙ සිනා තහනම්වූ දිනයේ සිට අනෙත් දෙතොල්වලින්ද සිනාවක් දැක ගැනීමට නොවුණි. දවසේ පැය විසිහතර දෙගුණයක්වී ඇති තරමට සෙමෙන් කාලය ගෙවීයන්නට විය.

උදෑසන මෙන්ම සවස ද හිමායාගෙ ජනෙල් කවුළුව වැසී තිබුණ බැවින් නෙතුම්ගේ හිත නොසන්සුන් වූයේ ය. නිවසට ගිය නෙතුම් කල්පනා කළේ රෑ කාලෙ නිවසේ විදුලි එළියක් හෝ ඇත්දැයි බැලිය යුතුබවයි.

"අම්මෙ... මම වැඩකට යාළුවෙක් හම්බෙන්න යනවා.."

"පොඩී... මේ රෑම යන්න ඕනෙ ද?"

"ඔව් අම්මා....."

"අයියත් එක්ක යන්න පුතා..."

"අයියා එද්දි මට පරක්කුයි අම්මා.... මම ඉක්මනට එන්නං.."

"එහෙනම් පරිස්සමට ගිහින් එන්න..."



Scanned by CamScanner

සුපුරුදු තාප්පය අසල වාහනය නවත්වා නෙතුම් හිමායා වෙනදා සිටින ජනෙල් කවුළුව වෙත එබී බැලුවේ ය. එහෙත් කිසිඳු ආලෝකයක් දක්නට නොවුණි. උස් තාප්පයෙන් වෙනත් කිසිවක් නොපෙනුණි.

''තවම වෙලාව හතයි දහයයි. මෙච්චර කලින් නිදිවෙන්න බෑ... ඒ කියන්නෙ දවස් දෙකේ ම දවල්ටත් කාමරේ ජනෙල් වහලා. රෑත් නෑ... හිමායට මොකද වුණේ....'' නෙතුම් දෑත සුක්කාම මත තබාගෙන කල්පනා කරන්නට විය. විදුලි පහන් දල්වා ගත් වාහන කීපයක් ඉදිරියටත් අනෙක් පසටත් ගියහ. තාප්පෙට ඇතුලින් තිබුණු තරමක් උස ගස් කීපයක කණාමැදිරි එළි කිහිපයක් දක්නට ලැබුණි.

කොතරම් බලා සිටියද පිළිතුරක් නොලැබෙන බැවින් නෙතුම් වාහනය ආපසු හරවා ගත්තේ ය. සුසුම් හෙලමින් හිතේ දුක ඉවතට විසිකළ ද බූමරංගයක් මෙන් වේදනාව හිතට පැමිණෙන්නට විය.

නිවස ඉදිරිපසින් දුවන සූරියමල් මාවත අයිනෙ වාහනය නවතා දුරකතන ඇමතුමක් ගත්තේ ය.

''හෙලෝ... මචං මෙත්තා......''

''නෙතුම්..... කියපං.... හදිස්සියක් ද?''

''හදිස්සියක් කියන්නෙ බං... මම දූන් අර ගේ ළඟට ගියා... ලයිට් එකක්වත් නෑ... උදෙයි හවසයි ජනේලෙ වහලා තිබුණෙ.....''

''දූන් උඹ කොහෙද ඉන්නෙ..''

''මම මේ ගෙදර යන ගමන් ගෙවල් ළඟ ඉන්නෙ.''

''මම හෙට කොහොම හරි උඹට තොරතුරක් හොයලා දෙන්නං, මචං දූන් ගෙදර ගිහින් රිලැක්ස් වෙයං...''

''ඕකේ... මචං ගුඩ් නයිට්...''

''ගුඩ් නයිට්..''



# 18

තටු සලා රඟන බඹර නෙතු සොරාගන්නටත් මුනි පා වැඳුමට යන සමනලුන්ගේ බැති සිත් සිඳින්නටත්, සුවඳින් වර්ණයෙන් පොහොසත්වී මල් කැකුළු තුරු අග අඩනිරුවතින් ඉස්සීගෙන සිටින්නේ ය. හිරු ඇතින් පැමිණෙන විටම මල්කැකුලියෝ මතිපත්‍ර කවුළුවෙන් බසින්නට වූහ.

මල්වට රඟන අනඟ බඹර රැඟුම් නෙත්ලා ගන්නට හිමායා ජනේල් කවුළුව අසල නැත. තෙවැනි දිනටත් වැසීඇති ජනෙල් පියන් පතේ සිට ලොවි ගහේ අත්තකට දිවයන මකුළු දැළේ අයිතිකාර මකුළු මුත්තාට හිමායාගේ ජනේලය පිළිබඳ වැටහීමක් නොවුව ද තාප්පයට එහායින් සිට බැලුම්ලන නෙතුම්ට උභතෝකෝටික ගැටළුවක් විය.

උදෑසන සහ සවස වැසුණු ජනෙල් පියන්පත් දෙස බලමින් රෝහලට යන එන නෙතුම්ගෙ හදවත දස්වර හඬා වැටුණේ ය. රාජකාරියෙන් මිදිනෙ හැම මොහොතක්ම නෙතුම් හිමායාගේ රුව හදවතින් දකින්නට උත්සාහ ගත්තේ ය.

වාට්ටුවටම එළිය කරන පසළොස්වක සඳවල් වැනි හෙදියන් කොතරම් සිටිය ද නෙතුම්ගේ හිත් නොගත්තේ ය. සඳ පරදන තරම් රුවකින් යුතු නෙතුම්ට නෙත්දෙන හෙදියන් දෙස නෙතුම් බැලුවේ



Scanned by CamScanner

නැගණියන් ලෙසිනි, එහෙත් මෙත්සරට නෙත් දුන් කිසිවකු සිනාගෙන ආපසු ගිය බවක් අසා නැත.

නෙතුම් අමාරුවෙන් හිතේ වේදනාව පසෙක තබා තමා පැමිණෙන තුරු බලා සිටින රෝගීන් බැලීමට වාට්ටුවට පැමිණියේ ය.

"ගුඩ් මෝර්නින් ඩොක්ටර්....."

"ගුඩ් මෝර්නින්..."

වාට්ටුවේ සේවක සේවිකාවෝ සුභ පතන්නට වූහ. සිනාවෙන් කතාවෙන් සුභ පතමින් සුහද කතාවෙන් වාට්ටුවේ මුල සිට පිළිවෙළට රෝගීන් වෙත ගියේ ය. එම වාට්ටුවේ වූයේ කාන්තාවන් ය. තුන්වෙනි ලෙඩා වූයේ තරුණ ලස්සන ගෑනු ළමයෙකි, හිමායා තරම් ලස්සන නොවුන ද නෙතුම්ට සැණෙකින් හිමායගෙ මුහුණ මැවී පෙනුණි. සිත රාජකාරියට බාරදුන් නෙතුම් රෝගීන් වෙත ඇවිද ගියේ ය.

විවේක වෙලාව පැමිණි විට නෙතුම් විවේකාගාරයට පැමිණියේ ය. නෙත්මි ජංගම දුරකතනය කනට ගෙන ඇමතුමක් ගනිමින් සිටියා ය. කටින් පමණක් නොව අතින් ද සංවාදය පැවති අතර කැකිරි පැලෙන සිනාහඬ ද ඇසෙන්න විය. නෙතුම් ආපසු හැරී කොරිඩෝව දෙසට ඇවිද ගියේ ය.

"මෙත්සර... මෙත්සර..." තමා ඉදිරියේ වූ දොරකින් පිටුපා යමින් සිටි මිතුරාට නෙතුම් කතා කළේ ය.

"ආ..... මචං.. ගිව් මී ටූ මිනිට්ස්" මෙත්සර පිටුපා ගියේ ආපසු එන බවට පවසමිනි.

නෙතුම් මෙත්සර බලාපොරොත්තුවෙන් කොරිඩෝවෙ රැඳී සිටියේ ය. මෙත්සර පැවසූ ලෙසම පමා නොවී පැමිණියේ ය.

"ඉතිං...... මොකද තත්ත්වෙ" මෙත්සර ඇසුවේ සැහැල්ලුවෙනි.

"කිසිම පොසිටිව් ඉම්ප්‍රොමේෂන් එකක් නෑ මෙත්තො...."

"මම ටෙලිෆොන් ඩිරෙක්ටරියෙ නම්බර් එක හොයාගත්තා. මම උඹට කියන්ඩ හිටියෙ"





"ආ........ නම්බර් එක කියද්දි මතක් වුණේ, අන්න මට ගේම දීලා නෙත්මි මල් නෙවෙයි ගෙඩිත් එක්ක ම කඩනවා." නෙතුම් නෙත්මිගෙ දුරකතන සංවාදය පිළිබඳ මෙත්සරට පැවසුවේ ය.

"ම්... අද උදේ ආවේ ඒකිගෙ කාර් එකේ නෙවෙයි. කළු පාට කාර් එකක... ඒක තමයි එහෙනං...."

"බලපංකො මගෙ කරේ එල්ලෙන්ඩ ඇවිල්ලා ඔක්කොම වර්වස් කරන් නැතුව ඔය මඟුල කලින් ම කරගත්ත නං ඉවරයිනෙ."

"ඒකනෙ.... වසල ගති අරින්ඩ බෑ බං...."

"මෙත්තො... අපි කෝල් කරලා අර ගෙදරින් මොනා ද අහන්නෙ."

"ඒකත් ඇත්ත..."

"මෙහෙම කරමු. කෝල් එක අරගෙන ෆෝන් එකට ආන්සර් කරන කෙනා අනුව කියන දේ ක්ෂණිකව තීරණය කරන්න වෙනවා."

"හැබැයි පරිස්සමෙන්... අනිත් පාර සැක හිතිලා පොලිසියට එහෙම කිව්වොත් ඉවරයි."

"අපි දූන් ගමු. වැඩට යන අය එහෙම ඉන්නවා නම් මේ වෙලාවෙ නැනෙ, දූන් ඇත්තෙ සර්වන්ට් විතරයිනෙ හෙමීට තොරතුරක් දූන ගන්න බැරිවෙන එකක් නෑ....."

"මෙත්තො මට හිතාගන්න බෑ... උඹ ම කතා කරපංකො.."

නෙතුම් විමසිල්ලෙන් බලාසිටි අතර මෙත්සර අංක ඇතුළත් කරමින් ඇමතුම සම්බන්ධ කරගන්නට උත්සාහ දූරුවේ ය.

"සමාවන්න ඔබ අමතන දූරකතනය ක්‍රියා විරහිත හෝ ආවරණ කලාපයෙන් බැහැරව ඇත. කරුණාකර පසුව අමතන්න."

"ෂිහ්.. වැඩ කරන්නෙ නැනෙ..... ඩිස්කනෙක්ට් කරපු එකක් වගේ." මෙත්සර කට ඇද කරමින් පවසන විට නෙතුම්ගෙ කට පමණක් නොව හදවත ද ඇදවුණි.



Scanned by CamScanner

"ඒකත් එහෙම ද?"

"මම තව ටිකකින් බලන්නං.... අපිට අද හෙට මොකක් හරි තොරතුරක් ගන්න පුළුවන් වෙයි."

මෙත්සර වැඩි කලබලය නිසා අංක පටලවා ගත් බැවින් එම අංකයට ම නිමාලි ගත් ඇමතුම සුදු ආච්චිඅම්මාට ලැබුණි.

"ක්‍රී.....ං ක්‍රී....ං...." සුදු ආච්චිඅම්මා ඇමතුම ගැනීමට යන අතර සුදු බිංදු ද දුවන්නට වූ බැවින් දෙපයේ පැටලෙන්නට විය. ආච්චිඅම්මා සමඟ හැප්පෙමින් ඇමතුම ගැනීමට දුවගෙන ගියද සුදු බිංදු කියන්නට දන්නේ... ඤාව්...ඤාව්....මියැව් පමණි. එය තේරුම් ගැනීමට ඇමතුම ගන්නාද පූසෙක් හෝ පූසියක් විය යුතුය. කරදර මැද්දේ බොරු කරදර කරන සුදු බිංදුට ගුටියක් දුන් සුදු ආච්චිඅම්මා රිසීවරය කනට ගත්තා ය,

"හෙලෝ.. ආ.... ලොකු බේබි... කියන්න.."

"සුදු ආච්චිඅම්මෙ..... අද හවස ඩොක්ටර් කැලුම් එනවා දෝණිව බලන්ඩ, මම අද එක වෙද්දි එනවා."

"හා හොඳයි බේබි...."

"කෝ දෝණි.... "

"වෙනසක් නෑ... මම බලෙන් පලතුරු ටිකක් එහෙම කැව්වා. බොහොම පොඩ්ඩයි කෑවෙ... බලාගත්ත අත බලාගෙන කල්පනා කරනවා. දැන් නං නිදාගත්තා."

මුදුන් වුණ හිරුගෙ උණුසුම වැඩිවන්නට විය. ගැබ්බරවූ දම්පැහැති වලාකුළු බිමට බසින්නට කල්පනා කරමින් ඒ මේ අත සෙමෙන් ඇවිදින්නට විය. හෝරාවකින් පමණ හිරු එළිය සඟවමින් වැහි අඳුර හාත්පස සිය ආධිපත්‍ය පැතිරෙව්වේ ය. මිදුලට පැමිණ අහසට දෑස් දුන් සුදු ආච්චිඅම්මාගෙ හිතට දුකක් දැනුණි.

"අද සුදු බේබිව බලන්න දොස්තර මහත්තයා එන දවස... අද මහ මුහුදෙ මඩත් අරගෙන එන තරම් ලොකු වැස්සක් එන්නයි හදන්නෙ... අනේ වැස්ස වලාහක දෙවියනේ අද නැවිදින් ඔය වැසි





කුඩෙ වෙන දවසකට අතඅරින්න බැරිද? " සුදු ආච්චිඅම්මා වැහිබර අහස දෙස බලමින් හූල්ලන්නට වූවා ය.

දිය පොදක් හෝ ඇතුළට නොපැමිණෙන මෝටර් රථයෙන් ඔහු පැමිණෙන බැවින් වැස්ස කිසිඳු බාධාවක් නොවන බව සුදු ආච්චිඅම්මාට අවබෝධයක් නොවුණි. වැස්ස පවා හිමායා සුවකර ගැනීමට බාධාවක් වෙතැයි ඇය බියපත් වූවා ය.

"පී..ප්.... පී.......ප්.." පැල දොර ළඟටවී අහස දෙස බලමින් අනවශ්‍ය කරදර හිසට ගෙන සිටි සුදු ආච්චිඅම්මා ගේට්ටුව දෙසට දිවගියා ය.

"ලොකු බේබි...... දොස්තර මහත්තයා එන්නෙ කීයටද?"

"වෙලාවක් නම් කිව්වෙ නෑ.. තුනෙන් පස්සෙ එන්නං කිව්වා."

"බලන්ඩකො නා කපන වැස්සක් වැටෙන්ඩ හදන්නෙ වැහි මන්දාරම ටිකෙන් ටික මුදුන් කරනවා.. වැස්සොත් දොස්තර මහත්තයා එන්නෙ නැතිවෙයි ද දන්නෑ.."

"නෑ... ඩොක්ටර් කාර් එකේනෙ එන්නෙ.."

"කෝකටත් සුදු ආච්චිඅම්මෙ අපි ගේට්ටුව ඇරලා තියමු. කෝ දෝණි.... තාම නිදි ද?"

"නෑ දැන් ඇහැරලා ඉන්නෙ..... ඒත් කිසිවෙනසක් නෑ...."

"හොඳට හිනාවෙලා හිටිය දරුවනෙ... ප්‍රදර්ශනේ දවස් දෙකේ කොච්චර සතුටු වුණා ද? මට හිතා ගන්න බෑ.... කාමරේට ම වෙලා සතුටින් වටපිට බල බලා හිටපු දරුවට මොක ද වුණේ."

"ඒක තේන්නං ලොකු බේබි මාත් දහඅතේ කල්පනා කරන්නෙ."

සුදු ආච්චිඅම්මා සහ නිමාලි ඉදිරිපස දොරටුව අසල වාඩිවී වෛද්‍යවරයා එනතුරු නොඉවසිල්ලෙන් බලාසිටියහ. ඔරලෝසුවේ කටු තුනේ ඉලක්කමත් පසුකර දිවගියේ ය. වැහි අඳුර කෙමෙන් මෝරා ගියේ ය. දෙදෙනාගේ සිත්වල තිබුණු බලාපොරොත්තුව සෙමෙන් සෙමෙන් ගිලිහෙමින් තිබුණි.



Scanned by CamScanner

වෙනදාට වඩා පැයකට පමණ කලින් රාජකාරි අවසන් කළ නෙතුම් සහ මෙත්සර හිමායාගෙ ගෙවල් අසලින් දුවන මාවත දිගේ පැමිණෙමින් සිටියහ.

මීට දිනකට පෙර අලුත් වැඩියා කටයුත්තක් සඳහා ගරාජයකට බාරදුන් මෝටර් රථය ගැනීමට ගොස් සිදු වූ ප්‍රමාදය නිසා කැලුම් වෛද්‍යවරයාට පොරොන්දුවූ වෙලාවට නිමාලිගෙ නිවසට පැමිණීමට නොහැකි වූ අතර ඔහු නියමිත වෙලාවට වඩා පැයක් පමාවී එමින් සිටියේ ය. හිමායා මෙතක් තමාගේ සේවා කාලය තුළ හමුවූ විශේෂ අයෙකු ද විශේෂ හැකියා ඇති අයෙකු මෙන්ම පියා අහිමි අයෙකු වන නිසා පමාවී හෝ පැමිණීමට කැලුම් වෛද්‍යවරයා තීරණය කළේ ය.

නෙතුම් සහ මෙත්සර බ්ලූවෝටර් ලිලී ගාර්ඩ්න්ස් සීමාවට ඇති පිවිසුම් කොන්ක්‍රීට් මාර්ගයෙ හිමායාගෙ නිවසට මීටර් සියයක පමණ දුරින් එමින් සිටියහ. සිදු වූ ප්‍රමාදය නිසා කැලුම් වෙනදාට වඩා වේගයෙන් වාහනය පදවන්නට විය. නිමාලි පැවසූ මඟ සලකුණු බලමින් පැමිණෙමින් සිටියේ ය. කැලුම් එක් මඟකින් ද නෙතුම් හා මෙත්සර වෙනත් මඟකින් පැමිණිය ද මේ වන විට මෝටර් රථ දෙකම නිවස ආසන්නයට පැමිණ තිබුණි.

''පී....ප්.......පීප්..........''



# 19

ඉරි තැලුණු ඉඩෝරය පොළොවෙන් දියකර හරිමින් නිල් කැට සදිසි වැසි බිංදු පොළොවට පැමිණි බව නැවුම් දූවිලි සුවඳ දසත දුවමින් දැනුම් දෙන්නට විය. වියලි තණපත් වැසි දියෙන් පණලබා දෙපයින් සිටගත්හ. වැසි දියෙන් උදම් වූ ගල් බොරළු වැසිදිය කරපින්නාගෙන මාවත් දිගේ දුවන්නට විය. දුර අහසේ සිටි වැහිදියට අතවැනූ සියලු දෙනා වැසිදිය සිසිලස විඳිමින් සැනසෙන්නට වූහ.

කැලුම්ගෙ වාහනය ගේට්ටුව ළඟදී නළාව හඬවනවිට සුදූ ආච්චිඅම්මට සහ නිමාලිට දැනුන සතුට ද ඉරි තැලුණු පොළොවට වැටුණ සිසිල් වැස්සක් බඳුවිය. දෙදෙනාම නැගිට ඉදිරිපස දොරටුවෙන් එළියට පැමිණියෙ ගෞරව පෙරදැරිව ය.

''සමාවෙන්න මම ගොඩක් ප්‍රමාද වුණා.... කාර් එක ගන්න සර්විස් එකට ගිහින් පරක්කු වුණා. කෝල් එකක් දෙන්න විදිහක් තිබුණෙ නෑ ෆෝන් එක ඕෆ් වෙලා...'' කැලුම් වාහනෙන් බැස්සේ ප්‍රමාදයට හේතු දක්වමිනි.

''ඒකට කමක් නෑ ඩොක්ටර්......'' මෙතෙක් හදවත රිදවගනිමින් ඇසිපිය නොහෙලා පාර දෙස බලා සිටි දෙදෙනා සතුටින් හා ගෞරවයෙන් වෛද්‍යවරයා පිළිගත්හ.



Scanned by CamScanner

කැලුම් කතා බහ කරන අතරෙ හිමායාගෙ දෑතින් හැඩවුණු සිතුවම් දෙසත් ජායාරූප දෙසත් බලන්නට වූයේ ය. ඒ අතර නිමාලි සිතුවම් පිළිබඳ විස්තර කර දුන්නා ය. සිතුවම් ගැන විස්තර කිරීමට වැඩි යමක් නොදන්නා සුදු ආච්චිඅම්මා වෛද්‍යවරයාට උණුසුම් කිරි කෝපි කෝප්පයක් පිරිනැමුවා ය.

"හරිම ලස්සනයි..... හිමායා කොච්චර දක්ෂ කෙනෙක් ද? අම්මෙ ඔයා දුව ගැන හිතලා දුක් වෙන්න එපා. කතාවක් තියනවනෙ එක පාරක් වැහෙනකොට තව පාරවල් කීපයක් විවර වෙනවා කියලා. හිමායා උපතින් මෙහෙම වුණාට එයාට ලොකු හැකියාවක් ලැබිලා තියනවා. මට හිමායව දෙපයින් ඇවිද්දවන්න බැරි වුණාට මම හොඳ මානසික මට්ටමට ගේනවා. ඊට පස්සෙ අම්මට, හිමායව ලංකාවේ නෙවෙයි ලෝකෙ ම ප්‍රසිද්ධ කෙනෙක් කරන්න පුළුවන්"

නිමාලි සහ සුදු ආච්චිඅම්මා දෑස්වල සතුටු කඳුළු පුරවාගෙන බලාසිටියහ. පතුල මතුවෙන්නට ආසන්න අඩු කෝප්පය බත්දෙසියේ තැබූ කැලුම් දෑස් නිදහස් කරගත්තේ ය.

අහසින් බිමට වැටෙන වැසිදිය එකසීරුවට පතිතවූයේ ය. මෙත්සර සහ නෙතුම් විවරවූ ගේට්ටුව ඉදිරිපස වාහනය නතර කළේ පුදුමයෙනි.

"මෙත්තො.. මම මෙයාව දකපු දවසෙ ඉඳලා මාසයක් විතර ම මෙතනින් ගියාට මේ ගේට්ටුව ඇරලා තියනවා දැක්කෙ අද විතරයි."

"නෙතුම්.... අපි වාහනේ ඇතුළට අරන් ගිහිල්ල ම බොරුවට නමක් හරි එඩ්‍රස් එකක් හරි අහමු. අපිට එතකොට ගෙදර ඉන්නෙ කවුද කියලා හරි බලාගන්න පුළුවන්නෙ"

"ඒකත් නරක ම නෑ..... ඒත් මේ වැස්සත් එක්ක...." තොරතුරු දැනගැනීමට උවමනාව තිබුණ ද නෙතුම්ගෙ සිත කලබල වී ඇත. පාර දිගේ ගලන බොරදිය රිය සක තෙමාගෙන ගලා ගියේ ය.

"නෙතුම් මෙහෙම පාරට වෙලා බකන්නිලාගෙන ඉඳලා වැඩක් නෑ.. ජනේලෙත් වහලනෙ.. එක්කො ගේට්ටුවෙන් ඇතුළට දාමු එහෙම නැත්තං යමු..." නෙතුම්ගේ දෙගෙඩියාව හමුවේ මෙත්සර පැවසුවේ තරමක කේන්තියෙනි.





"මන එකක් වෙන්ඩ යමු." නෙතුම් සැකහැර තීරණයක් ගත්තේ ය.

"ඔන්න ඔහොම කෙළිං හිටපං නැත්නං ලව් කරන්න බෑ බං.... මෙ තනියම එන්ඩ තිබුණෙ එහෙනම් මෙලහකට තොරතුරු අරගෙන යන්නඩත් ගිහින්." කතා කරමින් මෙත්සර වාහනය මිදුලට ගත්තේ ය.

"නෑ... බං බැන්නොත් .."

"ලැජ්ජවයි බයයි එක්ක ලව් කරන්ඩ බෑ බං."

තණ කොළ අතර වූ ගල් දෙපේළිය දිගේ මීටර් පනහක් පමණ ඉදිරියට ගිය වාහනය නතර වූයේ ය. මිදුල පුරා තිබුණු විසිතුරු මල් පඳුරු වැසි දියෙන් නෑවී තිබුණි.

"මෙත්තා..... අර කාර් එකක් දොර ළඟ නවත්වලා තියනවා. ගේ ඇතුළෙ කවුද කට්ටියක් ඉන්නවා... දැන් ගියොත් නං අමුවට නා ගන්න වෙනවා. හරියන් නෑ.... රිවර්ස් කරපං..... රිවර්ස් කරපං...." නෙතුම් මෙත්සරට බලකරන්නට විය.

"ගෙවල්වල වාහන මිනිස්සු ඉන්නවා තේන්නං. ඔහොම බය වෙලා බෑ...."

"බය නෙවෙයි බං...."

"මම කියන්නං.. කෝ අර සීට් එකේ තියන කුඩේ ගනිං..... උඹත් එක්ක ආවොත්නෙ මොකුත් කරන්න බැරි... උඹ ඉඳපං මම ගිහින් අහගෙන එන්නං.. කාර් එකත් මෙතනම තිබ්බචයි.. එතකොට කොහොමත් හිතනවානෙ පාර වැරදිලා කියලා...."

නෙතුම්ට විහිළු කළ මෙත්සර වැස්සෙන් නොතෙමීමට දිගහැරගත් කුඩයත් අතින් ගෙන ඉදිරිපස දොර පැත්තට ඇවිද ගියේ ය. වැස්ස එක්වරම පොහොසත් වන්නට පටන් ගත්තේ ය. කුඩේට අකීකරුවූ වැහිදිය මෙත්සර තෙමාදැමුවේ අනුකම්පා විරහිතව ය. තමා වෙනුවෙන් තෙමෙන මිතුරා දෙස නෙතුම් බලාසිටියේ අනුකම්පාවෙනි.

"පව් මෙත්තා මං හින්දා තෙමෙනවා.... මෙත්සරට බනී ද, ඒත් මෙත්සර මං වගේ නෙවෙයි තැනේ හැටියට ඇට නැති දිව කරකවලා



Scanned by CamScanner

මොනවා හරි කියලා ඇඟ බේරගෙන එයි'' නෙතුම් වාහනයටවී ජීරාෆ් මෙන් ගේ දෙස බලාගෙන කල්පනා කළේ ය.

ඉදිරිපස දොරටුව වෙත ළඟාවූ මෙත්සර කුඩය පසෙකින් තබා විදුලි බොත්තම තදකර නිවැසියන් පැමිණෙනතුරු බලාසිටියේ ය.

''සුදු ආච්චියේ කවුද බලන්න.....'' වෛද්‍යවරයා සමඟ කතාබහේ යෙදී සිටි නිමාලි සුදු ආච්චිඅම්මාට පැවසුවා ය.

''ඇයි දරුවො.....'' සුදු ආච්චිඅම්මා විමසුවා ය.

''ආච්චි අම්මෙ...... මේ හරියෙ ඉන්නවද සඳුන් සම්පත් කියලා ඩොක්ටර් කෙනක්..... එයා අපේ හොස්පිට්ල් එකේ වැඩ කළේ. අපිට ගේ හොයා ගන්න විදිහක් නෑ..'' මෙත්සර තමන් වෛද්‍යවරයෙක් බව හැඟවීමට එසේ පැවසුවේ අභිතක් නොසිතීම පිණිස ය.

''මේ හරියෙ නං එහෙම කෙනෙක් අපි දන්නෙ නෑ.. අලුතින් ආපු කෙනෙක් ද දන්නෑ... ඉන්න මම ලොකු බේබිගෙන් අහලා කියන්නං..''

සුදු ආච්චිඅම්මා ගෙතුළට පිටුපා ගිය අතර මෙත්සර ඇය පැවසූ දේවල් යලි ආවර්ජනය කළේ ය.

''මේ ආච්චි ලොකු බේබි කිව්වෙ.... ඒ කියන්නෙ පොඩි බේබි කෙනෙකුත් ඉන්ඩ එපැයි. ලොකු බේබි කියන්නෙ අක්කා වෙන්න ඇති. පොඩි බේබි කියන්නෙ නංගි වෙන්න ඇති. කවුද දන්නෙ නෑ.. නෙතුම්ගෙ කෙල්ල......'' මෙත්සර කල්පනා කරමින් බලාසිටියේ දූත් දූත් තරුණියක ගෙතුලින් අහම්බෙන් හෝ එහා මෙහා යනු ඇතැයි සැකයෙනි.

''නෑ.... පුතේ එහෙම කෙනෙක් මේ හරියෙ නැතිලු... ලොකු බේබිට එන්න විදිහක් නෑ. දොස්තර මහත්තයා එක්ක කතාවක්.''

''ආ..... ඇත්ත ද?. අපිට මේ හදිසි පණිවිඩයක් කියන්න.....''

මෙත්සර ඒ මොහොතේ ගොතන ලද බොරුව නියම ඇත්තක් ලෙසින් පැවසුවේ නළල රැළි ගන්වාගෙන ය.





''මේ වැස්සෙ හොයන්න අමාරුයි හැමෝම ගේට්ටු දොර ජනෙල් වහගෙන ඉන්නෙ.... වැස්ස වැඩි කරනවා පරෙස්සමට යන්න දරුවො..''

ආච්චිගෙන් යමක් දැන ගැනීමට සිතා සිටිය ද පරෙස්සමින් යන්න කියූ බැවින් තව දෙයක් ඇසීමට මෙත්සරට ඉඩක් නොවී ය.

''හොඳයි ආච්චි අම්මෙ ගිහින් එන්නං.''

වැඩි ප්‍රමාදයක් ලතවීමක් නැතිව සුදු ආච්චිඅම්මා ගේ ඇතුළට ගියා ය. මෙත්සර හිතේ බලාපොරොත්තු මඳක් අකුලගෙන හිසට කුඩය ඉසලාගෙන වාහනයට පැමිණියේ ය.

වෛද්‍ය කැලුම් සමඟ වැදගත් සාකච්ඡාවක පසුවූ බැවින් නිමාලි මෙත්සරට මුණ නොගැසුණි. නිමාලි පැමිණියේ නම් ප්‍රදර්ශනය දිනයේ හමුවීම මතක් වීමට ඉඩ තිබුණි. එසේ වූයේ නම් මෙත්සරට ගෙට ගොඩවී කතාබහ කරන්නට හැකිය. කැලුම් මීට පෙර මෙත්සරව නොහඳුන බැවින් එයද ගැටලුවක් නොවේ. එහෙත් යහළුවා පිළිබඳ විමසන්නට ගියේ නම් සියලු දෙනා මුණගැසෙන්නට තිබුණි. එහෙත් නිමාලි නොපැමිණ සුදු ආච්චිඅම්මා පැමිණීම නිසා සියල්ල උඩු යටිකුරු විය.

හිමකුමාරි, නෙත්සරණී සහ ජනේලයෙන් ආදරය කරන දෙවඟන යන අය එක්කෙනෙකු බව පමණක් නොව හිමායා යනු තමන් ජනේලයෙන් මුහුණ පමණක් ම දකින සිහින කුමාරිය නොවන බව නෙතුම්ටත් මෙත්සරටත් දැන ගැනීමට හැකි වනු ඇත. එසේ වූවානම් නෙතුම් හිමායා ගැන මැවූ සිහින ලොව විසිකර පසුනොබලා පලා යනු ඇත. එහෙත් එසේ සිදු නොවී තව දුරටත් හිමායා සහ නෙතුම් දෑස්වලින් වසා තැබීමට දෛවය ක්‍රියාකරන ලදි.

''මම නිසා හොඳට ම තෙමුනා නේද?'' නෙතුම් මෙත්සරගෙන් විමසුවේ මහා අපරාධයක් කළ වරදකරුවෙකු ලෙස සිතමිනි.

''කමක් නෑ මචං.... තව විනාඩි දහයෙන් ගෙදරනෙ.... ඩෝන්ට් වොරි...''

''මොකද වුණේ....... බැන්න ද?''



Scanned by CamScanner

"නෑ.... බැන්නෙ නෑ.... මම හිතන්නෙ සර්වන්ට් කෙනෙක් හරි ආච්චිඅම්මා කෙනෙක් හරි වෙන්න ඇති. වැඩි දෙයක් දැන ගන්න බැරි වුණා. මට අහන්න තිබුණ ඒවා අහන්න වෙලාව මදි වුණා. ඒ ආච්චි නං කරුණාවන්තයි."

"ඉතිං මොනවද කිව්වෙ.... උඹ කොහොම ද ඇහුවෙ..." නෙතුම් නොඉවසිල්ලෙන් ඇසුවේ ය.

"මම මොකක් ද බොරු නමක් කියලා එහෙම ඩොක්ටර් කෙනෙක් ඉන්නව ද ඇහුවා. ඊට පස්සෙ ආච්චි කිව්වා, එහෙම කෙනෙක් නං මේ හරියෙ නෑ.. මම ලොකු බේබිගෙන් අහන්නං කියලා."

"ම්... ඒ කියන්නෙ..........."

"ඒක තමයි ලොකු බේබි කෙනෙක් ඉන්නවා නං පොඩි බේබි කෙනෙකුත් ඉන්න එපැයි.. උඹ කොයි බේබිට දන්නෑ ජනේලෙන් බැලුම් හෙලන්නෙ.."

"ඒකනෙ...... මම දකින කෙනා වයස අවුරුදු විස්සක් හරි ඒ ආසන්න වයසක කෙනෙක් බං."

"ඒත් බං පොඩි බේබි කිව්වෙ ඊට වැඩිය පොඩි කෙනෙක් තව ඉන්නව ද දන්නෑ... අනිත් එක තමයි ගෙට ගිහින් ඇවිත් එහෙම කෙනෙක් දන්නෑ කියලා මේ ආච්චි කිව්වා ලොකු බේබිට එන්න විදිහක් නෑ දොස්තර මහත්තයා එක්ක කතා කර කර ඉන්නවා කියලා...."

"ආ......... එහෙනං වැඩේ හරි ..... මම එක්ක ඔරොප්පුවට කෙල්ල වෙන එකෙක් එක්ක සෙට්වෙලා වෙන්න ඇති බං.... දැන් වැඩක් නෑ...."

"එහෙම ම කියන්නත් බෑ.....බලමුකො.. මම තව මොනවා හරි අහන්ඩ කියලා හිතාගෙන හිටියෙ, මේ ආච්චි කිව්වනෙ... පුතේ වැස්සත් වැඩි කරන්න එනවා පරිස්සමට යන්න කියලා.... ආය තව මොනා අහන්ඩ ද මම ගිහින් එන්නං ආච්චිඅම්මෙ කියලා ආවා."





"මදූයි නෙත්මි මට කරපු හරිය... හිහ්.... අපරාදෙ මට ගාතට සෙට් වෙගෙන ආවා විතරයි. ආය මම කවදාවත් කෙල්ලන්ට ලව් කරන්නෑ නෑ බං..." නෙතුම්ගේ හඬ දුක්බර විය. මෙත්සර වෙනත් අවස්ථාවල විහිළු කළද නෙතුම්ගෙ මානසික තත්ත්වය තේරුම් ගෙන නිහඬව සිටියේ ය. නෙතුම් අත්දෙක ඔසවා පිටුපසට ගෙන අසුනෙ දවටාගෙන ඉදිරිපස වීදුරුවෙන් පාර දෙස බලාගෙන කල්පනා කරන්නට වූයේ සියල්ල සුළඟට ගසාගෙන ගිය විලාසයකිනි.

හිමායා පිළිබඳ දෛනික විස්තර දැනගැනීමෙන් පසු වෛද්‍යවරයා අතීත තොරතුරු දැනගැනිමට සූදානම් වූයේ ය.

"දැන් හිමායගෙ වයස කීයද?"

"විසි එකයි."

"අම්මා මට දැන් කියන්න.. හිමයාගෙ පුංචි කාලෙ ඉඳලා මේ වෙන තුරු වුණ හැම විස්තරයක් ම, සමහරක් විට පරණ දේවල් අවුස්සලා මම අම්මගෙ හිත රිදවනවා වෙන්න පුළුවන් .... ඒත් ඒ තොරතුරුවලින් මට හිමායගෙ මානසික තත්ත්වෙ අඳුන ගන්න ලොකු උදව්වක් මොකද මට මෙයාගෙ හිත ගැන දැන ගත් නැතිව ට්‍රීට්මන්ට කරන්න බැහැ."

"හොදයි ඩොක්ටර් මට තේරෙනවා."

නිමාලි දිගු සුසුමක් හෙලා සිත නිදහස් කරගෙන අතීත කතාව වෛද්‍යවරයා හමුවේ ආවර්ජනය කිරීමට සූදානම් වූවා ය. නෑදෑයකු නොවූවද සියල්ල දන්නා සුදු ආච්චිඅම්මා ද සැදී පැහැදී බලා සිටියේ නිමාලිට අත ඇරෙන දෑ සිහිකිරීමට මෙනි.

කැලුම් සටහන් පොතක් සහ පෑනක් ගෙන වැදගත් වන යමක් වේ නම් සටහන් කරගැනීමට සූදානමින් නිමාලි දෙස බලා සිටියේ ය.

"ඩොක්ටර් මම තමයි අපේ පවුලෙ එකම දරුවා. කැම්පස් ඉන්න කාලෙදිම යි මම දුම්දූ ආශ්‍රය කරන්න පටන් ගත්තෙ.... ගෙදරින් ප්‍රශ්න තිබුණත් අපි දෙන්න ම හොඳ තත්ත්වෙක හිටපු නිසා අම්මලා



Scanned by CamScanner

අපිට විරුද්ධ වුණේ නෑ... අපි බැඳලා සතුටින් අවුරුද්දක් විතර හිටියා... ඊට පස්සෙ දෝණි ලැබෙන්න ලෑස්තිවෙලා ඉන්නකොට අපි වෛද්‍යායතනවලට නොවරදවා ම ගියා මුලින් ඩොක්ටර්ස්ලා කිව්වා, අසම්පූර්ණ කළලයක් කියලා.. ඩොක්ටර්ස්ලා තීරණය කරා අයින් කරන්න... එහෙම කියපු ඩොක්ටර්ස්ල ම පස්සෙ කිව්වා. දරුවා හොඳින් ඉන්නවා කියලා. දුවෙක් කියලත් කිව්වා. අපි දෙන්නා ඊට පස්සෙ ගොඩාක් සතුටු වුණා අපි ලස්සන නම් ලියාගෙන රෝස පාට ඇඳුම් මහගෙන ලෑස්ති වුණා. කාලෙ ගෙවිලා ගිහින් මම හොස්පිටල් ඇඩ්මිඩ් වුණා. දවස් එක හමාරක් විතර හොස්පිට්ල් එකේ ඉඳලා දෝණිව ඉපදුනා... ඒ දවස එනකං අපි සතුටින් බලාගෙන හිටියට ඒ දවස අපේ හිත්වලට ගිනි ගොඩක් එකතු වුණා. මම දරුවා බලන්න ඉල්ලනකොට ඩොක්ටර්ස්ලා මට දරුවා දුන්නෙ නෑ... පස්සෙ මම අඬලා දරුව මගේ අතට ඉල්ලගත්තා..... ඩොක්ටර්......... මාස ගාණක් බලාගෙන ඉඳල මගේ තුරුළට ආපු දෝණිගෙ කකුල් දෙක මුලින් ම තිබුණෙ නෑ....... කඳයි අත් දෙකයි විතරයි තිබුණෙ..... මට දෝණි ගැන ගොඩාක් දුක හිතුනා...... මම ඒ වෙලාවෙ දෝණිව අතේ තියාගෙන මේ ලෝකෙ කාටවත් මේ වගේ දෙයක් වෙන්න එපා කියලා ඇස් දෙක පියාගෙන දෝණිව පපුවට තුරුළු කරගෙන ප්‍රාර්ථනා කළා....."

කතාව මොහොතකට නතර කළ නිමාලි දිගු සුසුමක් පිටකළා ය. සුදූ ආච්චිඅම්මා දෑසෙන් වැටෙන කඳුළු චීත්ත පොටින් පිසදා ගත්තා ය. මීට සමාන අවස්ථා අත්දැක තිබුණ ද වෛද්‍යවරයා මේ දුක්බර කතාව අසා සිටියේ ආයාසයෙනි.

"ඊට පස්සෙ.." වෛද්‍යවරයා නැවතත් නිමාලිව කතාවට යොමු කළේ ය.

"ඊට පස්සෙ අපි අපේ දරුවට කිසිම වෙනස්කමක් කරන්නෙ නැතිව ආදරෙන් බලාගත්තා. උණ හපුළු අම්මට එයාගෙ දරුවා මැණිකක් වුණා වගේ අපිට අපේ දරුවා මැණිකක් වුණා. අපි තවත් දරුවෙක් හදන්නෙ නැතිව මේ දරුවා හදාගත්තෙ තව දරුවෙක් හිටියොත් මෙයාට අසාධාරණයක් වෙයි කියලා හිතලා. අපි දෙන්නගෙ ජීවිතවලටත් වැඩිය අපි දෝණිගෙ ජීවිතේ ගැන හිතලා හැම දෙයක්





ම තීරණය කළා. අපි දෙන්නම ජොබ් එකත් කරගෙන දොණිව සතුටෙන් තිබ්බා. මගේ අම්මයි තාත්තයි ගොඩාක් උදව් කළා. අම්මයි තාත්තයි නැතිවුණාට පස්සෙ ඒ අඩුව මේ සුදූ ආච්චිඅම්මා එයාට පුළුවන් විදිහට පිරෙව්වා...."

සුදූ ආච්චිඅම්මා කඳුළු පිරෙන දෑස් ආයාසයෙන් රවටගෙන නිමාලි දෙස බලා සිටියේ හදවතින්ම උපන් කරුණාවෙනි.

"මෙයා පොඩි කාලෙ දඟලලා කතා කරලා හිටියද?"

"ඔව් ඩොක්ටර් අනිත් ළමයින්ට වගේ දණගාන්න කකුල් තිබුණෙ නැති වුණාට අත් දෙක බිමට තියලා ගේ පුරා ම ගියා. ටිකෙන් ටික කතා කරන්නත් පටන් ගත්තා. පොත් පෑන් අරගෙන කුරුටු ගාන්න පටන් ගත්තා. ඊට පස්සෙ අපි දෝණිව නර්සරි එකකට දැම්මා. අපි දෙන්නගෙන් එක්කෙනෙක් උදේට වඩාගෙන ගිහින් තියලා එනවා දවල්ට ගිහින් ආයෙත් වඩාගෙන ගෙදර අරන් ආවා. මේ කාලෙ දරුව දකින අය ඕපාදූප අහන්නත්, සානුකම්පිතවත් තොරතුරු ඇහුවා.. ඒ හැම වෙලාවක දිම අපේ හිත්වලට ලොකු වේදනාවක් දැනුනා. ටිකෙන් ටික දෝණි ලොකු වෙනකොට අපි දෝණිව සමුද්‍රදේවි බාලිකාවට බාරදුන්නා. මුලදි කැමති වුණේ නෑ.. පස්සෙ දෝණිගෙ දක්ෂකම් දැකලා කැමති වුණා."

"එතකොට කොයිකාලෙදී ද කතාකරන එක නතර කළේ...."

"ම්..... එදා තමයි ඩොක්ටර් මගේ හදවතට දෙවැනි වතාවට ගිනි ගත්තෙ.... හිමායා ඒ වෙනකොට හිටියෙ දහය වසරේ ඒ වෙනකොට හිමායා වැඩිවියටත් පත්වෙලා හිටියෙ..... පොඩිකාලෙ වගේම අපි දෙන්නගෙන් එක්කෙනෙක් උදේටයි හවසටයි ඉස්කොලෙට යනවා. පොඩි දරුවෙක් වගේ දෝණි වඩාගෙන තමයි එක්ක ගියේ.. මුලදි ළමයි විහිළු කළා. පස්සෙ ඉස්කොලෙ ගුරුවරු, ළමයි ඔක්කොම හිමායට ගොඩාක් ආදරේ වුණා.. ඒ නිසා දවල් දවසේ හැමෝම හිමායගෙ හැම වැඩක් ම කරලා දුන්නා. දවල් දවසේ රෝද පුටුව එහෙ මෙහෙ තල්ලුකරගෙන ගියෙ යාළුවොයි ගුරුවරුයි... හිමායා හැමදා ම පන්තියේ පළවැනියා වුණා. ඉගෙනීමට වගේ ම කවි සිංදු ලියන්න චිත්‍ර අඳින්නත් දක්ෂයි.. ලස්සනට සිංදු කියන්නත් පුළුවන්...



Scanned by CamScanner

එක දවසක් ඉස්කොලෙ ගිහින් එක්ක එන්න ගියෙ දුමිඳු.... හිමායගෙ තාත්තා.... මමත් එදා නිවාඩු දාලා ගෙදර හිටියෙ දුමිඳු දෝණි එක්ක එන්න ගියා මම ගෙදරට වෙලා දවල් කෑම හැදුවා.''

''ඒ වෙද්දි හොඳට කතා බහ කරනවා, කනවා, බොනවා කිසිම වෙනසක් නෑ....'' නිමාලිගෙ කතාව මැදින් කැලුම් විමසුවේ ය.

''වෙනසක් නෑ අනිත් ළමයින්ගෙන් මෙයා වෙනස් වුණේ කතුල් නැති එකෙන් විතරයි.. අනිත් හැමදෙයක් ම සාමාන්‍ය විදිහට කළා.... ඉතිං එදා දෝණියි එහා ගෙදර සඳුනි දුවයි දෙන්නවත් ජීප් එකේ දාගෙන දුමිඳු එනකොට දෝණි මිදි ඕනෙ කියලා. ඊට පස්සෙ දුමිඳු වාහනේ පාර්ක් කරලා. එතන තිබුණ කහ ඉරෙන් පාර පැනලා කාර්ගිල්ස් එකට යන්න... එතකොට වේගෙන් ආපු මොන්ටෙරෝ එකක් දුමිඳුව යටකරගෙන ගිහිල්ලා....... හිමායා හැමදෙයක් ම දැකලා. ඒ වෙලාවෙ තාත්තේ.......... තාත්තේ....... කියලා පැය භාගයක් විතර නතර කරන්නෙ නැතිව ම කෑගහලා තියනවා. ඒත් එක්ක ම සිහිනැතිවෙලා වැටිලා. ළඟ හිටපු අය දුමිඳු ඉස්පිරිතාලෙට අරන් ගිහිල්ලා... ඒත් ඒ වෙනකොටත් දුමිඳු නැතිවෙලා.... දෝණි පැයගාණක් ඇස් ඇරලා නෑ.. සඳුනි දුවලගෙ අම්මලයි පොලිසියෙ අයයි දුවවත් රෝහල් ගතකරලයි මට ඇවිත් කිව්වෙ.... පස්සෙ තමයි ආරංචිවුණේ ඒ මොන්ටෙරෝ එකේ ගිහින් තියෙන්නෙ ඇමති කෙනෙක්ගෙ පුතෙක් කියලා. දවල්ට කෑම හදන්න කියලා දුව එක්ක එන්න ඉස්කොලෙට ගිය දුමිඳු ගෙදර ආවේ පහුවදා උදේ මල්ශාලාවෙ වාහනේක, මූණයි ඔළුවයි ඔක්කොම බැන්ඩේජ් කරලා වහලා තිබුණා. දැකපු අය කිව්වෙ ඔළුව තිබුණෙ නෑ කියලා. දුව දුමිඳුගෙ පෙට්ටියවත් දැක්කෙ නෑ.... එදා ඉඳලා දෝණියි මමයි මේ ලෝකෙ තනි වුණා. දුව ගෙදර ගෙනාවෙ මාසෙකින්.. ඒ වෙනකං එයා ඇස් ඇරියෙවත් කතා කළේවත් නෑ... ඊට පස්සෙ දෝණිට සිහිකල්පනාව එන්න සෑහෙන කාලයක් ගියා. ඒත් කටෙන් කිසිම වචනයක්වත් සද්දයක්වත් පිට කළේ නෑ....''

''හිමායා මනෝවෛද්‍ය සායනයකට එක්ක ගියෙ නැද්ද.?''

''දැම්මා ඒත් මාස ගාණක් ගියා වැඩක් වුණේ නෑ.... ඒ ඩොක්ටර්ස්ලා කිව්වා දරුවට ගොඩාක් ආදරේ කරලා... එයා මොකක්





හරි වැඩක යොදවන්න කිව්වා. ඊට පස්සෙ මම චිත්‍ර අඳින්න ඕන කරන දේවල් දීලා උඩ තට්ටුවේ කාමරයක් එයාට ලෑස්ති කරලා දුන්නා. එතන බැල්කනියට එයාට හොඳට අහස වටපිටාව බලන්න පුළුවන් විදිහට හදලා දුන්නා. ටිකෙන් ටික ආයෙත් හොඳ අතට හැරුණා. හැබැයි කතා කරේ නෑ...''

''එයා කොහොම ද ඔයාලත් එක්ක අදහස් හුවමාරු කරගත්තෙ..''

''අත් දෙකෙන් කියනවා, පෙන්නනවා, කොළවල ලියනවා. හිනාවෙනවා. ඉරියව්වලින් එයා කියන දේ අපිටත් පුරුදු වුණා.''

''එතකොට මුළු දවසම මෙයා කාමරේට වෙලා තනියම ද හිටියෙ''

''තනියම කියන්නෙ, මම උදේ අට හමාරට වැඩට ගියා ම ගෙදර එනකොට පහ විතර වෙනවා. සුදු අච්චිඅම්මා විතරයි ගෙදර ඉන්නෙ.. මම උදේ තේ එක දීලා ගියාට පස්සෙ කෑම බීම හැමදෙයක් ම හොයලා බලලා දෙන්නෙ සුදු ආච්චිඅම්මා.''

''ආච්චි අම්මෙ දවල්ට හිමායා සතුටින් ඉන්නව ද කම්මැලි කමින් ද ඉන්නෙ..'' කැලුම් නිමාලිගෙන් මොහොතකට දෑස් ගෙන සුදු ආච්චිඅම්මාගෙන් තොරතුරු විමසුවේ ය.

''මම නිතරම කාමරේට යනවා. සුදු බේබි චිත්‍ර අඳිනවා සිංදු ලියනවා. මොනවා හරි දෙයක් කර කර තමයි ඉන්නෙ.''

''එයා කවදාවත් දුකෙන් ඉන්නවා දැකලා නැද්ද?''

''එක දවසක් එහා ගෙදර ළමයි දෙන්න අම්මයි තාත්තයි එක්ක බෝල ගහනවා බලාගෙන හිටියෙ ඇස්වල කඳුළු පුරවගෙන හිටියා. ඊට පස්සෙ දවසක් දෙකක් ඇස්වල කඳුළු තියෙනව දැක්කා කල්පනා කර කර ඉන්නවත් කීප දවසක් දැක්කා. ඒත් මම ගියාට පස්සෙ හිනාවෙලා මට එයා ඇඳපු චිත්‍ර පෙන්නුවා.''

''අම්මට මෙයා ගැන වෙනසක් දැනුනෙ කවදා ඉඳලද?''

''එයා අඳින චිත්‍රවල වෙනසක් තිබුණා.. ජනේලෙ ළඟට වෙලා ඉන්න කීප දවසක ඇස්වල කඳුළු තිබුණා. දවසක් රෑ කළුවරේ ජනේලෙ ඇරලා එළිය බලාගෙන හිටිය එදත් අඬලා තිබුණා.''



Scanned by CamScanner

"මෙයාව එළියෙ ඇවිදින්න එක්ක යන්නෙ නැද්ද?"

"මම නිවාඩු දවස්වලට එක්ක යනවා.. ඒත් එක දවසක් මම එකට ගිහින් එනකොට කලබල වෙලා ඉස්සි ඉස්සි වටපිට බැලුවා. මට අදටත් හිතා ගන්න බෑ එච්චර චූවමනාවෙන් බැලුවෙ මොකක් දිහා ද කියලා..."

"හිමායාගෙන් මේ ගැන ඇහුවෙ නැද්ද?"

"දෝණිගෙ හිත රිදෙයි කියලා මම මොකවත් ඇහුවෙ නෑ. එයාගෙ හිතට අලුත් බලාපොරොත්තු දුන්නා."

"ඒ කොහොම ද?"

"දෝණි ලියන කවි පත්තරේ පළ කළා. හිමකුමාරි කියලා පළවෙන කවි අපේ දෝණිගෙ.."

"ඕ.......... මම හැමදා ම ආසාවෙන් කියවනවා. ඒ මෙයා ද කවුද දන්නෙ මම එයාගෙ හොඳ පාඨකයෙක්......... ගොඩක් ලස්සනයි...."

"ගිය සතියෙ පුරහඳ හෝල් එකේ දෝණිගෙ චිත්‍ර පන්සියක් තියලා "පැහැසර" කියලා දවස් දෙකක ප්‍රදර්ශනේකුත් කළා.."

"ආ...... ඒක කළේ හිමාය ද? මම පත්තරේ නෝටිස් එක දැකලා එන්න හිටියෙ... මම ඒ දවස්වල අනුරාධපුරේ හිටිය නිසා එන්න බැරි වුණා. මම චිත්‍රවලට හරි ආසයි.. ඒකනේ.. කවුද දන්නෙ මම මේ.. ට්‍රීට්මන්ට් කරන්නෙ මම ගොඩාක් කැමති කලාකාරියෙකුටනෙ... මට ලොකු සතුටක් හිමායා වෙනුවෙන් මේ වගේ දෙයක් කරන්න ලැබුණ එක මම මේ හැම සේවයක් ම නොමිලේ කරලා දෙනවා."

වෛද්‍ය නෙතුම් දිල්හාර මෙන්ම වෛද්‍ය කැලුම් කල්හාර ද හිමායගෙ රසිකයන් ය. නිමාලි හිමායා පිළිබඳ කියූ විස්තරවලින් කැලුම් දැන ගත් නමුදු ඔහුගේ සොහොයුරා වන වෛද්‍ය නෙතුම් සියලු විස්තර හරියාකාරව නොදන්නේ ය.

"එක්ෂිබිෂන් එක ඉවරවෙලා දවස් දෙකක්වත් ගියෙ නෑ..... දවසක් මම වැඩට ගිහින් එනකොට දොර ජනෙල් ලොක් කරගෙන





කියලා සුදු ආච්චිඅම්මා කිව්වා. මම දොර කඩලා බලනකොට දෝණිට කලන්තෙ හැදිලා හිටියා.. අපි දෙන්න වතුර ඉහලා සිහිය ගත්තා... ඒත් ඒ වෙලාවෙ ඉඳලා බලාගත්ත අත බලාගෙන හිටියා."

"ඕ බෙහෙත් ගන්න එක්ක ගියා ද?"

"ඔව් ඩොක්ටර් ආමන්ත ගනේගොඩ ළඟට ගියා ම කිව්වා මානසික කම්පනයක් කියලා."

"ආ..... ආමන්ත ළඟට ගියා කිව්වා නේද? ඔව් මෙයා මොකට හරි බය වෙලා තියනවා. නැත්නං මෙයාට දරාගන්න බැරි දුකක් දැනිලා තියනවා."

"ඒත් ඩොක්ටර් මෙයා කාමරේට ම වෙලානෙ ඉන්නෙ.."

"අපිට එහෙම කියන්න බෑ.. කාමරේ ජනේලයක් එහෙම තියනවා නේද? අපි හෙමින් බලමු. මම දැන් යන්න ඕන.... මම හෙට හවසට එන්නං... සංග්‍රහවලට ගොඩාක් ස්තූතියි මම ගිහින් එන්නං."

"ඩොක්ටර් නෙවෙයි අපි ස්තූතියි කරන්න ඕන.. මම තැන්ක්යූ කියන්නෙ නෑ... ගොඩාක් පිං...."

"මේක මම මානුෂිකව සලකලා කරන දෙයක්, හිමායා කියන්නෙ අපේ රටට විතරක් නෙවෙයි ලෝකෙට ම මිල කරන්න බැරි වටිනා සම්පතක් මේ වගේ දක්ෂ කලාකාරියක් වෙනුවෙන් මම කරන මේ දේ කෙස් ගහක් තරම් දෙයක්වත් නෙවෙයි. බලමු මට කරන්න පුළුවන් උපරිමයෙන් මම හිමායට උදව් කරනවා. දුක්වෙන්න එපා අම්මෙ.. ඕන දේකට මම ඉන්නවා."

"හොඳයි ඩොක්ටර්....."

හිමායා සහ හිමකුමාරි දෙදෙනාම එක්අයෙකු බව දැනගැනීමෙන් පසු කැලුම් බෙහෙවින් සතුටු වූයේ ය. වෛද්‍යවරයාගේ කරුණාව නිමාලිගෙ සහ සුදු ආච්චිඅම්මගෙ සිතට ගොඩවුණ ශක්තිය හිමාලයේ එවරස්ට් මුදුණටද දෙවැනි නොවී ය. හිමායා නිදිකුමරිය සමඟ සිටි බැවින් වෛද්‍යවරයාට හිමාය සමඟ කතාකරන්නට උත්සාහ කිරීමට පවා නොහැකි වුණි.



Scanned by CamScanner

වැස්ස අවසන්වීමෙන් පසු සියුම් හිරිකඩ ද පතිතවී අවසන්විය. බිමදිගේ ගැලූ දියමං පොළොවට සින්නවී තිබුණි. වැහි දිය පාතය කළ ගස් වැල් ආඩම්බරයෙන් වැනෙන්නට විය. ජක... බක... යැයි දිය මැඩියන් තණ පඳුරු අතර හැංගිමුත්තං කරන්නට වුණි. අපහසුවෙන් හැඳ සිටි කිළිටි වැහිවලා ඇඳුම් බිමට අතහැර අහස නිල් සේලයක් දවටාගෙන සිටියේ ය. මහ වැස්සෙන් දිය නාගත් ගස් කොළන් සහ සතා සිව්පාවන්ට උණුසුම දෙන්නට මෙන් කළුවර සළුව පොළොව වසාගත්තේ ය. ඔරලෝසුව අච්ච වැස්ස කළුවර කිසිවක් මායිම් නොකර තම රාජකාරිය ඉටු කළේ ය. මේ වනවිට පැය කටුව හතේ ඉලක්කම පසුකර දුවමින් තිබුණි.

විදුලි පහන් දල්වාගත් වාහනය ගේට්ටුවෙන් පිටව ගියේ ය. කැලුම් කුලී රථය බාරදී තම මෝටර් රථය ගෙන නිවසට යන විට හෝරා දෙකක් පමණ ගෙවී ගියේ ය. සවස කැලුම්ගේ වාහනය ගරාජයෙන් ගැනීමට හැකිවූවා නම් නෙතුම්ට වාහනය හඳුනා ගැනීමට තිබුණි. එහෙත් සියල්ල වසන්වීමට අවශ්‍ය ලෙස වටපිටාව ඉබේටම සකස්වී තිබුණි.



# 20

පෙරදා හැන්දෑවේ වැසි දියෙන් පෙඟුණු ගුරු පැහැ පොළොවේ ඇවිද ගිය අපා දෙපා සිව්පා පා සටහන් අතර දියබරි, මිනිස්, පූනබ, පූස්, ගෙම්, ඉබි, ගව ආදී සටහන් සිතාමතා කළ රටා මෝස්තරයක් බඳු ය. ළපටි දළුපත් සිරසින් ගත් තණ පඳුරු අහසට එසවී බලාසිටින්නට වූයේ පොළොවේ සාරයෙන් ජනිතවූ තම දරුවන් හිරුගේ කිරණින් හදාවඩා දෙන ලෙස අයදින්නාක් මෙනි.

විසිතුරු දසුන් සපිරි සොබාසිරි ගෙන අහස පොළව තව දවසක විස්තර විදහා පෑවද ජනෙල් කවුළුවෙන් වගී වූ රුවට පෙමින් බැඳී ආතුරවූ නෙතුම්ගේ හිත නොයෙක් අනුමාන ඔස්සේ දුවමින් තම හද පුරා පායා බැස ගිය සරා සඳ කොහිදැයි සොයන්නට විය. උදෑසන රෝහලට යන නෙතුම් රාජකාරිය ඉටු කිරීම හැරුණු විට කතාබහ කළේ මෙත්සර සමඟ පමණි. ඒ වචන කිහිපය ද හිමායා ගැන ය.

''මල්ලී..... මල්ලී..... පොඩී.......... ඔයා මොකද කරන්නෙ..''

''මම වැඩට යන්න ලෑස්ති වෙනවා....''

''මෙච්චර උදේ ම...''

''මම වෙන ගමනකුත් ගිහින් වැඩට යන්නෙ....''

''ඇයි ලොකු ..... මොකක් ද වෙන්න ඕන.'' නෙතුම් සිතේ වූ වේදනාව සඟවාගෙන විමසුවේ ය.



Scanned by CamScanner

"නෑ.. කතාවක් කියන්න. මම ඊයෙ හවස ට්‍රීට්මන්ට් කරන්න ගියා ගෙදරකට... මට හරි පුදුමයි... මා.....ර ලස්සන කෙල්ලෙක්..... ඒක මෙහෙම හදිස්සියේ කියලා වැඩක් නෑ... මම පස්සෙ කියන්නං දූන් පොඩීට පරක්කුවෙයි ඔයා යන්න."

කැලුම් හිමායා පිළිබඳ විස්තර දිගහරින්නට සූදානම් වුවද නෙතුම්ට ප්‍රමාද වන බැවින් පසුවට කල්තබන ලදි.

කැලුම් එම ගැහැනු ළමයාගේ අලංකාරය ගැන පවසන විට නෙතුම්ට එක්වර ම සිතුනේ "ලොකුට වැඩිය ලස්සන ගෑනු ළමයෙක් මට ඉන්නවා.... ජනේලෙ ගාව හිටපු ළමයා දැක්කනං එයා පුදුමවෙනවා". කැලුම් කියන්නට පෙරුම්පුරන්නේත් ජනේලය ළඟින් මුහුණ දැක දුක් වේදනා ලබන්නේත් එකම තරුණියට බව නෙතුම් සිහිනෙනුදු නොසිතන්නේ ය.

"මම යනවා ලොකු... අම්මට ගියා කියන්න." වෙනදා මවගේ දෙපා නැමද අවසර ගෙන නිවසින් පිටවන නෙතුම් අයියාට පවසා යන්නට ගියේ ය.

"පොඩී ලන්ච්..."

"අද එළියෙන් ගන්නවා.."

"අම්මේ...... පොඩී ගියා...."

"ම්.... ඒ මොකද උදේ පාන්දර ම මටවත් නොකියා...."

"මටත් ඒක හිතුනා........."

"වැඩට ද ගියෙ....."

"වෙන ගමනකුත් ගිහින් වැඩට යනවා කිව්වා.."

"ලොකු...... මල්ලි මොකක් නමුත් පඹ ගාලක පැටලිලා වගේ..... දවසක් සපත්තුත් දාගෙන ඇඳේ හාන්සිවෙලා හිටියා මම හිතුවෙ ලෙඩක් කියලා. පස්සෙ දවසක් දෙකක් දැක්ක කල්පනා කර කර ඉන්නවා."

"අම්මා මොකුත් ඇහුව ද?"





"නෑ.. "

"ඒක හොඳයි.... දූන් මල්ලි පොඩි එකෙක් නෙවෙයිනෙ.... ඕවට කවුරුත් අතදාන්න යන්න ඕන නෑ.. පටලගන්න දේවල් තමන්ට ම ලිහාගන්න දීලා අනිත් අය නිහඬව ඉන්න එක තමයි හොඳම වැඩේ. දූන් පොඩීට හොඳ නරක දෙක තේරෙනවා. ඩොක්ටර් කෙනෙක් වෙන්න පුළුවන් මිනිහට අනිත් දේවල් කොහොමත් තේරෙන්න එපැයි."

"බත්එක ඔතන්න ද ලොකු....."

"මට බත් එපා අද අපේ යාළුවෙක්ගෙ බර්ත් ඩේ එකක්. අද ලන්ච් එයා ගානෙ.."

"නියම අයියයි මල්ලියි උයලා ඉවර වෙනකං එක්කෙනෙක්වත් කිව්වෙ නෑ..."

"මතක් වුණේ නෑ අම්මෙ........"

"පරක්කු වෙලා නැද්ද?"

"තාම නෑ.... අද මට පැයක් පරක්කු වෙන්න පුළුවන්.... අද උදේ මට වැඩ නෑ...."

මෙත්සෙවණ මානසික සුව සහන වෛද්‍ය මධ්‍යස්ථානයේ හිමිකරුවා කැලුම් ය. ඔහු එම ආයතනයේ ප්‍රධානියා ලෙස මෙන්ම වෛද්‍යවරයකු ලෙස ද කටයුතු කරන්නට විය. නෙතුම් මෙන්ම නිරහංකාර නිහතමානී ගතිගුණවලින් යුතු ඔහු බාහිර ස්වරූපයෙන් ද ප්‍රිය මනාප බවකින් යුක්ත ය. නෙතුම් සහ කැලුම් රුවින් අප්පච්චී මෙන් ද වර්ණයෙන් මව මෙන් ද විය. මව රැකියාවක් නොකරන අතර පියා විශ්‍රාමික ඉංජිනේරුවෙකි.

"අම්මේ....... වැඩක් නැත්නං එන්නකෝ..."

කැලුම් උදෙන් ම හිමායා ගැන විස්තර මල්ලීට කියන්නට ගත් උත්සාහය ද අසාර්ථක වූ බැවින් අම්මාට පැවසීමට සූදානම් විය. කුස්සියේ සිටි අම්මා ටික වෙලාවකින් කැලුම් වාඩිවී සිටි සැටියේ ඉදිරිපස පුටුවේ වාඩි වුවා ය.



Scanned by CamScanner

"ඇයි ලොකු........ "

"මේ ළඟදි දවසක් වයසක ආච්චි කෙනෙකුයි තරුණ අම්මා කෙනෙකුයි ලස්සන ගෑණු ළමයෙක් රෝද පුටුවක තියාගෙන ආවා. ඒ ළමයත් බලාගත්ත අත බලාගෙන හිටියා. හැබැයි ඒ ළමයගෙ ආබාධිත බවක් මූණෙන් පේන්ඩ තිබුණෙ නෑ.. ගවුමක් අන්දලා තිබුණ හින්දා වැඩි තොරතුරක් පෙනුනෙ නෑ.. කොහොම හරි ඇවිදින්ඩ බෑ... මලක් වගේ පුදුම ලස්සනයි. ලස්සනට ඇඳපු සුරංගනාවියක්ගෙ පින්තූරයක් වගේ, ලස්සන කොණ්ඩෙකුත් තියනවා. මම ටිකක් විස්තර කතා කළා. ඒ වෙලාවෙ ලෙඩ්ඩු ගොඩක් හිටිය නිසා මම වෙලාවක් දුන්නා ගෙදරට එන්නං කියලා. මම සාමාන්‍යයෙන් එහෙම යන්නෙ නෑ.. මට ඒ ළමයා දැක්කම දුක හිතුණා. ඒ අම්මා මට කිව්වා, ඕන ගාණක් ගෙවන්නං සනීප කරලා දෙන්න කියලා. මම ඊයෙ හවස ගෙදර ගියා. ඉතිං ට්‍රීට්මන්ට් කරන්න කළින් මම ඒ ළමයා ගැන විස්තර ඇහුවා... පස්සෙ බලනකොට ඒ ළමයා උපදිනකොට ම කකුල් දෙකම තිබිලා නෑ..."

"මොනවා ......" වේදනාවෙන් අසා සිටි අම්මාට කතා කරගැනීමට වචන ද නොවුණි.

"ඔව් අම්මෙ කකුල් දෙක එක දශමයක්වත් නැතිලු. අත්දෙකයි කඳයි විතරයි තියෙන්නෙ.."

"ඔයා දැක්ක ද?"

"අම්මත් හරි කතාවක්නෙ අහන්නෙ... ඒ ළමයා අවුරුදු විසි එකක් විතර ඇති මම කොහොම ද කකුල් බලන්නෙ. ඒ අම්මා මාත් එක්ක අඬ අඬා කිව්වා."

"දෙයියනේ ....... මගේ ඇඟත් හිරිවැටුණා. තව ළමයි ඉන්නව ද?"

"නෑ..... එකම ළමයා.."

"කොහෙද ලොකු...... ගෙවල් තියෙන්නෙ..."

"බ්ලූ වෝටර් ලිලි ගාර්ඩන්ස්වල"





"අම්ම දැක්කං ආය.... මාර ලස්සනයි මම දැකලා නෑ එච්චර ලස්සන කෙල්ලෙක්.. අම්මත් ගොඩාක් ලස්සනයි."

"ඒත් පුතේ කොච්චර ලස්සන වුණත් කකුල් නැතිව.... අනේ සතෙකුටවත් එහෙම වෙන්න එපා....."

"ආ....... හොඳම දේ මට අම්මට කියන්න බැරිවුණානෙ,"

"ඒ මොකක් ද?"

"අම්මත් එයාගෙ කවි කියවලා ඇති."

"ම්...... "

"ඉරිදා පත්තරේ කවි අරණෙ.... හිම කුමාරි කියලා හැමදාම ලස්සන කවි පන්තියක් යන්නෙ...... ඒක ලියන්නෙ හිමායා..."

"නම හිමාය ද? ලස්සන නමක්....."

"කවි විතරක් නෙවෙයි ගෙදර කලාභවනක් වගේ චිත්‍ර පුරවලා. මේ ළඟදි පුරහඳ එකේ පැහැසර කියලා එක්ෂිබිෂන් එකකුත් කරලා. පත්තරේ ඇඩ් එකක් මමත් දැක්කා. අනුරාධපුරේ ගිය දවස් නිසා මට යන්න බැරි වුණා. චිත්‍රත් දැක්කම පිස්සු හැදෙනවා."

"දැන් ඔයාට මොකක්ද කරන්න තියන ට්‍රීට්මන්ට් එක එයාට.."

"ආ...... මට ඒක අම්මට කියන්න අමතක වුණානෙ. ඒ ළමයා ඉස්කෝලෙ ගිහින් පන්තියේ හැමදා ම පළවෙනියා අරගෙනත් තියනවා. පොඩි ඉස්කෝලෙක නෙවෙයි සමුද්‍රදේවි බාලිකා එකෙ...."

"කැම්පස් එහෙමත් ගිහිල්ල ද?"

"නෑ... දහය වසරේ ඉගෙන ගන්නකොට ඒ ළමයා ඉස්කොලෙ ගිහිල්ලා එක්ක එන්න තාත්තා ගිය දවසක කහ ඉරෙන් පාර පනින කොට ඇමති පුත්තරයෙක් යටකරගෙන ගිහින්... එතනමයිලු. ඒක දැකලා වුණ කම්පනේට ඒ ළමයා අවුරුදු පහක ඉඳලා මේ වනතුරු කතා කරලා නෑ...... ඊට පස්සෙ ඉරියව්වලිනුයි අකුරෙන් ලියලයි ඕන දේවල් අනිත් අයට කිව්වාලු මේ ළඟක් වෙනකං හොඳට ඉඳලා



Scanned by CamScanner

තියනවා. ඒත් මොකක් හරි දේකින් ආයෙත් ඒ ළමයගෙ හිතට ලොකු කම්පනයක් ඇවිත් තියනවා.''

''එච් ලොකු.. කොහොම හරි ඔයාට කරන්න පුළුවන් උදව්වක් කරන්න.''

''ඔව් මමත් හිතුවා.. මම හැමදා ම ඉරිදට පත්තරේ අරගෙන මුලින් ම  කියවන කවි පංතිය ලියන්නෙ ඒ ළමයා කියලා දැන ගත්තාම මට ගොඩාක් දුක හිතුනා. මම ඒ වෙලාවෙ ම තීරණය කළා සතයක්වත් ගන්නැතිව සනීප කරලා දෙන්න.''

''කමක් නෑ ලොකු.....''

''ලොකු සල්ලිකාරයො ගේ මාළිගාව වගේ... අම්මා බැන්ක් මැනේජර් කෙනෙක්.. ඒ වුණාට මම මේ කරන්නෙ එයාගෙ රසිකයෙක් විදිහට මගේ යුතුකමක් කියලයි මම හිතන්නෙ..''

හිමායාට මෑතකදී ඇතිවූ කම්පනයට නෙතුම්ගේ සම්බන්ධයක් ඇතැයි අම්මා හෝ කැලුම් විහිලුවටවත් කල්පනා නොකරන්නේ ය.

කැලුම් අම්මා සමඟ හිමායා ගැන දුක්වන අතරේ තාත්තගෙ වාහනය ගේට්ටුවෙන් ඇතුළට පැමිණියේ ය. හරමානිස් නොපමාව ගොස් ගේට්ටුව ඇරියේ ය.

''ආ..... හරමානිස් මාමට දකින කොට මට මතක් වුණේ... මේ ළඟද දවසක මල්ලි හරමානිස් මාමට බැනලා තියනවා.''

''ඒ... මොකද අම්මලාවත් හරමානිස් සීයට සැරෙන්වත් කතා කරන්නෙ නෑනෙ..''

''ඒකනෙ....... ''

''හරමානිස් සීයට කේන්ති ගිහිල්ල ද?''

''අනේ නෑ..... මාත් එක්ක ඊයෙ හවස කිව්වෙ මල්වලට වතුර දාන ගමන්..... එයා කියන්නෙත් නෑ..... මට කිව්වෙ.. එයාටත් තේරිලා මොකක් හරි හිතේ අමාරුවක් වෙන්න ඇති කියලා. මට කිව්වා





පොඩි බේබි කවදාවත් මට එහෙම කතා කරලා නෑ.. මොකක් හරි හිතේ ආමාරුවක් හින්දා තමයි එහෙම කිව්වෙ කියලා.''

''ඒක හරි වැඩක්නෙ.... පොඩ්ඩගෙ හිතේ අමාරුවලට හරමානිස් සීයා බයිට් ද? පොඩීගෙ හැම වැඩක් ම හොඳ වුණාට ඒ වැඩේනං නැතයි.''

පුතුන් දෙදෙනා මෙන් උස මහත කඳකින් යුක්ත වුණු කැලුම්ගේ පියා ඉදිරිපස දොරෙන් ගෙට ඇතුලුවිය. මීට වසර විස්සකට තිහකට උඩ දී නම් ඔහුගේ පෙනුමත් කැලුම්ගේ රුව මෙන් වූ බව මංගල ජායා රූපය සාක්ෂි ය.

''ආ... අම්මලා පුතාලා මොනා ද බරටම සාකච්ඡා කරන්නෙ..''

''එහෙමට ම දෙයක් නෑ........ ලොකු ඊයෙ බලන්න ගිය ලෙඩෙක් ගැන කිව්වා. ඒක ගොඩාක් දුක හිතෙන කතාවක්..... මම පස්සෙ වෙලාවක කියන්නං.''

''ලොකු අද වැඩට යන්නෙ නැද්ද?....''

''යනවා අප්පච්චි...... තව ටික වෙලාවක් තියනවා.''

''වෙනදා උදෙන් ම යනවා නේද?''

''ඔව්.. අද මගේ ටයිම් එක පැයක් පරක්කු වෙලා... මම ඊයේ ටයිම් ටේබල් එක මාරු කළා.''

ආදරය සතුට කරුණාව පිරුණු සුහඳ කතාවලින් ගෙතුළ පොහොසත් වන අතර හැම අතින්ම දිළිඳු හරමානිස් මිදුලෙ සුපුරුදු බංකුව මත වාඩිවී විටක් සපන්නට විය.



Scanned by CamScanner

# 21

**දෙවැනි** ගමනට සැරසුණු මනාලියක් සිහිකරන රතුම රතු පාටින් සැරසුණු ලොවි ගහේ හරිත පත්‍ර නොපෙනෙන තරමට ගෙඩි පිරී තිබුණි. ලොවි ගෙඩි උපදින්න පෙර අතු අග මලින් සරසාගෙන සිටින කාලයෙ පටන් රතු පැහැගෙන මෝරන තුරු හිමායා බලා සිටින්නේ ය. රක්තවර්ණ ලොවී ගෙඩි සහ ඒ අතර පෙම්කරන බටිති, ගිරා, මලිති, කොබෙයියන්ට ද හිමායාගේ දෑසින් වසන්වීමට නොහැකි ය. එහෙත් ළපටි මලින් උපන් ලොවි ගෙඩි මෝරන තුරුත් කුරුල්ලන් කිරිල්ලියන් පෙම්බැද රහසේම පැන යන තුරුත් හිමායා ජනේලය ළඟට පැමිණියේ නැත.

"පී.......ප්.... පී......ප්" වාහනයක් ගේට්ටුව ළඟ කෑගසන්නට වූයෙන් සුදු ආච්චිඅම්මා එදෙසට දිව්වා ය.

"ආ.......... ලොකු බේබි...... අද වේලාසනින් ම"

"සුදු ආච්චිඅම්මෙ ගේට්ටුව වහන්න එපා, දූන් ඩොක්ටර් එනවා කිව්වා."

කැලුම් මෙත් සෙවණෙ නියමිත රාජකාරි අවසන්කර හිමායා බැලීමට පැමිණෙමින් සිටියේ ය. හිරු අතපය හකුලාගෙන පිටව යාමට සූදානම් ය. වැහි අඳුර රාත්‍රී අඳුර සමඟ අත්වැල් බැඳගන්නට ලෑස්ති විය. බ්ලූවෝටර් ලිලි ගාර්ඩන්ස් හරහා දුවන කෝන්ක්‍රීට් පාර දිගේ දුවන වාහන අතරට කැලුම්ගේ වාහනය ද එකතු වුණි.





පෙර දිනයෙ මෙන්ම නිමාලිගෙ නිවසෙ ගේට්ටුව හැර තිබූ බැවින් කැලුම්ට නළාව අඬවන්නට උවමනා නොවුණි. තණකොළ පලස මත දෙපේළියට බිම අතුරලන ලද ගල්පතුරු දිගේ රිය සක ගමන් කළේ ය.

නිමාලි සහ සුදු ආච්චිඅම්මා දොරටුව අසලටවී පෙර මග බලාසිටියහ.

"එන්ඩ ඩොක්ටර්........ අද නං වෙලාවට ම ඇවිත්.."

"ඔව් මට එදා ප්‍රමාද වුණේ වාහනේ ගන්න ගියානෙ ඒකයි.."

සුදු ආච්චිඅම්මා කුස්සිය වෙත ගියේ වත්තෙ ගසෙන් කඩන ලද කටු ආත්ත ගෙඩියෙන් බීමක් සෑදීමට ය. කැලුම් හිමායාගෙ සිතුවම් දෙස බලමින් අසුන් ගත්තේ ය.

"කෝ..... හිමායා ඇහැරලා ද ඉන්නෙ.."

"ඔව් ඩොක්ටර්...... එක්ක එන්න ද?"

"නෑ... දූන්ම එපා පොඩ්ඩක් මට එයාගෙ කාමරේ බලන්න ඕන.. එයා ජනේලෙන් මොනා ද දකින්න ඇත්තෙ කියලා මට අනුමාන කරන්න පුළුවන්..."

"යමු ඩොක්ටර්...."

"දොස්තර මහත්තයෝ මේක බීලා යන්න.."

"ආ.. ආච්චි අම්ම බීමත් හැදුව ද? මොනවද මේ.."

"මහත්තයෝ ඕවා ගොඩක් ගුණ යි.. කටු ආත්ත"

"ෂා.... බොහෝම ස්තුතියි ආච්චි අම්මෙ."

උඩු මහලට යන ගමන මොහොතකට පමාවූයේ සුදු ආච්චිඅම්මගෙ කටු ආත්ත බීම රසබැලීමට වූ නිසාවෙනි.

"එන්න ඩොක්ටර්..." හිමායගෙ කාමරේට ඇතුළුවූ නිමාලි පැවසුවා ය.



Scanned by CamScanner

මෙසය මත සායම්, පෑන්, පැන්සල්, පින්සල් පිළිවෙළට අසුරා තිබුණි. පුරතල් වළඳුන්, බෝනික්කන් සහ විසිතුරු සතුන් ඇඳේ පුරවා තිබුණි. කැලුම් කාමරය තුළ මෙන්ම ජනේලයෙන් පිටත ද හොඳින් නිරීක්ෂණය කළේ ය.

"මෙතන හරිම ලස්සනයිනෙ... හිමායා මෙතන ඉඳලද චිත්‍ර අඳින්නෙ, කවි ලියන්නත් මෙතන එයාට ගොඩාක් වටිනවා ඇති.."

"ඔව්.. ඩොක්ටර් එයා දවසම වුණත් මෙතන ඉන්නෙ හරිම ආසාවෙං"

"එහෙම ආසාවෙන් මෙතන හිටපු හිමායට මෙතන එපා වුණේ ඇයි?" එයට පිළිතුර කැලුම්ගේ සිතට වැටහුණු නමුදු නිමාලිට නොපැවසුවේ ය.

"ඒක තමයි ඩොක්ටර්......."

"මම දොණිගෙ හිත හදල දෙන්නං අම්මා බය වෙන්ඩ එපා..."

"කවුරුහරි කෙනෙක් ගැන හිමායා සිහින මවන්න ඇති. එහෙම නැත්තං මට ඒ වගේ ලොකයක් නෑනෙ කියලා හිතට ඊර්ෂ්‍යාවක් එන්න ඇති. එහෙම දැනෙන දෙයක් මේ ජනේලෙන් හිමායා දකින්න ඇති." යනුවෙන් කැලුම් උපකල්පනය කළේ ය.

පසුව කැලුම් උඩු මහලින් බැස පැමිණියේ හිමායා හමුවී කතා කිරීමට ය.

"ම්... අම්මෙ හිමායා එක්ක එන්න..." පුටුවකට බරදෙමින් කැලුම් පැවසුවේ ය.

නිමාලි හිමායාගෙ රෝද පුටුව කැලුම් අසුන්ගත් පුටුව ඉදිරිපසට ගෙන පැමිණියා ය.

"අපරාදෙ කොච්චර ලස්සන, වටින, කෙල්ලෙක් ද?" කැලුම් කල්පනා කළේ ය.

"යමු අපි අර පුටු ටික ළඟට, හිමායව මට එළියට ගෙනත් දෙන්ඩ." මැංගුස් ගසක් යට රවුමට තබා තිබූ මේසය සහ පුටු වෙතට හිමායා කැඳවා ගෙන යෑමට කැලුම් තීරණය කළේ ය.





නිමාලි සහ සුදු ආච්චිඅම්මා කැලුම්ගේ ඉල්ලීම ඉටු කළේ විනාඩියක් හෝ පමා නොකරමිනි.

"ඩොක්ටර්..... මෙයා පුටුවෙන් ඉන්දවන්න ද?"

"එයාට ඔහොම්ම ම ඉන්න දෙන්න, දැන් ටිකක් ඔය දෙන්න පැත්තකට යනව ද?"

නිමාලි සුදු ආච්චිඅම්මා සමඟ පිටව ගියද ඈතටවී හිමායාට නොපෙනෙන්නට බලා සිටියහ.

හිමායාගෙ පුටුව ඉදිරිපස පුටුවේ කැලුම් වාඩිවිය. හිමායගෙ රෝද පුටුව සහ කැලුම් වාඩිවූ පුටුව අතර රවුම් මේසයක් තිබුණි. පළමුව කැලුම් හිමායගෙ මුහුණ දෙස බලාගෙන සිනාසුණේ ය. එහෙත් හිමායාගේ මුහුණෙ වෙනසක් දැකගැනීමට නොහැකි වුණි.

"ඔයාගෙ නම මොකක් ද? ම්....... ඔයාගෙ නම මොකක්ද.....?"

එහෙත් හිමායා බලාගෙන සිටි ඇස් මායිම වෙනස් නොකළා ය. සුදු බිංදු අනාරාධිතවම මේසය මතට පැමිණ ඤා...ව්... මියෑව්. යනුවෙන් පූස් බාසාවෙන් යමක් පවසන්නට විය. වෙනදා සුදු බිංදුට ආදරය කරන හිමායාට නිහඬ ය.

"ඔයාගෙ නම හිමාය ද? ම්.... හිමායා ලස්සන නමක්..." කැලුම් කාරුණික ස්වරයෙන් කිහිප වරක් පවසන විට හිමායා සෙමෙන් ඇහිපිල්ලම් ගසමින් කැලුම් දෙස බැලුවා ය.

"හිමායා ඔයා ගොඩක් ලස්සන කෙනෙක්....... ඔයාට හැමෝම ගොඩාක් ආදරෙයි....... අම්මයි සුදු ආච්චි අම්මයි.... ඔයාගෙ චිත්‍ර බලන කවි කියවන අපි හැමෝ ම ඔයාට ගොඩාක් ආදරෙයි හිමායා...ම්.. ඔයා ගොඩාක් දක්ෂ කෙනෙක්....... එහෙම නේද?"

කැලුම් හිමායගෙ අවධානය ගැනීමට බොහෝ දෑ පවසන්නට විය. එවිට ඇය පෙරට වඩා ඇහුම්කන් දෙන බවක් පෙනුණි.

"හිමායා ඔයා මට චිත්‍ර අඳින්න කියලා දෙනව ද? මම ආසයි ඔයාගෙන් ඉගෙන ගන්න... ආ... මට කියලා දෙනවා නේද?."



Scanned by CamScanner

හිස් සුදු පැහැති කොලයක් සහ පැන්සලක් හිමායට පෙනෙන්නට මේසය මත තැබුවේ ය. බොහෝ වෙලාවකට පසු ඇස් එදෙසට හරවා බැලුවා ය.

හිමායා සමඟ මෙලෙස කතාකිරීමෙන් ඇගෙ හිතට ළංවිය හැකිබව දැනගත් කැලුම් හිමායා මෙත් සෙවණෙ නේවාසිකව මාසයක් පමණ රඳවගෙන සුවපත් කරන්න තීරණය කළේ ය.

පාන්දර ඉපදී හෝරා කිහිපයක් ගතකර හැන්දෑවෙ මියදෙන්න යන දවස කළුවර එනතුරු මඟ බලාසිටියේ ය. කැලුම් හිමායව සුවපත් කරන්නට ගත් උත්සාහයේ පළමු දවස අවසන් විය. පළමු දිනයෙම හිමායගෙ ඇස් තම කටහඬට යොමුකරගන්නට හැකිවීම ගැන පුංචි සතුටක් කැලුම්ට දැනුන අතර ඒ සතුට නිමාලිට නම් මහමෙරක් මෙන් විය.

"හිමායා.... මම දැන් යනවා.. මම ඔයාව බලන්න ආයෙත් එනවා...." කැලුම්ගේ කටහඬට සවන් දෙමින් හිමායා බලා සිටියා ය.

"ආච්චි අම්මේ එන්න....." ඈතටවී බලාසිටි සුදු ආච්චිඅම්මා හිමායා ළඟට පැමිණියා ය.

නිමාලි පැමිණිය ද හිමායා එතැනින් රැගෙන යනතුරු කිසිවක් නොකියා සිටීමට කැලුම් වගබලා ගත්තේ ය.

"සුදු ආච්චියේ දෝණිව එක්ක යන්න..." හිමායාගේ රෝද පුටුව ගෙතුළට රැගෙන ගියේ සුදු ආච්චිඅම්මා විසිනි.

"ඩොක්ටර් දෝණිගෙ තත්ත්වෙ කොහොම ද?"

"මට එයාව සුවකරන්න පුළුවන්, මම කතා කරනකොට මුලින් නම් අවධානය දුන්නෙ නෑ.. මම එකම දේ ගොඩාක් වතාවක් කියනකොට එයා හෙමින් ඇහුම් කන් දුන්නා. අම්මට පුළුවන් ද මෙයාව අපේ මෙත්සෙවණෙ මාසයක් තියන්න. අම්මට බැරි නම් අර ආච්චිඅම්මට මෙයත් එක්ක නවතින්ඩ කියන්න."

"දෝණිව හොඳ කරගන්න පුළුවන් නම් මම කරන්න පුළුවන් ඕන කැපකිරීමක් කරනවා. ඩොක්ටර්....."





"අම්මා බය වෙන්න එපා... දෝණි ආයෙත් කතා කරයි...."

"ඩොක්ටර් ගොඩාක් පිං..."

"එහෙනං මම යන්නං හෙට වුණත් කමක් නෑ අම්මට පුළුවං ඉක්මනට හිමායා මෙත් සෙවණට බාර දෙන්න.."

"හොඳයි ඩොක්ටර්..."

පිටුපා යන වෛද්‍යවරයා දෙස නිමාලි සහ සුදු ආචචිඅම්මා බලා සිටියේ බැතිබර හැඟීමෙනි. ඔවුන් කැලුම් පිළිබඳ කල්පනා කළේ හිමායගෙ අඳුරු වෙන්න යන ජීවිතය ගොඩ ගන්න ජීවකයෙක් ලෙස නොව දෙපා අහිමි තම දියණියගේ අනාගතයම එළිය කරන්නට පැමිණි දෙවිකෙනෙකු ලෙසිනි.

"අනේ කාගෙ වුණත් ගුණ යහපත් දරුවෙක්, හැදූ වැඩූ දෙමාපියන්ටත් පිං සිද්ධ වෙනවා." සුදු ආච්චිඅම්මා හැඟීම්බරව පැවසුවේ ගේට්ටුවෙන් මෝටර් රථය නොපෙනී ගිය පසුව ය.

"ඔව් සුදු ආච්චිඅම්මෙ.... ඩොක්ටර් අපේ දෝණිව හොඳ කරලා දෙයි... අපි අනිද්දා මෙත් සෙවණට එක්ක යමු..."

වෛද්‍යවරයා පිළිබඳ කතාබහ අවසන් කළ සුදු ආච්චිඅම්මා සහ නිමාලි හිමායා සොයා යන විට මෙතෙක් දිනක් බලාගත් අත බලාගෙන සිටි හිමායා කඩදාසියක යමක් ලියමින් සිටියා ය.



Scanned by CamScanner

## 22

දවස තිස්සේ ම ගස් මුදුණේ සිටිමින් ද අහසේ පියඹමින් ද අහෝරක් නැතිව යටිගිරියෙන් මොරදෙන සියගණන් වූ කපුටන්ගේ හඬ නගරාශ්‍රිතව නිතර දකින්නට ලැබෙන්නකි. තවෙකෙකුගේ කේලමක් අසුනු රිසියෙන් ද ළමා ළපටින්ට සැරවැර කරමින් ද නිවාස ආරවුලක් මෙන්ම පෙම් පටලැවිල්ලක් හෝ අනියම් පෙමක් හසුවීමෙන් ද ආදී ලෙස නොයෙක් මාතෘකාවන් ඔස්සේ ලැජ්ජාවක්, හැදියාවක් නැති කපුටන්ගේ මෙන්ම කපුටියන්ගේ හඬ නගරයෙ ඝෝෂාව වැඩි කළහ.

නෙතුම් රෝහලේ ප්‍රධාන ගේට්ටුවෙන් වාහනය ඇතුළු කරමින් සිටියේ ය. සැමදා ම ඇසෙන මේ ගෝරනාඩුව අද නෙතුම්ට දැනුනේ තමාට ඔච්චම් කරනවාක් මෙනි.

වාහනයෙන් බැසගත් නෙතුම් වටපිට කිසිවකට අවධානය යොමු නොකොට දෙපා ගැටෙන බිමට පමණක් දෑස් යොමාගෙන කාර්යාලයට ඇවිද යන්නට වූයේ පැමිණීම සටහන් කිරීමට ය.

තමාට පෙර පැමිණි සහෝදර වෛද්‍යවරු කිහිප දෙනෙක් කාර්යාලයේ සුහද කතා බහේ යෙදී සිටි අතර නෙත්මි පෑනක් ගෙන අත්සන තැබීමට යනු දුටු නෙතුම් ළඟ සිටි වෛද්‍යවරයකු සමඟ ආගිය තොරතුරු කතා කළේ නෙත්මි පිටව යන තුරු ය.





"ගුඩ් මෝර්නින් ....... සාලින්ද ඉතිං කොහොම ද? මේ දවස් ටිකේ මම දැක්කෙ නෑ කොහෙද ගිහින් හිටියෙ..."

"ලන්ඩන් ගියා මචං.... අපේ අම්මට බෙහෙත් වගයක් ගේන්න.. ඊයෙ රෑ ආවේ..."

"ආ.... ඒක තමයි.. අම්මත් එක්ක ආව ද?"

"නෑ.... අපේ නංගි එහෙනෙ ඉන්නෙ, අම්ම එහෙ නැවතුනා.."

නෙතුම්ගේ කටහඬ ඇසෙන තුරු නෙතුම් කාර්යාලයේ සිටින බවක් නෙත්මි දැන සිටියේ නැත. අත්සන් තැබීමෙන් අනතුරුව නෙතුම් කතාබහ කරමින් සිටි සාලින්ද සමඟ බලෙන් කතාබහට පිවිසියේ නෙතුම්ගේ සහ සාලින්දගේ කතාව අවසන්වීමට ද පෙර ය.

"ආ.. ගුඩ් මෝර්නින් සාලින්ද... ඇයි අම්මට මොකක් ද අසනීපෙ.."

"හාර්ට් කේස් එකක්.. වැඩි ගැටළුවක් නෑ... නංගි වැඩ කරන හොස්පිටල් එකේ ඩොක්ටර් කෙනෙක් ට්‍රීට්මන්ට් කරන්නෙ..'

"ආ.. ඒක හොඳයි..."

නෙතුම් සාලින්දගෙන් සමුගෙන අත්සන සහ වේලාව සටහන් කර පිටව ගියේ ය. නෙතුම් කාමරයෙන් පිටව ගිය බව සාලින්ද සමඟ කතාකරමින් සිටි නෙත්මි නොදුටුවා ය. නෙතුම් සිටිනවා ඇතැයි සිතූ නෙත්මි පුරසාරම් දොඩවන්නට වූයේ අකුරට නොගිය වට්ටි අම්මාකෙනෙකු මෙනි.

"ඉතිං... නෙත්මි කොහොම ද ජීවිතේ....." සාලින්ද ඇසුවේ එපමණකි. සාමාන්‍යයෙන් මිතුරන් මුණ ගැසුන විට කාගෙන් හෝ අසන සුපුරුදු ප්‍රශ්නයකි. එහෙත් නෙත්මි ලද ඉඩෙන් ද නෙතුම්ගේ සිත රිදවීමට සිතා බෙලිකටු මල්ල හොල්ලන්නට පටන් ගත්තේ ඇතමෙකුගේ දෙතොලට සිනා එකතු කරමිනි.

"මේ දවස්වල මම හැපී එකේ ඉන්නෙ සාලින්ද.... මම හිතාගෙන ඉන්නෙ අද හෙට ම මැරි කරලා ඇමෙරිකා යන්න... ස්ටඩීස් වලටත් හොඳයිනෙ.... අනිත් එක අපේ මෙයාගෙ පවුලේ හැමෝම ඉන්නෙ



Scanned by CamScanner

වෙස්ටර්න් කන්ට්‍රීස්වල. කොහොමත් මම කැමති නෑ ලංකාවෙ ඉන්න.. අප්පෝ මෙහෙ ඉන්න මිනිස්සු මට නං තිත්ත වෙලා තියෙන්නෙ...."

නෙත්මි කියවන්නට පටන් ගත්තා ය. සාලින්දට නෙත්මි සමග කතාවට යෑම හැපින්නියකගේ නගුටෙන් අල්ලා ගත්තාක් මෙන්විය. නෙත්මි ළඟින් ඇසුරු නොකළ නිසා නෙත්මිගෙ වග හරි හැටි නොදන්නා සාලින්ද මගහැර යාමට මගක් බලමින් සිටියේ ය. කාමරයේ සිටි දෙතුන් දෙනා ද දෙතොළට නැගි සිනාව ආයාසයෙන් මුවාකරගෙන නික්ම ගියහ.

"ආ...... සාලින්ද...... මම මේ උඹ හොය හොයා හිටියෙ...." කඩිමුඩියේ කාමරයට පැමිණි මෙත්සර නෙත්මිගේ පම්පෝරියට හසුවී ගැලවීමට මගක් සොයමින් සිටි සාලින්දට සැනසීමක් ගෙනාවේ ය.

"ඇයි මචං........" ලද අවස්ථාවෙන් නෙත්මිගෙ මුහුණ ඉදිරියෙන් පැනගත් සාලින්ද මෙත්සරගේ කතාවට උත්තර බඳින්නට සූදානම් විය. තමාට වැඩක් නොවුව ද නෙත්මි එතැනින් ඉවත්ව නොගියා ය.

"මේ පාරත් මොකද දන්නෑ... නෙතුම්ගෙ බ්ලුවෝටර් ලිලි ගාර්ඩන්ස්වල කෙල්ලත් එක්ක තිබුණ ලව් එකනං ඉවරට ම ඉවරයි..... ඒකනෙ මූණ අමාවක වගේ වෙලා තියෙන්නෙ.. ආයෙත් ඒක ම පටන් ගන්න ලෑස්ති ද දන්නෑ... නැත්නං වෙන එකක් සෙට් කරගන්න යනවද දන්නෑ.. මෙත්සරයා තමයි ඕවට උල්පන්දං දෙන්නෙ.... ම්.... මම ඉන්නකං නෙතුම් ලව් කරනවාවත් කසාද බඳිනවාවත් බොරු.. මට හොරෙන් වෙඩින් එකක් ගන්න ගියත් මම අන්තිම මොහොතෙ මඟුල් පොරුව ළඟට හරි ගිහින් ඔක්කොම සුන්නද්ධූලි කරනවා." නෙත්මි යටි හිතේ කේන්තිය, වෛරය, ඊර්ෂ්‍යාව නොගපිටින් පුරවගෙන පළිගැනීමට පෙරුම් පුරන්නේ තාමාට අබමල් රේණුවක් තරම්වත් දහසකින් කොටසකින්වත් වරදක් නොකළ නෙතුම් ගෙනි.

මෙත්සර තම පැමිණීම සටහන් කරන තුරු සාලින්ද ළඟට වී ආගිය තොරතුරු පවසන්නට විය. නෙත්මි මේසය මත වූ තමන්ට අදාළ ම නොවන පරණ පොතක පිටු පෙරලමින් කාමරයේ ම රැඳෙමින් හොරගල් අහුලන්නට විය. මෙය සාලින්දට හරිහැටි නොවැටහුණු නමුදු මීට පෙර නෙත්මිගෙ වැඩ දන්නා මෙත්සරගේ





සිත වහා තේරුම් ගත්තේ ය. නෙතුම් මෙන් අහිංසකයකු නොවන මෙත්සර කටකාරයෙකි.

"මෙත්තො මොකක් ද අර ප්‍රොබ්ලම් එක......"

"මෙහෙම කියන්න බෑ...... මචං.... පරමාණු බෝම්බ ළඟට ගිත්දර තියා හිස් ගිනි පෙට්ටියක්වත් ළං කරන්න නරකයි. මචං ජපානෙට දාපු පරමාණු බෝම්බවලින් විනාශවුණේ හිරෝෂිමාවයි නාගසාකියයි විතරයි..... ඒත් බං.... ලංකාවේ බෝම්බ වැටුණොත් පෘථිවිය නෙවෙයි අනෙක් ග්‍රහලෝකත් ඉවරයි...."

"මොනාද බං උඹ ඔය කියන්නෙ.. කරුණාකරලා ඔය හතර පද ප්‍රහේලිකාව මට තේරුං කරලා කියනව ද?"

"මේකනෙ බං....."

මෙත්සර වරක් නෙත්මි දෙස බලන විට නෙත්මිගේ හොර බැල්ම හසුවිය. දෑස් එකවර මුණ ගැසිනි. මෙත්සර ගේ දෙතොල් අවඥාවෙන් ද නෙත්මිගේ දෙතොල් වෛරයෙන් ද පොපියන්නට විය.

"දී කිරට බළල්ලුත් සාක්කිනෙ..."

කිසිවක් කරකියා ගන්නට ම නොහැකි වූ තැන නෙත්මි මෙත්සරට ඇනුම් පදයක් කියා යන්නට ගියේ පස්ස හිතා මතා ම පද්දමිනි. මුහුණ සඳ මෙන් වුවද ඇඟ හැඩ වැඩකට උරුමකම් නොකිවූ නෙත්මිගේ පස්ස යෝධ වට්ටක්කා පළුවක් සිහිගන්වන්නට විය. ආයාසයෙන් නළවා පද්දා යන විට එය කෝලම් මඩුවේ කෝලමක පස්සකට දෙවැනි නොවේ. පිටුපා ගිය නෙත්මිගේ අඟර දඟර නෙත්මිගේ වැඩගැන හොඳින් දන්නා මෙත්සරට මෙන්ම කිසිවක අගමුලක් නොදන්නා සාලින්දට ද සිනා ගෙන ආවේ ය.

"ඈ බං.. මොකද මෙත්තො නෙත්මිට හැඳුන කඩ් කුලප්පුව..."

"උඹ දන්නෑනෙ...... උඹට නෙතුම් මීට්වුණේ නැද්ද?..."

"අද උදේ හම්බුණා. මොකුත් කිව්වෙ නැද්ද?"



Scanned by CamScanner

''නෑ... ඌ උඹලා අපි වගේ කටකියවන්නෙ නෑනෙ... උවමනා දේ කිව්වා. විහිළුවක් කරත් උගෙ ලිමිට් එකක් තියනවනෙ..''

''ඒකම තමයි බං ඌට හෙනේට හිටියෙ...''

''දන්වත් කියපන්කො...'' කාර්යාලයෙන් එළියට පැමිණ කොරිඩෝව දිගේ යන අතර සාලින්ද මෙත්සරගෙන් ඇසුවේ නොඉවසිල්ලෙනි.

''නෙතුම් කෙල්ලෙක් එක්ක යාළුවෙන්ඩ ට්‍රයි කළා. ඒකි ඉන්නෙ මචං..... ගෙදරක උඩ තට්ටුවේ මූට සෙට් වෙලා තියෙන්නෙ අහම්බෙන්... ඒ ගේ ළඟදි වාහනේ කැඩිලා.... ඔන්න ඔහොම කතාවකින්..... ඒත් බං මේ මාසෙට ම කතා කරන්නවත් හම්බෙලා නෑ... මූ උදේ හවස යන එන ගමන් හිනාවෙලා අතවනලා.. ඒකිත් වැඩිය ගණන් ගන්නැතිලු.. ඊටපස්සෙ මේ ළඟදි දවසක වෙනදට වැඩිය හොඳට හිනාවෙලා ජනේලෙ ළඟට වෙලා බලාගෙන ඉඳලා තියනවා....''

''වැඩක් ද බං එහෙම ලව් එකක්..''

''ඒක තමයි බං මාත් කිව්වෙ.. ඒත් මූ කියනවා ඒ වගේ කෙල්ලෙක් මූ කවදාවත් දැකලා නැතිලු දැක්කම පිස්සු හැදෙනවාලු.''

''මෙහෙමයි ඔය සඳළුතලාවල ඉන්න කෙල්ලො ලස්සනනම් තමයි දූවිල්ලක් වැලිකැටයක් ගෑවෙන්න පොළොවෙ පය ගහන්නෑනෙ බං....''

''ඔව් බං මාලිගාවක් වගේ ලොකු ගෙයක් මාත් මේ ළඟ දි ගියා..''

''ඉතිං... මේකට නෙත්මිගෙ සම්බන්ධෙ මොකක් ද?''

''ආ.... හොඳම හරිය කියන්න බැරි වුණානෙ... නෙත්මියි නෙතුම් දෙන්නා එක මෙඩිකල් කොලේජ් එකේනෙ ඉඳලා තියෙන්නෙ.... නෙත්තා මට කිව්වෙ ඌ ඒකිට සැලකුවේ යාළුවෙක් විදිහට විතරයි කියලා. ඒත් මචං නෙත්මි සීමාවෙන් පැනලා.. මූට ලව් කරන්න





ගිහිලා දැන් ඒකිට නෙත්තා බැඳගෙන උගෙ ගෙදර පදිංචි වෙන්න ම ගිහිලා...''

''මේකිව නෙත්තාට හරියන්නෑ බං මේකි හොඳයි මහසෝනට... දැක්කෙ නැද්ද ඉස්සරවෙලා මූණෙ හැටි... අපි වගේ එකෙක්ගෙන් පළිගන්නත් කමක් නෑ බං ඒත් නෙත්තා..''

''දවසක් නෙත්තා හොස්පිට්ල් එකේ ඩියුටි ඔෆ් වෙලායන කොට මේකිත් පස්සෙන් ගිහිල්ලානෙ...''

''නෑ.......''

''නෑ........ නෙවෙයි ඔව්..... මේකි නෙත්තාව බඳාගෙන බැනලා අඬලා මලමගුලක් නටලා...''

''අර කෙල්ලත් බලාගෙන ඉද්දි.......'' සාලින්ද පුදුමයෙන් මෙන් අසන්නට විය.

''ඔව් බං..... ඔව්.... නෙත්තාට කරකියා ගන්ඩ දෙයක් නැතිවෙලා.. ටිකකින් බලනකොට ජනේලෙ වහලා තිබුණලු...''

''මම නං අල්ලලා ගහනවා පොළොවෙ..''

''ඒ අපිනෙ... නෙත්තා එහෙම නෑනෙ...''

''මේකි තියන්නඩ වටින්නෑ... මම දන්නවනං වචනයක් දෙකක් කියනවා ආය මූණවත් නොබලන්ඩ.''

''ඔව් බං මටත් පෙන්නන්ඩ බෑ... ගෑනුත් දැකලා තියනවා ඒත් බං මේ වගේ අම්මණ්ඩි කෙනෙක්නං දැක්කෙ නෑ.''

''ඉතිං දැන් නෙත්තගෙ ලව් එක බ්ලාස් ද?''

''එදා වහපු ජනේලෙ තව වෙනකං වහලලු බං.. හැමදාම ගේට්ටුවත් වහලා දවසක් ඇරලා තිබුණා. අපි ගිහින් බොරු නමක් ඇහුවා.... ඒත් ආච්චි කෙනෙක් ආවා.. හරි තොරතුරක් දැනගන්න බැරිවුණා. ඒ ආච්චි ලොකු බේබි කෙනෙක් ගැන කිව්වා. ඒ කියන්නෙ තව පොඩි බේබි කෙනෙකුත් ඇති. හොඳ කාර් එකක් මිදුලෙ තිබුණා.



Scanned by CamScanner

ඩොක්ටර් කෙනෙක් ගැනත් කිව්වා. ඒත් බං හරිහමං විස්තරයක් දැන ගන්න බැරිවුණා."

"ඉතිං මගෙන් මොකක් ද කෙරෙන්න ඕනෙ..."

"උඹලගෙ කවුරුවත් නැද්ද බං ඒ පැත්තෙ..."

"උඹත් පුදුම එකෙක් නෙ මට දිව්‍යඥානෙ තියනව ද ඕක වුණේ කොහෙද කියලා."

"ආ..... මෙච්චර වෙලා විස්තර කිව්වට මම ඒක කිව්වෙ නැතෙ.. මචං මේ ගේ තියෙන්නෙ බ්ලු වෝටර්ලිලී ගාර්ඩන්ස්වල..."

"ආ... ඇත්ත ද... හරි.... මම හොයාගන්නං ඇයි බං අපේ මද්දු අම්මා ඉන්නෙ එහෙ..."

"කවුද දන්නෙ..... මට ඊයෙ රෑ ඉන්නගමන් නිකමට උඹව මතක් වුණේ..."

හරි මට දවස් දෙකක් දීපන්.. අද උදේ මම මද්දු අම්මලගෙ ගෙදර ගියා. අද රෑ එයා නෑ.. ලොකු අක්කලාගෙ ගෙදර ගියා.... හෙට දවල් එයා එනවා කිව්වා. හෙට හවස මම ගෙදර යන්න කලින් එහෙට ඔළුව දාලා එන්නං.."

"මේක උදව්වක් නෙවෙයි බං පිනක්... පව් සතියක විතර ඉඳලා නෙත්තා සෑහෙන්ඩ විඳවනවා බං..."

"ඕකේ... ඕකේ..... "



# 23

**කහපාට** නාමල් රේණු වටකරගත් කිරිසුදු පාට මල්පෙති හොරුන්ගෙන් රැක ගැනීමට මෙන් කඩුපත් වැනි නා කොළ සැම අත්තක ම සීරුවෙන් බලාසිටින්නට විය. මී මැස්සියො මලින් මලට රහස් කොඳුරමින් සිට කොළවලට රහසින් රොන් ගෙන දෙපාවල සඟවගෙන ඉඟිල ගියහ.

මෙත් සෙවණ මානසික සුව මැදුරෙ සුදු ආච්චිඅම්මා සමඟ නැවතී සිටින හිමායා ජනේල ළඟ සිටිමින් නා ගසේ මල් අතරට එන සතුන් දෙස බලා සිටියා ය. හිමායා මෙත් සෙවණට පැමිණ සති තුනක් පමණ ගතවනවිට සුපුරුදු ලෙස සිනාසෙමින් ඉරියව්වලින් අකුරුවලින් තොරතුරු හුවමාරු කරගත්තා ය. මෙත් සෙවණෙ වෛද්‍යවරු සහ සේවකයන් හිමායාගෙ මිතුරන් වූහ.

මෙත්සරගෙ පොරොන්දුව ඉටු කිරීමට සාලින්ද රාජකාරි නිමාවී නිවසට යෑම පමාකරමින් බ්ලූවෝටර් ලිලී ගාර්න්ඩ්ස්වල සිටින මද්දු අම්මාගේ නිවස වෙත පිටත් වූයේ ය. හිරු විශ්‍රාම ගිය හැන්දෑවෙ කළුවර සෙමින් සෙමින් පොළොවට පාත්වෙමින් පැවතියෙ හිමිකරුවෙකු නොමැති මිහිලියට නුරාසිතින් බැලුම්ලන්නාක් මෙනි.

කළුවර නිවෙස්වලට යන්නට පෙර තම අඹු දරුවන් වෙත යෑමට සියලු දෙනා කලබලවූ බැවින් වාහන තදබදය වැඩිවී තිබුණි.



Scanned by CamScanner

බිලූ වෝටර් ලිලි ගාර්ඩන්ස් වෙත සාලින්ද ළඟා වන විට අඳුර පැමිණ තිබුණි.

"පී...ප්.... පී...ප්....."

"ආ.. මෙ මෙයානෙ මම බැලුවා කවුද කියලා...."

"ගේට්ටුව අරිනවා හලෝ....?"

"හරි... හරි.... අරින්න තමයි හැදුවෙ... පොඩ්ඩක් ඉවසන්ඩකො.... දොස්තර මහත්වරුන්ට හොඳට ඉවසීම තියෙන්ඩ ඕනෙ...." විහිළු කරමින් චාමර ගේට්ටුව විවර කළේ ය.

"මල්ලි අම්මා ආවද?"

"මොකද අද ආපු ගමන් අම්ම හොයන්නෙ... කේලමක්වත් කියන්න ද?"

"හොරාට කළින් කෙහෙල්කැන වැට පැන්නේ.... කොල්ලා මට ජේන විදිහට හොර වැඩක්වත් කරනවා වගේ.."

"නෑ.... නෑ.... කවදාවත් අයියා වාහනෙන් බහිද්දිම අම්ම ගැන අහන්නෙ නැනෙ.."

"හා... පණ්ඩිතකං ඇති.... අම්මා කෝ....."

"අම්මා කුස්සියේ උයනවා..."

සාලින්ද මල්ලි සමඟ විහිළු කරමින් මද්දූ අම්මා සොයාගෙන කුස්සිය වෙත ගියේ ය.

"අම්මේ...... අම්මේ...."

"මොකද ළමයො කෑ ගහන්නෙ.. දූන්ද අම්ම කියන්න පුරුදු වෙන්නෙ..."

"මදූයි..... මේ සාලින්ද අයියා ආවා."

"ආ..... සුදූ පුතේ......."

"මද්දූ අම්මා කීයට ද අක්කලාගෙ ගෙදර ගිහින් ආවෙ..."





"දොළහට විතර ඇති පුතේ....."

"ඇයි මේ හදිස්සියෙන් ම.... කෝ.. ඉන්නකො මම බොන්න මොනවා හරි හදනකං.."

"එපා මම්මෙ ඉක්මනට යන්න ඕනෙ... මේ හදිස්සි වැඩකට ආවෙ යාළුවෙකුගෙ....."

"ඒ මොකක් ද?"

සාලයට පැමිණි මද්දූ අම්මා සහ සාලින්ද සැටියේ වාඩිවූ අතර මල්ලී පිටව ගියේ තමාට එම කතාවට සම්බන්ධ වීමට හේතුවක් නොවූ බැවිනි.

" මොකක් ද පුතා........."

"මද්දූ අම්මෙ.... අර.. මේ පාරෙ එනකොට වැව එහෙම පහු වුණාට පස්සෙ ලොකු නුග ගහක් තියෙන්නෙ... එතන ඉඳලා ඉස්සරහට එනකොට දකුණු පැත්තෙ... ඒ කියන්නෙ මේන් රෝඩ් එකේ ඉඳලා එනකොට දකුණු පැත්තෙ තට්ටු තුනේ ලොකු ගෙයක් තියෙන්න.. දෙවැනි තට්ටුවෙ බැල්කනි එකේ මල්වැල් එහෙමත් තියෙන්නෙ....."

"ම්.... ඔය කියන්නේ......... " මද්දූ අම්මා නළල අතගාමින් මොහොතක් කල්පනා කළා ය.

"ඒ ගෙදර තාප්පෙ හදලා තියෙන්නෙ..... ගල්පතුරු දාලා... ගේට්ටුව දෙපැත්තෙ ගලින් නෙළපු අලි දෙන්නෙක් තියලා තියෙනවා... "

"ආ........ මේ කියන්නෙ නිමාලිලාගෙ ගෙදරනෙ.." ගේ ඉස්සරහා දකුණු පැත්තෙ කොළ පාට උණ ලොකු පඳුරක් එහෙමත් තියනවා නේද?"

"ම්... ඒවගේ යන්තම් මතකයි...."

"ඉතිං... එහෙ විස්තර ඇයි ඔයාට.... මොකෝ එහෙ කෙල්ලෙක්වත් නැනෙ..."

"ඈ....... එහෙ කෙල්ලෙක් නැද්ද?"



Scanned by CamScanner

"ආ.... මට නේද කිව්වෙ හොරවැඩ කරනවා කියලා.. ඔය බලල්ලු රංචුවක් ම පැත්තෙ මල්ලෙන් බිමට ම." උඩු මහලේ පඩිපෙල බසිමින් පැමිණි මල්ලි විහිළු කළේ ය.

"මට නෙවෙයි කොල්ලො......."

"නේද අම්මෙ ඔහොම තමයි කියන්නෙ.... අර කතාවක් තියෙන්නෙ.. මට නෙවෙයි අර.. .අර.. අර නමට කියලා.."

සාලින්දට කියන්නට දෙයක් නොමැතිවූ අතර මද්දූ අම්මා ද සිනාසෙන්නට විය. අවුරුදු විසි එකක් දෙකක් පමණ වූ චාමර මල්ලි ද සාලින්දලා මෙන් මුබරී ය.

"කියන්න.... කියන්න... ලැජ්ජවෙන්න එපා මාත් සපෝර්ට් එකක් දෙන්නං.." කියමින් මල්ලී ද සැටියේ වාඩිවී කතාවට හවුල් විය.

"විහිළු නෙවෙයි..... ඉතිං මද්දූ අම්මෙ ඒ ගෙදර කවුද ඉන්නෙ... එයාලා අඳුනනව ද?"

"ඔව්.. අඳුනනවා නිතර යන්නෙ එන්නෙ නෑ.... උවමනාවක් වුණොත් යනවා එනවා කතාබහ කරනවා."

"එහෙනං මම්මා තමයි මේ වැඩේට හොඳ ම කෙනා.."

"කෝ.. ඉතිං කියන්නකො වටිං ගොඩින් යන්නෙ නැතිව.. ඕපාදූපයක් එහෙම හොයන්න නං මට බෑ...."

"ඕපාදූපයක් මත් නෙවෙයි.."

"ඒ කියන්නෙ...."

"බලන්න දෙයක් නෑ අම්මේ අම්මට ඔය නං බාර දෙන්නෙ යන්නෙ කපුවගෙ පාර්ටි එක.. ඉස්සර වෙලා ම කියන්නකො ඇත්තට ම යාළුවට ද ඔයාට ද ?"

"නෑ..... නෑ..... මට නෙවෙයි අපේ හොස්පිටල් එකේ යාළුවෙකුට...."

"ඉතිං පුදු පුතේ කියන්නකො..."





"මද්දූ අම්මෙ එහෙ කවුද ඉන්නවා කිව්වෙ.."

"නිමාලියි... ආච්චි කෙනෙකුයි, ආ.... දුවෙක් ඉන්නවා.... දුවෙක් කිව්වට රෝද පුටුවෙ ඉන්නෙ......."

"එහෙනං ඔය මං කියන ගෙදර නෙවෙයි ද දන්නෑ....." සාලින්දට තමාට වැරදුනා දෝයි සැක සිතුනි. මේ ගෙදරට නෑදෑ ගෑනු ළමයෙක්වත් ඇවිත් හිටිය ද දන්නෑ.... සාලින්ද, මද්දූ අම්මා පවසන දෑ අසන අතරේදී ම කල්පනා කළේ ය.

"ඔය කියන විදිහෙ වෙන ගෙයක් මේ පැත්තෙ නෑ පුතා.... මොකද මේ පැත්තෙ ගෙවල් මහ ගොඩක් නෑ..."

"එහෙනං එහෙ නෑදෑ කෙනෙක්ගෙ ගෑනු ළමයෙක් ඇවිත් හිටිය ද දන්නෑ.."

"මම දන්න තරමින් නිමාලිට නෑදෑයො නෑ..."

"මම්මා හොඳට ම දන්නවද එහෙ වෙන ගෑනු ළමයෙක් නැද්ද කියලා.."

"ඔව් මේ සතියකට විතර කලිං කිරිඅම්මා දානෙකට මටත් එන්න කියලා තිබුණා.. ඒ දරුව විතරයි ඉන්නෙ..... අපි විස්තර නං අහන්න ගිහින් නෑ.. අපි දන්න දවසෙ ඉඳලා රෝද පුටුවෙ තමයි ඉන්නෙ... පව් සීදේවි කෙල්ල.. ඇස්වහක් කටවහක් නෑ පුදුම ලස්සනයි සුරංගනාවියක් වගේ..."

"මම හිතන්නෙ නෙතුම් රැවටිලා වෙන්න ඇති..."

"කවුද නෙතුම් කියන්නෙ.. අපෙ හොස්පිටල් එකේ... ඩොක්ටර් කෙනෙක්..."

"එයා කොහොම ද මෙයා දකින්නෙ...... ගෙදරට කවුරුවත් යන්නෙ එන්නෙ නැනෙ.... අනිත් එක මේ ළමයා ඉන්නෙ ගෙදර උඩ තට්ටුවෙ."

"ආ... එහෙනං මද්දූ අම්මා කියන්නෙ ඔය මං අහන කෙනාම තමයි.."



Scanned by CamScanner

''කොහොම ද එහෙම වෙන්නෙ ඒ දරුව තාත්තා ඇක්සිඩන්ට් වෙච්ච දවසෙ ඉඳලවු කතා කරන්නෙත් නැත්තෙ.... ඉතිං කොහොම ද ඒ ළමයා කතාබහ කළේ.....''

''ඒකනමයි.. කතා බහ කරලා නෑ.. ජනේලෙ ළඟ ඉන්නවා දැකලා.. දවසක් එයාගෙ කාර් එක ඔය හරියෙදි කැඩිලා. ඊට පස්සෙ ඔය කියන ළමයා ජනේලෙ ළඟ බලාගෙන ඉඳලා... මේ ළමයගෙ ලස්සනට රැවටිලා හැමදාම උදේ හවස බලාගෙන ඉඳලා ඊට පස්සෙ දවසක ගෑනු ළමයත් කැමැත්තෙන් අත වනලා දවස් දෙකක් යන්ඩත් කලින් ඔක්කොම ඉවර වෙලා. හොස්පිටල් එකේ ඉන්න ලේඩි ඩොක්ටර් කෙනෙක් නෙතුම් පස්සෙන් එනවා. එයා පස්සෙන් ඇවිත් ඕන්න විකාරයක් කරලා. එදායින් පස්සෙ මේ ළමයා ජනේලෙ වහලා දාලා. ඉතිං අපේ යාළුවා බෙල්ල කඩාගන්ඩ හදනවා.''

''මදයි..... උගත් ළමයි වෙච්චම දුක්ක පලියට හිනා වෙච්ච පලියට කෙල්ලො පස්සෙ යනව ද? දූත් ඕක ඒ ළමයට කියන්නෙ කොහොම ද?''

''ඒක තමයි මමත් මේ කල්පනා කළේ. ඌ ඒ කෙල්ලට මාර ආදරෙයි. දූත් කියන්නෙ ආය කවදාවත් කෙල්ලන්ට ආදරෙ කරන්නෙ නෑ කියලා..''

''ඔවා වෙනස් වෙනවා. තව කෙල්ලෙක් දකින කං විතරයි..''

''නෑ... මද්දූ අම්මෙ නෙතුම් එහෙම කෙනෙක් නෙවෙයි. ඔන්න අපිට වගේ නං ඔය කතාව හරි.''

''ආයෙත් අහලා..'' චාමර සිනාවෙමින් පැවසුවේ ය.

''මට නිකමට හිතුනා.. මෙත්සර කියනකොට. මොකද මේ මාසෙට ම වචනයක්වත් කතා කළේ නෑ කිව්වම. එත් මම හිතුවා සඳළුතලාවල හැඳෙන කෙල්ලො එක විදිහක්නෙ අහංකාරකමට ද දන්නෑ කියලා..''

''මෙහෙමයි කෙල්ලගෙ කකුල් දෙක තිබුණනං කියලා වැඩක් නෑ..'' මද්දූ මම්මා ද හිමායාගේ රූපය වර්ණනා කළා ය.





''කාටද ඉතිං ආඩම්බර...'' චාමර හැඳසිටි කමිසයේ කොලරය උස්ස ගනිමින් පැවසුවේ ය.

''අනේ... කොල්ලො...'' සාලින්ද සිනාසුණේ ය.

''අපිත් දැකලා තියනවා ඔය ළමයා නෙතුම් දිහා විතරක් නෙවෙයි පාරෙ යන එන කවුරු දිහත් බලාගෙන ඉන්නෙ.. ඇයි ඉතිං ඒ ළමයා ලෝකෙ දකින්නෙ ඔය ජනේලෙන්... ''

''මම මේ කල්පනා කළේ නෙතුම්ට ඕක කියන්නෙ කොහොම ද කියලා... නෙතුම් කියන්නෙ අපේ හොස්පිටල් එකේ හැන්ඩසම්ම එකා.... නර්ස්ලයි ලේඩි ඩොක්ටර්ස්ලයි පුළුවන් නං නෙතුම්ව බලෙන් උස්සගෙන ගෙදර ගෙනියන ගාන, මේ ප්‍රශ්නෙ වුණෙත් ලේඩි ඩොක්ටර් කෙනෙක් හින්ද තමයි.''

''ඔව් ඉතිං අපි ඒ ළමයට කකුල් නෑ කිව්වට.... ආබාධිතයි කිව්වට ඒ ළමයත් අපි වගේ ම ලේ මස් නහරවලින් හැදිච්ච අපි වගේම මනුස්ස දූවෙක්නෙ.. ඉතිං අනිත් අයට වගේ ඒ දරුවටත් හැඟීම් දැනීම් තියනවනෙ...''

''නෙතුම් වගේ කොල්ලෙක් ජනේලෙන් නෙවෙයි අල්පෙනෙති සිදුරකින් දැක්කත් කාගෙද හිත නොයන්නෙ..... මට මේ දෙන්නම ගැන දුකයි...''

''ඔව්... පුතේ ඒත් අපිට කරන්න දෙයක් නැනෙ.... අපිට මේ දරුවට කකුල් දෙකක් දෙන්නත් බෑ.. අපිට අර කියපු දරුවට මේ දරුවව කසාද බන්දන්නත් බෑ...''

''ඒක තමයි.. මගෙ ඔළුවත් අවුල් වුණා වගේ.. මේක උත්තර නැති අගක් මුලක් නැති ප්‍රශ්නයක්.... ඔක්කොටෝ ම වැඩිය මේක නෙතුම්ට කියන්නෙ කොහොමද? ඌ ආත්මෙම කලකිරිලා මහණ වෙන්න යයි.''

''ඇත්තමයි අයියෙ ඒ ළමයා මා......ර ලස්සනයි.''

''ආ.. මෙයත් ඇහැදාලා වගේ....''



Scanned by CamScanner

''ඇයි ඒ ළමයා අපේ වයසනෙ... දහය වසරට එනකං ඉස්කොලෙත් ගියා..''

''ඔයා ගියෙ බෝයිස්කූල් එකකට නේද?''

''ඔව් අනේ........ ඒ ළමයා ගියෙ සමුද්‍ර දේවි එකට. අපි පාරෙදි දකලා තියනවා. දකින දකින කොල්ලන්ට පිස්සු හැදෙනවා.. ඕක් පව්. බං අපරාදෙ කියලා හැමෝම හිත හදාගන්නවා.. මාත් ඇතුළුව'' මල්ලි සිනා සෙමින් කතාව නැවැත්වූවේ තමන් ද එම ළමයාට කැමැත්තක් දක්වූ බව නොකියා කීමෙනි. සාලින්ද සහ මද්දු අම්මා සිනාසුනහ.

''මද්දු අම්මෙ රෑත්වෙලා මම යන්නං, අම්ම අමතන්ඩ ළඟයි.''

''ආ... මම හදපු කොණ්ඩ කැවුම් වගයක් ඇති අම්මට ගිහින් දෙන්න.''

මද්දු අම්මා ඉක්මනින් කුස්සියට දිව ගියා ය. ඒ අතරේ චාමර සාලින්දට ළං වූයේ සත්‍ය ම විස්තරය දැනගැනීම සඳහා ය.

''මේ.. යාළුවෙකුට කිව්වට ඔයාට නේද?''

''නෑ... අපේ නෙතුම් කියලා යාළුවෙක් ඉන්නවා. මේක එයාගෙ සීන් එකක්...මම මොකට ද බොරු කියන්නෙ.. අපි ඔය සින්නක්කර ඉඩම්වලට දන්ම ඔප්පු හොයන්න යන්නෙ නෑ.... තාම පොදු දේපල තියනවනෙ... ''

''මල්ලිලා එක්ක කියන කැත විතරක්...''

''මල්ලිත් කැම්පස් එකෙන් එළියට බැහැලා ජොබ් එකක් සෙට්වුණ දවසට බලන්ඩ බැරියැ... අපිටත් හම්බෙයිනෙ..''

''අපෝ අපිනං ඔය වගේ වැඩ කරන්නෙ නෑ..... ගත්තොත් සින්නක්කර පිරිසිදු ඔප්පුවක් පමණයි...''

''කට...කට.... අන්න මද්දු අම්මා එනවා....'' සාලින්ද මද්දු අම්මා පැමිණෙන විට කතාව නතර කළේ චාමරට ද දන්වමිනි.

''ආ... මෙන්න.... පුතේ...''





''මං යනවා මද්දු අම්මෙ,''

''පරිස්සමෙන් යන්න.. තෙරුවන් සරණයි.''

''මල්ලි මම යනවා..''

''හරි..... අයියෙ.......''

වාහනය පණ ගන්වාගත් සාලින්ද මෙත්සර ගේට්ටුවෙන් පිටවීමට පෙරම දුරකතන ඇමතුමක් ගත්තේ ය.

''ඔබ ඇමතූ ඩයලොග් දුරකතනයෙන් ප්‍රතිචාරයක් නොමැත. කරුණාකර පසුව අමතන්න.''

සාලින්ද පටිගත කළ නිවේදනය ඇසුණු බැවින් දුරකතනය පසෙකින් තබා කළුවර බොඳකරමින් දල්වුණු වාහනයේ ඉදිරිපස විදුලි බල්බවලින් පාර දෙස බලාගෙන වේගය අඩු වැඩි කරමින් ද පසු පසින් පැමිණෙන වාහනවලට සහ ඉදිරියෙන් යන වාහනවලටත් පයින් යන්නන්ටත් සංඥා නිකුත් කරමින් ද කහ ඉරි ළඟින් තිරිංග තබමින් ද යන්නට විය. පැයක පමණ ධාවන කාලය නිමා කරමින් සාලින්ද නිවෙසට ගියේ ය.

''ඔබ අමතූ ඩයලොක් දුරකතනය ක්‍රියාවිරහිත හෝ ආවරණ කලාපයෙන් බැහැරව ඇත. කරුණාකර පසුව අමතන්න..''

නිවසට පැමිණි සාලින්ද දෙවැනි වතාවටත් මෙත්සරට ඇමතුමක් ගැනීමට ගත් උත්සාහය ව්‍යවර්ත වූයේ ය.

නිශාචර සතුන්ට වැඩි අයිතියක් හිමි වූ රාත්‍රියෙ තම ආධිපත්‍ය පතුරවමින් අහසේ මෙන්ම පොළොවේ සිටින නිශාචරයන් එකෙකුට එකෙක් නොදෙවෙනිව හඬ දෙන්නට විය.

ඔරලෝසුවේ කටු මැදියම් රැයට ආසන්න වෙමින් පැවතුනි. ඇඳට පැමිණ බොහෝවෙලාවක් ගතවුණ ද ඇහිපිය පිරිමදින්නට ඇඳේ ළඟට වී බලාසිටි නිදිකුමාරිය ද තුරුකර නොගනිමින් සාලින්ද කල්පනා කරන්නට වූයේ මල නොතලා රොන් ගන්නා මී මැස්සකු මෙන් නෙතුම්ගෙ හිත නොතලා ඔහු රැවටුණු ආබාධිත ගැහැනු ළමයා ඔහුගේ මතකයෙන් අමතක කරන ක්‍රමයක් ගැන ය.



Scanned by CamScanner

මදුරු දැලේ වසමින් ඉගිලෙමින් විදුලි බල්බයේ එළියට දැස් නිලංකාරවූ සලබයකු සාලින්දගේ කල්පනාවට බාධා කරන්නට වූ බැවින් විදුලි බුබුල නිවා දමා මදුරු දැළ තුළට අතපය ගෙන ඇඳේ උඩු බැලි අතට දිගා විය. මෙතෙක් වෙලා පුල පුලා බලා සිටි නිදි කුමරිය සාලින්දට හෙමින් තුරුළු වී අඩක් පියවුණු නෙතුපියන් සිප උඩුකය නිරුවත් සාලින්දගේ උණුසුමට තුරුළුවී නිදිසුව දුන්නා ය.

"ක්‍රීං...ක්‍රීං........" නිදිකුමාරිය පසෙකට ඇඳ දමා සාලින්ද දුරකතනය අතට ගත්තා ය. ආ.. මෙත්තා....

"ඔව් මෙත්තා...... මොකෝ බං උඹට දෙපාරක් ගත්තා... වැඩ කළේ නෑ..."

"ඔව් මම ෆෝන් එක ගෙදර දාලා ගිහින්...."

"ආ... අද පැන්න ද?"

"නෑ.. බං මල ගෙදරක ගියා. දැන් ආවෙ.. මේ.... උඹ අරහෙ ගියා ද?"

"ගියාදත් අහනවා. මට උඹට කියනකං ඉවසිල්ලක් නැතිව හිටියෙ.."

"වැඩේ ගොඩ ද බං... කොහොම ද?"

"ගොඩ නෙවෙයි මං මඩෙත් නෑ........"

"ඇයි බං මොකෝ සීන් එක"

"කට උත්තර නෑ බං... මම්මා මට විස්තර කිව්වා.. ඒ ගෙදර කෙල්ලෙක් ඉන්නවනං තමයි... ඒත් බං ඒ කෙල්ලගෙ කකුල් දෙකම මුලින්ම නැතිලු බං.. ඒ මදිවට අවුරුදු පහක ඉඳලා වචනයක්වත් කතා කරන්නෙත් නැතිලු. මේ ළඟදී නෙත්මි කරපු අඩව්ව නිසා තිබුණ සිහියත් විකල්වෙලාලු.."

"නෑ....... මේ.. බං උඹ විහිලු කරනව නෙවෙයි නේද? උඹ මය කියන්නෙ සීරියස් ද සාලි......." නෙතුම්ට තවමත් සිතෙන්නේ සාලින්ද විහිළුවක් කරනවා වන්නට ඇත. යනුවෙනි.





"ඔව්.... මෙත්තො.... ඔව්.. සහතික ඇත්ත මම විහිළු කරනවා ඒත් බං මෙක විහිළුවක් නෙවෙයි. මචං අපේ මද්දු අම්මා හොඳට දන්නවා. මෙ ළඟදි ඒ ළමයට කිරිඅම්මා දානෙකුත් තිබිලා. මම්මා ගියා කිව්වා..."

"උඹ නම ඇහුවෙ නැද්ද?"

"උඹට විකාරද බං.. නම දැනගත්තා කියලා අපිට ඒ ළමයට කකුල් දෙකක් දෙන්ඩ බැනෙ...."

"ඒකත් ඇත්ත... දැන් මොකද කරන්නෙ.."

"ඒකි ලස්සනයි කියන කතාව නං ඇත්ත.. මද්දු අම්මා කිව්වා සුරංගනාවියක් වගේ කියලා. ආබාධිත වුණාට මූණෙ කිසිම අඩුපාඩුවක් නැතිලු. කොණ්ඩෙත් සෑහෙන්ඩ දිගයිලු. චාමර මල්ලි කියනවා ඉස්කොලේ යනකාලේ කොල්ලො මැරෙන්ඩ හැදුවලු..."

"ආ..... ඉස්කොලෙත් ගිහිල්ල ද?"

"ඔව් බං.. ඒක මාර දුක හිතෙන කතාවක් මම හෙට උඹට ඔක්කොම විස්තර කියන්නං....."

"කෙල්ලනං පව්... ඒත් බං අපිට ඒ ළමයට උදව්කරන්න විදිහක් නැනෙ.. එහෙම කියලා නෙත්තාගෙ හිත රිදවන්නත් බෑ..... මොකද සාලි අපි මේකට කරන්නෙ..."

"ඒකනෙ හිතා ගන්නවත් බෑ බං.. උඹට මතක නැද්ද නෙතුම්ගෙ හිත ගිය වෙන කෙල්ලෙක් ගැන....එහෙම."

"ඇයි බං නෙත්මි ඉන්නෙ..." සාලින්ද විහිළුව පැවසුවේ ය.

"අම්මො... ඊට වැඩිය හොඳයි නෙත්තට මුහුදෙ පනින එක."

"ඒකනං ඇත්ත..... අපිට දැන් කරන්න තියෙන්නෙ මේ වෙලාවෙ නෙතුම්ගෙ හිත වෙන කෙල්ලෙකුට සෙට් කරන එක."

"නෙතුම් ලේසියෙන් කෙල්ලෙකුට ලව් කරන එකෙක් නෙවෙයි. ආ..... මචං අපි ආර්ට් එක්ෂිබිෂන් එකක් බලන්න ගියා. නෙත්තා



Scanned by CamScanner

පස්සෙන් තමයි මාත් ගියෙ..... ඒකෙ හිටපු ලස්සන කෙල්ලෙකුට ටිකක් විතර නෙතුම්ගෙ කැමැත්තක් තිබුණා.''

''එහෙමමත් හරියන්නැනෙ බං මූ ඩොක්ටර් කෙනෙක්නෙ, නිකං කෙල්ලෙකුත් හරියන්නෑ නෙ''

''පිස්සුද බං නිකං කෙල්ලෙක් නෙවෙයි. එක්ෂිබිෂන් එක ඒ ළමයගෙ.. ඒත් බං මාර ලස්සනක්... දැක්කම උන් හිටි තැන් අමතක වෙනවා. අපි පොඩ්ඩක් සෙට්වෙන්න ට්‍රයි කළා.. හරි ගියෙ නෑ..... අම්මා දුවලා ඇවිත් උඳුල්ල දම්මා... කෙල්ලට වචනයක්වත් කතා කරන්න නොදී අම්මා පැන පැන උත්තර දුන්නා. කෙල්ල හිනාවෙවී බලාගෙන හිටියා. යන්තං විෂ් කරන්න අත දීලා සිනිඳු සුදු අත අල්ලලා හිත හදාගත්තා. මෙමරි බුක් එකේ පොඩි මැසේජ් එකකුත් එක්ක නම්බර් එක ලිව්වා තනතුරත් එක්කම ඒත් කිසිම සද්දයක් නෑ.... ඒකත් බං මරු.... මාර ලස්සනයි. එක අතකින් ඒ වගේ ලස්සන කෙල්ලෙක් පරිස්සම් කරගන්න රත්තරං කූඩුවක්වත් හදන්න වෙනවා.''

''නෑ... ඒ තරං ලස්සනයි ද? මම රට ගිය ටිකේ මූන් දෙන්නා නිකං ඉඳල නෑ...''

''ඒ ළමය ව කොහොම ද සෙට් කරගන්නෙ....''

''අම්මත් හොඳට කතා කළා. නෙතුම් නම් මොකවත් කියන්න ගියෙ නෑ.. මම කිව්වා අපි ඩොක්ටර්ස්ලා කියලා. අම්මට හිතට ඇල්લුවා. නෙත්තට තියෙන්නෙ ආසයි බයයි වගේනෙ.. ඌ තමයි මාවත් ඇදගෙන ගියෙ..''

''නෙතුම්ගෙ පොඩි කැමැත්තකුත් තියන එකේ.. මේක අමතක වෙන්නත් එක්ක අපි ඒක සෙට් කරමු.''

''මචං ඒකි ඉරිදා පත්තරේටත් ලියනවා. නමින් නෙවෙයි ලියන්නෙ නික් නේම් එකකින් ලියන්නෙ.... හිම කුමාරි කියලා....''

''ආ.... මම කියවලා තියනවා.... මාර ලස්සන වචන තියෙන්නෙ පරිසරය ගැන එහෙම ලියනවා. එච්චර ලස්සන වචන කොහෙන්ද කියලා හිතෙනවා. උඹල නම අහගත්තෙ නැද්ද?''





''අම්මා නම කිව්වා....... නෙත්.......නෙත්සරණි''

''සර්නේම් එකක් ෆෝන් නම්බර එකක් දන්නැද්ද?.''

''කොහෙ ගන්ඩ ද බං අම්මා ඒකිට වචනයක්වත් කතා කරන්න දුන්නෙ නෑ...''

''පත්තරෙන් නම්බර් එක ගමු..''

''ඒත් කොහොම ද ගන්නෙ.....''

''මම බලන්නං මගේ යාළුවෙක් ඉන්නවා මීඩියාවලට සම්බන්ධ එකෙක්... මම බලන්නං....''

''හරි මචං... එහෙම කරමු.''

''ඕකේ.... බායි.. ගුඩ් නයිට්.''

''ගුඩ් නයිට්...''

පැයක පමණ දුරකතන සංවාදය හමාර කරන විට කේන්ති ගිය නිදි කුමරිය සාලින්ද හැර ගොසිනි. සාලින්ද නෙතු පියා ගනිමින් නිදි කුමාරියට ඇවිටිලි කරන්නට විය. පුංචි දේකින් වුවද සිත් කම්පාවීම ගැහැනු ගතියක් බැවින් නිදි කුමරිය සාලින්දට දඬුවම් දුන්නා ය. එහෙත් මොහොතකින් සියලුදේ අමතක කර සමාවදීම කාන්තාවන්ගෙ ලක්ෂණයක් බව මතක්කරමින් නිදි කුමරිය සෙමින් ඇසිපියට ළංවූයේ පසුදා හිරු පැමිණෙන තුරු සාලින්දට තුරුළුවී සිටීමට ය. ටික්... ටික්....... හඬින් ඔරලෝසු කටු දුවන හඬ පමණක් කාමරයෙ නිහඬබව බිඳින අතරේ සාලින්ද නිදි කුමරිය තුරුළු කරගෙන නිදිසුව විඳින්නට විය. ඔවුන් පිළිබඳ ලෝබ සිත් උපදවාගත් මදුරු ගැහැනුන් මදුරු දූලට පිටතින් කුරු... කුරු... කු...ං කු...ං.... යැයි නොනවත්වා කෙඳිරිගාන්නට වූයේ හිතේ උපන් වේදනාව දරාගැනීමට නොහැකිව මෙනි.

මදුරු කරදර මැද සොඳුරු රාත්‍රි කාලය අවසන්වූයේ ය. තම ස්වාමියා වූ හිරු පැමිණීමට පෙර නිදිකුමරිය සාලින්ද ළඟින් ඉවත්වී පෙරදා හැන්දෑවේ ලිහාදැමූ කළුවර සළුපිළි හැඳගෙන හිරු නැග එන්නට පෙර හිමිදිරියේ ම පිටව ගියා යා. නිදි කුමරිය බැස ගිය යහනේ උණුසුම නොදැනී සාලින්ද ඇස් හැරියේ ය.



Scanned by CamScanner

# 24

**නාඹර** ගොයම් ගස්වලට පිනි ඔටුණු පළඳා රෑ පුරා සැණකෙළි පවත්වා තිබුණි. පිනි ඔටුනු හිරු කිරණ පැහැර ගෙන යනු ඇතැයි තැතිගත් මකුළු හේවායෝ, ගොවි ආතට හොරෙන් වැවුණු මාරුක් ගස්වල මුදුන් යාකර ගොයමට උඩින් දැල් එළා තැබූහ. එලෙසම නෙතුම් හදවතේ තබාගෙන පරිස්සම් කරන ආදර සිහිනය සත්‍ය දන්වා හදවතින් ඉවත් කිරීමට නොහැකිව මෙත්සර සහ සාලින් විකල්ප සැලසුම් කරන්නට විය.

''ගුඩ් මෝර්නින් සාලි....''

''ගුඩ් මෝර්නින්..... මේ මෙත්තො..... මට අද උදේ වැඩ..... එක හමාරෙන් පස්සෙ පොඩ්ඩක් ගිහින් මම කියපු ෆ්‍රෙඩා බලලා සීන් එක කියලා එන්නං.. අද ම ගන්න බැරිවෙයි.''

''දවසක් දෙකක් ගියාට කමක් නෑ.. මම අද ඉන්න ගමන්... නෙත්තගෙ හිතට එදා සීන් එක හෙමින් හෙමින් දාන්නං..''

''හරි.. උඹ හොඳ විදිහකට එන්ටර් වෙයං මම වැඩි විස්තර හොයාගන්නං..''

''හරි... මට ටයිම් රෙඩි.. මම යනවා වෝඩ් එකට...''





වාට්ටු දෙකක සේවය නියමිතව තිබුණ සාලින්ද සහ මෙත්සර කොරිඩෝව දිගේ දෙපසකට ඇවිද ගියේ ය. නෙතුම් මේ වන විට තමාට හිමි වාට්ටුවේ රාජකාරි ආරම්භකර තිබුණි.

මීට පෙර නෙතුම්, මෙත්සර දෙදෙනාගේ කතාබහ දැනගැනීමට ඇන්ටනා සවිකර ඕපාදූප සෙවූ නෙත්මි අලුත් ම ඔත්තුසේවය ක්‍රියාත්මක වූයේ සාලින්ද සහ මෙත්සර පසුපස්සේ ය. අනතුරක් දුටු සැනින් ගොළුබෙල්ලා හිස මුදුනේ ඇති ඇන්ටනා සඟවා ගන්නේ යම් සේද නෙත්මි ද මල් පඳුරුවලට, බිත්තිවලට සහ කණුවලට මුවාවී සිට කිසිවකු දුටුවිට සැඟවෙන්නේ එලෙසිනි. නපුරු සිතක් හිමිව තිබූ නෙත්මි හැම මොහොතක ම නෙතුම්ගෙන් පලිගැනීමට බලාසිටියේ ගුලකට වැදුණු මූසිකයෙකු පැමිණෙන තුරු ගුලෙහි දොරටුව රකින, මී මසට ලොබ බඳිමින් කෙල හලන දින ගණනක් නිරාහාරව සිටි බැළලියක් ලෙසිනි. රාජකාරියේ දී නෙතුම්ට නෙත්මි මුහුණට මුහුණ මුණ ගැසුණු ද දෑස් මඟ හැර යනවා විනා රහසින් හෝ වෛර නොකළේ ය.

''මෙත්සර..... මොකවත් ම තොරතුරක් නැද්ද අර පැත්තෙ..''

නෙතුම් දවල් කෑම විවේකයෙන් පසු මෙත්සර හමුවී විමසුවේ හිතේවූ සියලු වේදනාව වචන කිහිපයකට එක් කරමිනි.

''සාලියි මමයි ඊයෙත් ඒ පැත්තෙ ගියා.. ගේට්ටුවයි ජනේලෙයි දෙක ම වහලා තිබුණා.... වෙන තොරතුරක් නම් හම්බුනෙ නෑ...''

''ඇත්ත ද?''

''එක අතකිං ඔය සඳළුතලාවල ඉන්න කෙල්ලො විශ්වාස කරන්ඩත් බෑ බං.. ඔවුන් පොළොවෙ පය තියලා ඉන්න එවුන් වගේ නෙවයිනෙ.. හැමදේම වෙන්නෙ හොඳට කියනවනෙ.... අපි තව පුළුවන් තරං විස්තර හොයන්නං.... ඕකට ඔච්චර දුක් වෙන්ඩ එපා බං.... අපි උඹට ඕන දේකට ඉන්නවා. රිලැක්ස් වෙයං බං''

''උඹට ඒක කියලා තේරුං කරන්ඩ මට වචන නෑ මචං..''

''හරි... හරි... මට තේරෙනවා. අපිත් බූට් කාලා හොරෙන් අඬලා තියනවා රෑ එළිවෙනකං.... ඔය දුක තේරෙනවා බං.''



Scanned by CamScanner

"සඳඑතලාවල ඉන්න හැම කෙල්ල ම එකම මිම්මෙන් මනින්ඩ එපා බං... මම කියන කෙල්ල ගැන ලොකු විශ්වාසයක් තියනවා."

"හරි.. හරි... අපි තව විස්තර හොයන්නං... ඒත් මම කිව්වෙ හොඳ ම විදිහ.. නෙත්මි කරපු වැඩේ හැටියට ඒ කෙල්ල හිතාගෙන ඉන්නෙ ඒ උඹෙ වයිෆ් කියලා... ඒ ළමය ව ආය ෂේප් කරගන්න ලේසියෙන් නෑ... බං.. අනිත් එක ගෙයින් එළියට එන කෙනෙක් නං කතාබහ කරලා හරි තේරුං කරන්ඩ පුළුවං... ඒත් බං මේ ළමයා හම්බෙන්නෙ කොහොම ද? එදා ගෙදරට ගිය වැඩේ හරිගියෙත් නෑ.. ආය යන්ඩත් බෑ.... අපිත් කැමතියි උදව් කරන්ඩ.... වැඩේ තියෙන්නෙ කොහොම ද අපි කරන්නෙ කියන එක.. සත්තයි නෙතුම් අපි උඹ වෙනුවෙන් ඕන දේකට ඉන්නවා."

"මම දන්නවා බං.. මගේ හිතට තියන එකම සැනසීමත් උඹලා දෙන්න විතරයි.."

"නෙතුම්..... මේ අහපං..... උඹට මතක ද අර පුරහඳ එකේ තිබුණ පැහැසර ආර්ට එක්ෂිබිෂන් එකේ හිටපු හිම කුමාරි...."

"ම්...... උඹ මට විහිළු කරනවද? මෙත්සර..."

"විහිළු නෙවෙයි බං සීරියස් කියන්නෙ... එදා ඒ ළමයගෙ අම්ම අපිත් එක්ක පැන පැන කතා කළානෙ අපි ඩොක්ටර්ස්ලා කිව්වාට පස්සෙ ගොඩාක් කැමති වුණානෙ."

"ඒක මෙතෙන්ඩ අදාල නෑනෙ මෙත්සර..."

"අදාල නෑ. අපි අදාල කරගමු... මුහුදේ එක මාළුවෙක් නෙවෙයිනෙ බං ඉන්නෙ... අපි හැම උදව්වක් ම කරලා ඒකිව උඹට කතා කරලා දෙන්නං.. උඹ බය වෙන්ඩ එපා..... සාලියි මායි දැනටමත් ඔක්කොම ප්ලෑන් කරලා තියෙන්නෙ.. සාලි අද හවස යාළුවෙක් මීට් වෙන්න යනවා. හිම කුමාරිගෙ තොරතුරක් පත්තරෙන් ගන්න."

"උඹල දෙන්නා පිස්සු නටන්නැතුව හිටපං.. ඕව හරියන වැඩ නෙවෙයි. අනිත් එක මට අර ගෑනු ළමයා නැතුව වැඩක් නෑ.. මම ආය එක කෙල්ලෙකුටවත් ලව් කරන්නෙ නෑ.... බං...."





"මේ උගුරට හොරා බෙහෙත් බොන්න බෑ බං.. එදා එක්ෂිබිෂන් එක බලන්න උඹෙ තිබුණ කඩි කුලප්පුව මට තාම මතකයි.."

"එතකොට මේ ළමයා මට එච්චර සෙට් වෙලා තිබුණෙ නෑ."

"අනේ පලයං.. පස්සෙත් නෑ.. ජනේලෙන් බලලා හිනාවුණ එක විතරයි වෙනසකට තියෙන්නෙ... මාසයක් ගිහිල්ලා පුළුඟිල්ලෙන්වත් අල්ල ගන්න බැරිවුණානෙ අඩුගානෙ එකවචනයක්වත් කතා කළාද නෑනෙ.. ඔන්න ඔය මනස්ගාත හිතෙන් අතඇරලා දාපං... හිම කුමාරි කොච්චර ලස්සනයි ද ඇහිපිය ගහන්නෙ නැත්නං සුරංගනාවියක් වගේ... බලපංකො අහසෙත් හොරකං කරපු පසළොස්වක හඳ වගේ,"

"උඹ ඔය වචන ලස්සනට රවුම් කරලා කිව්වට හිම කුමාරි මට සෙට් කරන්න තියා ළං වෙන්නවත් බෑ.... ඔච්චර ලස්සන කෙල්ලෙක්ගෙ හිත මේ වෙනකොට කොල්ලෙක් හොරකං කරලා තිබුණෙ නැත්තං ඉර පායයි දකුණෙන්."

නෙතුම්ගේ සිතේ පුංචි කැමැත්තක් හීනියට දළුලා තිබුණ ද එය කළ නොහැකි දෙයක් යැයි දැඩි විශ්වාසයක් සිතේ පැලපදියම් වී තිබුණි. එහෙත් සාලින්ද සහ මෙත්සරගේ සිත්වල වූයේ ඊට හාත්පසින් වෙනස් සිතුවිල්ලකි. ඒ අනුව මෙත්සර සහ සාලින්ද සඳඑතලේ ජනෙල් කවුළුවෙන් දැක නෙතුම්ගේ හද රැවටුණු දෙපා අහිමි ගැහැනු ළමයා ගැන සෙවීම අතහැර හිම කුමාරි පිළිබඳ මතකය අවදි කොට නෙතුම්ගේ සිත සැනසීමට උත්සාහ දරන්නට විය.

මෙත්සර, නෙතුම් හෝ සාලින්ද මේ වන තෙක් හිමකුමාරි යනුවෙන් අන්වර්ථනාමයකින් හඳුන්වන ජනප්‍රිය කිවිදිය සිත්තරිය සහ සඳඑතලේ ජනේලෙන් දුටු දෙපා අහිමි තරුණිය යන දෙදෙනාම එක් අයෙකු බව සිහිනෙනුදු නොසිතුහ. කිසිවකු ඇගේ නම හිමායා බව නොදන්නා අතර නෙතුම් ජනේලය ළඟ දී සහ ප්‍රදර්ශනයේ දී දුටුවේ හිමායාගෙ රුව දෙආකාරයකිනි. ජනේලය අසලදී සාමාන්‍ය ලෙස දකින අතර ප්‍රදර්ශනයේ දී දුටුවේ හැඩකළ රුවකි. එබැවින් නෙතුම්ට හඳුනා ගැනීමට අපහසු විය. මෙත්සර දැක ඇත්තේ එදින පමණක් බැවින් මෙත්සරට කිසිවක් තීරණය කළ නොහැක. මෙම



Scanned by CamScanner

අවස්ථා දෙකෙහිදීම නොදුටු සාලින්දට කිසිම තීරණයක් ගැනීමට අවස්ථාවක් නොවී ය.

සාලින්ද පැමිණීමට ප්‍රමාද වන බැවින් සවස රාජකාරිය නිමා වූ බව සටහන් කර නෙතුම් සහ මෙත්සර නිවෙස් බලා ගියහ.

මේ වන විට මෙත් සෙවණ අසපුවේ අවසන් දින කිහිපය ගෙවන හිමායා වසර පහක නිහඬ කාලය අමතක කර හොඳින් කතා කරන්නට වූවා ය. කැලුම් මෝහන විද්‍යාව සම්බන්ධ ප්‍රසිද්ධ වෛද්‍යවරයෙක් කැඳවා හිමායාට තම පියාගේ රිය අනතුරෙන් යටිසිතට කාවැදී තිබුණ දැඩි කම්පනය අමතක කොට දමන ලදී. දැන් හිමායාට නොහැක්කේ ඇවිදීමට පමණි. කැලුම් හිමායාගේ අම්මාට වූ පොරොන්දුව මාසයක් සම්පූර්ණ වීමටත් කලිං ඉටු කළේ ය. තමා නැවත ලද ජීවිතය ගැන හිමායා සතුටු වන අතර ඒ සතුට දකින අම්මා මෙන්ම සුදු ආච්චිඅම්මා ද හදවතින් කැලුම්ට දහස්වතාවක් පිං දුන්නේ ය.

තමා වෛද්‍ය ජීවිතයේ මෙතෙක් ලද විශාලම අභියෝගය කෙටි කලකින් ජයගැනීම ගැන කැලුම්ට ද ඇත්තේ මහත් වූ අභිමානයකි. දින දෙකකදී ම රාත්‍රී ආහාරයෙන් පසුව අම්මා සහ අප්පච්චී සමඟ තමා හිමායා සුවපත් කළ ආකාරය විස්තර කළේ ය. නෙතුම් සමඟ කතා කිරීමට දෙතුන් වතාවක් උත්සාහ කළ ද නෙතුම් කුමක් හෝ හේතුවක් කියමින් මඟහැර ගියේ ඔහුගේ හිතේ වූ ව්‍යාකූල බව නිසා මිස අයියා සමඟ අමනාපෙකින් හෝ ඔහු ලද ජය නොසලකා හැරීමක් ලෙස නොවේ. තමා පැය විසිහතර ම මැරි මැරී උපදින සිහින කුමරිය පිළිබඳව අයියා මෙතරම් කතාබහ කරන බව නෙතුම් එක් මොහොතක හෝ නොසිතුනේ ය.

අම්මා, අප්පච්චි සහ අයියා පහල මාලයටවී හිමායා කියමින් කතා කරන්නේත්, නෙතුම් උඩු මහලටවී සිහින කුමරිය බඳු යැයි සුසුම්ලන්නේත්, සාලින්ද සහ මෙත්සර හිම කුමාරි යැයි විස්තර සොයන්නේත් තිදෙනෙකු නොව එක් අයෙකුම බව කිසිවකු නොදනී. මෙය විශ්වාස කිරීමටත් නොහැකි තරම් අරුම පුදුම දෛවෝපගත සිදුවීමකි.





පෝයක් ළඟ බැවින් සඳේ අසම්පූර්ණ ඡායාව අහසේ කම්මැලි කමින් ඔහේ ඇවිදින්නට විය. කළුවරේ පිපිණ රැ කුමාරි මල්වල සුගන්ධය හුළඟෙ පැටලී වැට මායිම් නොතකා දුවගියේ ය. නැටි රතු කරගත් සේපාලිකාවෝ වැලි බිමට දෙපා තබන්නට නැකත් ගෙන මැදියම් රැ පැමිණෙන තුරු අතු මතට වී බලාසිටියහ. කලකට පෙර මියැදුණ කොහොඹ ගසක නිරුවත් අරටුව බදාගත් කඩුපුල් තොමෝ සුදු වතින් සැරසූ දරුවන් දැතින් අල්ලාගෙන බලාසිටින්නේ බුදු පුදට යන දෙවියන්ට දරුවන් දන්දී බුදුබව පතන්නට මෙනි.

නෙතුම් ජනේලයෙන් කළුවර දෙස බලාසිටිය ද සේපාලිකා, රැකුමාරි, කඩුපුල් රාත්‍රියේ කුමක් කරන්නේ දැයි නොදුටුවේ ය. කලාවට මෙන්ම පරිසරයට ලැදි නෙතුම් සිත ආතුරවීමට පෙර පරිසරයේ සොඳුරු බවට ඇලුම් කළේ ය. දැන් නෙතුම්ට දැනෙන්නේ තමා සමඟ පරිසරය ද ආතුරවී ඇති බවකි. අහස පොළොව පුළඟ යන සියලු තැන්වලින් නෙතුම් දැන් සොයන්නට උත්සාහ කරන්නේ ජනෙල් කවුළුවෙන් එහා සිට තමාට සිනාදුන් සිහින කුමරියගේ සොඳුරු රුව ය.

ලොකු හුස්මක් හෙලා හදවත නිදහස් කරගත් නෙතුම් විදුලි බුබුළ නිවාදමා අඳුරේ සිට ජනේලයෙන් අඳුර දෙස බලා සිටියේ ය.

"එක අතකින් මෙත්සර කියන කතාවෙ ඇත්තකුත් තියනවා. මුහුදෙ එක මාලුවෙක් නෙවෙයිනෙ ඉන්නෙ.. මම නෑ කියලා ඒ ළමයට වෙන කෙනෙකුට ආදරේ කරන්න පුළුවන්නෙ.. එදා අපි ගේට්ටුවෙන් ඇතුළට ගිය දවසෙ ලොකු බේබි ඩොක්ටර් එක්ක කතා කරනවා කියලා කිව්වලුනෙ.. ඒ කියන්නෙ මාත් එක්ක කේන්තියට වෙන කෙනෙක් එක්ක යාළුවෙලා වෙන්න ඇති. මම ඒ ළමයට වැරැද්දක් කළේ නෑනෙ... අපට යම් දෙයක් හිමි නැත්තං අපි කොච්චර හිතුවත් වැඩක් නෑ... මට එයා හිමි නැති හින්දා තමයි එහෙම වෙන්න ඇත්තෙ.. කමක් නෑ.. එයාගෙ ජීවිතේ සාර්ථක වෙන්න කියලා මම මුළු හදවතින්ම ප්‍රාර්ථනා කරනවා. හැබැයි ඒ ලස්සන මූණ මගේ හිතින් කවදාවත් ම අමතක වෙන එකක් නෑ.. මම හිතන්නෙ ඒක සංසාර බැඳීමක් වෙන්න ඇති. නැත්නං වචනයක්වත් කතා නොකර ඈත ඉඳලා දැකලා විතරක් මගේ හිතට මෙච්චර දුකක් දැනෙයි ද



Scanned by CamScanner

සමහරවිට මෙත්සරයි සාලින්දයි හිතනවා ඇති මට පිස්සු කියලා, කෙල්ලෙකුට තියන පෙරේතකම කියලා. මම මේ ලොකෙ ඉන්න මෝඩ ම මිනිහා කියලා හිත යටින් හිතාවෙනවා ඇති. ඒත්... මට ඒ ළමයා ගැන තියෙන්නෙ පුදුම හැඟීමක්.... ඇත්තමයි.... මේ ළමයා ගිය ආත්මෙ මගෙ කවුරු හරි වෙන්න ඇති.''

නෙතුම් කළුවරටවී පැය කිහිපයක් කල්පනා කළේ ය. ටික්... ටික්.. හඬින් බිත්තියේ එල්ලීගෙන පුංචි බැටරි දෙකක ශක්තිය අරන් කළුවරේ රාජකාරිය අකුරට ම ඉටු කරමින් සිටින ඔරලෝසුවෙ කටු දොළහෙ ඉලක්කම ද පසුකර දුවගොස් තිබුණි.

රෑ වැඩමුරය බාරව සිටින නිශාචර සතුන් වැඩි කලබලයක් නොකර ම තම තමන්ගෙ වැඩකටයුතු ඉටු කළහ.

ලෝකෙ ම නින්දට ගිය රාත්‍රියෙ නෙතුම් අවදියෙන් ගත කරන්නේ කොයි මොහොතක හෝ බොඳවුණ ආදර මන්දිරයට යෑමට මාවතක් පෙනෙනු ඇතැයි යන මනඃකල්පිත සිතුවිල්ලෙනි.

''හූම්..... හූම්.....හූම්.......'' බකමූණා ඈත ගස් මුදුනක සිට යමක් කියන්නට විය.



# 25

අකුරු අමුනමින්, පද ගලපමින්, කවි අමුණන කිවිදිය, පින්සලෙන් පැන්සලෙන් සිත්තර මවන සිත්තරිය සිටින්නේ කොහේදැයි පත්තර මහගෙදරින් දැන ගන්නට මිතුරකු සොයා ගිය සාලින්ද හිම කුමරියගේ දුර ඇමතුම ලබාගත්තේ ය.

''සාලි ... ගුඩ් මෝර්නින් ..... කෝ.... නම්බර් එක.'' වෙනදා උදෑසන ට වඩා කලබල බවක් මෙත්සරගේ හැසිරීම තුළ වූයේ හිම කුමාරිගෙ අංකයට ඇමතුමක් දී තොරතුරු දැනගැනීමට වූ හදිස්සිය නිසාවෙනි.

''ගුඩ් මෝර්නින්.... මට පේන විදිහට නෙතුම්ට ජෝඩු කරයි ද, උඹ සෙට් කරගනී ද? දන්නෑ....''

''නෑ... බං මම මිත්‍රද්‍රෝහියෙක් වෙන්නෑ... සෙට් කරගන්න තියනවා නම් කියලා වැඩක් නෑ... ඒ වුණාට මට කළිං නෙත්තාට හිත ගිහින් තිබුණනෙ... මම නෙත්තා වෙනුවෙන් ඉවසනවා බං.... උඹ ඔහොම කියන්නෑ දැක්කනං මාර ලස්සනයි බං..... අන්න කෙල්ලො....''

''ඇත්ත ද බං.''

''කෝ නම්බර් එක.....''

''ෆොන් එකේ තියෙන්නෙ. මම කතා කරන්නද උඹ කතාකරනවද?''



Scanned by CamScanner

"නෑ.. සාලි මම කතා කරන්නං, මොකද එක්ෂිබිෂන් එක තිබිලා වැඩි දවසක් නැති හින්දා තාම අපි දෙන්නවා මතක ඇති. අඳුරන්නෙ නැති කෙනෙක් කතා කළොත් වැඩි යමක් දූන ගන්න බැරි වෙන්න ඉඩ තියනවා. කෙල්ලගෙ අම්මා ටිකක් එක විදිහක් වගේ..."

"වසයි ද?"

"නෑ... හැම දෙයක් ම වෙන්නෙ අම්මට ඕන විදිහට වගේ.. මොකද කෙල්ලට අපි එක්ක වචනයක්වත් කතා කරන්න ඉඩ නොදී අම්ම තමයි හැම දෙයක් ම කිව්වෙ....."

"හුරතලේට හැදෙන කෙල්ලො එහෙම තමයි. ඔය සල්ලිකාර ළමයින්ට හාගෙට නාකිවෙනතුරුම කෑම කවන්නෙයි රෙදි හෝදල දෙන්නෙයි අම්මලා. ඒක හයි ක්ලාස් ෆැමිලිවල ස්ටයිල් එකක්නෙ.."

"හැබැයි අහංකාර බවක් නම් අම්මගෙන්වත් දුවගෙන්වත් පේන්න තිබුණෙ නෑ.. වැඩේ අපි දෙන්න කෙල්ල ව දැක්කෙ අන්තිම වෙලාවෙදී, ඉතිං කතා කරන්න වැඩි වෙලාවක් තිබුණෙ නෑ...."

"මචං... වෝර්ඩ් එකට යන්ඩ වෙලාවත් කිට්ටුයි... ආ... කතා කරලා බලපං....."

"උදේ පාන්දර ම නාගන්න වෙයි ද දන්නෑ.."

මෙත්සර සාලින්දගෙ දුරකතනයේ අදාල අංකයගෙන උගුර කට පාදගෙන සූදානම් විය. සාලින්ද ඇසිපිය නොගසා බලාසිටියේ ය.

"රිංග්ස් යනව ද?" නොඉවසිලිවන්ත වුණු සාලින්ද සෙමින් විමසුවේ ය.

වචන පාවිච්චි නොකර අතින් සංඥා කළ මෙත්සර ඇමතුම සම්බන්ධ වන තුරු සිටියේ ය.

"හෙලෝ..... ගුඩ් මෝර්නින් මිස්."

"ගුඩ් මෝර්නින්"





"මම ඩොක්ටර් මෙත්සර මනතුංග කතා කරන්නෙ.... මේ හිම කුමාරි ද?"

"ම්... දෝණි නම් ගෙදර... මොනාද ඩොක්ටර් දූන ගන්න ඕනෙ..."

"මේ හිම කුමාරිගෙ අම්ම ද?"

"ඔව්... කවුද මේ......."

"ආ.....මේ.... ආන්ටි..... මම පුරහඳ එකේ තිබුණ පැහැසර එක්ෂිබිෂන් එකේ දි මීට් වුණෙ.."

"ම්... කවුද?... මට හරියටම මතක නෑ..."

"ජෙනරල් හොස්පිට්ල් එකේ වැඩ කරනවා කිව්වෙ. ආන්ටිත් එක්ක අන්තිම වෙලාවෙ අපි දෙන්නෙක් ඇවිත් කතා කළේ.."

"ම්... ආ.. ඩොක්ටරස්ලා දෙන්නා නේද?... අනේ සොරි... ඉතිං පුතේ කොහොමද විස්තර.. තාමත් වැඩ කරන්නෙ ජෙනරල් හොස්පිට්ල් එකේ ද......"

"ආන්ටි වැඩක...ද හිටියෙ.."

"වැඩක තමයි.. කමක් නෑ කියන්නකො..."

"අපේ යාළුවෙක්ගෙ නංගි කෙනෙක් ලන්ඩන්වල ඉන්නවා.. අපි එහෙ එක්ෂිබිෂන් එකක් කරන්න යනවා. අපිට පුළුවන් හිම කුමාරිටත් අවස්ථාවක් දෙන්න."

"ආ.... ඒක නං දුවගෙන් අහන්න ඕනෙ..."

"එයාගෙ නම්බර් එකක් නැද්ද ආන්ටි....."

"ගෙදර ෆොන් එක වැඩ කරන්නෙ නෑ, අපි හැමදාම හවසට මූන් ෂයින් හොටෙල් එක ළඟ බීච් එකට එනවා. ඔයාලට පුළුවන් නම් පහ හමාරට විතර එන්නකො.. එතකොට මූණ ගැහිල ම කතා කරන්න පුළුවන්නෙ."

"හරි.. ආන්ටි.. අපි එන්නං"



Scanned by CamScanner

"හවසට කෝල් එකක් දීලා එන්න.."

"සාලි..... වැඩේ ගොඩ...... ආන්ටි කිව්වා ම කොහොමත් මඟ අරින්න නෑ කියලා මට හිතුනා."

"හවසට එන්න කිව්වා නේද?"

"ආය මොනවද?.... දූන් කවුරු කවුරු ද යන්නෙ.."

"අපි දෙන්න ම යමු... නෙත්ත ව එක්ක යන්න ඕනෙ ඔක්කොම ඕකේ වුණාට පස්සෙ.. එක බූට් එකක් කාලා දිරවන්නත් කලින් තව එකක් සෙට් වුණොත් බං ලෙඩක් වෙනවා."

"ඒකත් ඇත්ත..... අද උඹට නයිට් නෑනෙ..... කල්දාන්න ඕනෙ නෑ.. අපි අද ම වැඩේට බහිමු... මං කිව්ව දේ බොරුද කියලා බලපංකො... පිස්සු හැදෙනවා බං... ඇස් එහෙම මාර ලස්සනයි. කිඳුරියෙක්ගෙ වගේ"

"උඹ ඒ පාර මටත් පිස්සු වට්ටන්න හදනවා. අන්තිමට කපුවා කපෝති වෙයි ද දන්නෑ.." හිම කුමාරිගේ ලස්සන වර්ණනා කරන අතරම මෙත්සරට විහිළුකරමින් සාලින්ද ඔරලෝසුව බැලුවේ ය.

"තව පොඩ්ඩෙන් ටයිම් ලේට් වෙනවා."

"රයිට් මචං..."

විහිලු පසෙකින් තැබූ යහළුවන් දෙදෙනා රෝගීන් වෙත ගියහ. මෙත්සර සහ සාලින්ද හිම කුමරිය පිළිබඳ අලුතින් දැනගත් කිසිවක් නොදන්නා නෙතුම් රෝගීන් අතරට ගොස් ඔවුන්ගේ සුවදුක් විමසුවේ ය.

පෙර පරිදි කතා බහ කිරීමට හැකිවූ හිමායා මේ වනවිට නිවසට පැමිණ සිටියා ය. වෛද්‍යවරයාගේ නියමය පරිදි හිමායාගේ කාමරය වෙනත් තැනකට මාරු කර තිබුණි. දැන් හිමායට පෙනෙන්නේ වතුර පිරුණු වැවේ සහ හරිත පැහැති කැලයේ දර්ශනයන් ය. මීට පෙර පෙනුන තාප්පය සහ කොන්ක්‍රීට් මාවතෙ කොටසක් හෝ දැස්වලට හසුනොවන්නේ ය. එබැවින් උදේ සවස නෙතුම් කොතරම් බැලුම් දුන්නද හිමායා දැක ගැනීමට නොහැකි වුණි.





ඉර ගෙවා දැමූ දවසේ වෙහෙස දරාගැනීමට නොහැකිව මුහුදට එහායින් වාඩිවූයේ ය. දහසකුත් වැඩ රාජකාරි අවසන් කළ සාලින්ද සහ මෙත්සර දෙදෙනා නෙතුම්ට රහසින් හිම කුමාරි සහ ඇගේ මව මුණ ගැසීමට වෙරළට යෑමට පිටත්වූහ.

හිරු බැසගිය හැන්දෑවෙ හිමායා මව සමඟ වෙරළ කොනේ පොල් ගස් යට වාඩිවී සිටියා ය. හිමායා රෝද පුටුවෙ සිටි අතර නිමාලි පරණ ඔරු කඳකට හේත්තුවී සිටියහ. මුහුදු රළ කුමරියගේ නිමක් නැති අනඟ රැඟුම් දෙස බලාසිටින හිමායාගෙ සිත සතුටින් පිරී යන්නට විය.

"අම්මෙ.... කෝ අර ගොල්ලො තාම නෑනෙ.... දැන් පහ හමාර පහුවෙලා ඇති...." හිමායාට මනෝ වෛද්‍ය ප්‍රතිකාරවලින් අතීත සිදුවීම් අමතක කළත් නෙතුම්ගේ රුව සහ ප්‍රදර්ශනයේ දී පැමිණි ඩොක්ටර් නෙතුම් ගැන මතකය අමතක වී නොතිබුණි. එහෙත් අවසන් වරට දුටු දින සිදුවූ සිදුවීමෙන් හිමායා සිතා සිටින්නේ නෙතුම් විවාහකයකු වන බවයි. එනම් තමා රවටා ගැනීමට ජනේලයෙන් බැලුම් හෙලූ බව හිමායා සිතා සිටින බැවින් නෙතුම් පිළිබඳ කලින් තිබූ පැහැදීම අඩුවී ඇත. සිතෙහි තදින් කා වැදුනු වේදනාව මෙත්සෙවණෙහි දී ලද උපදේශනය නිසා සමහන්වී තිබුණි. එබැවින් නෙතුම් පිළිබඳ හිමායා තුළ පෙර වූ සිතුවිලි දැන් නොමැත. එමෙන් ම හිමායාගේ සිත දැන් සියුමැලි නොමැත.

"මොකක් ද අම්මේ, එයාලගෙ නම කිව්වෙ.."

"මෙත්සර මනතුංග කිව්වා වගේ තමයි මට මතක.."

"දෙන්නෙක් කිව්වා නේද?"

"ඔව්...."

සාලින්ද සහ මෙත්සර වෙරළ ආසන්නයේ වාහන නවතා නොඉවසිල්ලෙන් එමින් සිටියහ.

"අම්මෙ අර දෙන්න වෙන්න ඇති." ඈතින් එමින් සිටි තරුණයන් දෙදෙනා පෙන්වූ හිමායා පැවසුවා ය. ඒ අතර නෙතුම්ගේ රුව නොමැති බව හිමායා දුර සිටම අඳුන ගත්තේ පුංචි තිගැස්මකිනි.



Scanned by CamScanner

"එදා හිටිය දෙන්නගෙන් එක්කෙනයි නේද අනිත් එක්කෙනා වෙන කෙනෙක් වගේ.." නිමාලිට ද නෙතුම් නැතිබව හඳුනා ගැනීමට හැකිවිය.

"සාලින්ද එයාලා අපිට ලණුවක්වත් දුන්නද දන්නෑ.. කොල් එකක් දීලා බලමු."

හිම කුමාරි හෝ මව යැයි අනුමාන කළහැකි කිසිවකු පෙනෙන මානයේ නොසිටි බැවින් සැකසිතු මෙත්සර දුරකතන ඇමතුමක් ගත්තේ ය.

"ආන්ටි අපි ඇවිල්ලා ඉන්නෙ බීච් එකට..."

"අපිට ඔයාලා පේනවා ඔතනින් වම් පැත්තට එන්න..."

"සාලි... අපිව එයාලට පේනවලු වම් පැත්තට එන්න කිව්වා."

"ආ.. ඇත්ත ද එහෙනං බොරුවක් නෙවෙයි... වම දකුණත් මතක නැතුව ගියා."

"කෝ පේන්නෑනෙ බං"

"අර ෆොරීනස්ලා ටිකක් ඉන්නෙ ඒ පැත්තෙ වෙන්න ඇති. යමුකො වම් පැත්තටනෙ එන්න කිව්වෙ..."

"අපි තරුමයො දෙන්නෙක් වගේ පේන්නෑනෙ නේද? යන්තමින් හරි වැදගත් පාටක් පේනවා නේද?"

"නෑ.. බං එච්චර ම අවුලක් නෑ.." දෙදෙනා තම සිරුරු දෙස විහිළුවෙන්ම බැලූහ.

"අනිත් පාර හිතයි අපි දෙන්න බොරුවක් කියලා. දුව සෙට් කරගන්න හදනවා කියලා."

"ඒකත් ඇත්ත අම්මා අපේ වයස පහු කරපු කෙනෙක් නෙ.."

කොතරම් කටකාරයින් වුවද හිත යට කැකෑරෙන නොඉවසිල්ල සහ කුතුහලය දෙදෙනාගේම හදවත්වල වේගය වැඩි කරන්නට විය.





උදේ සිට දවස පුරාම අව්වෙන් වේදනා විඳින ලද මුහුදු වැලි කේන්තියෙන් සපත්තු තුළට පනින්නට විය.

"අර ඉන්නෙ.... ඒ දෙන්නා වෙන්න ඕනෙ..."

"ඔව්.. අන්න අත වනනවා..."

"ඒකනෙ... හිතන තරම් කොක්කු සුදු නෑ වගේ... " සාලින්ද පැවසුවේ ය.

"එහෙම තමයි දුරට නෙළුම් මලේ රේණු පෙන්නෑ සාලියො..."

"යමන්කො රේණු බලන්ඩ ළඟට ම" දෙදෙනාම විහිළු කරමින් වැල්ලේ එරෙන සපත්තු ඔසවමින් ගියහ.

නිමාලිට එහා පැත්තෙන් හිමායා වාඩිවී සිටි බැවින් ඇය සම්පූර්ණයෙන් නොපෙනුන ද ඇගේ රෝද පුටුව මෙත්සරගේ දෑස්වලට හසුවිය.

"මළමගුලයි.... සාලි... සාලි....... අර බලපං.... එයත් රෝද පුටුවක"

"උඹ කොහොමද දන්නෙ....."

"ඇයි කියන්නෙ උඹට පේන්නැද්ද බං අර... රෝද පුටුව... මදැයි... නෙත්තා... ලිපෙන් ගිනි මැලේට වැටෙන්න ගියා වගේ වැඩක්"

"ෂිහ් දූන් මොකද කරන්නෙ.. මේක පුදුම වැඩක්නෙ බං.."

"දූන් මොකද කරන්නෙ.. ආපහු යන්නත් බෑ.. දූන් අපිව දැක්කනෙ, දැක්කෙ නැත්නං ආපහු යන්න තිබුණා."

"අනේ මෙත්තො..... දැක්කද මල් රේණු...." මේ අතරේ සාලින්ද මෙත්සරට විහිළු කිරීමට ද අමතක නොකළේ ය.

"කලිං කිව්වෙවත් නෑනෙ..."

"උඹට පිස්සුද බං.... මොන අම්ම ද බං එහෙම පැනලා කියන්නෙ දුව අබාධිතයි කියලා... අනිත් එක අපි ඇහුවෙ දුවගෙ විස්තර නෙවෙයිනෙ ආර්ට් එක්ෂිබිෂන් එක ගැනනෙ.."



Scanned by CamScanner

"අපිට තමයි වැරදුනෙ..... වෙලාවට බං නෙත්තව එක්කගෙන ආවෙ නැත්තෙ.."

"ඔව් කියලා වැඩක් නෑ.. එහෙනං නෙත්තා අනිවාර්යෙන් ම මහණ වෙනවා.."

හිතේ මල් පොකුරු පොකුරු පුරවාගෙන පැමිණි සාලින්ද සහ මෙත්සර රෝද පුටුව දැකීමෙන් පසු ඔහුන් වෙත ගමන් කළේ නොයා බැරිකමට ය.

හිතට දැනුන වෙනස මූණෙන් නොපෙන්වා මෙත්සර සිනා මුසු මුහුණින් යුතුව පිළිසඳර ආරම්භ කළේ ය.

"ආ... ආන්ටි ගොඩක් වෙලා ද ඇවිල්ලා.."

"ඔව් අපි හැමදා ම පහ හමාරෙ ඉඳලා හය හමාර වෙනකං මෙතන ඉන්නවා. සමහර දවස්වලට දෝණි මෙතන ඉඳලා චිත්‍ර අඳිනවා."

"ඉතිං...... හිම කුමාරි කොහොම ද? අපි ඔයාගෙ ඇත්ත නම දන්නෙ නෑනෙ."

"මම හිමායා නෙත්සරණි දොඩම්ලන්ද....." පෙරදින කතා කිරීමට නොහැකිව තිබුණ ද හිමායාට දැන් කතා කිරීමට හැකිව තිබුණි.

"ෂා.... ලස්සන නමක්.. කොහොම ද මේ දවස්වල චිත්‍ර එහෙම අඳිනව ද?"

"ඔව් තවත් එක්ෂිබිෂන් එකක් තියනවා ලබන මාසෙ,මේ දවස්වල ඒකට ලෑස්ති වෙනවා."

"පුතේ... කෝ අනිත් ඩොක්ටර්.... "

"ආ.... නෙතුම් ද? එයා අද වැඩ, මෙයත් අපේ හොස්පිටල් එකේ වැඩ කරන්නෙ... සාලින්ද.."

"මොකක් ද ලන්ඩන් එක්ෂිබිෂන් එකක් ගැන කිව්වෙ.." හිමායා පැකිලීමක් නොමැතිව කතා කළා ය.





"හිමායා... කමක් නෑ නේද හිමායා කියලා කතා කළාට."

"අපෝ කමක් නෑ..... ඩොක්ටර්ස්ලා වෙච්ච ඔයාලා මෙච්චර නිහතමානි වෙනකොට.. කාලාකාරියක් වෙච්ච මම කොහොමත් නිහතමානි වෙන්න එපැයි."

"හිමායා අපි මේ මාසෙ අග විතර ලන්ඩන් එක්ෂිබිෂන් එකක් කරනවා. අපිට ඔයාගෙ චිත්‍ර පනස්සියක් විතර දෙන්න බැරිද?"

මෙත්සර බොරුව නියම බොරුවක් ලෙස මෙන්ම ඉටුකිරීමට නොහැකි ඉල්ලීමක් ලෙසින් පවසා සිටියේ ය.

"අපෝ... ඒක නං කරන්න බෑ.. වෙලාව මදි?"

"තව මාසෙකින් විතර මම එකක් කරනවනෙ. අඩු ගානෙ තව මාස දහයක්වත් යයි....."

"ආ.. ඇත්ත ද? අපි ඔය ගැන එච්චර දන්නෙ නෑනෙ... දැන් අපිට මොකුත් වෙනස් කරන්න බෑ නේද සාලින්ද?"

"ඒකනෙ..... දැන් නංගිලා හෝල් එකත් බුක් කරලා ඉන්විටේෂන් එහෙමත් යවලා ඉවරයිලු"

"කමක් නෑ... අපි නෙක්ස්ට් ඉයර්..... බලමු..."

"පුතාලට වෙලාවක් තියනවා නං වීක් එන්ඩ් එකක අපේ ගෙදර ඇවිත් යන්න එන්න. දෝණිගෙ අලුත් චිත්‍ර වගයක් තියනවා. එදා හරිම කැමැත්තෙන් චිත්‍ර බැලුවනෙ.. නෙතුම් පුතාවත් එක්ක එන්න...." ලන්ඩන් ආර්ට් එක්ෂිබිෂන් එක පිළිබඳ මෙත්සරගෙ බොරුව නිමාලි දෝතින් බාරගත්තා ය. නිවසට පැමිණෙන ලෙස ආරාධනා කළේ නෙතුම් ද සමඟ ය.

"ආන්ටි කොහෙ ද ගෙවල් තියෙන්නෙ...."

"එන්න කිව්වට ගෙදර තියෙන්නෙ කොහෙද කියලා කිව්වෙ නෑනෙ... පුතා අපේ ගේ තියෙන්නෙ බ්ලූවෝටර් ලිලී ගාර්ඩන්ස්වල, ටවුන් එකේ ඉඳලා යන කොට වැව පහුවෙනකොට පාර අයිනෙ ලොකු නුග ගහක් තියනවා වම් පැත්තෙ. අපේ ගේ තියෙන්නෙ ඒත්



Scanned by CamScanner

එක්ක ම දකුණු පැත්තෙ.... හොයා ගන්න අමාරු නෑ.... බැරි වුණොත් නිමාලි ආන්ටිලාගෙ ගේ කොහෙද කියලා අහන්න.. හැමෝම දන්නවා.''

නිමාලි මෙසේ පවසන විට මෙත්සර තමා පිටුපස සිටි සාලින්දගේ අත සෙමෙන් කොනිත්තුවේ ය. හිම කුමාරි සහ හිමායා දෙදෙනා එක් අයෙකු බව හඳුනාගැනීම මෙත්සරට අදහා ගැනීමට නොහැකිවුණි.

''ආ...... අපි නිවාඩු දවසක එන්නං.. රෑ වෙන්නත් එනවා. අඳුන ගන්න ලැබීම සතුටක්, අපි ගිහින් එන්නං ආන්ටි.. අපි යනවා හිමායා...''

''හරි පුතා... .''

''සොරි එක්ෂිබිෂන් එකට ජොයින් වෙන්න බැරි වුණාට.''

''කමක් නෑ හිමායා අපි පස්සෙ බලමු.''

''අපි එන්නං හිමායා..'' සාලින්ද සහ මෙත්සර කටට පැමිණි බොරු කන්දක් පමණ අතහැර වෙරළ පසුකර පැමිණියහ.

අඳුර හාත්පස වැටීගෙන එද්දී දැල් ආම්පන්න රැගත් ධීවරයෝ මුහුදු යන්නට වෙරළට ළඟා වූහ.

''බලපන්කො..... අපි වටේ ගිහින් තියෙන්නෙ එකම කෙල්ලටනෙ.... එදා එක්ෂිබිෂන් එකේදී නෙත්තා නිතරම කිව්වා කොහෙදි හරි දැකලා පුරුදුයි කියලා....''

''ඒ වෙද්දි ජනේලෙ ගාවදි දැකලා ඉවරද?''

''ඔව්... සතියක් විතර ඇති...''

''මේක අපෙත් ඔළුව කොලොප්පන් වෙන වැඩක්..''

''සාලි..... මොකද බං කරන්නෙ.... අපි නෙත්තගෙ හිතටත් හිම කුමාරි ගැන දැම්මනෙ...''

''කවුද බං මෙහෙම දෙයක් හිතුවෙ... හිතා ගන්නත් බැරි තරං පුදුමයක් බං''





''කොහොම ද කකුල් තිබ්බනං කෙල්ලගෙ වටිනාකම....''

''සමහර විට කකුල් තිබ්බනං ඔය හැකියාවල් පිහිටන්නෙ නැති වෙන්න තිබුණා.''

''මෙත්තා උඹ කිව්වත් වගේ සුරංගනාවියක් වගේ ලස්සනයි නේද?''

''ඒකනෙ ආබාධිතයි කියලා මූණෙන් කිසිම අඩුවක් නෑ... බලපන්කො කොණ්ඩෙ ලස්සන..''

''නෙතුම් පිස්සු වැටුන එක අහන්ඩත් දෙයක් ද? අපිත් ජනේලෙන් දැක්ක නං ඔය ටික තමයි. හැබැයි අපි නෙත්තාට වඩා ඉක්මනට හිත හදාගෙන තව මලකට ඉඟිලෙයි.. එච්චරයි වෙනස..''

''පව් බං.. ලස්සන අනාගතයක්........''

''ඒව ඔක්කොම ඇත්ත. මට තාමත් මේක හීනයක් වගේ දෙන්නම එක්කෙනෙක් වෙච්ච එක..''

''දැන් අපි නෙතුම්ට කියන්නෙ කොහොම ද?...''

''කිව්වොත් මහණවෙයි, ඕකා ඒ තරමට මිනිහා.''

සාලින්ද සහ මෙත්සර අහස පොළොව ගැටලන්නට තරම් කල්පනා කරන්නට වූයේ නෙතුම්ට හිමායා පිළිබඳ කෙසේ දැන්විය යුතුද යන ගැටළුව විසඳාගැනීමට නොහැකිව ය.

හිමායා යථා තත්ත්වයට පත්වී සිටිය ද කැලුම් සතියකට වතාවක් හිමායා බැලීමට නිවසට යන්නට විය. එය දූත් රෝගියෙකු බැලීමකට වඩා වැඩි හිතවත් කමක් විය. නිමාලිත් හිමායත් සුදූ ආච්චිඅම්මත් ගෞරවයෙන් භක්තියෙන් කැලුම්ට සලකන්නට විය. හිමායාගේ යටපත්ව තිබූ හැකියාවන් දිනෙන් දින වර්ධනය විය. කැලුම් හිමායා වෙනුවෙන් බොහෝ වෙහෙසවී උපදේශනය ලබාදුන්නේ ය.

දවස් ගෙවී යන අතර තුර කැලුම් වෛද්‍යවරයා හිමායාගේ මිතුරෙකු ද සහෝදරයකු ද නෑදෑයෙකු ද වන අතර නිමාලිට සහ සුදූ ආච්චිඅම්මාට දෙවියකු මෙන් පෙනුනි. එබැවින් කැලුම්ට හිමායා



Scanned by CamScanner

හමුවීමට මෙන්ම නිමාලිගෙ නිවසට ඕනෑම අවස්ථාවක පැමිණීම කොන්දේසි රහිත බලපත්‍රයක් ලැබුණි. බුද්ධිමත් වෛද්‍යවරයකු වන කැලුම් තම වෘත්තියට නිගාවන අයුරු පහත් මානසිකත්වයකින් යුත් අයෙකු නොවන බැවින් හිමායාට අනතුරක් කිරීමට කිසිවිටෙක යටි සිතෙන් හෝ නොසිතුවේ ය. අතීතයේ සිටි පැරැන්නන් පැවසුවේ ගින්දර සහ පුළුන් ළඟ තැබීමෙන් ගිනි ගන්නා බවයි. තරුණ වියේ පසුවන හිමායා කෙරෙහි කැලුම්ගේ හදවතේ ලෙන්ගතු හැඟීමක් කාටත් රහසින් පිළිසිඳ ගත්තේ ය.

ඇවිදින්නට දෙපා නැති හිමායා කෙරෙහි කැලුම්ගෙ සිතෙහි උපන් ලෙන්ගතුකම දිනෙන් දින මෝරා ආදරයක් බවට පත්වීමට වැඩි දිනක් ගත නොවුණි. එහෙත් වචනෙකින්, බැල්මකින් හෝ ස්පර්ශයකින් හිමායට ඒ බවක් නොඅඟවා සිටීමට කැලුම් උත්සාහ ගත්තා ය. එය මිහිපිට ආදරවන්තයෙකුට අසීරුම කාර්යයකි. එවැනි කැපකිරීමක් කැලුම්ට කිරීමට සිදුවූයේ ඔහු ඇගේ වෛද්‍යවරයාවූ නිසාවෙනි. වෘත්තීය ගෞරවය මෙන්ම නිමාලිගෙ සිතට වැදී වැටහීමක් යාම වැළැක්වීම පිණිස කැලුම් හිමායාට දක්වන ආදරය සදාකාලික රහසක් ලෙස හදවතේ මිහිදන් කර තබාගැනීමට තීරණය කළේ ය. කැලුම්ගෙ හදවතේ උපන් අකලංක ආදරය නිසා හිමායාගේ කලා ජීවිතයට මහත් පිටුවහලක් ලැබුණි. එබැවින් දිනෙන් දින හිමායාගේ සතුට මෙන්ම හැකියාවන් ද  වැඩෙන්නට විය.

හැඩකාර රුවක් හිමිවුවද දෙපයින් නැගී සිටින්නට නොහැකි තමාට මේ ආත්මයේ ආදරය තහනම් බව වටහාගත් හිමායා පළවෙනි දෙවැනි හා තෙවැනි තැනත් කලා ජීවිතය වෙනුවෙන් වෙන් කළා ය. එබැවින් කැලුම් පිළිබඳ ඇගේ සිතට දැනුනේ ජීවකයකු, ගුරුවරයකු සහ සහෝදරයකු යන හැඟීමක් පමණි.

මෙත්සර සහ සාලින්ද එක්වී නෙතුම්ගේ තැලුණ සිත සැනසීමට නොයෙක් බොරු ගොතමින් කල්පනා කළේ නෙතුම්ට අනංගයා මෙතරම්ම වෛර කරන්නේ ඇයිද යන්න පිළිබඳව ය. හිම කුමාරිලා හිමායලා ගැන ඇත්ත දන්නෙ නැති නෙතුම් සිනාව සහ සතුට උකස් සේප්පුවක රඳවා රොබෝවෙකු මෙන් රාජකාරිය සහ දෛනික ජීවිතය පුරුද්දට මෙන් ගෙවමින් සිටින්නේ ය.





කැලුම්ගෙ හදවතේ හිමායා පිළිබඳ ආදරයෙ දිග පළල කිසිවකුට පැවසීමට නොහැකි ය. එහෙත් කැලුම්ට හිමායා දකින්නට කතාබහ කරන්නට හැකි බැවින් හිතට දැනෙන වේදනාව මොහොතකට හෝ නිවීයන්නේ ය. එහෙත් නෙතුම්ට කිසිම වරප්‍රසාදයක් නොවීම හදවත ඉරී තැලී වේදනා දෙන්නට තරම් ය. කැලුම් කල්හාර අයියා සහ නෙතුම් දිල්හාර මල්ලි එකම තරුණියක වෙනුවෙන් දෙයාකරයක හඳුනාගැනීමකින් එක වහලය යට සිටිමින් තැවෙන්නට වූහ. කැලුම් රුවැති, දක්ෂ, පොහොසත්, ආබාධිත තරුණ ගැහුනු ළමයෙක් ලෙසත්, නෙතුම් වැඩි විස්තර කිසිවක් නොදන්නා රූමත් සහ පොහොසත් තරුණියක ලෙසත් හිමායා හඳුනාගෙන තිබේ. එක මලට දෙදෙනාම හදවතින්ම පෙම් කරන බව දෙදෙනාම නොදන්නා එකම කරුණ විය.

එදින ප්‍රසිද්ධ රජයේ නිවාඩු දිනයකි..... නෙතුම් පෙරදිනවලදී නිවාඩු දිනයට නිවසින් බැහැරව ගියද දැන් ගෙතුළටමවී පොතක්, පත්තරයක් එසේත් නොමැති නම් රූපවාහිනිය හෝ නරඹන්නට විය. එදිනද උදෑසන ආහාර ගැනීමෙන් පසු සැටියෙ වාඩිවී රූපවාහිනිය නරඹන්නට වූයේ ය. කැලුම් ද එදිනෙදා විස්තර කතාකරමින් සිටියේ ය. කතාව වැඩිදුර යන්නට නොහැකි වූයේ කැලුම්ගේ ජංගම දුරකතනය අඬන්නට වූ නිසාවෙනි. ඔහු දුරකතනය කනේ තබාගෙන ගොස් වාහනය නැගුණේ ය. දිනපොතෙ පෙරලමින් සිටි පිටුව එලෙසින්ම බලාසිටියේ කැලුම් ආපසු පැමිණෙන තුරු ය. සිරුරට දැනුණ දහඩිය දරාගැනීමට නොහැකි බැවින් නෙතුම් අත මානයේ තිබූ විදුලි පංකාවේ බොත්තම තද කළේ ය. දින පොතේ පිටු වේගයෙන් පෙරළී ගියේ එහි ඇතුළත සැඟව සිටි කුඩා කඩදාසි සියල්ලම සාලයේ අස්සක් මුල්ලක් නැර විසිකර දමමිනි. හිතේ තිබුණ වේදනාව ද ටික වෙලාවකට සුළඟට  ගියා මෙන් දැනුනේ කලබලය නිසාවෙනි.

සිදුවීම දුටු සැනින් නෙතුම් විදුලි පංකාව ක්‍රියාවිරහිත කළේ ය. එවිට සියල්ල සිදුවී අවසානවී තිබුණි. කැලුම් ගිය දෙස බලමින් පුටුවෙන් නැගිට සිටියේ මහා වරදක් කළ පොඩි එකෙකු මෙනි. සැණෙකින් හතර අත විසිවී ගිය කඩදාසි ඇහිදින්නට වූයේ ය. කැලුම්ගේ ඇමතුම දිගු බැවින් නෙතුම්ට සියල්ලම ඇහිදින්නට කාලය තිබුණි.



Scanned by CamScanner

''ම්.. අම්මෝ ඇති යන්තං... ලොකු දුක්කනම් ඉවරයි... බැන්නෙ නැතත් මොනවා හරි කියනවනෙ.... කෝකටත් කියනවා ෆැන් එකට හුළගෙ ගියා කියලා. ආ... අර මොකක්ද ෆොටෝ එකක්... සමහරවිට අයියගෙ කෙල්ලගෙ වෙන්න ඇති...''

නෙතුම් එසේ සිතමින් කළුවර කච්චිචිය යට වැටී තිබුණ ජායාරූපයක් ඇහිදින්නට ගියේ දණහිස ද බිම තබමිනි.

''ම්.... මේ මම මෙච්චර දවසක් හෙව්ව කෙනා.... ම්.... මෙයාගෙ ෆොටෝ එකක් කොහොම ද අයියට....ම්..... එතකොට එදා මෙත්සර එක්ක අපි ගේට්ටුව ළඟ ඉන්නකොට වයසක ගෑනු කෙනා මෙත්සරට කිව්වලු ලොකු බේබි ඩොක්ටර් එක්ක කතාවක් කියලා.. එහෙනං එදා අයිය ද ගේ ඇතුළෙ හිටියෙ... ඒ වුණාට එදා තිබුණෙ අයියගෙ කාර් එක නෙවෙයි නෙ.... එතකොට අයියා ලස්සන ළමයෙකුට ට්‍රීට්මන්ට කරනවා කිව්වෙ මේ ළමයා ගැන ද?.. මේ ළමයා ලෙඩ වුණේ මට නෙත්මි ඇවිත් එදා කතා කරපු එක දැකල ද? අයියා ඒ ළමයා ලස්සන හින්දා ෆොටෝ එකක් ගේන්න ඇති... අයියා ඒ ළමයත් එක්ක සම්බන්ධකමක් නැතිව ඇති.''

නෙතුම් ජායාරූපය වෙව්ලන අතින් ගෙන කල්පනා කරන්නට විය. නොයෙක් නොයෙක් අනුමාන ඔස්සේ හිත දුවන්නට වූයේ හරිහැටි යන මඟක් නොදන ඉබාගාතේ දුවන පිස්සු බල්ලෙකු මෙනි. පැරණි මතකයන් සියල්ල එකින් එක පිළිවෙළටත් අපිළිවෙලටත් මතක් කරන්නට වූයේ හදවත වේගයෙන් ගැහෙද්දී ය.

කැලුම් තවමත් වාහනයටවී දුරකතන ඇමතුම හා සම්බන්ධවී ඇත. හිතුමතේ පෙරලී ගිය දිය පොත මේසය මත තිබුණි. හිමායගෙ ජායාරූපය ආපසු දිනපොතට දැමීමට නොහැකිවූ නෙතුම් එය රැගෙන කාමරයට ගියේ බැංකුවක් කොල්ලකෑ මංකොල්ලකරුවෙකු ලෙසිනි. කාමරයට ගොස් ජනේලය අසලටවී කල්පනා කරන්නට වූවද හිස හිරිවැටී ඇත. සිරුර පුරා වේදනා දෙමින් කුහුඹුවන් දුවන බවක් දැනුණි. ඇඳට වැටී මුනිල්තලාවී සිටින්නට උත්සාහ කළත් හිත කේලම් කියන්නට විය.

''පොඩී.... පොඩී...... මම හන්දියට ගිහින් එන්න යනවා...''





''හා....'' හිතේ වේදනාව සඟවාගෙන නෙතුම් උත්තර දුන්නේ ය.

''ලොකුගෙ දින පොත ටිකක් බැලුවොත් තව මොනවා හරි දැන ගන්න පුළුවන්, ඒක හොඳ වැඩක් නං නෙවෙයි. ඒත්...... මගේ හිත හදාගන්න ඒක ටිකක් බලන්න ඕන..'' වැරදි වැඩක් බව දැන දැනම නෙතුම් පඩිපෙල් පසුකරන්නට විය.

''අයියා දැන්ම එයිද දන්නෙ නෑ... එයාගෙ දින පොත බැලුවා කියලා අහු වුණොත් නම් තරහ යයි.... හුළඟට ගිය එක නම් හිතලා කරපු දෙයක් නෙවෙයිනෙ. ඒත්....'' නෙතුම්ගෙ හිත දෙගෙඩියාවෙන් ලතවුවද දින පොත බැලීමට හිත එකඟ කරගත්තේ ය.

අම්මා සහ අප්පච්චි පැමිණෙන්නේ සවස ය. කැලුම් පැමිණීමට ඉඩ තිබෙන බැවින් නෙතුම් ඉක්මන් විය. බිත්තියේ හිටපු හූනෙක් චිත්.. චිත් කියමින් පින්තූරයක් පිටුපස සැඟවුණේ ය. එය නෙතුම්ට කළ බැණ වැදීමක් නොවුන ද නිහඬ ගේ පුරාවට ම දෝංකාර දුන්නේ ය. අල්පෙනෙත්තක් වැටුණද ඇසෙන තරමට නිහඬ බවක් පැතිරී ගියේ ය.

නෙතුම් ගැහෙන පපුව, වෙව්ලන දෑත් සහ දහඩිය ගලන පිටකොන්ද අසීරුවෙන් පුටුවට හේත්තු කරගෙන ඇහිපිය නොහෙලමින් පිටු දිගේ වේගයෙන් දුවන්නට වුණි. මේ වන විට අවසන් වීමට ද ළඟ බැවින් සැක සිතන්නට තරම් කිසිවක් හමු නොවුණි. නෙතුම්ගෙ සිතට සියුම් ලැජ්ජාවක් ගොඩවෙමින් පැවතියේ අයියා පිළිබඳ වැරදි සිතුවිල්ලක් ඇති කරගත් බව දැනුන නිසාවෙනි. එසේ සිතමින් අවසන් පිටුවට කලින් පිටුව පෙරළුවේ මෙහි නැතිනම් අවසන් පිටුවේ හෝ යමක් ඇත්දැයි දැකබලාගෙන සිත සනසා ගන්නට ය.

ගේට්ටුව දෙසින් ඇසුණු වාහන නළා හඬ හදවත බය කළ බැවින් හිස ඔසවා බලන්නට සිදුවිය.

''ඕ.... ලොකු එනවා...'' හිතට විදුලි සැරක් ගොඩවුණ ද, අන්තිම පිටුව ඇස් සොරාගත්තේ ය.



Scanned by CamScanner

"සොඳුරිය හිමායා, මට කවදාවත් ඔයාට ආදරෙයි කියන්න බෑ. මං එහෙම කිව්වොත් මම අවස්ථාවාදියෙක් කියලා ඔයා වගේ ම අම්මත් හිතයි. මම සල්ලිත් ගන්නෙ නැතිව ඔයා සනීප කළේ මේ හේතුව නිසා කියලා හිතයි. මට ඒ හැටි නම අහගන්න බෑ.. ඒත් මම ඔයාට ආදරෙයි හිමායා. මගේ ජීවිතේට මම දැකපු ලස්සන ම කෙනා ඔයා. ඒත්... ඔය ලස්සන මට අයිති කරගන්න මේ ආත්මෙදි බැරිවෙයි. ඔයා ළඟ ඉන්න හැමවෙලාවෙ ම මගේ හිතට ලොකු වේදනාවක් දැනෙනවා. මම ඔයාට තියෙන ආදරේ නිසා ඔක්කොම ඉවසගෙන ඉන්නවා. හිමායා ඔයා සඳ කිඳුරියක් වගේ ඔය ලස්සන මගේ ජීවිත කාලෙ ම මම පරිස්සං කරගන්නවා. මට මේ ලෝකෙ ඉන්න වටිනම කෙනා ඔයා... ඒත් මම කොහොම ද ඔයාට ආදරෙයි කියන්නෙ, මම ඔයාට ආදරෙයි මගෙ පුංචි සඳ කිඳුරියේ........"

මෙ සඳහන් වන්නේ තමන් ජනේලෙන් ආදරේ කළ ගෑනු ළමයා නොවෙයැයි නෙතුම්ට තවදුරටත් නොසිතා සිතන්නට නොහැකි ය. ජායාරූවෙහිවූ රුවට සමාන රුවක් කැලුම් පැනෙන් දින පොතේ අවසන් පිටුවේ ඇඳ තිබුණේ ඉහත ඡේදයට පහතිනි. කැලුම් වාහනය ගරාජයේ නවතා ගෙට එන පමාවට නෙතුම් ඉක්මනින් කියවා පඩිපෙල පසුකර ගොස් තිබුණි.

"පොඩී...... පොඩී...... කෝ මේ පොඩී ගෙදර නැද්ද?" කැලුම් කතා කරමින් නෙතුම්ගෙ කාමරය වෙත ගියේ පිළිතුරක් නොවූ නිසාවෙනි. අයියා ගැන වෛරයක් අහිතක් කේන්තියක් නොවුන ද හදවතට දරාගත නොහැකි වේදනාවක් දැනෙන්නට විය. එබැවින් නින්දගිය බව හැඟවීමට මුනින්අතට පෙරළුණේ ය.

"පොඩී......." කැලුම් කාමරේට පැමිණ කතා කළේ ය. එහෙත් පිළිතුරක් නොවුණි.

"ම්... මෙයා මේ උදේ හොඳට ම නිදි" සැබෑවට නිදාගත් ආයෙකු ඇහැරවිය හැකි වුවද බොරුවට නිදාගත්තෙකු දවසක් කතා කළත් ඇහැරවිය නොහැකි බව දන හෝ නොදන කැලුම් පිටව ගියේ ය.

හිමායා පිළිබඳ විස්තර දින පොතෙන් දැකීමෙන් ඇතිවූ හිතේ ආමාරුව නිසා මල්ලි නිදාසිටින බව කැලුම් නිකමටවත් නොසිතුවේ ය. මේසය උඩ දිනපොතෙහිවූ කඩදාසි තැන් තැන්වල මාරුවී තිබුණද





පෙරලා නොබැලූ බැවින් දැනගන්නට නොහැකිවුණි. තිබූ පැටියෙන්ම ගෙන කාමරයේ මේසය උඩ තැබූ කැලුම් නාන කාමරයට ගියේ ය. හිමායාගේ නිවසේ දවල් කෑමට කැලුම්ට ආරාධනාව ලැබුණේ මීට දින පහකට කළිනි.

"එතකොට ඒ ළමයාගෙ නම හිමාය ද? ලස්සන නමක්. ඒ ලස්සන මූණ ළඟට මට ආය කවදාවත් ළං වෙන්න බෑ... හැබැයි නෙත්මි එදා මං පස්සෙන් ආවෙ නැත්නං ඒ ළමයා මගෙන් කවදාවත් ඈත් වෙන්නෙ නෑ... මම අකමැත්ත පෙන්වද්දිත් නෙත්මි මම පස්සෙන් ඇවිත් එහෙම කළේ මට හිමායා ලබාගන්න වාසනාවක් නැති හින්දා වෙන්න ඇති. මම මොකක් හරි ගිය ආත්මෙ ලොකු පවක් කරලා ඇති. ඒත්... අයියා කවද හරි මනමාලි කරගෙන මේ ගෙදරට හිමායා ගේන දවසෙ මම කොහොම ද බලාගෙන ඉන්නෙ... මම මේ ලෝකෙ ඉන්න අසරණ ම කෙනා නේද?"

පිළිතුරක් පෙනෙන මායිමකවත් නොමැති උභතෝකෝටික ගැටළුවක් හදවතේ පුරවගත් නෙතුම් කල්පනා කරන්නට විය. සිදුවී ඇති දෙය කිසිවකුට පැවසීමට ද ශක්තියක් නොවූ බැවින් නෙතුම් මුහුදු වෙරලට ගොස් සිත සනසාගන්නට කල්පනා කළේ ය. අල්මාරියෙන් ගත්ත ඇඳුමක් ඇඟලාගෙන නෙතුම් නිවසින් පිටව ගියේ ය. නාන කාමරයේ සිටි කැලුම්ට නෙතුම් යන බවක් හෝ නොපැවසුවේ අමතකවීමෙනි. දිනපොත අතට ගත්විට චිහ්.. කියූ හූණා නෙතුම් දොරෙන් එළියට යන විටත් එලෙසින්ම කෑ ගැහුවේ ය. එහෙත් දන් හූනකු නොව අලියකු කෑ ගැසුවද නෙතුම්ට නොඇසෙන තරම් ය. නෙතුම්ගේ වාහනයේ හඬ ඇසී කැලුම් හිසෙහි තෙත සළුවකින් පිහදමින් ඉදිරිපස දොර ළඟට පැමිණියේ ය.

"පොඩී... පොඩී........ කොහෙද යන්නෙ..."නිවසේ කිසිවකුට නොදන්නා කිසි දිනක නිවසින් පිටව නොයන මල්ලීගේ ගමන පිළිබඳ පුදුමයෙන් බලාසිටි කැලුම් ඉණට හැදි සුදු සළුව පිටින්ම දොර ළඟ තිබූ සෙරෙප්පු පයලාගෙන ගේට්ටුව ළඟට ද ගොස් බැලුවේ ය.



Scanned by CamScanner

''පොඩී..... මොකක් හරි ලොකු ප්‍රශ්නෙකින් දුක් විඳිනවා. මම පිට අයගෙ හිත් හදනවා ඒත් මගේ මල්ලි මාස ගාණක් තිස්සෙ පසු තැවෙනවා. ඇයි මට මල්ලිගෙ හිත හදන්න හිතුනෙ නැත්තෙ... කමක් නෑ පොඩී ගිහින් ආපුවා ම මම අද කෙළින් ම කතා කරලා අහනවා ඇයි කියලා. පොඩි කාලෙ ඉඳලා එක ඇඳේ නිදාගෙන තරගෙට ගස්වලට වූ දාලා, එකට කාපු අපි දෙන්නට කතා කරන්න බැරි දෙයක් නෑ.. මම පොඩීට ආදරෙයි වගේ ම පොඩිත් මට ගොඩාක් ආදරෙයි. ඒ නිසා පොඩී කවදාවත් මම කියන දෙයක් අහක දාන්නෙ නෑ.. අක්කලා නංගිලා නැති මේ ගෙදර අම්මටයි අප්පච්චිටයි ඉන්නෙ අපි දෙන්නා වගේ ම අපි දෙන්නට ඉන්නෙත් අපි දෙන්නා විතරයි.'' නෙතුම් පිටව ගිය දෙස බලා සිට ආපසු නිවසට එමින් සිටි කැලුම් කල්පනා කළේ ය.

''හරමානිස් සීයේ.... හරමානිස් සීයේ....'' කැලුම් හරමානිස් සීයා සෙවුයේ ඔහුට හෝ යන්නේ කොහේදැයි පවසා ඇත්දැයි දැනගැනීමට ය. නිහඬ බවෙන් පෙනී යන්නේ ඔහු ළඟ පාතක නොවූ බවයි. එනම් ඔහුට ද පැවසීමට අවස්ථාවක් නොමැති බවයි.

කැලුම් කල්පනා කරමින් හිමායාගෙ නිවසට යෑමට සූදානම් වූයේ ය. සාමාන්‍යයෙන් අසා නුපුරුදු තරම් හඩක් පිටකරමින් කැරලෙක් ගේ මුදුනින් යටිගිරියෙන් කෑ ගහගෙන ගියේ ය.



# 26

**අහසේ** දම්පාට වලාකුළු බිමට පැමිණීමට හදිසියේ එහෙ මෙහෙ ඇවිදිනවිට එකිනෙකා හැපී රැවුම් ගෙරවුම් දෙන්නට විය. අහසේ තිබූ නිල්පැහැය කෙමෙන් කෙමෙන් බොඳවූයේ ය. කෑ කෝගැසීම්වලට අකමැති ඉර වලාකුළු වැහි වලාකුළුවලින්ම මුහුණ වසාගත්තේ ය. පාලම යට මැටි ගෙදර වැහිළිහිණි පරම්පරාව දෑත් ඔසවාගෙන අහසට පැන්නේ වැස්ස රැගෙන පමානොවී පැමිණෙන ලෙස වැහිවලාවට ඇවිටිලි කරන ලෙසිනි.

මුහුදු වෙරළට යෑමට සිතාගෙන නිවසින් පිටව පැමිණිය ද කොහේ යන්නදැයි නෙතුම්ට තීරණයක් නොවුණි. හිතෙන හිතෙන පැත්තට පාවෙන වේලිච්ච වරා ගෙඩියකින් ගැලවුණ පුළුං රොදක් මෙන් නෙතුම්ගේ සිත ද අරමුණක් නොමැතිව දස අතේ පාවෙන්නට විය. සිත රිසිසේ සරන්නටවූ අතර මෝටර් රථයට යනමග කියන්නට වූයේ දෑත් දෙපා පමණි.

''මේ ආත්මෙදි කිසිම කෙනෙකුට වරදක් නොකරපු මට මේ තරම් දුකක්....'' සිත හඬා වැටෙමින් නොනවත්වාම අසන්නට වූයේ ය.

''මට දුන් කරන්න දෙයක් නෑ... මම තව එකසැරයක් ගිහින් හිමායාගෙ ලස්සන මූණ දිහා බලලා එනවා. කමක් නෑ... මම ටික කාලෙකට රට යනවා. ඊට පස්සෙ මට හිත හදාගන්න පුළුවන් වෙයි.''



Scanned by CamScanner

නෙතුම් බ්ලූවෝටර් ලිලී ගාර්ඩින්ස් හරහා දුවන පාර වෙත වාහනය රැගෙන ගියේ ය. නෙතුම් අලුත් බලාපොරොත්තු මවමින් වෙනස්වීමට උත්සාහ දරුවද අතීතය වළඳාලීමට සිත අකමැති ය.

සුපුරුදු තාප්පය කෙළවර වාහනය නතර කළේ ය. මේ වන විට හිමායාගේ කාමරය නිවසේ අනෙක් පසට මාරුවී තිබුණි. එබැවින් නෙතුම්ට දැක ගැනීමට හැකිවූයේ හිමායාගේ රූමත් මුහුණ නොව තීන්ත ආලේප තවරාගෙන පිටුපා සිටින ජනෙල් පියන් දෙක ය.

"හිමායා....මට අන්තිම වතාවට ඔයාගෙ මූණවත් බලන්න දෙන්නෙ නැද්ද? මම ඔයාට වරදක් කළේ නෑ.... මම ඔයාට ආදරෙයි."

නෙතුම් සුක්කානම මත දෑත් තබාගෙන දෑස් වැසුණු ජනෙල් පියන් වෙතට යොමුකරගෙන කල්පනා කළේ ය.

"මම තරහා නෑ හිමායා...... මම යනවා. ඔයාට මම ලස්සන අනාගතයක් ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. මම වගේ ම අපේ අයියත් ඔයාට කවදාවත් දුකක් දෙන එකක් නෑ.." නෙතුම් කඳුළින් බොඳ වුණු දෑසින් බලා සුභ පැතුම් වැසුණු ජනේලය අසල තබා ආපහු පැමිණෙන්නට විය.

මාදං ගසේ කොළ වැසෙන තරමට ඉඳුනු එල බරවී ඇති ලෙසින් අහසේ වැහි වලාවෝ එල්ලී සිටියහ. වැස්ස ගැන තැකීමක් නොකළ කැලුම් හිමායගෙ නිවසේ දිවා ආහරය සඳහා පිටත්ව ගියේ ය. ඒ වනවිට නෙතුම් බ්ලූවෝටර් ලිලී ගාර්න්ඩ්ස් පසුකර එමින් සිටියේ ය.

උකුස්සො උඩ අහසෙ රවුම් රවුම් කැරකෙමින් ඉගිලෙන අතර වැහිළිහිණියන් පාතින් ඒ මේ අත ගියහ. ඇට්කුබ්බො ගස්වල වාඩිවී කෑ ගැසූහ. ළඟ එන මහ වරුසාවට බියෙන් සුදු අරලිය මල් අතු අගින් බිමට පැන්නේ තණ පත් අතර සැඟවීමට මෙනි. බය දනුන ද වතුසුදු මල් තදින් අතු ඉති අල්ලාගෙන සිටියහ.

මුහුදු රළ මෙන් නොනැවතෙමින් නැගී බිඳී විසිරෙන සිතුවිලි සිතේ පුරවාගත් නෙතුම් රොබෝවකු මෙන් රියඅසුනේ වාඩිවී සියුමැලි සුරතින් සුක්කානම හසුරවන්නට වූයේ ය. දරාගන්නට බැරි තරම් සිතුවිලි හදපාරවන්නට වූයේ සියලුදේ මොහොතකට අමතක කරමිනි.





වාහනේ වේගෙය ඔහුට නොදැනුවත්වම වැඩිවූයේ ය. දෑස් නොපෙනී මුළු ඇඟම අප්‍රාණික විය. නෙතුම්ගෙ සිරුර නිසිලෙස හැසිරවීමට අවැසි සංඥා දීමට මොළය අසමත් වුණි. නෙතුම්ටවත් කලින් නොදන්වා හදිසියේ සිදුවූ වෙනස ඉදිරියෙන් පැමිණි වාහනවල රියදුරන්ට ද තේරුම් ගැනීමට නොහැකි වුණි. ඉදිරියෙන් පැමිණි ලොරි රථයෙ නළාව උපරිම හඬින් කෑගැසුවේ ක්‍රා......ස් ක්....රී.......ස් ක්......රෝ......ස් යැයි තිරිංග හඬ ද සමඟිනි.

"දඩා......ස්..... ස්....ලා....ං...." පාරේ දුවන වාහන මෙන්ම මිනිසුන් ද මොහොතකට නිසල වුණි.

අධික වේගයකින් පැමිණි නෙතුම්ගේ මෝටර් රථය ලොරි රථයේ එම්පස මුහුණට මුහුණ වැදුණේ මහා හඬක් නංවමිනි. කාන්තාවන් දෑස්වසා ගෙන මුහුණු බෙරිකරගත් අතර පිරිමින් වහ වහා ඒ වෙත දුවන්නට වූහ.

වාහනය ලොරි රථයේ හැප්පීමට මොහොතකට පෙර සිට නෙතුම් සිහිසුන් වී සිටියේ ය. එහෙත් ඒ බවක් පිටත සිටි කිසිවකුට දැකගත නොහැකිවිය. පාරේ දුවමින් තිබුණ වාහන සියල්ල ම නැවතුනි. මේ අතර කිසිවක් නොදුටු කනේ කරාබු දෙක තුනක් එල්ලගෙන පාටකරපු කොන්ඩ පෙන්දක් බෙල්ලට වනාගත් ඉලන්දාරින් කිහිප දෙනෙක් තම ගණන්කාරකම් එළිදක්වන්නට විය.

"ඔහොම ද යකෝ වාහන එලවන්නෙ... කවුද උඹට ලයිෂන් දුන්නෙ.. ඈ... යකෝ..."ලොරි රථයේ රියදුරුට ගුටි අනින්නට සූදානම් විය.

"මේ මල්ලි දන්නෙ නැතිව කෑ ගහන්ඩ එපා.... නවත්වපු වාහනේ ඇවිත් මේ කාර් එක වැදුනෙ..."

සිහිසුන් වූ නෙතුම්ගේ හිසෙන් දෑත්වලින් සහ දෙපාවලින් ගලාගිය රුධිරය වාහනයෙන් බිමට ද වෑහෙන්නට විය. ඉක්මන් වූ සියලු දෙනා නෙතුම් රෝහලට ඇතුළත් කරන්නට කටයුතු කළ අතර නෙතුම් රැගෙන ගියේ ඔහු සේවය කරන රෝහලටම ය. මේ වන විට ද ඔහු වෛද්‍යවරයෙක් යන්න කිසිවකු දැන නොසිටියේ ය. වාහනයේ



Scanned by CamScanner

මුහුණත වූ වෛද්‍ය ලාංඡනයද බිඳුණු වීදුරු සමග බිම වැටී තිබුණි. මෝටර් රථයේ ඉදිරිපස සම්පූර්ණයෙන් ම පොඩිවී තිබුණි. මෙතෙක් වෙලා පෙරුම් පුරමින් සිටි වැසිදිය කඳුළු ගිගුම්දෙමින් බිමට වැක්කෙරෙන්නට වූයේ නෙතුම්ගෙ සිරුරින් බිමට ගැලූ රුධිරය සෝදා හැරීමට මෙනි.

කැලුම් පැමිණෙන විටද පාරෙහි වූ තදබදය අඩුවී නොමැත. සෙනග පාර පුරා ඇවිදිමින් සිටියේ ය. පාර මැදවූ වාහන දෙක පොලිසිය සහ රැස්ව සිටි පිරිසගේ මැදිහත් වීමෙන් ඉවත් කරමින් තිබූ බැවින් කැලුම්ගෙ වාහනය ඇතුළු වාහන පැමිණි තීරුවේ ම නැවතී ගත්හ.

"ඇක්සිඩන්ට් එකක් වගේ.." සුක්කානමෙන් දෑත් ඉවතට ගෙන බලා සිටින කැලුම්ට සිතුනි.

"අපේ මිනිස්සු වාහන අතට ගත්තම ඉගිලෙනවනෙ.. හැමෝම පරෙස්සමට ගියා නං ඔය කරදර මොකුත් නැනෙ.. කැලුම් කල්පනා කරමින් ඉදිරිය බලාගෙන හිටියෙ වාහනයට ඉදිරියට යාමට පාර පැහැදිලි වනතුරු ය.

උඩට එසවුණු බැකෝ යන්ත්‍රයකින් නෙතුම්ගේ මෝටර් රථය ඔසවා තට්ටු ලොරියක් මතින් තැබුවේ ය. කැලුම් අහම්බෙන් මෙන් එදෙසට හැරුණි.

"මොහ්........ මේ අපේ පොඩීගෙ කාර් එක....." වාහනයේ දොර හැර එළියට පැනගත් කැලුම්...... මල්ලී......... කියමින් මොර දෙමින් දුවන්නට විය. කැලුම් එක්වර ම කෑගසන්නට වූයේ මන්දැයි අවට සිටියවුන්ට සිතා ගැනීමට නොහැකි විය.

"ඇයි.... මහත්තයා..... "අවට සිටියවුන් කැලුම් ළඟට පැමිණෙන්නට විය.

"මේ...මේ.... මේ.... මගෙ මල්ලිගෙ කාර් එක..... කෝ මල්ලි....... මල්ලි කෝ...." කැලුම් පිස්සු විකාරයෙන් මෙන් එහෙ මෙහෙ දුවන්නට විය. ඒ වනවිට නෙතුම් රෝහල් ගත කර විනාඩි පහක් පමණ ගතවිය.





"ආ..... ඒ මහත්තයාගෙ මල්ලි ද අසල සිටි අයෙකු ඇසුවේ කැලුම්ගෙ උරහිසට අතක් ද තබාගනිමිනි.

"මහත්තයා බයවෙන්න එපා මල්ලි හොස්පිටල් එකට අරන් ගියා."

"කොයි හොස්පිටල් එකටද? මල්ලිට අමාරුද?" කැලුම් කලබලයෙන් දඟලන්නට විය.

"යමු මහත්තයා.. දෙන්න කාර් එකේ යතුර..." මැදිවියේ පිරිමි කෙනෙකු කැලුම්ගේ වාහනයේ යතුර ගෙන කැලුම් සමඟ රෝහලට ගියේ ය.

වලාකුළු තම දෑස්වල කඳුළු අවසන් වනතුරු ම හඬාවැටුණහ. හැඬුම නවත්වා ගැනීමට නොහැකිව ඉකිබිඳුම් දෙන විට බිමට හෙමින් වැටුණු පිනිපොද ද මේ වන විට නතර වී තිබුණි. පාර අයිනේ කාණු දිගේ වැහිකඳුළු දිය වේගයෙන් ගලා යන්නට වූයේ මල්ලී ගැන දුකෙන් රෝහලට යන කැලුම්ගේ සිතුවිලි මෙන් වේගයෙනි.

හිසට, කොන්දට සහ දෙපාවලට බරපතල හානි සිදුවී තිබුණි. එයාබෑග් සක්‍රිය වීම නිසා පපුවට හානිවී නොතිබුණි. එහෙත් හිසට සහ දෙපාවලට දැඩිලෙස හානිවී තිබුණි. වෙලුම්පටිවලින් ආවරණය කරන ලද නෙතුම් අඳුන ගැනීමට බැරි තරම් ය. කැලුම් මල්ලී දෙස පපුව ගිනිගන්නා තරම් වේදනාවෙන් බලාසිටින්නට විය. අමාරුවෙන් කට වසාගත්ත ද දෑස්වලින් නොනවත්වා ගලා ගිය කඳුළින් නෙතුම් සිටි ඇඳ අසල බිම තෙමෙන්නට විය. සහෝදර වෛද්‍යවරු නෙතුම්ට සියලු සත්කාර කරමින් සිටී.

අවස්ථාවෙන් උපරිම වාසිගෙන ලකුණු රැස්කරගනිමින් සිටින නෙත්මිට මේ අවස්ථාව හබන් කිකිලිට අහම්බෙන් ලද මඟුලක් මෙනි. බොරු කලබල මවමින් එහෙ මෙහෙ දුවමින් නෙත්මි දඟලන්නට වූවා ය. ශල්‍ය කර්ම සියල්ල සිදු කළේ වෙනත් වෛද්‍යවරුන් පස්දෙනෙකු විසිනි. නෙත්මි සියලු ලකුණු තම ගිණුමට බලෙන් ඔබා ගනිමින් සිටින්නී ය. එදින ඉරිදා දිනයක් වුවද නෙත්මි රාජකාරියට පැමිණ සිටියා ය. නෙතුම්ගෙ හොඳම මිතුරන් දෙදෙනා වූ මෙත්සර



Scanned by CamScanner

සහ සාලින්ද රෝහලේ මිතුරන්ගෙන් ලද තොරතුරක් මත පැමිණෙන විට බොහෝ කාර්යයන් සිදු කර තිබුණි.

"කැලුම් අයියෙ..... නෙතුම්ට ටිකක් අමාරුයි කිව්වා..." මෙත්සර කැලුම් ළඟට පැමිණ පැවසුවේ ශෝකයෙනි.

"ඔව් මල්ලී..... ඩොක්ටර්ස්ලා කිව්වා. මම මල්ලිව රට හරි අරන් යනවා. ඒත්... පැය පහක්වත් යනකං මොකුත් කරන්න එපාලු."

කැලුම්ගේ දෑස් කඳුළින් පිරීගොසිනි. සාලින්දට සහ මෙත්සරට දකින්නට නෙත්මි එහෙ මෙහෙ දුවන්නට වුයේ මවාගත් රාජකාරිවලට මිස සැබෑවට නොවේ. නෙත්මි දකින විට සාලින්දට මෙන්ම මෙත්සරට දැනෙන කේන්තියේ සීමාවක් නැත. කැලුම් පැමිණීමට පෙර නෙත්මි පැත්තකට කැඳවා මදිනොවෙන්නට දෙහි කැපුව ද එය මී හරක් අඟ අග රැඳුණු මකුලු දැලක් තරම්වත් ගණන් නොගෙන පිටුපා යන්නට ගියේ. නෙතුම්ට හේත්තු වීමට හීන දකිමිනි. එහෙත් මේ වන විටත් නෙතුම්ගේ ජීවිතය වැට උඩ මෙනි. හිසට වූ අනතුර බරපතල බැවින් වෛද්‍යවරු ද නෙතුම්ගේ ජීවිතය පිළිබඳ සැක මතු කරන්නට විය.

දිවා ආහාරයට පැමිණීමට නියමිත වූ කැලුම්ගේ ප්‍රමාදය පිළිබඳ තොරතුරු දැනගැනීමට නිමාලි දුන් දුරකතන ඇමතුමෙන් කැලුම්ගේ මල්ලීට සිදුවූ අනතුර පිළිබඳ දැන ගෙන ඒ මොහොතේ ම රෝහලට පැමිණියා ය. එහෙත් සාලින්ද සහ මෙත්සර මේ වන විට නෙතුම්ට අවශ්‍ය ලේ දීමට වෙනත් කාමරයක සූදානම්වී සිටි නිසා නිමාලි මුණ ගැසීමට අවස්ථාවක් නොවී ය. එබැවින් තවත් අලුත් තොරතුරක් දැන ගැනීමට ඔවුන්ට තිබූ අවස්ථාව මඟහැරී ගියේ ය.

නෙතුම්ගේ මව පියා සහ නෑදෑයන් ලෝකය ගිනිගත් ලෙසින් කලබලවී අවශ්‍ය දෑ සැලසුම් කරමින් සිටියහ. අනතුර සිදුවී රැයක් ගෙවී ගොස් තිබුණ ද නෙතුම් තවම දෑස් පියාගෙන ය. රුධිරය මෙන්ම සේලයින් සපයන නළද සහ ඔක්සිජන් සපයන උපකරණ නෙතුම්ගේ ඇඳ වටේ සිටින්නේ නෙතුම්ගේ ජීවිතය සොරකම්කරගෙන පරලොවට ගෙනියන්නට මරුවා එතැයි සිතා එයින් වැලැක්වීමට මෙනි. වෛද්‍යවරුන් තම රාජකාරී වෙලාව අවසන් වුවද නිවෙස්වලට නොයා රැදී සිටියේ නෙතුම් වෛද්‍යවරයකු මිතුරෙකු නිසාම නොව





මේ කාලයේ කලාතුරකින් දකින්නට ලැබෙන සැබෑ මනුෂ්‍යයෙකු වූ බැවිනි.

නෙතුම්ගේ ජීවිතයට එක පිට කරදර ගෙනා නෙත්මි බොර දියේ මාළු බෑමට දූල් ආම්පන්න සකස් කරමින් සිටියා ය. කැලුම්, මෙත්සර සහ සාලින්ද රෝහල් බිමෙන් පිටව නොගියේ නෙතුම්ගේ සෞඛ්‍ය තත්ත්වය කෙමෙන් අයහපත් තත්ත්වයට හැරෙමින් තිබූ බැවිනි.

"කැලුම් අයියෙ මම අපේ නංගිට විස්තරේ කියලා තියෙන්නෙ.. අපි ලන්ඩන් අරන් යමු." නෙතුම් විදේශයකට රැගෙන යාමට කැලුම් ද සූදානම් වෙමින් සිටියේ ය. සාලින්දගේ ඇරයුම දෙවරක් නොසිතාම පිළිගත් කැලුම් ඊට එකඟවිය.

වටිනා වෛද්‍යවරයෙකුගේ සේවය මෙන්ම ජීවිතය අහිමිවීමෙන් වළක්වා ගැනීමට රෝහල් බලධාරීන් මෙන්ම රජයේ ද අවධානය යොමුවී තිබුණි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ද විශේෂ සැලකිලි මත නෙතුම් ගුවන් මඟින් ලන්ඩන් රෝහලක් වෙත ගෙන යන ලදි. කැලුම්, මෙත්සර, සාලින්ද සමඟ අම්මා සහ අප්පච්චි ද විදේශ ගතවිය.

"දෝණී.... ඩොක්ටර් කැලුම්ගෙ මල්ලිට ගොඩක් අමාරුයිලු අද උදේ පාන්දර ලන්ඩන් අරන් ගියාලු."

"ඇත්තද පව් නේද අම්මෙ.. ඩොක්ටර් කැලුම් හරිම හොඳයිනෙ මල්ලිත් ඒ වගේ වෙන්න ඇති."

"අනේ කරදරයක් නං වෙන්න එපා.... එයාට සනීප වෙන්න ඕනෙ.." හිමායා මුළු හදවතින් ම ප්‍රාර්ථනා කළේ කැලුම් ට ඇති හිතවත්කම නිසා මිස නෙතුම් හඳුනාගෙන නොවේ.

මිතුරන් හිතවතුන් සහ පවුලේ අය හදවතින් දහස්වර මැරී මැරී ඉපදෙමින් නෙතුම් බේරාගැනීමට වෙහෙසන අතර නෙතුම් ජීවිතය සහ මරණය අතර සියුම් ඉඩක නිසලව වැතිර සිටිනේනේ ය.



Scanned by CamScanner

# 27

**පරණ** පත්‍ර සුළඟට අතහැර දමූ රබර් ගස් අලුත් පත්‍ර හැඳගෙන නිරුවත් අතු ආවරණය කරගත්හ. බිමට වැටුණු වියපත් රබර් කොළ පොළොව බදාගෙන නිදාගන්නට වූයේ ආපසු ගසට නගින්නට අවසරක් නොවූ බැවිනි. අවස්ථාවෙන් වැඩක් ගැනීමට සිතූ වෙයන් තම නිවාස සකස්කරගැනීමට වියලි රබර් පත්‍ර පාවිච්චි කළේ කිසිවකුගෙන් අවසර නොගෙන ය. අලුත් රබර් කොළවලින් හැඩ වුණු රබර් ගස් පෙලින් පෙල වාඩිවී සුළඟෙ ගීතවත් වූහ.

නිමාලි මිදුලේ සිට දුවගෙන පැමිණියේ දුරකතනය නොනවත්වා හඬදුන් බැවිනි.

''හෙලෝව්...........'

''ආන්ටි මම කැලුම්.....''

''ආ.. ඩොක්ටර් කොහොම ද මල්ලිට....''

''ඔව් ආන්ටි මම මල්ලි ගැන කියන්න තමයි ගත්තෙ... දැන් මල්ලිට ටිකක් හොඳයි. ඩොක්ටර්ස්ලා කිව්වා මල්ලිව ඉක්මනින් හොඳ තත්ත්වෙට එනවා කියලා.''

''තුවාල ඔක්කොම සනීපයි ද ඩොක්ටර්..''





''ඔව් ආන්ටි... ඒත් තවම කොන්දෙ පොඩි ඩැමේජ් එකක් තියනවලු තව අවුරුදු දෙකක් විතර ට්‍රීට්මන්ට් කරන්න වෙනවා කිව්වා.''

''අපි තුන්දෙනා නිතර ම හිතින් ප්‍රාර්ථනා කර කර හිටියෙ....''

''ඔව් ආන්ටි හැමෝම උදව්කළා, ආන්ටි එවපු සල්ලිත් බෙහෙත් ගන්න වියදම් කළා.''

''තව ඕනනම් කියන්න ඩොක්ටර්. මගේ දෝණිව සනීප කරපු එක මට මිලකරන්න බැරිතරම් වටිනා උදව්වක්.....''

''දැන්නං ලොකු වැඩ ගොඩාක් ඉවරයි.... අපි තව සතියකින් ලංකාවට එනවා...''

''හරි.. ඩොක්ටර්.....ඔකේ.. බායි..'' නිමාලි හිමායාගේ කාමරයට දුව ගියේ සතුටිනි.

''දෝණී... දෝණී....''

''ඇයි අම්මා මොකද මේ කලබලෙන්... වෙනදා ඔහොම කලබලෙන් දුවන්නෙ අපේ.. සුදු බිංදු.....''

''විහිළු නෙවෙයි දෝණී........ ඩොක්ටර් කැලුම්ගෙ මල්ලිට දැන් ගොඩක් හොඳයිලු.... ඒත් අවුරුදු දෙකක්වත් බෙහෙත් කරන්න වෙයිලු''

''අනේ ඇත්ත ද?'' හිමායා අතෙහිවූ පින්සල පසෙකින් තබා අම්මාගේ විස්තර අසා ගැනීමට සූදානම් වූවා ය.

''ඩොක්ටර් කැලුම් තව සතියකින් ලංකාවට එනවා කිව්වා.''

''එතකොට කවුද මල්ලි ළඟ නවතින්නෙ....''

''ඇයි අම්මලා, යාළුවො දෙන්නෙකුත් ඉන්නවා කිව්වා.''

''ආ.... අම්මට මතක ද අර එක්ෂිබිෂන් එකක් ගැන කතාකරගන්න කියලා බීච් එකට ආපු දෙන්නත් ඩොක්ටර්ස්ලා කිව්වා නේද?''



Scanned by CamScanner

"ආ.... ඔව්නෙ... මටත් කලබලේට මතක් වුණේ නෑ... එදා ඇක්සිඩන්ට් එක වුණ වෙලාවෙ මල්ලිව අරන් ගියෙත් එයා වැඩ කරන හොස්පිටල් එකටලු. මල්ලිත් ඩොක්ටර් කෙනෙක්නෙ.."

"අපි මෙත්සර පුතාට කෝල් එකක් අරන් බලමු.."

"ඔබ ඇමතූ ඩයොක් දුරකතනය ක්‍රියාවිරහිත හෝ ආවරණ කලාපයෙන් බැහැරව ඇත. කරුණාකර පසුව අමතන්න." පටිගත කළ නිවේදනය ඉංග්‍රීසි බසින් පමණක් ඇසුණා මිස මෙත්සර සමඟ සම්බන්ධ වීමට අවස්ථාවක් නොලැබුණි.

"වැඩ කරන්නෙ නැද්ද අම්මා...."

"නෑ.. ඔෆ් කරලා. වෝර්ඩ් එකේ වැඩ වෙන්න ඇති. පස්සෙ බලමු."

මෙත්සර සහ සාලින්ද යනු කැලුම්ගෙ මල්ලිගෙ හොඳම මිතුරන් දෙදෙනා බව හිමායට මෙන්ම නිමාලිට ද දැන ගැනීමට අවස්ථාවක් නොලැබුණි.

"ලොකු බේබි..... දෙන්නම එන්න තේ බොන්න..."

"හරි.. එන්නං සුදු ආච්චිඅම්මේ....." දෙදෙනාම කුස්සියේ රවුම් මේසය වටේ වාඩිවී සුදු ආච්චිඅම්මා සැදූ හැලප රසබලමින් තේ පානය කළහ. හැලප කෑල්ලක් ලැබෙනතුරු සුදු බිංදුගේ ඤැව්..ඤාව්.. කරච්චලය නතර නොවුණි.

"දොස්තර මහත්තයාගෙ මල්ලිට දැන් සනීපයි කිව්ව ද ලොකු බේබි."

"ඔව් සුදු ආච්චිඅම්මෙ අපිත් දැන් මේ ඒ ගැන තමයි කතා කර කර හිටියෙ..... දැන් ගොඩාක් හොඳයි කිව්වා... ඒත් තව අවුරුදු දෙකක්වත් බෙහෙත් කරන්න වෙයිලු."

"ආ..... ඇත්ත ද? අනේ තුණුරුවන්නේ සරණයි." සුදු ආච්චිඅම්මට නෑ කමක් නොතිබුණද, හදවතින් ම සෙත් පැතුවා ය.





හැමෝගෙ ම හිත්වලට ගිනි දෙන්න මුල්වුණ නෙත්මිට නෙතුම් පිළිබඳ කිසිදු තොරතුරක් දැනගැනීමට අවස්ථාවක් නොවීය. කාලය සුපුරුදු පාඩුවේ ගෙවී යමින් තිබුණි.

කැලුම්, සාලින්ද සහ මෙත්සර පමණක් ලංකාවට ආපසු පැමිණියහ. නෙතුම්ට තව වසර දෙකක කාලයක් ප්‍රතිකාර ලැබීමට නියමිත බැවින් අම්මා සහ අප්පච්චි එහි රැඳුණි.

කැලුම් විදේශගතව සිටි මාස දෙක පුරාවට ම කාර්ය මණ්ඩලය මෙත් සෙවණ සුපුරුදු පරිදි පවත්වා ගෙන ගොස් තිබුණි. කැලුම් නැවතත් තම රාජකාරී ආරම්භ කළේ ය. මෙත්සර සහ සාලින්ද ලබා තිබූ විශේෂ නිවාඩු අවසන් කර නැවත රෝහලට පැමිණියහ. පළමු උදෑසන මිතුරන් සහ පහල සේවකයන් පැමිණ නෙතුම් පිළිබඳ විස්තර විමසූහ. කිසිවක් විමසීමට නොහැකිවූ නෙත්මි සෙක්කුව මෙන් දෙතුන් වතාවක් කැරකෙන්නට විය.

මෙත්සරගෙ වචන නෙත්මි මෙතෙක් දිනක් බැඳ සිටි වෙස්මුහුණු ගලවා දැමීමට සමත්විය. නෙත්මි නෙතුම්ගේ ආදරය බලෙන් ගැනීමට ගිය සිදුවීමක අවසන් ප්‍රතිඵලය නෙතුම් අනතුරට පත්වීම බව එදින සිට රෝහලේ සියලු දෙනා අතර ප්‍රසිද්ධ රහසක් විය.

කාලය විසින් සියල්ල තීරණය කරන අතර හිමායාගේ දෙවැනි සිතුවම් දැක්මේ ආරම්භය ළං වෙමින් පැවතුණේ ය.

"අම්මෙ ඔයා හෝල් එක බුක් කළා නේද?"

"ඔව්.... පුරහඳ හෝල් එකේ තරම් ඉඩ නම් නෑ වගේ......"

"ම්.. ගොඩක් මදි ද?"

"නෑ... එච්චර ම මදි නෑ..."

"ආ. දෝණි ඩොක්ටර් කැලුම් දවල් කෝල් කළා. එක්ෂිබිෂන් එකට මොනව ද කරලා ඕනෙ ඇහුවා."

"අපිට කරගන්න පුළුවන්නෙ නේද? උදව් කරනවට ම එහෙම උදව් ගන්න හොඳ නෑ නේද අම්මෙ.."



Scanned by CamScanner

''මමත් හිතුවා පව්නෙ..''

''අපි ගිය වතාවෙ කරගත්තා වගේ කරමු.''

''මේ වතාවෙත් අපි පැහැසර කියල ම ඇඩ් එක දාමු නේද?''

''ඔව් දෝණි ඒක ලස්සනයි. පැහැසර 2 කියලා දාමු.''

කැලුම් විවේකයක් ලද අවස්ථාවල හිමායා බැලීමට පැමිණිය ද පෙර මෙන් නිතර පැමිණීමට නොහැකිවූයේ රාජකාරි කටයුතු අධික බැවින් මෙන්ම නිවසේ සිටින්නේ වියපත් හරමානිස් සීයා පමණක් නිසාත් ය.

කැලුම්ගෙ සිතේ හිමායා පිළිබඳ ඇතිවූ ආදරය සෙනෙහස තවම වෙනසක් නොවුණි. දෙවනි, පැහැසර චිත්‍ර ප්‍රදර්ශනයෙන් පසු හිම කුමාරි යන අන්වර්ථ නම බොහෝ ප්‍රසිද්ධ විය. හිම කුමාරි කවුද යන්න පුවත්පත්වලින්ද සොයන්නට විය. පසුව පුවත්පත් දෙක තුනක ම මුල්පිටුවලට හිමායාගෙ පින්තූර එකතුකර තිබුණි. රුවැති හිමායාගේ මුහුණ දකින බොහෝ ඇස් නෙතුම් මෙන් ඇවටුණහ. එදින පටන් හිමායාට ලැබෙන රසික ලිපි මෙන්ම ආදර ඇරයුම් ලිපි ගණනින් වැඩිවුණි.

පුවත්පතින් ලද ආලෝකය විද්‍යුත් මාධ්‍ය මගින් දෙගුණ තෙගුණ කළේ ය. හිමායා දහය ශ්‍රේණිය දක්වා පාසල් ගොස් තිබුණද ඇය සතු හැකියාවන් අසමසම විය. විද්වතුන්ගේ සුවිශේෂී අනුග්‍රහය මත හිමායාට උසස් අධ්‍යාපන අවස්ථා හිමිවිය. ඇය පසුකාලයේ ලද සාමාර්ථයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ඇයට ආධුනික කථිකාචාර්ය තනතුරක් හිමිවී විශ්ව විද්‍යාලයේ චිත්‍ර විෂය හදාරන විද්‍යාර්ථයින්ට ශිල්පදෙන්නට අවස්ථාවක් ලැබුණි. පසුකාලීනව හිමායගෙ අසමසම දක්ෂකම්වලට උපහාරයක් ලෙස ජපන් විශ්ව විද්‍යාලයකින් හිමායට ගෞරව උපාධියක් ද පිරිනැමුවේ ය.

දිනෙන් දින ආලෝකයෙන් හැඩවෙන හිමායාගේ ජයග්‍රහණ පිටුපස කැලුම් යෝධයෙක් මෙන් සිටියේ ය. විදේශීය ආබාධිත උපකරණ නිපදවන ආයතනයකින් සිට ගැනීමට සහ ඉඳගැනීමට හැකි පුටුවක් ගෙන්වා ගැනීම සඳහා කැලුම් බොහෝ වෙහෙස විය.





දෙපයින් නැගී සිටීම සදාකාලික හීනයක් වූ හිමායාට නවීන පුටුව නිසා අඟලකවත් දෙපා නොමැති වුවද සිට ගැනීමට අවස්ථා ලැබුණි.

හිමායාට නෙත් වශීකරන රුවක් මෙන්ම මන බඳින කටහඬක් ද කතා විලාසයක් ද උපතින්ම ලැබී තිබුණි. ඇයට දෛවය අහිමි කර තිබුණේ දෙපා පමණි. එහෙත් දස දහස් රසික පිරිසකගේ ආදරය සහ සුහ පැතුම් දෙපා නැති හිමායට මහත් ශක්තියක් විය. කවියට සිතුවමට මෙන්ම ජායාරූපවලට පෙම් බඳින පාඨකයන් හිමායා ජාතික වස්තුවක් ලෙස සලකමින් රැකගන්නටත් ගරුසැලකිලි දක්වන්නටත් විය. මේ වන විට ජාතික මෙන්ම ජාත්‍යන්තර සහතික සහ සම්මාන කිහිපයක් හිමිවී තිබුණි.

හිමායා පිළිබඳ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවලින් කිහිප අවස්ථාවකදීම විස්තර පළකළද කිසිවක් නෙතුම්ගේ දෑසට අසු නොවීම පුදුමයක් විය. ලන්ඩන් නගරයේ සාලින්දගේ සොයුරියගේ නිවසේ ගතකරන නෙතුම් ප්‍රතිකාර ලබන අතර උසස් විභාගයකට සූදානම් වීම නිසා අනවශ්‍ය කිසිවකට අවධානය නොදීමත් හිමායා පිළිබඳ නොදැනීමට හේතුවක් විය. මෙත්සර සහ සාලින්ද සියලු විස්තර දැන සිටිය ද නෙතුම්ගෙන් හිතාමතාම එම විස්තර සඟවා තැබූහ.



Scanned by CamScanner

# 28

**සුදෙර්** සුදු වලාකුළු ගුවන් යානයේ දැවටෙන්නට විය. ලංකාවෙ බිම්කඩ වටා වැතිරුණු සයුරු දිය දියඹට වන්නට තද පැහැයෙන් ද වෙරළට ළංවත් ම ලා පැහැයෙන් ද යුතු විය. ගිනි පෙට්ටි මෙන් ද ගඩොල් කැට මෙන් ද තනිවද සමූහ වශයෙන් ද ඉදි වූ ගොඩනැගිලි දිස්වන්නට විය. හරිත පැහැ ගස්වැල් ද බිම වැතිර ගත් වැව් දිය ද අලංකාර සිතුවමක් වැනි ය. තැනින් තැන උඩට එසවී බලා සිටින සම්ප්‍රේෂණ කුළුණු ද විය. ක්‍රමයෙන් වේගය අඩු වූ ගුවන් යානය ගුවන් පර්යන්තය වෙත සේන්දු විය.

අම්මා, අප්පච්චී සහ නෙතුම් මගීන් පැමිණෙන දොරටුවෙන් පැමිණෙමින් සිටියහ. තවමත් සම්පූර්ණ සුවය ලබා නොමැති බැවින් නෙතුම්ට මාස පහක් පමණ වනතුරු රෝද පුටුවක් පාවිච්චි කිරීමට වෛද්‍යවරුන් නියම කොට තිබුණි.

කැලුම්, මෙත්සර, සාලින්ද සහ තවත් මිතුරන් කිහිප දෙනෙක් නෙතුම් පිළිගැනීමට ගුවන් තොටුපලට පැමිණ සිටියහ.

''නෙතුම්...... කොහොම ද?''

''ම්..... දැන් නං ගොඩාක් හොඳයි. මේ විදිහට තව මාස පහක්වත් ඉන්න වෙනවා..''





''උඹට ඉක්මනින් හොඳ වෙනවා.... අපි එදා කිව්වා වගේ හැමදාමත් උඹ ළඟ ඉන්නවා නෙතුම්....''

''ඔය දෙන්න කරපු උදව්වලට ගොඩාක් පිං......''

''මේ අවුරුදු දෙකට ලස්සන වෙලා.....ආ...''

''ලස්සන තමයි මචං මට දැනෙන්නෙ මැරිලා ඉපදුනා වගේ..''

''ඒකනං ඇත්ත... අපිට ඒ දවස් ටිකේ පිස්සු වගේ...''

''හරි යමු...''

''ඔයාලා මොකේ ද ආවෙ... ''

''අපි වෑන් එකක් අරන් ආවේ කට්ටියට ම යන්න. මෙත්සරගෙ කාර් එකත් තියනවා. නෙතුම් ඒකට ගමු. ගැස්සෙනවා අඩුයිනෙ,''

''කැලුම් අයියෙ ඔහොම ඉන්න අපි වාහනේ අරන් එන්නං.''

කැලුම් දැන්වූ වෙලාවට වඩා විනාඩි විස්සක් කලින් ගුවන් යානය පැමිණි බැවින් නිමාලිට සහ හිමායාට කිසිවකු දැකගැනීමට නොහැකිවුණි.

''ඩොක්ටර් කැලුම් හිතුව ද දන්නෑ අපි බොරුවට එන්න ඇහුවා කියලා.''

''නෑ.. දැන් අපි ආවා කියලා දන්නවනෙ..... කමක් නෑ.. අපිට පස්සෙ බලන්න පුළුවන්නෙ....''

''ඒත් ගෙදරට යන එක හොඳමදි නේද? අම්මලා එහෙම කොහොමද දන්නෑනෙ වරදවා හිතුවොත් නේද?''

නිවාඩු දිනයක් බැවින් නිමාලි සහ හිමායා මුතුදූව වැව ළඟ හෝරාවක් දෙකක් විවේකයෙන් ගත කර ආපසු නිවෙස බලා පිටත්වූහ. සවස නිවෙසට පැමිණි කැලුම්ට සිදුවූ ප්‍රමාදය පිළිබඳ පවසා සමාව අයැදීමට හිමායා සහ නිමාලි අමතක නොකළහ.

නෙත්මි නෙතුම් පිළිබඳව තොරතුරු දැන ගැනීමට නොහැකිව තළියන්නට විය. රෝහලේ දී නෙත්මි දකින හැම විටම මෙත්සරට සහ සාලින්දට කටවල් වසා ගෙන සිටීමට අසීරු විය.



Scanned by CamScanner

"මේ මචං සාලි...... දැන් නෙතුම්ට හොඳයි නේද? ගෙදර ගියා නං හරි තව මොකක් හරි ගින්නක් දෙන්න පුළුවන්...." මෙත්සර පැවසුවේ පිටුපා යන නෙත්මිට ඇසෙන්නට ය.

"කොහොමත් දැම්ම වැඩට එන්නෙත් නැනෙ...." සාලින්ද ද ඊට හවුල් විය.

මූණ කොරහක් තරම් පුම්බාගන්නවා ඇරෙන්නට නෙත්මිට කළ හැකි දෙයක් නොවී ය.

නෙතුම්ගේ සුව දුක් බැලීමට රෝහලේ සහෝදර වෛද්‍යවරු මෙන්ම බොහෝ සේවකයන් ද නිවසට ගිය මුත් ගිනි ඇවිලවූ නෙත්මිට යාමට නොහැකි විය. නෙතුම් මුලින් සිට සිනහවෙමින් පියවරෙන් පියවර හිමායා යනු කවුදැයි හඳුනා ගත්තේ නම් ඔහුට දැනෙන වේදනාව අඩු ය. එසේ නම් හිමායා සහ කැලුම් හඳුනා නොගන්නා අතර නෙතුම්ට ගැටළුවක් නොවන්නේ ය. කෙසේ හෝ කැලුම්ට හිමායා හමුනොවන්නට තවමත් ඇය ඇවිදීමට පමණක් නොව කතා කිරීමට ද නොහැකිව සඳළු තලයටවී සිටින අප්‍රසිද්ධ සිත්තරියක වන්නට තිබුණි. නෙතුම් අනතුරට ලක්නොවන්නට සිදුවූ සියලු දේ යහපත් ඵල ගෙනදී තිබුණි. නෙත්මිගේ වෛරී සිතුවිලි නෙතුම්ගේ සිත මෙන්ම ගතද පීඩාවට පත් කළේ ය.

අම්මා සහ අප්පච්චී සමඟ නෙතුම් නිවසටවී කාලය ගත කරන්නට විය. හරමානිස් සීයා ද පවුලේ කෙනෙකු මෙන් නෙතුම්ට සාත්තුකරන්නට සැදිපැහැදී සිටියේ ය. කැලුම් රාජකාරිය අවසන් වූ විට කිසිම ප්‍රමාදයක් නොමැතිව නිවසට එන්නේ මල්ලී කම්මැලිකමින් සිටින බැවිනි.

"මම කලබල වුණා වැඩියි... අයියා මට කොච්චර ආදරෙයි ද?... ඒත් හිමායා ... ගැන මම අමතක කරන්නෙ කොහොම ද?"

නෙතුම් සිත වෙනස් කරගැනීමට කොතරම් උත්සාහ කළද දවල් දවසම විශේෂ කාර්යයකින් තොරව ගෙවා දමන විට හිමායා නිතරම මතකයට පැමිණියේ ය. එහෙත් අයියා තමා වෙනුවෙන් කළ කැපකිරීම් නිසා හිමායා අයියාගෙන් උදුරා ගන්නට ඉඩ නොදෙන්නේ ශක්තිමත් සහෝදර බැම්ම ය.





සාලින්ද සහ මෙත්සර එක් ඉරිදා දිනක උදෑසන නෙතුම්ව මුහුදු වෙරළට කැඳවාගෙන ගියහ. රළ රැළි මතින් බිඳී විසිරෙන සියුම් මීදුම සමඟ රන් හිරු කිරණ සයුරු දිය අලංකාර කළේ ය. වැඩි මහතක් නොමැති නෙරළු ගස් මුහුදු හුළඟට පැද්දෙමින් නැලවෙමින් වෙරළෙ වාඩිවී සිටියහ. වෙරළ අයිනෙ ගල් ගොඩැලිවලට දෙපා හේත්තු කරගත් වැටකෙයියා පඳුරු අතු අග්ගිස්සේ මල් ගවසාගෙන එලගත් දෑත් පහතට එල්ලාගෙන මුහුදු දිය පහස ලබමින් සිටියහ.

නෙතුම්ගෙ රෝද පුටුව තල්ලු කරමින් මෙත්සර සහ සාලින්ද වෙරළෙ ඒ මේ අත ඇවිද ගියහ. හිරුගෙ රැස් උණුසුම්වන විට නෙරළු සෙවණට පැමිණ තණ කොළ මත තිබුණ පරණ බෝට්ටුවක බඳ උඩ වාඩි වූහ. රසකැවිලි, බැදපු ඉස්සො, කකුළුවො රැගෙන විත් කිරි කෝපි පානය කරමින් සිංදු කියන්නට විය. මෙම ස්ථානය අලංකාරවූවද වැඩි දෙනෙකු නොපැමිණෙන්නේ වැටකෙයියා පඳුරුවලින් අමුතු බියකරු බවක් මවාපෙන්වන බැවිණි.

ඩෙනිම කලිසම් හැඳගෙන හිස්වැසුම් පැළඳගෙන හිටින බැවින් ඈතට මෙ තිදෙනා දන්නා අයෙකුට වුවද හඳුනා ගැනීමට අසීරු ය. කමින් බොමින් සිංදු කියමින් විනෝදයෙන් ගත කළ බැවින් කාලය නොදැනීම ගෙවී ගෙවීගියේ ය. උදෑසන ළා හිරු කිරණ මැදින් පැමිණි අතර දැන් හිරුගෙ අවසන් හෝරාවට ආසන්නවී තිබුණි.

"අන්න සාලි... කාර් එකක් මේ පැත්තට එනවා.. පේන විදිහට නම් ලස්සන කෙල්ලො දෙන්නෙක් වගේ....."

"අනේ මෙත්තො ඔච්චර ඈතට ලස්සනත් දැක්ක ද?"

"වාහනේ ලස්සන නිසා මම හිතුවා ඇතුළෙ ඉන්න දෙන්නත් ලස්සන ඇති කියලා."

"කෝ .... නවත්වලා ටික වෙලාවක් නෙ, බහින්නෙ නෑ වගේ.."

"අපි ඉන්න හින්දා වෙන්න ඇති...."

පුරුද්දක් ලෙස ඉරිදා සවස විවේකය ගත කිරීමට හිමායා සහ නිමාලි මෙම ස්ථානය තෝරා ගෙන තිබුණි. වෙරළ තීරය බියකරු



Scanned by CamScanner

දුවද පාරට ආසන්නයෙවූ වෙළඳසැළ ඒ බිය තරමක් දුරු කළේ ය. සාලින්ද සහ මෙත්සර වාඩිවී සිටින්නේ වෙනදා හිමායා සහ නිමාලි හේත්තුවී සිටින පැරණි බෝට්ටුව මත ය.

"දෝණී අද මෙතන රස්තියාදුකාරයො වගයක් ද කොහෙ ද?"

"ඔව් අම්මා අපි තව ටිකක් එහාට යමු. මෙතන බහින්න බෑ.."

නතර කළ වාහනය නැවත පාරට ගෙන නිමාලි ඉදිරියට ධාවනය කරන්නට වූවා ය.

"අන්න බං යන්න යනවා...." සාලින්ද සිනාසෙමින් කීවේ ය.

"අනේ මම හිත්ද නං නෙවෙයි. උඹලා දෙන්න ඇතට දුක්කත් කියන්න පුළුවන් ඇති මොනවගේ සත්තු ද කියලා.."

"අන්න.... අන්න... නෙතුම් කැත කතාවක් කිව්වා.."

"ඇත්තනෙ මං කිව්වෙ... පුළුවන් නං නෑ කියපං.... කටට කෙළ ඉනුවා නේද?"

නෙතුම්ගේ කතාවට දෙදෙනාගෙම දෙතොල්වලට සිනාතැගුණේ එය බොරුවක්ම නොවන බැවිනි. පුංචි හේතුවක් පවා විහිළුවට ගෙන සිනාසෙමින් ගෙවූ කාලය නිමාකරන ලෙස ගොම්මන් අඳුර පැවසුව ද ආපසු යැමට කල්පනා නොවුණි. පඳුරු අතර සැඟවී පළඟැටියන් ගෙම්බන් ඝෝරනාදූ කරන්නට වූයෙන් තිදෙනා ආපසු යන්නට තීරණය කළහ.

රෝද පුටුවයි සාලින්දයි පසුපස අසුනට නංවගෙන නෙතුම් ඉදිරිපස අසුනට අරගෙන මෙත්සර වාහනය පැදෙව්වා.

"සාලි.... අර කලිං නවත්වලා ගිය කාර් එක නේද?" මෙත්සර වේගය වැඩි කළේ ය.

"පොඩ්ඩක් ඇහැදාලා බලමු ද?"

"මේ.. සාලි මම බහින්නං උඹලා දෙන්න ඕන රේස් එකක් පලයල්ලා."





"නෙතුම් බය වෙන්ඩ එපා බං."

"බය නෙවෙයි බං. ගිනි පෙනෙල්ලෙන් බැටකාපු එකා කණාමැදිරි එළියටත් බයයි කියලා කතාවක් තියනවනෙ... අනිත් එක නමයි මම ඇවිද ගන්නත් බැරි එකා. අවුලක් ගියොත් උඹලා දෙන්න පැනලා දුවයි අන්තිමට උඹලා දෙන්නගෙ ජීවත් එක්ක මට කන්න වෙයි.."

නගරයේ කඩ සාප්පු පාට පාට විදුලි බුබුලු දල්වාගෙන අඳුර එළවා තිබුණි. එක එක ගමන් ගිය ගැහැනු පිරිමි කොයි කාගෙත් ගමන් විලාසය වේගවත් විය. බස් රථවල පාපුවරුවල පවා මගීන් පිරී පැවතුනේ කළුවර දූනටමත් තම ගෙවල්වලට ගොස් ඇතිබැවිනි.

විදුලි ආලෝකයෙන් අලංකාරවූ සුපිරි වෙළඳ සංකීර්ණයක් ඉදිරිපිට සාලින්ද නෙත්දුන් මෝටර් රථය නවතා තිබුණි. රියදුරු අසුනෙ කිසිවකු නොවුන ද වම් පස අසුනෙ හිසක් පෙනෙන්නට විය. මෙත්සරගේ දැස් හිමායාගේ රුව හඳුනාගත් සැනින් වාහනය ඉදිරියට ධාවනය කළේ ය.

"පොඩි කෙල්ලෙක් බං..." මෙත්සර එසේ පැවසුවේ එතැන පසුකර යාමට හේතුවක් ලෙසිනි.

"මදූයි පස්සෙන් පැන්නුව නං... අහක ඉන්න නයි අහවල් එකට දාගත්තා වගේ වැඩක් වෙන්නෙ... මෙයාලා හැමදාම බීච් එනවා ඇති....." මෙත්සර කල්පනා කළේ ය.

නෙතුම් නිවසට බාරදුන් මිතුරන් දෙදෙනා තම නිවෙස් වෙත ගියෙ ප්‍රීතිමත් දිනයක් නිමා කරමින් ලද සතුට ද සිතෙහි තබා ගෙන ය. ලොවට පෙනෙන්නට සිනාසෙමින් සිටිය ද නෙතුම්ගෙ සිත හිම කන්දක නිදා සිට වරින් වර අවදිවන ගිනි කන්දක් මෙනි. වෙනසකට ඇත්තේ කිසිවකුට හානියක් නොවීම පමණි.

නෙතුම් තමන්ට අහිමි වුණ හිමායා ගැන හිතෙන් දහස්වතාවක් ලතවන අතර කැලුම් තම සිතේ හිමායා වෙනුවෙන් උපන් සෙනෙහස වචනයෙන් ක්‍රියාවෙන් එළිදූක්වීමට නොහැකිව දහස්වර තැවෙන්නට විය.



Scanned by CamScanner

# 29

**වැව** ඉස්මත්තේ ඇටිපෙරියාමල් ආරාමයට වන්දනාවේ පැමිණි වැහිවලා නඩයෙන් බිමට බැසගත් වැසිබිඳු, ගස් වැල් සිඹගෙන පහළට විත් ගල් මුල් උඩින් කෙළිමින් සිනාසෙමින් පොහොර් මඩ, කොළ රොඩු සහ ගල් බොරළු ද නැගී ලෙස ගෙන වැව්දියේ වෙසෙන කුමුදු නෙළුම් කුමාරියො බැහැදකින්නට පැමිණියහ. උදෑසන හිරු එළියෙන් සදාගත් දම්සුපුන් බිම වැටෙතැයි දියහබරල පඳුරු සැල්විනියා ළඟින් වාඩිකරගත්තේ වැඩි පරිස්සමට මෙනි. ඒ මේ අත වරල් සලමින් දඟපාන මාළු ගැටවුන්ගෙන් බේරෙන්නට කෙකටිය මල් වතුරෙන් උඩට එසවුණි.

අන්තිම නිවාඩු දවස් ගෙවමින් සිටි නෙතුම් පාළු හැන්දෑවක කාටත් හොරෙන් බ්ලූවෝටර් ලිලී ගාර්ඩන්ස් පෙදෙස අලංකාර කරන ජයන්තිවැවේ ඉවුරේ කොටයක් උඩ වාඩිගෙන පැයක් පමණ කල්පනාවේ කිමිදුණේ ය.

ඉස්සර මෙන් ජනේලෙ ළඟ රැඳෙමින් වැව දිය දෙස බලාගෙන කවි සිංදු ලියන්නට සිතුවම් අඳින්නට හිමායාට දැන් වෙලාවක් නොවුණි. නිමාලිට කෙටි නිවාඩුක් ගැනීමට නොහැකි හැම අවස්ථාවක්ම කැලුම්ගෙ වාහනක් සහ රියදුරෙකු හිමායාගෙ ගමන් බිමන්වලට එකතු වුණි. මෙලෙස කැලුම් කැපවන්නෙන හිමායාගේ ආදරණීය රසිකයෙකු වීමත්, ඇගේ කායික මානසික වගයෙන් ඉහලට ගෙන ඒමත් මෙන්ම





පෙර ආත්මයක සබඳකමක් මත වන්නට ඇතැයි හිමායා සහ නිමාලි නිතරම කතාවූහ.

රෝද පුටුවට ආත්මයම සිරවූ හිමායට තරුණයකු රහසින්වත් ආදරය කරනු ඇතැයි හිමායා, නිමාලි පමණක් නොව මේ ලොවෙහි කිසිවකු විශ්වාස නොකරන්නේ ය. එහෙත් ඇගේ වෛද්‍යවරයා වූ කැලුම් කල්හාර හිමායා වෙනුවෙන් කියාගැනීමට නොහැකි ආදරය නිදහස් හැම මොහොතකම දින පොතේ පිටු අතර අකුරැන් සටහන් කළේ ය.

මාස කිහිපයකින් අතීතය වියපත්වූ අතර රෝද පුටුව නෙතුම් වෙනුවෙන් ගතකළ සේවා කාලය අවසන්වී පෙර දින පවස අසරණ රෝගියෙකු සොයා සේවයට ගියේ කැලුම්ගෙ මෝටර් රථයෙනි. නෙතුම් පෙර මෙන් දෙපයින් ඇවිදයන්නට විය. කොඳු ඇට පෙලෙහි සහ දෙපාවල සුවවූ තුවාල කැළලි යාන්තමින් දක්නට ලැබුණ ද එය නෙතුම්ගේ සොඳුරු රුව අවලස්සන කිරීමට අසමත් ය.

අනතුරින් අහිමිවුණ වාහනයට ලැබුණු රක්ෂණ මුදලට ඒ හා සමානව අගයක් එකතු කරමින් කැලුම් නවීන මෝටර් රථයක් නෙතුම් වෙනුවෙන් ගෙනවිත් තිබුණි. එය නෙතුම් ලංකාවට පැමිණ දින දෙකකින් සිදුවුණි. දෙදෙනා අතර නොබිඳිය හැකි ලෙස සහෝදරත්වය ගොඩ නැගෙන විට නෙතුම්ගේ සිත හිමායා පිළිබඳ මතකයේදී වඩාත් අසරණ විය. කැලුම් හිමායා ගැන තම ආදරය රහසේ රකින අතර හිමායා සහ අයියා අතර ආදර අන්දරය සදාකාලික රහසක්ව තබාගන්නට නෙතුම් තීරණය කරන්නට ඇත්තේ. මට අහිමි වුණත් සාදු සාදු මල් පිපියන් මගෙ අයියාට... යනුවෙන් කල්පනා කරමින් වන්නට ඇත.

සිත අහසක් දේ කීවද අයියා දකින හැම මොහොතකම නෙතුම්ට පෙනුනේ ඔහුගේ පැහැපත් කඩවසම් මුහුණ නොව හිමායාගේ සොඳුරු මුහුණ ය. අයියට තියන සෙනෙහස සහ හිමායා පිළිබඳ හදවතේ ඇති සෙනෙහස එක සමාන වන නිසා පුංචි ඉරිසියාවක්වත් ලියලන්න නෙතුම් ඉඩ නොදුන්නේ ය. දරාගන්නට බැරි දියකඳ වැව බැම්ම උඩින් යා නොදී වැව බැම්ම මහා ජල කඳ උසුලන්නේ යම් සේද



Scanned by CamScanner

එවැනි වූ ශක්තියකින් නෙතුම් හදබැම්ම උඩින් සිත සිතුවිලි එතුරා යා නොදී දරාසිටින්නේ ය.

අවසානයේ නෙතුම් මේ සියලූ වේදනාවලින් පලායෑමට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර රෝහලකට මාරුවක් ගැනීමට තීරණය කළේ ය.

"නෙතුම්..... මෙත්තා කිව්වා උඹ මෙහෙන් යන්න හදනවා කියලා..."

"ඔව් සාලි....... මම කියන්න හිටියෙ...... ටික කාලෙකට පොළොන්නරුව පැත්තට යන්න හිතුවා.."

"උඹට පිස්සු ද බං"

"නෑ.. අපේ රස්සාවෙ හැටියට අපිට ඒ වගේ දේවල් කරන්න පුළුවන් වෙන්න ඕනෙ.... එහෙ හිටියත් මෙහෙ හිටියත් අපි කරන්නෙ එකම දේ. ඒ වගේ පැතිවල ගිහින් වැඩ කරන එක හිතට ගොඩක් සතුටක්. ඒ අහිංසක මිනිස්සුන්ගෙ ජීවිත හරිම අහිංසකයි සාලි...."

"කතාව ඇත්ත ඒත් මචං... කොළඹ ඉඳලා කවුද දුෂ්කර ඉල්ලලා යන්නෙ. ඒ පැතිවල ඉන්නවුන් බලාගෙන ඉන්නවා කොහොම ද එහෙන් පැන ගන්නෙ කියලා."

"ගොඩක් අය එහෙම හිතන එකෙ මට එහෙම හිතෙන්නෙ නෑ සාලි."

"උඹ ඔය තීරණේ වෙනස් කරන්නෙ ම නැද්ද?"

"මේක මම ගොඩාක් කැමැත්තෙන් හොඳට හිතලා ගත්ත තීරණයක් ඒ නිසා ඒක වෙනස් කරන්න මම උත්සාහ ගන්නෙ නෑ.."

"ඇත්ත ද? මෙත්තවත් මමවත් උඹේ ඔය තීරණේට කැමති නෑ"

"එහෙම ආත්මාර්ථකාමී වෙන්න එපා සාලි. අපි මේ ලෝකෙ ජීවත් වෙන කෙටි කාලෙදි පුළුවන් තරම් හොඳ දේවල් කරන්න ඕනෙ. නරක දේවල් කරන්න ගොඩාක් ලේසියි හොඳ දේවල් කරන්න අමාරුයි. හැබැයි අමාරුවෙන් හරි හොඳ දෙයක් කරන්න ඕනෙ..."





"නෙතුම් උඹ ලඟදි ඉඳලා හරි වෙනස්.... උඹ අපට නොකියන දෙයක් හිතේ තියාගෙන දුක් වෙනව ද?.."

"නෑ සාලි... මොකුත් ප්‍රශ්නයක් නෑ... මම කවදත් උඹල වගේ සෙල්ලක්කාර වුණේ නැහැනෙ.."

"ඒක ඇත්ත ඒ වුණාට ඉස්සර තිබුණ හැම ඉරියව්වක්ම දැන් වෙනස් උඹ කියන හැම වචනයක්ම ගොඩාක් බරයි නෙතුම්."

"ඔව් දැන් එදාට වඩා වයසයි. ඒ නියා අත්දැකීම් වැඩියි. ඒකයි."

"මට තේරෙන් නෑ බං.."

සාලින්දට නෙතුම්ගේ වෙනස්වීමක් ඇති බව වැටහුණ ද ඒ කුමක්ද යන්න නිශ්චිතව වටහා ගැනීමට නොහැකි විය. ශ්‍රී ලංකාවට පැමිණි පසු එක් වතාවක්වත් හිමායා ගැන හෝ හිමකුමාරි ගැන කතා නොකළ බැවින් ඔහුට ඇති ගැටළුව කිසිවක් සාලින්දට දන්නට නොවුණි.

"මෙන්නෙ..... නෙත්තා මෙහෙම ගිහින් මහණ වෙයි ද දන්නෑ. උඹ කියපු කතාව ඇත්ත බං මම ඇහුවා ම කිව්වා. පොළොන්නරුව පැත්තෙ හොස්පිටල් එකකට යනවා කියලා."

"පහුගිය කාලෙ වෙච්ච දේවල් නිසා ජීවිතේ කලකිරිලා ඇත්තෙ, අපිට පේන්න මේ ටිකේ හිතාගෙන හිටියට නෙතුම්ට හිමායාගෙ ගේ ලඟින් උදේ හවස යන එනකොට මතක් වෙනවා ඇති."

"ඔව් බං අපි වගේ එක අත්තක් ජර බර ගානකොට තව අත්තකට පය තියන ජාතියේ එකක් නෙවෙයි."

"අපි මෙකට මොකද කරන්නෙ සාලි...."

"ඒකනෙ..... ඔය පැත්තෙ ගියොත් නං ජොබ් එක පැත්තකින් තියලා. පන්සලකට ලං වෙයි."

"මම අපේ නංගිගෙන් අහලා බලන්නං, එනකොට නෙතුම්ට ස්ටේෂන්වලටත් හොඳයිනෙ.. ඇඟුරු දෙකක් හිටියත්නෙ"

"ම.. ඒක නං හොඳයි.."



Scanned by CamScanner

සාලින්ද එංගලන්තයේ පදිංචි තම සහෝදරියගේ උදව් ලබාගෙන නෙතුම් එහි යැවීමට තීරණය කලේ ය. ඇය විවාහවී සිටියේ ලන්ඩන් නගරයේ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක් සමඟ බැවින් සාලින්ද වෙනුවෙන් තම මිතුරාට එවැනි උදව්වක් කිරීමට අසීරු නොවන බව දන සිටියේ ය. පෙර වසර දෙකක කාලය තුළද ඔවුන් නෙතුම් වෙනුවෙන් කිසිදු අමනාපයකින් තොරව සියල්ල ඉටු කරදුන්හ.

"අයියෙ මම පොළොන්නරුව හොස්පිට්ල් එකට මාරුවක් ගන්න හිතාගෙන ඉන්නෙ.." රාත්‍රි රූපවාහිනී ප්‍රවෘත්ති නරඹමින් සිටින අතරතුර නෙතුම් අම්මා අප්පච්චි දෙදෙනාටම ඇසෙන සේ පැවසුවේ ය.

"ම්... ඇයි පොඩී..... හදිස්සියේ එහෙම හිතුවෙ,"

"ඒකනෙ එහෙ ඉන්න පුළුවන් ද පොඩි පුතේ" අම්මත් කතාවට හවුල් වූයේ කලබලයෙනි.

"දැන් ඉස්සර වගේ නෙවෙයි, සුදු මැණිකෙ.... දැන් දියුණුයි.. බයවෙන්ඩ දෙයක් නෑ....."

"අනේ මන්දා මගේ නං ඔය ගමනට කැමැත්තක් නෑ.... දැන් ඔයා ඔක්කොම හදාගෙන ද තියෙන්නෙ... පොඩි පුතේ.."

"නෑ.. තවම ලියුම බාර දුන්නෙ නෑ.... ඒත් මම මේ ගමන යන්න තීරණය කරලා ඉවරයි අම්මා."

"ඔයාලා පොඩි දරුවො නෙවෙයිනෙ මම ඔයාල හැදුව වැඩුව වුණාට මට ඔයාලගෙ තීරණවලට බලපෑම් කරන්න බෑ... ලොකු ඔයා මොකද කියන්නෙ"

"පොඩීට කොළඹ හැදිලා ඒ පරිසරයට හුරුවෙන්න පුළුවන් නං හොඳයි. මම ඉඳලා හිටලා ඒ පැත්තෙ යනවා එනවනෙ, පොඩී හිතන තරම් නං ලේසිවෙන එකක් නෑ.. හැබැයි උත්සාහ කළොත් බැරිත් නෑ.."

"මට ඕන දේකට හැඩගැහෙන්න පුළුවන්, ලොකු....."

නෙතුම්ගෙ අම්මා අකමැති වුවද කැලුම් මධ්‍යස්ථ විය. අප්පච්චි එහි වරදක් නොදුටුවේ ය. මිතුරන් තදින්ම විරුද්ධ වූයේ ය. එහෙත්





අනිත් අයගෙ මතයට වඩා තම මතයට ගරුකළ නෙතුම් පොළොන්නරුවෙ යෑමට ගත් තීරණය ක්‍රියාත්මක කිරීමට [illegible] ලිපිලේඛණ සූදානම් කරන්නට විය.

හිමායා පිළිබඳ මතකය සිතේ ඇනෙන කොහිල කටු මෙන් රිදුම් දෙන්නට වුවත් නිතරම පවුලේ අය මෙන්ම මිතුරන් සමඟ සතුටින් ගත කළේ ය.

නෙතුම් පිළිබඳ හොරගල් අතුලමින් සිටින නෙත්මිගෙ කණට පොළොන්නරු ගමන පිළිබඳ ආරංචිය වැටී තිබුණි. නෙත්මි නිහඬව කිසිවක් නොදන්නා ලෙස රඟපාමින් පොළොන්නරුව මහ රෝහලට ස්ථාන මාරුවක් ලබාගැනීමට කටයුතු කළා ය.

සියලු දෙනා කලබලයේ තම තම අරමුණු කරා දිවයන අතර අසනීප නිවාඩු ලැබූ නෙත්මි සතියක් රෝහලට නොපැමිණියා ය. නෙතුම් ලන්ඩන් යැවීමට අවැසි ලිපි ලේඛන සැකසීමටත් ඔහුගේ හිත වෙනස් කිරීමටත් දිවා රෑ නොබලා වෙහෙසුණු මෙත්සර සහ සාලින්දට නෙත්මි පිළිබඳ විපාදූප සොයන්නට ඉඩක් නොවී ය.

"ඔක තමයි කියන්නෙ උඩ අතු අල්ලන්න උඩ පැන්නට අන්තිමේ දී පල්ලෙහා තියන අත්තක තමයි එල්ලෙන්ඩ වෙන්නෙ කියලා. පොළොන්නරුවේ ගියාම මට කොහොමත් නෙතුම්ගෙ හිත වෙනස් කරගන්න පුළුවන්... මම නෙතුම්ට මෙච්චර දේවල් කරලත් මට එක්ක වැඩි තරහක් නෑ.. කතා නොකළට මම ගැන වෛරයක් නෑ කියලා දන්නවා. අනිත් එක නෙතුම් කියන්නෙ දාසකින්වත් නොසාගන්න බැරි තරම් හොඳ මනුස්සයෙක්. මම කරපු දේවල්වල හැටියට වෙන මිනිහෙක් නම් මම මෙලහකටත් පස් යට.. පොළොන්නරුවෙන් ආපහු එන්නෙ නෙතුම් මගේ ම කරගෙන." නෙත්මි හිතෙන් සතුටුවෙමි කාටත් හොරෙන් සිහින මන්දිර මැව්වා.

නෙත්මි යනු මව, පියා පමණක් නොව සහෝදරයෙක් හෝ නෑදෑයෙක් නොමැති අයෙකි. ඒ බව අවුරුදු පහක් එකට ඉගෙන ගත් නෙතුම් හෝ රෝහලේ එකට සේවය කරන සාලින්දවත් මෙත්සරවත් අනිත් කිසිම කෙනෙක්වත් නොදන්නා රහසකි. තමන් සමාජයෙන් ඉවත් කරතියි සිතූ නෙත්මි මුල සිටම ලිපිනය ලෙස භාවිත කළේ



Scanned by CamScanner

තනිකඩව සිට මියගිය හාමු කෙනෙකුගෙ වලව්වක ලිපිනයකි. නෙත්මි ඉපදුන මොහොතේ ම ඇගේ මව ඇයව හබරල පඳුරක් අයිනක අතහැර ගොස් තිබුණි. ඒ කඩුවෙල රණාල පැත්තෙ වෙලක් අයිනක ය. ඇඟ පුරාම කඩින් සහ කුහුඹුවන් පිරීසිටින විට ගොවියෙකුට අහඹු ලෙස හමුවූ බැවින් ජීවිතය බේරී තිබුණි. අද වනතුරු නෙත්මිගෙ මව පියා කවුදැයි හෙලි නොවූ රහසකි. උපතින්ම අසරණවුණු නෙත්මි හැදී වැඩුණේ පැලියගොඩ මහාමායා ළමා නිවාසයේ ය. ඉගෙන ගැනීමට උපන් හපන්කම් දැක්වූ නෙත්මි ශිෂ්‍යත්ව විභාගෙන් වැඩි ලකුණු ලබාගෙන විශාඛා බාලිකා විද්‍යාලයට ඇතුළත් වුණි. කාලය ගෙවී යද්දී වයසින් වැඩුණු ඇය පළවෙනි දෙවැනි කඩඉම්වලින් සමත්වී වෛද්‍ය විද්‍යාලයට යාමට තරම් වාසනාවන්ත වූවා ය.

තමා හැදී වැඩුනෙ ළමා නිවාසයක බව සදහටම රහසක් ලෙස තබාගැනීමට නෙත්මි තීරණය කළා ය. එනමුදු සිතෙහි ගිනිකන්දක් මෙන් වේදනාවක් නිදන්වී තිබුණි. නෙත්මිට තමන්ට ජීවිතේ නොලැබුණු ආදරය සෙනෙහස උපරිමයෙන් ලබාගැනීමට අවශ්‍ය විය. මේ ලෝකෙ කාත් කවුරුවත් නැති නෙත්මි ඒ අඩුව පුරවගන්න ඉඩකඩ ලැබෙන තුරු බලාසිටියා ය. නෙත්මි තම හිත මිතුරු නෙතුම්ගෙන් ඒ ආදරය ලබාගැනීමට ඒකපාර්ශවිකව සිහින මැව්වා ය.

නෙත්මි පිළිබඳ කඳුළු කතාව නොදන්නා මෙත්සර සහ සාලින්ද ඇයව හඳුනාගෙන සිටියේ හදවතක් නැති යක්ෂණියක් ලෙසිනි. නෙත්මි සහ හිමායා යන දෙදෙනාම අසරණ ගැහැණු ළමයින් ය. නෙත්මිට දෙපා ඇති අතර මිහිපිට තමාගෙ යැයි කිසිවකු නොමැත. හිමායට දෙපා සහ පියා හැර අනෙත් සම්පත් හිමි ය. දෙදෙනාම අසම්පූර්ණ චරිත දෙකකි. සත්‍ය සැඟවුණු නෙත්මිගෙ කඳුළු එළිදක්වූයේ වෛරී ස්වරූපයකිනි.

නෙත්මි ගැහැණියක්වූ වාසිය නිසා නෙතුම්ට පෙර මාරුවීම ඉහළින් අනුමත කරගැනීමට හැකිවූවා ය. නෙතුම්ට ඒ අවස්ථාව අහිමිවිය. එම ප්‍රමාදයෙන් සාලින්ද සහ මෙත්සර උපරිම ප්‍රයෝජන ගත්හ.

"මෙත්තො... අපේ නංගි කිව්වා නෙත්තගෙ වැඩේ ඕකේ කියලා."





"ආ...... ඇත්ත ද? දැන් අපි කොහොම හරි නෙත්තව කැමති කරගමු."

"ඔක්කොමත් හරි ඒක තමයි මේකෙ අමාරුම වැඩේ.."

"මව් කරන දෙයක් ඉක්මනට කරන්න ඕනෙ.. මම ඊයෙත් ඇහුවා. ඊට පස්සෙ කිව්වා. ගෙදර අයටත් කිව්වා කියලා."

"ගෙදර අය කැමතියිලු ද?"

"ගෙදරින් වැඩිඅකමැත්තක් නෑ කිව්වා."

සාලින්ද සහ මෙත්සර දෙදෙනා හවස වැඩ අවසන්වී නෙතුම්ගෙ නිවෙසට ගියෙ නෙතුම්ගේ කැමැත්ත ලබාගැනීමට ය. නිවසට ගොස් විවේක ගැනීමට ඇති කාලය මිතුරන් දෙදෙනා නෙතුම්ගෙ අනාගතය වෙනුවෙන් ආයෝජනය කළහ.

නොපෙනෙන අනාගතය ගැන මහමෙර පරදන හීන පොදි බැඳගත් නෙත්මි බ්‍රහස්පතින්දා දිනයක පොළොන්නරුව මහ රෝහලේ වැඩ බාරගන්නට ගියා ය. දුරුතු මාසයෙ මුල්කාලය නිසා ගස්වැල් ප්‍රාණවත්වී තිබුණි. වියලි කලාපයටම පෙම්කරන මැයි ගස් මල්වරවී ඇත. කැලෑවෙ ගස් මුල් අතරින් දොළපාරවල් දිගේ ගලාගෙන පැමිණි වැහි වතුර එකතු කරගෙන ගැබ්බර වුණ වැව් අම්මා කෙත්වතු සරුසාර කරන්නට වැව්දිය පරිස්සම් කරගෙන බලා සිටියෙ වාන් දොරටු විවෘත කරනතුරු ය. මල් සුවඳ රැගෙන හැම තැනම නැගම් යන සුළඟ නෙත්මිගෙ හිතට ද සතුට ගෙනෙන්නට වුණි.

පොළොන්නරුවට පැමිණි ගමන පිළිබඳ නෙත්මි සතුටු වූවා ය. අමාවක අවසන් කළ පසළොස්වක හඳ මෙන් එළිය අරන් නෙතුම් දිල්හාර එනතුරු පොළොන්නරුව මහ රෝහලේ අසරණ රෝගීන් සුවපත් කළා ය. අහිංසක මිනිස්සුන්ගෙ දුප්පත් දෙතොලෙ උපන් නිරුවත් සිනාව තුළ පවා නෙත්මි දකින්නට උත්සාහ කළේ නෙතුම්ගෙ අවංකබව සහ ආදරය යි. නෙත්මි පුංචි දූරිවියක් ලෙස රෑ නොනිදා දවස් ගෙවා දැමුවා ය.



Scanned by CamScanner

දවස් එකින් එක ඉපදිලා මියැදුනි. රෝහල් තිල නිවසේ දොර ළඟ ආඩම්බරෙන් මල් පුරවගෙන සිටි වෙරළු ගස කලින් නොදන්වාම මල්, කොළ, නැටි කිනිති බිමට අතහැර අවසන් ගමන් ගියෙ බිමට දුන් සෙවණ ඉර අව්වටම උකස් කරමිනි. වෙරළු ගසේ සෙවණ නොමැති බැවින් ඉර අව්ව නෙත්මිගෙ ජනේලෙන් ගෙට එබිකම් කරන්නට විය. වෙරළු ගස මියැදුණ අවසරෙන් හිරු අව්ව නෙත්මිගෙ සිහිනවල තෙතමනය ද වියලා දැමුවේ ය.

ඉඳ හිට කවුළුවලින් ගෙට එන හිරිකඩ නෙත්මිට අරියාදු කරතැයි සිතූ මකුළු හාමිනේ අලුත් සහ පරණ රටාවලින් කළ මකුළුදැල් කීපයක් ම කවුළුව අසල දැවටුවා ය. යටලීයෙ පරණ රන්කුඹල් ගම්මානයම පාළුවට ගොසිනි, රන් කුඹලියන් මෑතකදී ගැබ්බරවීමට සූදානම් නොමැති නිසා නිවෙස් අලුත්වැඩියා කිරීමට රන් කුඹලන්ට අවශ්‍ය නැත.

ජනවාරි විසි වෙනිදා පාන්දර හතරයි තිස් පහට නෙතුම් යාළුවන්ගෙයි පවුලෙ අයගෙයි බලාපොරොත්තු සිහිවටන සේ රැගෙන ලන්ඩන් යෑමට ගුවන්ගත විය. යාළුවොයි අයියයි අප්පච්චියි සතුටු සිනාමවද්දී අම්මා දෑස් අගින් ගැලූ කඳුළක් සාරිපොටින් පිසදැමුවා ය.

''පොඩි පුතා දක්ෂයි..... මගේ පුතාට තුණුරුවන්ගෙම සරණයි!.

''අපේ පොඩීගෙ මේ ගමන ඔය දෙන්නගෙ උනන්දුව නැත්නං කවදාවත් වෙන්නෑ...'' කැලුම් මෙත්සරට සහ සාලින්දට හදවතින්ම ස්තුති කළේ ය.

''අපිට සතුටුයි නෙතුම් පොලොන්නරුවේ යන්නෙ නැතිව ලන්ඩන් යවාගන්ඩ පුළුවන් වෙච්ච එක ගැන. දැන් නෙතුම් ආය ලංකාවට එන්නෙ ෆුල් කොලිෆයිඩ් ඩොක්ටර් කෙනෙක් විදිහට....''

''පුතාලා ගොඩාක් මහන්සි වුණා. නේද? ගොඩාක් පිං පුතේ ඔය දෙන්නට....'' නෙතුම්ගෙ අම්මා ඇස්වල දිළිසෙන කඳුළු අතරින් සිනාසෙමින් පැවසුවා ය.





''ඔව් මම පුංචි මැණිකෙත් එක්ක අද උදෙත් කිව්වෙ.... පුතාලා වගේ යාළුවො අද කාලෙ දකින්ඩ නෑ කියලා.''

''අපි වගේ හොඳ යාළුවෝ නෑ වගේම නෙතුම් වගේ හොඳ මිනිස්සුත් නෑ.... ඒ අම්මගෙයි තාත්තගෙයි හොඳ නිසා.'' මෙත්සර පැවසුවේ ය.

නෙතුම්ගෙ ගමන ගැන හැමෝම සතුටින් කතාකරන අතර නිල් අහසේ වලාකුළු අතරින් නොපෙනී යන ගුවන් යානයකට අම්මගෙ දෑස් සැණෙකින් යොමුවූවා ය.



Scanned by CamScanner

# 30

**සිරිපා** වඳින්න යන සුදු පාට, කහ පාට සමනලුන්ට තාඹර බණ්ඩි ගොයම් පාවඩ එළා තිබුණි. පසු කාලයේ පීදී කිරිවැදී සුහුඹුල් වී ඇටවලින් හිස පළඳගෙන ගොයම් ගස් ආඩම්බරයෙන් ලියදි මැද්දට වුයේ තියර වටකොට සිටින බැවිනි, බොල් වීඇට අමුණගත්ත වී කරල් තැනින් තැන නොනැමී අහසට එසවෙනවිට පිරිපුන් වී කරල් පොළොවට නැමුණි. ගුණ නුවණින් පොහොසත් හිමායා දවසින් දවස ජනප්‍රිය සහ ප්‍රසිද්ධ වනවිට පැහුණු වීකරල් මෙන් නිහතමානී වූවා ය. ගුණ නුවණින් දුප්පත් වුණ මුදලින් පොහොසත් අය හිමායා වගේ කෙනෙකුටත් ඊර්ෂ්‍යයා කළහ. සතා සිව්පාවෙකුට හෝ වැඩක් නොමැතිව බොල්වී කරල් ලියදිවල තනිවූ සේ දූදනෝ සමාජ ඉපනැල්ලේ අතරමංවූහ.

හිමායා කලාවට අමතරව සමාජ සේවා වැඩ වෙනුවෙන් කාලය සහ මුදල් වියදම් කළා ය. දෙපා නැති හිමායා ලංකාවේ ප්‍රසිද්ධ චරිතයක් වුවද ලන්ඩන් සිටින නෙතුම්ට හිමායගේ සත්‍යය කතාව තවමත් රහසක් වුණි. මාධ්‍යවලින් හිමායා ගැන තොරතුරු පැවසුව ද ආබාධිත බව ඇඟවෙන රූප රාමුවක්වත් හෝ තොරතුරක් නොදී සිටියහ.

සති අන්ත පුවත්පතක කලාපිටුව වෙන්වී තිබුණේ හිමායගෙ ඡායාරූප පිරුණු ලිපියකිනි. නිවාඩු දිනයෙ ලැබුණු පුංචි විවේකය





ගත කිරීමට පත්තරේ පිටු දිගේ ඇවිදින නෙතුම්ගේ ඇස්වලට හිමායගෙ ලිපිය අහම්බෙන් අසුවුණි. ''හිම කුමාරිට... පණ දුන් සඳ කිඳුරිය.. හිමායා නෙත්සරණි'' මාතෘකාව දුටු සැනින් නෙතුම්ට හිම කුමාරිගෙ චිත්‍ර ප්‍රදර්ශනේ එකවරම මතකයට පැමිණියේ ය.

''හිම කුමාරි කියන්නෙ මම දිහා ජනේලෙන් බලාගෙන හිටිය කෙනා ද?'' මෙතෙක් දිනක් නොදැන සිටි තොරතුරක් දැනගත් නෙතුම් ඇහිපිය නොගසමින් මුල් ඡේදය කියෙව්වේ ය.

''ඔව්.... ඒ හිමායා.. හිම කුමාරියි හිමායයි දෙන්න ම එක්කෙනෙක්, පුදුමයි. පුරසඳ එකේ පැහැසර චිත්‍ර ප්‍රදර්ශනේ කරපු ඒ ලස්සන කිඳුරි...... මම ජනේලෙන් බලාගෙන ආදරේ කරපු මට ආදරෙන් හිනාවුණ හිමාය ද? ඒත් ඇයි මට අඳුනගන්න බැරි වුණේ, ම්..ම්... මම ජනේලෙන් දැක්කෙ මූණ විතරනෙ. එදා කොහොමත් ලස්සනට හැඩකරලනෙ තිබුණෙ, එතකොට එයාට මාව අඳුනගන්න බැරිවුණා ද?.. ආ........ මම ඊට කළින් දවසෙ කොණ්ඩෙයි රැවුලයි කැපුවනෙ, ඒ නිසා එයාටත් මාව අඳුනගන්න බැරි වෙන්න ඇති. ඒත්.... අන්තිමට එයා මාව දැකපු දවසෙ නම් අඳුනගන්න පුළුවන් වෙන්න ඕන...ආ..... ඒක තමයි එයා අන්තිම දවසෙ හොඳට හිනාවුණේ..... ෂා...එච්චර ලස්සන දක්ෂ කෙනෙක් ද මගේ හිතින් බැහැලා ගියේ... එතකොට හිම කුමාරි ගැන මෙත්සරයි සාලින්දයි මට කියලා එකපාරට හෙමින් සැරේ විස්තර හොයන එක අතඇරියෙ එයාලා දන්නෙ නැද්ද? නැත්නම් ඒ දෙන්න මට නොකියා හිම කුමාරිට ආදරේ කරනවද දන්නෑ... නෑ..නෑ..... මට මෙච්චර උදව් කරන ඒ දෙන්නා එහෙම කරන්නෑ... එතකොට එයාලා මගෙන් මොනවා හරි හංගනවද දන්නෑ... සමහරවිට මට දැනුන වගේ අපේ ලොකුගෙයි හිමායාගෙයි මොනවා හරි දැනගෙන වෙන්න ඇති.ම.....'' නෙතුම් ජනේලයෙන් ඈත බලාගෙන ලොකු කල්පනාවකට වැටුණි. නොයෙක් මං ඔස්සේ අනුමාන කරමින් දොරකඩ වාඩිවී සිටි අතර අතේ තිබුණු ලොකු ඇපල් ගෙඩිය අවසන්වී තිබුණි. ඇටයක් හෝ පොත්තක්වත් ඉතුරුවී නොතිබුණි.

''කැලුම් කියන්නෙ මගේ අයියා නෙවෙයි නම් මට කෙළින්ම හිමායා හම්බවෙලා සිද්ධවුණ දේවල් ඔක්කොම කියන්න තිබුණා.



Scanned by CamScanner

ඒත් ලොකුයි හිමායයි අතරට ගිහින් මට ඒ කතාව කියන්න බෑ... මට මේ දැනුන දුක ලොකුටත් මේ වගේම දැනෙයි... මට මේ හැම දෙයක් ම හීනයක් වගේ....... මම මුහුදින් මෙහා හිටියට හිමායා දවසින් දවස මගේ හදවතට ළං වෙනවා. මට පුදුමයි කොච්චර ලස්සන කෙල්ලො හමුවුණත් යාළුකමකින් එහාට ඒ එක්කෙනෙක්වත් ළං කරගන්න මගේ හිත ඉඩ දෙන්නෙ නෑ... මම හිතන්නෙ හිමායා ආත්ම ගාණක් මගේ වෙලා ඉන්න ඇති...ඒත්........ මේ ආත්මෙ මගෙ හිතට අහම්බෙන් ඇවිත් මට නොකිය ම ගිහින්..."

පුවත්පතේ නිහඬ ලිපිය නෙතුම්ව අතීතයට කැඳවාගෙන ගියේ ය. හිතට දැනුන වේදනාවට පිටවෙන්නට මෙන් ජනේල් කවුළුව හැරදැමුවේ ය. සුදුපාට පුළුං මෙන් හිමවලින් බිම තණකොළ වැසී තිබුණි. වෙරි අතු උඩ හිමකැට දවස් කිහිපයක සිට අනවසරෙන් පදිංචිවී සිටිති. හුළඟට පාවෙමින් වැටෙන තුහින ජනෙල් පියන් අතරින් සෙමින් පාවී ඇතුළට පැමිණියේ ගිනිගන්න තරම් උණුසුම් වුණ නෙතුම්ගෙ පපුවට සීතල දෙන්නට මෙනි.

ඡායා රූපයක්වී හිනාවෙන හිමායාගෙ මුහුණ දුටු මොහොතේ සිතට දැනුන විදුලි සැර නිසා නෙතුම් පුවත්පත මේසය මත තනිකර ජනේලය අද්දරට ගොස් මුදුලෙස පතිතවන සීතල හිම දෙස බලා සිටියේ ය. හයියෙන් හුස්මක් ගෙන සිතේ එකතුවුණ වේදනාව ජනේලයෙන් ඈතට විසිවන්නට තරම් වේගයෙන් පහල හෙළුවේ ය. දෙවැනි වතාවට පුවත්පත අතට ගෙන, හිමාය ගැන සඳහන් විස්තරය දිගේ ඇස් පරෙස්සමින් ගෙනගියේ ය. කලා කටයුතු මෙන්ම සමාජසේවා වැඩ ගැනත් පවුලේ විස්තරත් ඒ අතර විය. හිතවත් මිතුරා නිසා තම අනාගතය ම වර්ණවත් වූ බව සඳහන් කර තිබුණත් නමක් සඳහන් නොවී ය. ඒ වෙනෙකෙකු නොව ආදරණීය අයියා වන බව නෙතුම් සැකහැර දැනගත්තේ අයියාගේ දින පොතේ වූ සමහර වචන හා සන්සන්දනය කිරීම නිසා ය. නිසලව තිබූ ළිං පතුළට ලණුව බඩ බැඳගත් බාල්දිය බැස දිය කැලතුයේ යම් සේද පැදී තිබුණ සිත සසල වීමට මේ ලිපියට හැකිවිය. ලිපිය අවසානයේ තව සතියකින් එහා දිනයක් සඳහන් කරමින් කතුවරිය හිමායාට සුභ උපන්දිනයක් ප්‍රාර්ථනා කර තිබුණි.





"නෙලාගන්න අත දිග නැති වුණාට මම හිමායට තරහා නෑ.. හිමායගෙ උපන්දිනේට සුභ පතලා මල් පොකුරක් යවන්න ඕනෙ.." නෙතුම් සිතුවේය.

"ම්... කෝල් එකක් දෙන්නත් පුළුවන්.. නම්බර් එකත් තිබුණනෙ... ඒත්... අයියට නම්බර් එක ගැන කිව්වොත්.... අයියා මම කියලා දැනගත්තොත්.. නෑ..... කමක් නෑ.. මම මල් පොකුරක් යවනවා. නම ලියන්නෙ නැතුව, හිමායට ආදරේ කරන රසිකයො ගොඩාක් ඇතිනෙ ඒ නිසා ඒක තමයි හොඳම විදිහ." නෙතුම් කාමරෙන් එළියට පැමිණ හිමෙන් වැසුණු පොළොව දෙස බලාගෙන කල්පනා කරන්නට විය. සුළඟට පාවෙමින් තිබුණ හිම පියලි කිහිපයක් තොප්පියේ නතර වුණි.

"මෙත්තටයි සාලිටයි කෝල් කරලා මේ විස්තර කියන්නත් හිතෙනවා. ඒත්.. ඕන නෑ ලොකු ගැන එයාලා දන්නවනම්, කමක් නෑ මම මොකුත් දන්නැවගේ ඉන්නවා. ඒත් හිමායා........ හිම කුමාරි........ කියන සඳ කිඳුරිය ගැන මගේ හිතේ ඉඩක් වෙන්වෙලා තියෙයි...." නෙතුම් ඇඳේ මුනින් අතට පෙරලීගෙන කල්පනා කළේ ය. හෙලපු පුසුම්වල උණුසුම නහයට කටට ළංවී සිටි කොට්ටය කොන්දේසි විරහිතව බාරගත්තේ ය.

නෙතුම් දින ගණන් කරමින් සිට හිමායගෙ උපන්දිනේ දවසෙ ලැබෙන පරිදි මල් පොකුරක් සහ වටිනා සපත්තු දෙකක් සූදානම් කළේ ය. හිමායා කිවිදියක ද වන බැවින් සුභ පැතුම කවි බසින් සිය අත්අකුරෙන් ම ලියා තැබුවේ ය.

"රන්වන් තැඹිලි මල් සිඹින බිඟු කැල මා නෙතු ඇසුවා ද
රතුපැහැ ලොවි ගසට බට්ටිත්ති තවමත් හී ගයනව ද
සුදුමුදු වලා නිල් ගුවනෙ රූ අසිරි මවනව ද
කුමුදු මලට සියපතට පෙම්බඳින බමරුන් දුටුවා ද
සියුමැලි සඳින් පන්හිඳ පත ලැබුවා ද
සඳ කිඳුරු රූ ඇසකට අසුවුනා ද



Scanned by CamScanner

සුභ උපන් දිනක්.... සුභ උපන් දිනක්,

මට අහිමි වන්න කින්නරියේ............"

පුවත්පතේ සඳහන් ලිපිනයට උපන්දින සුභ පැතුම සහ ත්‍යාගය අලංකාර ඇසුරුමක දවටා තැපැල් කරන ලද්දේ හදවතේ පිරී ඉතිරී යන ආදරයද මුසු කරමිනි.

"කමක් නෑ... නිකමට සාලිට එහෙම හිමායා ගැන අලුත් තොරතුරු කියන්න ඕනෙ... ඒ ගැන එච්චර ගණන් ගන්නෙ නැති විදිහට කියන්න ඕනෙ...."

"හෙලෝ...... මචං සාලි... ඉතිං කොහොමද?"

"අපි හොඳින් ඉන්නවා... බං"

"සතියකින් කෝල් එකක්වත් ගන්න බැරි වුණා. ගිය සතියෙ තමයි ෆයිනල් එක්සෑම් ඉවර වුණේ.. ඒ ටිකේ කිසිම විවේකයක් තිබුණෙ නෑ...."

"ආ.... ඒක තමයි මෙත්ත කිව්වා දවස් ගාණක් ම ගත්තා ෆෝන් එක වැඩ කළේ නෑ කියලා."

"ඔව් සාලි දැන් නං ඔළුවට පුදුම නිදහසක්, පහුගිය ටිකේ දවල් රෑ නැතුව පාඩම් කළා."

"ඊයෙ අපේ නංගි කිව්වා උඹ බලන්න ගියා කියලා."

"ඔව් සාලි.. ඒ දෙන්නා ඇවිත් ගියා... ඒ දෙන්නගෙ උදව් නිසා තමයි මට මේ වගේ චාන්ස් එකක් ලැබුණේ."

"ඒකත් ඇත්ත ඒ වගේ ම උඹ හොඳ මනුස්සයෙක් හින්ද තමයි බං ඕන කෙනෙක් දෙපාරක් හිතන්නෙ නැතිව උදව් කරන්නෙ..."

"සාලි උඹලට කියන්න අලුත් ආරංචියක් තියනවා.."

"ආ... සුදෝ සුදු චෙරිමලක්වත් නෙලා ගත්ත ද?"

"අපෝ නෑ.... කොයිකාට සුදුමල් වටිනවා වුණත් මට නම් ලංකාවේ මඩෙන් උඩට ඇවිත් පිනෙන නිල්මානෙල් තමයි වටින්නෙ..."





"එහෙනං මොකක් ද මචං"

"උඹට මතක ද මෙත්තයි මමයි පුරසඳ හොල් එකේ පැහැසර කියලා ආර්ට එක්ෂිබිෂන් එකක් බලන්න ගියා කිව්වා."

"ආ.... මෙත්තා මට කිව්වා.... ඉතිං....."

"ආ..... ඒ හිම කුමාරිගෙ නම හිමායලු. මම අර ජනේලෙන් හිනාවෙලා තියෙන්නෙත් එයාමයි. පුදුමයි බං.... විහිළුවක් වගේ.."

"ආ.. ඇත්ත ද?" සාලින්දට එය සීතලවුණු තොරතුරක් බැවින් පුදුමයක් නොවුණි. ඒ බව සාලින්ද නොකිව්වද සාලින්දගෙ උත්තරේ උණුසුම අඩුවුණ නිසා නෙතුම්ට සැක මතුවුණි.

"ඒ කියන්නෙ උඹලා දන්නව ද?" සාලින්ද නොදන්නා බව අඟවන්න කල්පනා කළද නෙතුම්ගෙ කටට උත්තරේ දීලා ඇසුවිට මඟහැර යාමට නොහැකිවුණි.

"ඔව්.... ටිකක් දන්නවා. ඒත් මේ ළඟදී. ඒ දවස්වල අපි කතා කරන්න උත්සාහ කළා හරියන්නෑ වගේ තේරුන නිසා උඹට තවත් දුකක් දෙන්න ඕන නැති නිසා අපි ඒ අදහස අත් ඇරගත්තා. උඹ දන්නෙ කොහොම ද?"

"ගිය සතියෙ පත්තරේක තිබුණා. දැන් තවත් ලස්සනයි"

සාලින්ද සහ මෙත්සර නෙතුම් කියවපු පුවත්පතේ විස්තරය පසුගිය සතියෙ දැක තිබුණි.

පැය භාගයක් පමණ පැවතුණු දුරකතන සංවාදය අවසාන වූයේ දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන නෙත්මි අසාධ්‍ය තත්ත්වයේ පසුවන බව සාලින්ද කියූ විස්තරයෙනි. තමන්ට කොතරම් නපුරුකම් කළ ද නෙතුම් ලංකාවට ගිය විට ඈ බැලීමට යා යුතු යැයි ඒ මොහොතේම තීරණය කළේ ය.

නෙතුම් හිමායගේ උපන් දිනේට ලංකාවට යැවූ පාර්සලය හමු වීමට නියමිත දිනය උදාවිය. රෑ බොහෝ වේලාවක් නින්ද දෑසට නොගෙන කල්පනා කරන්නට වූයේ සුභ පැතුම කියවන, මල්



Scanned by CamScanner

පොකුරේ හැඩබලන, සපත්තු දගෙන ඇවිදිමින් හැඩ බලන හිමායා. කිරිකෝඩු යෞවන වයස පසුවී ඇති මුත් නෙතුම්ගෙ ආදර හිත තවම මුහුකුරා ගිහින් නොතිබුණ බැවින් සිතුවිලි සියුමැලි ය.

හිමායා මීට පෙර උපන් දින බොහෝමයක් පසුකර තිබුණි. එහෙත් මෙවැනි උපන්දිනයක් කිසිදා පසුවී නොමැත. කැලුම්ගෙයි නිමාලිගෙයි වැඩි කැමැත්ත මත උපන් දින සාදය ලෑස්ති විය.

ළඟින් ම ඇසුරු කරන මිතුරන් නොවුනද මෙත්සරට සහ සාලින්දට හිමායා ආරාධනා පත් යවා තිබුණි. උපන් දින සාදයකට වඩා මිතුරු හමුවක් ලෙස සියලු දේ සැලසුම් වුණි. හිමායගෙ උපන් දිනය තබා තමාගෙ උපන් දිනයවත් නොදන්නා සුදු බිංදු වලිගය කරටගෙන සුපුරුදු ඤ...ව්.... බසින් මොනවදෝ කියවමින් නිමාලි පස්සේ ද සුදු ආච්චිඅම්මා පස්සේ ද දුවන්නට විය.

කළුවරත් රැගෙන එන ආගන්තුකයන්ට ඉඩ දීමට ගේට්ටුව දෙපසට වූයේ අඳුර එන්නටත් පෙර ය. මිදුලේ තැන් තැන්වල වාහන නතරවූ අතර අමුත්තන් හිමායාගේ නිවසට ඇතුළුවී හිමායාගේ සිතුවම් බලමින් ද තොරතුරු කතාබහ කරමින් ද ගත කරන්නට විය. නිමාලි සතුටින් ආගන්තුක සත්කාරයේ යෙදෙන්නට විය.

"අම්මා, මොකද දන්නෑ ඩොක්ටර් කැලුම් තාම නැත්තෙ..." රාත්‍රී හත පසුවෙමින් පැවතුන ද කැලුම් නොපැමිණීම පිළිබඳ හිමායා විමසිලිමත් වූයේ ඔහු ද මෙයට පැමිණිය යුතුම අනිවාර්යම මිතුරා බැවිනි.

"මම කතා කරලා බලන්නම් දෝණි..."

මිතුරන් සිංදු කියමින් විනෝද වන විට මෙත්සර සහ සාලින්දගේ මෝටර් රථ හෙමින් ගේට්ටුවෙන් ඇතුළු විය. මීට පෙර එක් දිනක නෙතුම් සමඟ මෙත්සර පැමිණ ඇත. එහෙත් ඒ බවක් නිමාලි තවමත් නොදනී. සුදු ආච්චිඅම්මා වචන කීපයක් කතා කළද ඇයට මීට වසර ගණනකට පෙරවූ සිදුවීම අමතකව ගොස් ඇත. මෙත්සර වසර ගණනකට පෙර වූ මතකය දිගහරිමින් විහිළු කරමින් ගෙට ඇතුළු වූයේ සාලින්දට පමණක් ඇසෙන ලෙසිනි.





ආරාධිත අමුත්තන් සියල්ල ම පැමිණ ඇත. කැලුම් පමණක් තව ම පැමිණ නැත. හිමායා මෙන්ම නිමාලි තරමක් කලබල වූයේ කැලුම්ගේ දුරකතනට ඇමතුම් සම්බන්ධ කරගැනීමට නොහැකි වූ බැවිනි. සාදයේ සිටිය යුතුම හිත මිතුරා නොවී ය. කතාබහේ නිරත වෙමින් ආහාරපාන භුක්ති විඳිමින් සියලු දෙනා සතුටු විය.

හිමායාගේ ජීවිතයට දෙවන උපත ලබාදුන් තැනැත්තා ලෙස නිමාලි කැලුම්ට මහත් ගෞරවයක් දක්වන්නට විය. රාත්‍රී දහය පමණ වන විට කැලුම්ගේ මෝටර් රථය ගේට්ටුවෙන් පැමිණෙනු දුටු නිමාලි සහ හිමායා හිතේ වූ බිය සැක පසෙකින් තැබුවාහ. සංග්‍රහ භුක්ති විඳීමෙන් අනතුරුව නෙතුම් හා මෙත්සර පිටව ගියේ මීට විනාඩි පහකට පමණ කලිනි. සාදයට පැමිණි හැමෝම රැයට වියපත් වෙන්නට ඉඩදී ආපසු ගියහ.

කැලුම් නිවසට පැමිණ ගේට්ටුව දෙස බලමින් දුරකතන ඇමතුමක් ගන්නට විය. සුදු පැහැති ඩොල්ෆින් වෑන් රථය දුටු කැලුම් ගේට්ටුව දෙසට ඇවිද ගියේ ය. පසුපසට ගේට්ටුවෙන් පැමිණි වාහනයේ විවෘත කළ දොරින් විශාල පෙට්ටියක් දෙදෙනෙකුගේ සහාය ඇතිව ගෙතුළට ගෙනෙන ලදී.

"ඕ.... ඇයි ඩොක්ටර් පරක්කු වුණේ මේක ගේන්න ගිහින් ද? අපි බය වුණා.."

"ඔව්... මම මේක අපේ මල්ලිට කියලා ලන්ඩන්වලින් ගෙනාවෙ. බාරගන්න ගිහින් පරක්කු වුණා."

"මොකක් ද ඩොක්ටර් මේ.. ඇයි මෙච්චර ලොකු දෙයක් ගෙනාවෙ, ඩොක්ටර් අපි වෙනුවෙන් කොච්චර දේවල් කරලා තියනවද? කරපු උදව්වලට අපි ආත්ම ගාණක් ණයයි."

"මොකක් ද ඩොක්ටර් මේ....."කොටස් එකලස් කර නොතිබූ බැවින් කුමක්ද යන්න සිතා ගැනීමට නොහැකිවිය.

"ඕක තමයි හිමායා ඔයාගෙ වැඩ ලේසි කරගන්න පුටුවක්, මේ තියෙන්නෙ කකුල්, වෙන ඒවා වගේ නෙවෙයි. හරිම ලේසියි. පෙනුමත් තියනවා."



Scanned by CamScanner

''ඩොක්ටර් ඔයා ගිය ආත්මෙ අපේ ම කෙනෙක් වෙන්න ඇති. නැත්නං මෙච්චර අපිට උදව් කරයිද?'' නිමාලි පැවසුවේ ගෞරවයෙනි

''හිමායා මම හෙට එන්නං අම්මා දෙපාරක් කෝල් කළා. මල්ලිත් නැති නිසා අම්මා මම ගෙදර එනකං බලාගෙන ඉන්නෙ..''

''ඩොක්ටර්.... මල්ලි රට ගිහින් දැන් ගොඩක් කල් නේද?'' නිමාලි විමසුවා ය.

''ඔව්.. තව මාස 4 කින් එනවා.''

''ඩොක්ටර්ගෙ මල්ලි ඉන්නෙ ලන්ඩන් කිව්වා නේද? අද මට කවුද ප්‍රසන්ට එකක් එවලා තිබුණා විෂ් කරලා. මම යන්තං බැලුවා. ලස්සන මල් පොකුරකුයි සපත්තු දෙකකුයි එවලා තිබුණා. අම්මා අර මේසෙ උඩ තියන රෝස පාට පාර්සලේ ගෙනත් දෙනවද?'' හිමායා පෙන්වීමට සූදානම් වන්නේ නෙතුම් එවන ලද ත්‍යාගයක් බව කිසිවකුට නොසිතුණි.

''ආ දෝණී.......''

''මේ බලන්නකො ඩොක්ටර්..... හරිම ලස්සනයි මේ සපත්තු දෙක...... ඒත්.....මට මේ සපත්තු දාන්න කකුල් දෙකක් නැනෙ.......''

හිමායා පපුවට පුරවගත් හුස්ම දෑස් පියාගෙන පිටකරනවිට ඇස්වලින් කඳුළු ගලායන්නට විය. නිමාලි සහ සුදු ආච්චිඅම්මාගෙ පමණක් නොව කැලුම්ගෙ හදවතද රිදුම් දෙන්නට විය.

''දෙන්න හිමායා... මම මේ සපත්තු දෙක ඔයා මතක් වෙන්න තියාගන්නං... ඔයාට කකුල් නෑ කියලා දුක් වෙන්න එපා. කකුල් තියන අයට වඩා දහස්ගුණයක් ඔයා ඉදිරියෙන් ඉන්නවා.'' කැලුම් සපත්තු දෙක ඉල්ලා සිටියේ එය දෙස බලමින් මින් පසුද ඇය දුක්වීම වළක්වාලීම පිණිස ය.

නිමාලි දෑස්වලට නැගුණු කඳුළු දෑතින් පිසදමමින් පිටව ගියා ය. කැලුම්ගෙ සිතේ කාලාන්තරයක් නිදන්ව තිබූ හැඟීම් වැටකඩොලු බිඳගෙන පිටවූයේ ය.





''හිමායා ඔයාට මම ඉන්නවා...... මම ඔයාව සුවපත් කළා වගේ ඔයාගෙ ලෝකෙ මම හැමදාම ඉන්නවා...... සත්තයි..''

''ඩොක්ටර්.......'' හිමායා පුදුමයෙන් දෑස් දල්වාගෙන කැලුම්ගේ මුහුණ දෙස බලා සිටියා ය.

''හිමායා.... බලන්න මේ මගේ ඇස්වල තියන කඳුළු ඔයාට පේනව ද හිමායා......මේ ඇස්වල කඳුළු ඔයාට සහතික කරන්නෙ මගේ හිතේ අවුරුදු ගාණක් ඉඳලා තිබුණ කතාව,''

''අනේ ඩොක්ටර්..... අත් දෙකයි ඔළුවයි කඳයි තියන මට වැඩිය ලස්සන ගෑනු ළමයෙකුට ආදරෙ කරන්න පුළුවන්.... මගේ පව්වලට ඩොක්ටර් වන්දි ගෙවන්න ඕනෙ නෑ.. මේ මම ගිය ආත්මෙ කරපු පවක්..... එපා ඩොක්ටර්.... එපා..... මට මේ රෝද පුටුවෙ ම නාකි වෙලා කවදාහරි මැරෙන්න ඉඩ දෙන්න.''

''නෑ... හිමායා ඒ කතාව බොරුවක්....''

''ඩොක්ටර් මාත් එක්ක විහිළු කරනවද?''

''නෑ හිමායා මට ඔයාගෙ ජීවිතේ විහිළුවක් නෙවෙයි.''

''අනේ ඩොක්ටර්....''

''පුදුම වෙන්න එපා හිමායා........ මම ඔයාට..........''

කුස්සියට ගිය නිමාලි කෑම පාර්සලයක් රැගෙන සාලෙට එමින් සිටි බැවින් කැලුම්ට කතාව අතර මැදින් අවසන් කිරීමට සිදුවිය.

''ඩොක්ටර් මේ කෑම පාර්සලෙ අම්මටයි අප්පච්චිටයි..''

''ආ........ බොහෝම ස්තූතියි අම්මා....'' කැලුම් වෙනසකින් තොරව පිළිතුරු දුන්නේ ය.

''ආ ඩොක්ටර් මේකත් ගෙනියන්න...'' හිමායා නිවසින් පිටවීමට සූදානම්වූ කැලුම්ට සපත්තු දෙක මතක් කළා ය. නෙතුම් ලියා එවූ කවි සුහ පැතුම සපත්තු පාර්සලේ තිබුණ බව හිමායා දැන නොසිටියා ය.



Scanned by CamScanner

# 31

අඬ සඳේ කිරණ සෙමින් නැලවෙන වැව් දියට බැස දිය කෙළියට සූදානම්වුණි. කුමුදු කුමාරියි නෙලුම් කුමාරියි තම රවුම් කොළවල සඳ සළු අතුරන්නට අවසර දුන්නේ ය. ගල්ලැහැ පඳුරෙ කොරවක් පොඩි එවුන් මවට තුරුළුවී නිදිගත්හ. ආදරිය සොයාගෙන වැව් බැම්ම දිගේ ගිය උරුලෑවා දකීමෙන් කකුල් උඩට හරවගෙන බිත්තර රකිමින් සිටි කිරලි යටිගිරියෙන් කෑ ගැහුවෙ හරි හැටි විස්තරයක් නොදන ය. මැදියම් රෑ ජනේලයෙන් බලාගෙන සිටි හිමායා අහසේ තරුවලට, බිම අඳුරු සෙවණෑලිවලට කැලුම් ගැන විස්තර දුන්වූවා ය.

''ඩොක්ටර් මට මේ කියන්නෙ ඇත්තක් ද? ඩොක්ටර් මම වගෙ කෙනෙකුට ආදරේ කරයි කියලා හිතන්නවත් බෑ..... නෙතුම් මට ළංවෙලා හිටියෙ එයාට තව ගර්ල් කෙනෙක් ඉද්දි... ඒ වගේ ම ලස්සන කැලුම් එහෙම නෙවෙයි කියලා මම කොහොම ද හිතන්නෙ.. නෙතුම් කියන්නෙත් ඩොක්ටර් කෙනෙක්...... මට හිතාගන්නවත් බෑ...'' හිමායා කල්පනා කළා ය.

මැදියම් රැයට ආසන්නවී නිවසට ගිය කැලුම් කොට්ට දෙකක් ඇඳ වියනට හිටවාගෙන හාන්සිවී කල්පනා කරන්නට විය. කාමරේ දොර ජනෙල් ඇස්පියා ගත්තද විදුලි බුබුළ කැලුම ගැන ඕපාදූප සෙවීමට ඇහැරී සිටියේ ය.





''ම්.. ... සපත්තු දෙක ගොඩාක් වටින එකක්. අර වගේ වටින මල් පොකුරක්, සපත්තු දෙකක් සාමාන්‍ය රසිකයෙක් එවන්නෙ නෑ. ලන්ඩන්වලින් එවලා තියෙන්නෙ මම අවුරුදු ගාණක් හිතෙන් පෙරුම් පුරලා ලැස්ති වෙනකොට හිමායට කවුරුහරි ආදරේ කරනව ද දන්නෙ නෑ...'' එසේ කල්පනා කළ කැලුම් ඇඳෙන් නැගිට ගොස් පාර්සලය අතට ගත්තේ ය.

''ම්.... සමහර විට හිමායගෙ ෆොටෝ එහෙම දකලා ආදරේ හිතුන කෙනෙක් වෙන්න ඇති. ඔය පිටරටවල ළමයි ඉන්න නාකි නළු නිළියන්ට පණ ඇරලා ආදරේ කරන අය ලංකාවෙත් ඉන්නෙ.. මේකත් එහෙම වෙන්න ඇති.''

සපත්තු දෙක අතටගත් කැලුම් හිත සනසාගත්තේ ය. පෙට්ටියෙ කොනක තිබූ නෙතුම්ගෙ අත් අකුරින් ලියූ කවි පේළි කැලුම්ගෙ ඇස්වලට හසුනොවුණේ හොඳින් නොබැලූ බැවිණි. කැලුම් පාර්සලේ නැවතත් පසෙකින් තැබුවේ ය. විදුලි බුබුළ නිවාදමූ පසු අඳුරට සියල්ල අයිති විය. කැලුම් කළුවරේ ඇඳේ හාන්සිවූ පසු නිදිකුමාරි එක පිම්මට කැලුම් ළඟට ආවා ය. කැලුම් ඇයව තුරුළුට නොගෙන හිමායා පිළිබඳ කල්පනා කළේ ය.

''මම මෙච්චර දුරක් ගෙනාපු හිමායා වෙන කාටහරි අයිති වෙයි ද? හිමායා හිතනවා ඇති මම වගේ කෙනෙක් එයාට ආදරේ කරන්නෙ විහිළුවට කියලා. හිමායා නෙවෙයි මේක දැනගත්ත ගමන් අම්මත් එහෙම හිතයි. අන්තිමේට ඒ දෙන්නට මාව උණු කිරි වගේ වෙයිද දන්නෙ නෑ, මම උදව් කරපු නිසා තරහා වෙන්නත් බැරිවෙයි. ඒත් මගෙ යෝජනාවට කැමති වෙන්නත් බැරිව දෙන්නම අසරණ වෙයි ද?... ඒත් මම කරන්නෙ බොරුවක් නෙවෙයි. මම හිමායට ආදරෙයි.''

මෙතෙක් දිනක් සිතේ සඟවගෙන සිටි ආදරය හිමායගෙ කඳුළු අභියසදී එළිදක්වුණේ අහම්බෙනි..... එහෙත් අහම්බෙන් හෝ ඇයට කියන්නට හැකිවීම පිළිබඳ කැලුම් සතුටු විය.

හිමායගේ මෙන්ම කැලුම්ගේ සිතුවිලි කැලඹූ රාත්‍රිය නිමාවූයේ පාන්දරින් හැමපැත්තෙන් ම ඇසුනු කුරුලු කටහඬවල්වලිනි. කිචිබිචිය අසා සිටීම කරච්චලයක් සේ සැලකූ අඳුර පියමං විය. අඳුර පලාගොස්



Scanned by CamScanner

හෝරා කීපයක් ගතවන විට කිරණ පෙරටු කොටගත් ඉර අහසට පය තැබුවේ ය. වසාසිටි නෙතු පියන් හැර මොට්ටැක්කිලි පසෙකින් තැබූ පුෂ්පාවෝ රේණුවලින් වත හැඩගන්වා පෙති විහිදුවා අතු අග විරාජමාන වූහ. මල්සර බැලුම්ලන්ට බඹරුන්, සමනලුන් වටින් ගොඩින් එබිකම් කරන්නට විය. තම රුව පරදනු ඇතැයි සිතූ මී මැස්සියෝ රුවුපිටින් පැමිණ රොන් පැණි ගෙන ගියේ මලේ රුව වරුණ අඩු කරනු රිසියෙනි.

සිතට දනෙන සිතුවිලි අවට වටපිටාව තුළින් ද හිමායට පෙනෙන්නට විය. නිමාලි තම රාජකාරිය සඳහා ද, හිමායා විශ්ව විද්‍යාලයට ද උදෑසන ගේට්ටුවෙන් නික්ම ගියහ.

පෙරදින රාත්‍රියේ කැලුම්ගේ මුවින් ගිලිහුණු වචන හිමායාගේ හිත ළඟ මුරකරන්නට විය. තවම නිමාලිට රහසක් වූ මේ පටලැවිල්ල කැලුම්ගේ මෙන්ම හිමායාගේ සිත් කලතමින් පවතී. දෙපා අහිමි වුවද හිමායා ද අනෙක් තරුණියන් මෙන් ආදරයට ලෙන්ගතු වන්නට සිහින දකින්නට විය.

මීට වසර කීපයකට පෙර හිතට හොරෙන් ජනේලයෙන් නෙතුම්ට කුළුදුල් ආදර සිතුවිලි පාකර හැරියේ එබැවිනි. එහෙත් වැඩිකල් නොගොස් හිමායාගේ හීන ලොව උපන්ගෙයි ම මියැදුනේ ය. එයින් ලද කම්පනය හිමායා අතහැර ගියේ නෙතුම්ගේ අයියා වූ කැලුම් හිමායාට මුණ ගස්සවමිනි. පළමුව වෛද්‍යවරයා ලෙස ද දෙවනුව හිතවතෙකු ලෙස ද තෙවනුව මිතුරෙකු ලෙස ද සිව්වනුව හිමායාගේ හිතට ආදරය ගෙනෙන ආදරවන්තයා ලෙස ද කැලුම් හිමායාගේ සිත් මායිමට ගොඩවී ඇත.

වෙනදාට වඩා දවස දිගු මන්දැයි කල්පනා කරමින් කැලුම් සහ හිමායා තම රාජකාරිවල නියැලුණේ ය. ඔරලෝසු මුහුණත දෑසට සිය දහස්වරක් එබිකම් කරන්නට වූයේ වේලාව ඇණහිට ඇත්දැයි සැක හැර ගැනීමට ය.

හිමායාගේත් කැලුම්ගේත් හිත් තේරුම්ගත් ඉර වලාකුළු සළු එහෙත් මෙහෙත් පටලවා ගෙන මද්දහනෙන් පසු බස්නාහිර පැත්තට





ඇවිද ගියේ ය. හිරු කළ උදව්වට තුති පුදන්නට මෙන් කුරුළු කොබෙයියො හිරුට ඇසෙන්නට කෑ ගසා කැදිවලට ගියහ.

කැලුම්ගේ ඉල්ලීම මත හිමායා කැලුම් පැමිණෙන තුරු මිදුලේ ඉදිරිපස සිටියා ය. ඒ අතරතුර පළමුව තම හිතට පැමිණි නෙතුම්ගේ මතකය අලුත් වන්නට විය. කැලුම් නෙතුම්ට බොහෝ සෙයින් සමාන වීම ඊට හේතුවයි.

හිමායාගේ සිතුවිලිවලට කෙටි විරාමයක් දෙන්නට වූයේ ගේට්ටුවෙන් පැමිණෙමින් තිබූ කැලුම්ගේ වාහනය නෙතට මෙන්ම සිතටත් රිංගාගත් බැවිනි.

''ආ...... මෙතෙන්ඩ ඇවිත් ගොඩක් වෙලාද?''

''නෑ ඩොක්ටර්.... වැඩි වෙලාවක් නෑ....'' හිමායා පිළිතුරු දුන්නා ය.

"ආච්චි අම්මෙ අපි යනවා"

"තෙරුවන් සරණයි."

හිමායට උපන්දිනේ වෙනුවෙන් කැලුම්ගෙන් තෑගි ලැබුණ කකුල් දෙක ඉණට සවිකළාට පසු පෙනුම සම්පූර්ණ ය. දිගට වැටුණු සාරියෙන් කෘතීම කකුල්දෙක ආවරණය වන්නේ ය. දෙදෙනාම ගොළුවන් මෙන් ගමන් කරන්නට වූයේ සිත්වලට දනුන නැවුම් වෙනස නිසාවෙනි.

කැලුම් නිහඬබව බිඳිමින් කතාකරන්නට පටන් ගත්තේ ය. අතු ඉති කොළ දිගඇරගෙන පාරට හිරවරණයක් වුණ මාර ගසක සෙවණේ මෝටර් රථය නතර වුණි.

''ඉතිං........ මම ඊයෙ කියපු දේ ගැන මොකද කියන්නෙ හිමායා...''

''ම්.. මට නාම මේ හැම දෙයක් ම හීනයක් වගේ.... ඩොක්ටර්.''

දිගු හුස්මක් ගත් හිමායා වීදුරු කවුළුවෙන් එළිය බලාගෙන පැවසුවා ය. එළියෙ උණුසුම් වුණු සුළඟ වායුසමනය කරපු වාහේට රිංගන්නට විත් වීදුරුවෙ හැපී විසිවුයේ ය.



Scanned by CamScanner

''හිමායා..... මං දිහා බලන්න... ඔයා මම කියපු දේට තරහින් ද ඉන්නෙ...'' අහක බලාගෙන සිටි හිමායාගෙ නිකටෙන් සියුම්ව ඇල්ලූ කැලුම් ඇසුවේ හැඟුම් බරව ය.

''නෑ.... ඩොක්ටර් මම තරහා නෑ...''

''ඒ කියන්නෙ ඔයා තරහත් නෑ..... ඒත් කැමතිත් නෑ.....''

''මට ඩොක්ටර් එක්ක කවදාවත් තරහ වෙන්න බෑ... මගෙ ජීවිතේට පණ දුන්නෙ ඩොක්ටර්..... ඉතිං කොහොම ද මම තරහා වෙන්නෙ.. මේ ආත්මෙ විතරක් නෙවෙයි තව ආත්ම සිය දහස් ගාණක් මම ඩොක්ටර්ට ණය යි.''

''එහෙනං මට ආදරේ කරන්න.... එතකොට ඔයාගෙ ණය ආත්ම ගාණකින් අඩුවෙයි..'' කැලුම් හිමායගෙ දෑත ස්පර්ශ කරමින් සිනාසුණේ ය.

''විහිළුකරන්න එපා ඩොක්ටර්....''

''අනේ හිමායා ඔයාව හිනස්සවන්න මම එහෙම කිව්වෙ.. ඔයා හිතන්න එපා මම ඔයාව සනීප කරලා අයුතු යෝජනා කරනවා කියලා. මම මෙච්චර දවසක් කියන්නෙ නැතිව හිටියෙත් ඔයා වැරදි විදිහට හිතයි කියලා.''

''අනේ නෑ ඩොක්ටර් මට මම ගැන දුකක් නෑ.. ඒත්.... මම වගේ කෙනෙක්ට ආදරේ කරලා ඔයාට මොනවද ඩොක්ටර් ඇති වැඩේ..''

''එහෙම කියන්න එපා හිමායා...''

''ඩොක්ටර් මට ඔයා ගැන පුදුමයි......''

''පුදුම වෙන්න එපා. ආ.... අනිත් එක තමයි.. දැන් මට ඩොක්ටර් කිව්වා ඇති නේද?''

''අනේ සමාවෙන්න ඩොක්ටර් මට ඒකනං වෙනස්කරගන්න අමාරුවෙයි..,''





''හිමායා..... ඔයා හිතුවට ඔයා වටින්නෙ නෑ කියලා.... ඔයාගෙ වටිනාකම තක්සේරු කරන්න මේ ලෝකෙ කාටවත් බෑ.. මටවත් බෑ....''

''ඔය ඇත්තම ද කියන්නෙ.....'' කැලුම්ගෙ මූණට එබී බැලූ හිමායා ඇස් ලොකුකරමින් ඇසුවෙ හිතට දැනුන පුදුම සහගත සිතුවිල්ල සම්පූර්ණයෙන් ම හිතෙන් අයින්වී නොමැති ලෙසිනි.

හෝරා දෙකක පිළිසඳර අවසන් කළ කැලුම් සහ හිමායා ආපසු පැමිණියේ හදවත්වල පිරුණු සතුටද රැගෙන ය. දෙවැනි ආදරේ පසුවට ළං කරගත්ත හිමායා පුංචි ආච්චිඅම්මගෙ උදව් අරගෙන නිවසට ඇතුළුවූවා ය. නිමාලි ගේ ඇතුළෙ සිට පැමිණෙන විට කැලුම් ආපහු යෑමට වාහනේ හරවමින් සිටියේ ය.

''ආ... ඩොක්ටර් ඔය යන්න ද?''

''ඔව් අම්මා.....''

''ගෙට එන්නෙ නැද්ද?''

''හෙට එන්නං.... අද පරක්කු වෙනවා.'' කැලුම්ට විශේෂයෙන් යා යුතු ගමනක් නොතිබුණ ද හිමායා සමඟ අලුතින් පටන් ගත් ආදරය නිසා සිත දෙගෙඩියාවෙන් පෙළෙන්නට විය. වෙනදා ආරාධනා නොකර ම ගෙට ගොඩවන කැලුම්ට අද ගෙට යාමට මෙන්ම නිමාලිගෙ මුහුණ බැලීමට ද අපහසු බවක් දැනෙන්නට විය.

''ඩොක්ටර් කවදාවත් ගෙට එන්නෙ නැතිව යන්නෙ නෑ.. මොකද දන්නෙ නෑ..'' හිමායා පස්සෙන් කාමරයට යන අතරෙදී නිමාලි පැවසුවේ පුදුමයෙනි.

''අද ඩොක්ටර්ලගෙ අම්මත් එක්ක කොහෙද යන්න තියනවා කිව්වා.'' කැලුම් පිටපාරෙන් ගිය හේතුව තේරුම් ගත්ත හිමායා බොරුවක් කියමින් සිදුවීම සාධාරණීකරණය කළා ය. නිමාලි දෙවරක් නොසිතාම හිමායාගෙ බොරුව පිළිගත්තා ය.



Scanned by CamScanner

# 32

**හිම** සීතලට ගැහෙමින් සිටි වෙරිමල් අතුවල එල්ලී මල්වර නැකතින් දොරට වඩින්නට විය ... ඉර වලාකුලකට මුවාවෙමින් බැලුම්ලන්ට විය. මාස ගාණනක් හිමෙන් වැසී තිබූ තුරුලිය මල් උපදවා අතු මත හිඳුවා ආඩම්බරෙන් හිරුට පෙන්වූහ.

අවුරුදු තුනක අධ්‍යයන කාලසීමාවකට විදේශගතවූ නෙතුම් නව නෙමසකින් ආපසු ලංකාවට පැමිණීමට නියමිත ය. අවුරුදු හතරක් ගව්ගාණක් ඈත සිටියද ලද හැම විවේකයක ම නෙතුම්ගෙ සිත ලංකාවට පැමිණියේ ය.

කාලය ගෙවී යන අතරෙ හිමායා සහ කැලුම් ආදරය විඳින්න පටන් ගෙන තිබුණි. එහෙත් හිමායට කැලුම්ගෙ මූණ දකින හැම වෙලාවෙ ම මතක් වූයේ නෙතුම්ගෙ මුහුණ ය. පසුව එම සිතුවිල්ල හිමායගෙ හිතට වදයක් විය. කැලුම්ට පවසා තිබුණේ මීට පෙර කිසිවකුට ආදරේ නොකල බවකි. කෙසේ වෙතත් මේ වන විට හිමායා කැලුම්ට තම පළවෙනි ආදරය පිළිබඳ සියලු තොරතුරු පවසා සිත සැහැල්ලු කරගැනීමට තීරණය කළා ය.

විවේකී හැන්දෑවක හිමායා සමඟ කැලුම් කතාබහක යෙදී සිටිය දී හිමායාගේ වෙනසක් දුටු කැලුම්,





"හිමායා මට ඔයාගෙන් දෙයක් අහන්න තියෙනවා. ඇත්ත ම කියන්න.. මම ඔයා ගැන මොකුත් හිතන්නෙ නෑ... ඔයා... මීට කළින් කාටවත් ම ආදරේ කරලා නැද්ද? කියන්නකො.. මම ද පළවෙනියයි අන්තිමයයි. ම්...."

හිමායාගෙ හිස ආදරෙන් පිරිමදිමින් කැලුම් ඇසුවේ දෑස් දෙස එක එල්ලේ බලමිනි.

"ම්..... මම මෙච්චර දවසක් ඔයාට බොරු කිව්වෙ.. ඒත් මගෙ හිතට ළඟදි ඉඳලා ඒ හේතුව ම ලොකු වදයක් වුණා."

"මොකක් ද හිමායා......"

"ඒක පරණ වගේම මගෙ හිතට දුනුන ලොකු කතාවක්...."

"ඔයා කියන්න කැමති නම් විතරක් කියන්න. ඔයාගෙ හිතට දුකක් දෙන්න මම කැමති නෑ...."

"කෙටියෙන් කියන්නම්, නැත්නම් ඔයාට දුක හිතෙයි....."

"නෑ... හිමායා මගේ හිත ගොඩාක් හයියයි. මම ආසයි දැනගන්න."

"දැනට අවුරුදු පහකට විතර කළින් මම උඩ කාමරේට වෙලා දවස ම චිත්‍ර ඇන්දා, කවි ලිව්වා. මගේ ලෝකෙ ම වෙලා තිබුණෙ ජනේලෙන් දකින වටපිටාව, අහසේ වලාකුළු, ඉගිලෙන කුරුල්ලො, ගස්වැල් හුළඟ ඈත පෙනෙන කඳු, වැව් ඉවුර දිහා බලාගෙන හිටියෙ හරිම ආසාවෙන්, ඒ වෙනකොට මට කතා කරන්න බෑ.... අම්මා මගේ තනිකම නැතිවෙන්න මට හැම පහසුකමක් ම සැලසුවා. මම ජනේලෙන් වටපිට බැලුවා වගේ ම තාප්පෙට එහා පැත්තෙන් තිබුණ පාරත් හොඳට පෙනුනා. දවසක් කාර් එකක් නතර වෙලා තිබුණා. පස්සෙ මට තේරුණා ඒක කැඩිලා කියලා. ඒ වාහනේ අලුත් වැඩියා කරන කෙනා එනතුරුත් අලුත් වැඩියා කරන අතර තුරත් ඒ වාහනෙන් ආපු ඔයා වගේ හැඩ රුව තියන කෙනෙක් මම දිහා බලාගෙන හිටියා. මම ත් හිනානොවී බලාගෙන හිටියා. එයා ගොඩාක් ලස්සනයි. ඔයා වගේමයි... ඊට පස්සෙ දවසට දෙවතාවක් එයා එනවා. හැමදාම එන්නෙ එක ම වෙලාවට එයා මොකක් හරි වැදගත් ජොබ් එකක්



Scanned by CamScanner

කරන කෙනෙක් කියලා මට හිතුනා. මේ විදිහට මාසයක් විතර ගෙවුණා. මම පුරසඳ හෝල් එකේ පැහැසර කියලා ආර්ට් එක්ෂිබිෂන් එකක් කළා. එදා ඩොක්ටර්ස්ලා කියලා දෙන්නෙක් කතා කළා. අන්තිමට ආපු නිසා ඒ දෙන්නා හොඳට මතක තිබුණා. ඊට පස්සෙ දවස් දෙකකට විතර පස්සෙ මම ජනේලෙ ළඟ ඉන්නකොට දෙන්නෙගෙන් එක්කෙනෙක් තමයි එදා ඇවිත් තියෙන්නෙ.... මගේ කකුල් නැති වුණාට මගේ හිතට අමුතු හැඟීමක් ගොඩවුණා. ඒත් ඒ හැඟීමට ආයුෂ තිබුණෙ දවසක් වගේ කෙටි කාලයක් විතරයි.''

''ඇයි මොකද වුණේ'' මෙතෙක් හිමායා නොනවත්වා කළ විස්තරයට නිහඬව සවන්දීගෙන සිටි කැලුම් කලබලයෙන් විමසුවේ ය.

''ඊට පස්සෙ පහුවදා හවස එයා ඇවිත් මම දිහා බලාගෙන හිටියා. එයා මාව අඳුන ගත්ත ද කියලා දන්නෙ නෑ.. මට නම් අඳුන ගන්න පුළුවන් වුණා. ප්‍රදර්ශනේ දවසෙදි වැඩියෙන් කතාකළේ එයාලා. හරිම අහිංසක විදිහට එදා පැත්තකට වෙලා හිටියා. එයාගෙ වෙනදා වගේ කාර් එක නවත්වලා බලාගෙන හිටියා. විනාඩියක්වත් ඉතිං යන්න කලින් කාර් එකකින් ආපු ගෑනු කෙනෙක් එයාගෙ ඇඟේ එල්ලිලා රණ්ඩු කරන්න ගත්තා. සමහරවිට ඒ එයාගෙ නෝනා වෙන්න ඇති. නැත්නං ආදරේ කරන කෙනා වෙන්න ඇති. මට දැනුනෙ මගේ කොන්දයි ඔළුවයි හිරිවැටීගෙන එනවා විතරයි. ජනේලෙ වහලා එහෙම් ම ඇඳට ආවා කියලා විතරක් මතකයි.''

''ඔයාට සතිපවෙන්න කලින් මම ඔයාගෙ ජනේලෙ ළඟට ගියාට පස්සෙ ඔහොම වෙන්න ඇති කියලා හිතුවා..''

''ඒ කොහොම ද?''

''ඒක වෘත්තියත් එක්ක සම්බන්ධයි. ඒක තමයි අපි ඔයාගෙ කාමරේ වෙනස් කළේ... ඉතිං ගොඩක් දුක හිතුන ද?''

''ඔව්.. ආදරේ දැකලා නැති මට ඒක දරාගන්න බැරි වුණා. එදායින් පස්සෙ අද වෙනතෙක් මම එයාව දැක්කෙ නෑ..''





''එයා කවුද කියලා මට කියන්නෙ නෑ කිව්වනෙ.. කමක් නෑ.. ඇයි ඔයාට හිතට වදයක් කිව්වෙ එයා ගැන හිතේ මොනවා හරි ඉතුරු වෙලා තියනව ද?''

''නෑ... ඔයාගෙ මූණ දකින හැම වතාවෙ ම මට මැවිලා පේනවා.''

''ඔයා ඔය පරණ දේවල් අමතක කරන්න හිමායා.... ඔයාගෙ හැමදේකට ම මම ඉන්නවා. සමහරවිට ඒ කෙනා බොරුකාරයෙක් වෙන්න ඇති.''

පාරේ නතර කර තිබූ වාහනේ ළඟට පැමිණි මිනිසා දත්නැති කටින් සිනාසී දෑත දිගු කළේ ය. හිමායා ඔහුට මුදලක් දීමට බෑගය විවර කරන විට කැලුම් වාහනයේ කැබිහෝල් එක හැරියේ මාරුකාසි ගැනීමට ය.

''ආ... මේ මොකක් ද?'' හිමායා එතුළවූ වර්ණවත් ලියුම් කවරය අතට ගත්තා ය.

''ආ... මම මේක අරන් ආවේ ඔයාට පෙන්වන්නමයි. කතාව නිසා අමතක වුණා. ඔයයි අම්මයි හැමදාම මගෙන් අහනවනෙ අපේ මල්ලි මොනවගේ ද කියලා. එයා ඊයෙ ෆොටෝ එවලා තිබුණා. එයා දැන් ගොඩාක් ලස්සන වෙලා....''

''ම..ම්.... ළඟදි එනවා කිව්වා නේද? කෝ බලන්න.. මස්සිනා පොඩ්ඩ...'' හිමායා අතට ගත් ලියුම් කවරය දිගහරිමින් පැවසුවා ය.

''ඔව් තව මාස තුනකින් එනවා. මල්ලිත් මම වගේම තමයි''

හිමායා මෙතෙක් වෙලා පැවසූ පළවෙනි ආදර කතාවේ කතානායකයා වන නෙතුම් කැලුම්ගෙ සහෝදරයා බව මෙතෙක් දැන නොසිටියා ය. වසර ගණනාවක් ගතවුවද නම හෝ රුවක් දැක ගැනීමට නොලද එකම මස්සිනාගේ රුව බැලීමට නොඉවසිල්ලෙන් බහාලුම දිග හරිමින් සිටියා ය.

''ම.. ම්... නෙතුම්........ නෙතුම්...... ඒ කියන්නෙ...''

නිරුවත් අල්ල මතට ගත් ඡායාරූප දැක්වලින් දුටු වහාම හිමායාගේ කටේ කෙළ සිඳී ගොස් හදගැස්ම දෙගුණ තෙගුණ වූයේ



Scanned by CamScanner

ය. වායුසමනය කරන ලද වාහනය තුළ සිටිය ද හිමායාගේ ඇඟ දිගේ දහඩිය ගලන්නට විය.

''ඇයි හිමායා... ඔයා අපේ පොඩීව අඳුනනව ද?... ඔයා නෙතුම් කියලා නම දන්නෙ කොහොම ද?.....'' හිමායාගේ ක්ෂණික වෙනස රියදුරු අසුනෙ සිටි කැලුම්ගේ සිතට කුතුහලයක් මෙන්ම පුදුමයක් ගෙනාවේ ය.

''ඩොක්ටර් නෙතුම්..... ඔයාගෙ ම මල්ලි ද? විහිළුවක් ද කරන්නෙ, ඔයාගෙ ම මල්ලි ද ඩොක්ටර්...... ඔයාගෙ ම මල්ලි ද?...''

''ඔව් හිමායා මල්ලි ගැන කියලා මම මොකට ද විහිළු කරන්නෙ.. නෙතුම් දිල්හාර කියන්නෙ මගේ මල්ලි.. මට ඉන්නෙ මල්ලි විතරයි මල්ලිට ඉන්නෙ මම විතරයි. අපි ආදරේට කියන්නෙ පොඩී කියලා.''

''පුදුමයි........? ඩොක්ටර් මම දැනගෙන හිටියෙ නැනෙ නෙතුම් කියන්නෙ ඩොක්ටර්ගෙ මල්ලි කියලා.''

''ඒකනෙ මට කවදාවත් මල්ලි ගැන වැඩිවිස්තර කියන්න බැරි වුණා. පහුගිය ටිකේ මල්ලිගෙ නම කියන්න තරම වුවමනාවක් වුණෙත් නැනෙ... පොඩීට මම අද රෑට කියන්නම්...''

''එපා ඩොක්ටර්, එපා .....''

''ඇයි හිමායා.... මොකක් හරි ප්‍රශ්නයක් තිබුණ ද?''

''නෑ.. ඩොක්ටර් සමහරවිට එයාට මාව මතක නැතිව ඇති.''

''මම විස්තර කියන්නං....''

''එපා ඩොක්ටර් එයා මම ගැන ගොඩක් විස්තර දන්නෙ නෑ... කියලා වැඩක් නෑ.. කියන්න එපා...''

''නෑ.. මල්ලි වස නපුරු කෙනෙක් නෙවෙයි. මම කිව්වා ම ඔයාට නඩුදායි කියලා බය වුණා ද?''

''නෑ... නෑ.... එයා මම ගැන වැරදිවට හිතයි''





''හා... හා.. විහිළු කළා ඇති හිමායා. ඔයා මගේ යෝජනාව අම්මට හෙමින් සැරේ කියන්න ඕනෙ...''

''අපේ ද?''

''ඔව් ඔයා අම්මට කියන්න මම අපේ අම්මලාට කියන්නම්. හැබැයි මම දන්නවා මේක ලේසි වැඩක් නෙවෙයි කියලා. අපේ අම්මයි අප්පච්චියි ඔයා ගැන හොඳට දන්නවා.''

''දන්නවා. ඒත්..... මම කකුල් දෙක ම නැති කෙල්ලෙක් කියලා දැනගත්තොත් නේද?'' හිමායා දුකෙන් පැවසුවා ය.

''ඔව් හිමායා...... ඒ වුණාට මම කොහොම හරි කැමති කරගන්නවා. අපේ අම්මලා කැමති කරගත්තා කියන්නෙ මට ඔයාගෙ අම්මා කැමති කරගන්න එක අමාරු නෑ...''

''ඒ කියන්නෙ ඔයාගෙ කල්පනාව වෙඩින් එක ළඟදිම ගන්න ද?''

''ඔව් හිමායා ඔයා අකමැති ද? ....මල්ලිත් ළඟදි එනවා. එයාටත් දැන් වයස හරි මම ගෙදර ඉද්දි එයාට බඳින්නත් බැනෙ...''

''මම අද ගෙදර ගිහින් හෙමින් සැරේ අම්මට කියන්නං, අම්මා මොනවගේ තීරණයක් ගනීද දන්නෑ..''

කැලුම් අනාගතය පිළිබඳ සිහින මවන අතර හිමායා හදවත තුළ දැවෙන මතකය සමඟ දුක්වින්දා ය. දම්පාට වැහි වලාවෝ ඕපාදූප සෙවීම නවතා අහසේ කොනක වාඩිගත්හ. වැඩි කාලයක් සුහදව විසිය නොහැකි කාන්තාවන් මෙන් වැඩිකල් යෑමට මත්තෙන් එකිනෙකා සමඟ ආරවුල් ඇති කරගන්නට වූහ. විදුලි කොටමින් ද ගොරවමින් ද ජයටම ගෝරනාඩුව පටන් ගත්හ. අවසානයේ වැරදිකාරියෝ මෙන්ම නිවැරදිකාරියෝ ද වැහි කඳුළු වගුරවමින් හඬන්නට වූයේ ලොවෙහි අනුකම්පාව ලැබීමට මෙනි. හැමදූක් උසුලන පොළොව නැමති අම්මා දෙපිරිසගේම කඳුළු තම හදතුළට එකතුකරගත්තා ය. අඩ හෝරාවකින් පමණ පසු පිරිසිදුවූ අහස නිල්පැහැ සේලයක් පැළඳගත්තේ ය. අහසේ ප්‍රධාන අයිතිකරුවකුවූ හිරු තවමත් ඉකි බිඳින වැහිවලාවන්ට උණුසුම දුන්නේ දේදුන්නක් තෑගි කරමිනි.



Scanned by CamScanner

අතීතයේ සිදුවූ දහසක් හිත් රිදුම් වේදනා මහ වැස්සක් බිමට හෙලා නිදහස්වූ අහසක් මෙන් අතහැර අහසේ පෙනෙන දේදුන්න මෙන් අනාගතය දෙස බලන්න යැයි කැලුම් හිමායාට පවසා සිටියේ අඩ හෝරාවක් පමණ වැටුණු වැස්ස අවසානයේ අහසේ ඇඳුණු වර්ණවත් දේදුන්න පෙන්වමිනි. වාහනයේ සිටි හිමායාට ගොරවමින් ඇද හැළුණ වැස්සේ සීතල නොදැනුනේ කැලුම්ගේ ප්‍රතාපවත් සිරුරේ උණුසුම හොඳින් දැනුණ නිසාවෙනි. ආදරයේ උණුසුම කවදාටත් වඩා දැනුන හෝරාව ගෙවී යද්දී වාහනයේ එන්ජිම සතුටින් පණගෙන ඉදිරියට ඇදී ගියේ ය. දෙදෙනාම තම නිවෙස්වලින් එදින අවසර ගන්නා බවට සපත කරගත්හ. ගමන අවසානයෙ කැලුම් තම ආයතනයට ගිය අතර ඔහුගේ රියදුරෙකුට හිමායා නිවසට ඇරලවන්නට බාරදුන්නේ ය.

හිමායා නිවසට පැමිණ ටික වෙලාවක් ගතවන තුරු බලාසිටි නිමාලි ඇය අසලට පැමිණියේ විත්තියේ නීතිඥවරයා ලෙසිනි.

''දෝණි..... ඔයාට දූන් වැඩ ඉවර වෙනකොට පරක්කු වෙනව ද? මම දූන් දවස් කීපයක්ම බලාගෙන හිටියෙ අහන්න කියලා''

හිමායාගෙ වයස පසුකර සිටි නිමාලිට ඇගේ තරුණ විය මතකයට නැගුණි. එහෙත් ඒ සැකය කැලුම් වෙත යටි සිතෙන්වත් යොමු නොවුණි. නිමාලිගෙ සිතට බියක් දැනුනේ කිසිවකු හිමායාගෙ සිත රවටා අයුතු ප්‍රයෝජන ගනීවි යැයි සිතූ බැවිනි. රූමත්, උගත්, දක්ෂ මෙන්ම ධනයෙන් ද පොහොසත් වුවද තම දියණියට ඇව්දයන්නට දෙපා අහිමි බැවින් ඇය මනාලියක් ලෙස කැන්දාගෙන යන්නට මේ ලෝවෙහි කිසිවකුත් නොඑන බව ඇය සක්සුදක් සේ දැන සිටියා ය.

''දෝණි.. ඩොක්ටර් කැලුම් සතියකින් විතර ආවේ නෑ නේ ද?'' නිමාලි එසේ පැවසුවේ කැලුම් ගැන සැකයකින් නොව ඔහු පැමිණියේ නම් හිමායාට අවවාදයක් දීමට සුදුසු යැයි සිතමිනි.

''ඒක තමයි. වැඩ වැඩි ඇති.'' හිමායා කැලුම් ගැන කිසිවක් නොදත් පරිදි පිළිතුරු දුන්නා ය.





''අද ආවෙත් ඩ්‍රයිවර් නේද?''

''ම්...''

''අපි එහෙම හිතුවට ඩොක්ටර් ආයතනයක් හැන්ඩ්ල් කරන්නත් ඉතෙ... ඒත් වෙනදා ඒකට හරි ඇවිත් යනවනෙ..'' නිමාලි පුදුමයෙන් පැවසුවා ය.

නිහඬව සිටි හිමායා උවමනාවක් නොමැතිව උවමනාවක් ඇති බව හඟවමින් පොතක් පෙරළමින් කල්පනා කරන්නට වූයේ කැලුම්ගේ යෝජනාව අම්මාට පැවසීමට කෙලෙසක ආරම්භ කරන්නේද යන්නයි.

''අම්මා ඩොක්ටර් කැලුම් ගැන වැරදි විදිහට හිතයි ද? අම්ම අකමැති වුණොත් කකුල් දෙක තියන ගෑනු ළමයින්ට වගේ හිතුවක්කාර තීරණය ගන්න කකුල් දෙක ම නැති මට බෑනෙ.... තාත්තත් නැති අම්මට දුක් දෙන්නත් බෑ.. අම්මා තරහකරගෙන සාමාන්‍ය ගෑනු ළමයෙකුටත් ලේසි නොවන එකේ, මම වගේ කෙනෙකුට ඒ අඩුව දරාගන්න ම බැරි වෙයි.''

හිමායා නොයෙක් දෑ සිතමින් ලතවූවා ය. හිමායාගෙ හිත තුළ ඇතිවී ඇති ද්වන්ධ ගැටුම නොපෙනෙන නිමාලි හිමායා ඉදිරිපිට කවිච්චියේ වාඩිවී පුවත්පතක් බලමින් සිටියා ය.

''මම හවස කැලුම්ට පොරොන්දු වුණාට කොහොම ද අම්මගෙන් අහන්නෙ, ඒ වෙලාවෙ හිතට හයිය තිබුණට අම්මගෙ මූණ දකිනකොට පපුව වෙව්ලනවා.''

හිමායාගේ හදවත නැතිගෙන තිබුණි. පොතේ පිටුවලට දෑස් යොමුවී තිබුණ ද එක අකුරක් හෝ දෑසට හසු නොවිනි. නිමාලි පත්තරයේ පිටු සියල්ලම කියවා අවසන් කර පසෙකින් තැබුවා ය.

''සුදූ බේබි තේ ගෙන්න ද කෝපි ගේන්න ද?'' සුදූ ආච්චිඅම්මා කුස්සියේ සිට ඇසුවා ය.

''අම්මා මොනාද බොන්නෙ''

''මම ආපු ගමන් තේ බීවා දෝණි.''



Scanned by CamScanner

"පුංචි ආච්චිඅම්මෙ කරදරයක් නැත්නං කෝපි එකක් බොමු නේද?"

"ඒක මට කරදරයක් නෙවෙයි පුංචි බේබී. මම හදන්නම්"

"පුංචි ආච්චිඅම්මේ..... ඔයා මම ළඟට කෑම බීම ගෙනත් දෙනවට ගොඩාක් පිං..." හිමායා කුස්සියේ සිටින පුංචි ආච්චිඅම්මාට පිං දුන්නේ ඇයටත් ඇසෙන ලෙසිනි.

"ඔව් දෝණි පුංචි ආච්චිඅම්මා මට අම්මා කෙනෙක් වගේ ඔයාට ආච්චිඅම්මා කෙනෙක් වගේ, කවදා හරි මම නැති කාලෙක හොඳට සලකන්න."

"ඔව් අම්මෙ... මගේ අතින් එයාට නෙවෙයි මේ ලෝකෙ කාටවත් කවදාවත් වැරැද්දක් වෙන්නෑ ......මට කරන්න පුළුවන් දේවල් මම හැමෝට ම කරලා දෙනවා. මම හිතනවා මට එතකොට මිත්මතු කිසිම ආත්මෙක මේ වගේ අවාසනාවන්ත ජීවිතයක් ලැබෙන එකක් නෑ කියලා...."

නිමාලිට කතා කරගන්න වචන පෙළගස්වා ගැනීමට අපහසු විය. හිමායගෙ වචන නිමාලිගෙ හිත අන්ත අසරණ කළා ය. නිමාලි ලොකු හුස්මක් හෙළුවා ය. ඇස්වලට පිරුණු කඳුළු ඇහිපිල්ලම් උඩින් උතුරා ගියෙ හදවතේ දුක ලොවට හඬගා කියන්නට මෙනි.

"දෝණි.... මට ඔයාට දුක් වෙන්න එපා කියන්න බෑ... අනිත් තරුණ ගෑනු ළමයිගෙ ජීවිත දකින ඔයාගෙ හිත අසරණ වෙනවා ඇති. ගේ ඇතුළෙ හිටපු පොඩි කාලේ වගේ නෙවෙයි පාරට බැහැලා සමාජෙ අනිත් අයත් එක්ක හැසිරෙන ඔයාගෙ හිත දහස්වතාවක් රිදෙනවා ඇති. ඒත් දෝණියේ මම කොහොම ද ඒ දුක ඔයාගෙ හිතින් එළවලා දාන්නෙ... මට හැම දෙයක් ම කරන්න පුළුවන් ඒත්....."

"මට කකුල් දෙන්න අම්මාට බෑ නේද?" හිමායා දෑසේ කඳුළු පුරවාගෙන කතාව සම්පූර්ණ කළා ය.

"ඔව් දෝණි..... මට පුළුවන් නම් මම මගේ කකුල් දෙක දෙනවා"

"අම්මට මම පුදුම හිතෙන කතාවක් කියන්න ද? අම්මා කලබල වෙන්නෙ නෑ කියලා මට පොරොන්දු වෙනව ද?"





"මො....මො.... මොහ්... මොකක් ද දෝණි."

හිමායා කතාව කියන්නටත් පෙර නිමාලි කලබල වූවා ය. නිමාලි මෙතෙක් දිනක් සිතේ තබාගෙන සිටි සැකය මඬේ යටකර තිබූ රබර් බෝලයක් මෙන් මතුවුණි.

"කියන්න දෝණි." නිමාලි පුවත්පත පසෙකට අතහැර ඇස් කන් හිමායා දෙසට යොමු කළේ බිය සහ වේදනාව මුසුවූ හැඟීමකිනි.

"අම්ම කියන්නත් කලින් ඔහොම කලබල වුණානං මට මේක නොකියන එක හොඳයි වගේ." ලැජ්ජාව, චකිතය, සැකය මුසු වෙච්ච හිනාවක් දෙතොලට නගාගත් හිමායා පැවසුවා ය.

"නෑ.. දෝණි.... ඔයා කියන්න. මම ඔයාට යහපතක් වෙන කිසිම දේකට අකුල් හෙලන්නෑ..." නිමාලිගෙ සිත කැරකෙන බඹරයක් මෙන් විය.

"අම්මෙ..... ඔයා මම කියන දේ වැරැදියට හිතන්න එපා.." හිතේ තිබුණ ලැජ්ජාව සහ කැළඹිල්ල නිසා හිමායා කතාව පටන් ගැනීමට වැඩි කාලයක් වැය කළා ය.

"හරි... හරි.....කියන්න මම අම්මා කෙනෙක් මටත් ඔය වගේ කාලයක් තිබුණා. මම දෝණිට කවදාවත් දුකක් දීලා නෑ... බය නැතුව කියන්න...." නිමාලි හිමායගෙ හිතට ලෙන්ගතු ලෙස කතා කළා ය.

"ඩොක්ටර්..... ඩොක්ටර් කැ.... කැ..... කැලුම්......... මා.....මාව බඳින්න...... කැමතියි ලු" හිමායා වචන ගොතගසමින් අමාරුවෙන් පැවසුවා ය.

"ම්..... මොනවා... ඩොක්ටර් කැලුම්..... බොරු කියන්න එපා..." පුදුමය මෙන්ම අදහාගැනීමට අසීරුවූ බැවින් නිමාලි වාඩිවී සිටි පුටුවෙන් රොබෝවකු මෙන් නැගිටවුණි.

"බොරු නෙවෙයි ඇත්ත අම්මෙ......"

"ඔයාගෙ හිත හදන්න ඩොක්ටර් විහිළුවට කියන්න ඇති..."



Scanned by CamScanner

"නෑ... අම්මේ ඇත්තම ඇත්ත.... අද එයාලගෙ අම්මලාගෙන් අහනවා කිව්වා. මට අම්මගෙන් අහන්න කිව්වා..."

"මට හිතාගන්නවත් බෑ දෝණී... ඔය ඇත්ත ද? ඒත්.. දෝණී.."

"අම්ම කියන්න යන්නෙ මට කකුල් දෙකක් නැතෙ කියලා නේද?"

"ඩොකටර් මගෙන් අහනකොටත් මමත් ඔය විදිහට ම කිව්වා.."

"ඩොක්ටර් ඒකට මොකද කිව්වෙ දෝණී."

"එයාට ඒක අඩුවක් නෙවෙයි කිව්වා. මෙච්චර කාලයක් හිතේ තියාගෙන කියන්න බැරිව හිටියා කිව්වා. අම්මයි මමයි එයා ගැන වරදවා හිතයි කියලා."

"අනේ මන්දා දෝණී, මට බෑ කියන්නත් බෑ.. හා කියන්නත් බෑ.. මම මේකට මොකක් ද දෙන උත්තරේ, මාව කරකවලා අතඇරියා වගේ."

"අම්මට ඔය ගැටලුවට හේතුව මගෙ කකුල් දෙක නැති එක නේද අම්මා..." හිමායා නිමාලිගෙ අත්දෙක අල්ලගනිමින් ඇසුවා ය.

"එහෙම අහන්න එපා දෝණී..." නිමාලි ඇස්වලින් ගලන කඳුළු දෑතින් ම පිහිදමින් හිමායා වැඳගත්තා ය.

"කමක් නෑ අම්මෙ..... මට ආදරේ අයිති නැති දෙයක් කියලා හිත හදාගන්නං අම්මා දුක් වෙන්න එපා.... මම කකුල් දෙකක් එක්ක ඉපදෙන ආත්මයක මනමාලියක් වෙන්නම්."

"රත්තරං දෝණියේ....... මම මේ ලෝකෙ ඉන්න අවාසනාවන්ත ම අම්ම නේද?"

"නෑ... අම්මෙ අපි කොච්චර කැමති වුණත් අපිට උරුම වෙන්නෙ අපිට ලැබෙන්න තියන දේ.... කමක් නෑ අම්මෙ... මම කැලුමට කියන්නම්.. මම දූනටත් පිං කරනවා තව ගොඩා......ක් පිං කරන්නම්...."





හිමායාගෙ වචනත් සමඟ හිතේ තිබුණ දුක වේදනාව කඳුළට නුවාවී දෑස් බැමි පෙරලාගෙන උතුරා ගලන්නට වූයේ මහා ජල කඳක් වැව් බැම්ම සිඳ බිඳගෙන පිටාර ගලන්නාක් මෙනි.

"දෝණී.... කකුල් නැති ඔයයි. කකුල් තියන මමයි අපි දෙන්නම එක වගේම අසරණයි මයෙ වස්තුවේ..... අපි දෙන්නා කොච්චර ඇඬුවත් මේකෙන් අපිට ගැලවීමක් නෑ.. දූත් අඬන්න එපා දෝණියේ......"

හිමායා සහ නිමාලිගෙ කතාව අවසන්වී කඳුලින් දෑස් තෙමාගෙන සිටිනවිට සුදු ආච්චිඅම්මා කිරිකෝප්ප රැගෙන පැමිණියා ය. නිමාලිගෙන් සිදුවූ දෙය දූනගත් ඇයද දුක බෙදාගත්තා ය. හඬන්නට දෑසට කඳුළු නොමැතිවාක් මෙන්ම ද කැලුම් හෝ නෙළුම් ගැනවත් නොදන්නා සුදු බිංදු ද ඤාව්...ඤාව්.. කියමින් හිමායාගෙ හැර අනිත් දෙපාවල දවටුණේ තමන්ද නිවසේ සාමාජිකයෙකු බැවින් දුකේදීත් සැපේදීත් තමන්ද ඔවුන් සමඟ සිටින බව මතක් කිරීමට මෙනි.

එදින රෑ නිදිකුමාරිට හිමායා සහ නිමාලි ළඟට යෑමට තහනම් විය. දෙදෙනා දෙමඟක සිතුවිලි හිතේ පුරවාගෙන කල්පනා කළහ. හෝරා එකින් එක ගෙවී ගොස් තවත් දිනයක් එනබව පාන්දර අවදිවූ සතුන් දන්වා සිටියහ. දෙවනුව රන් පැහැති හිරු කිරණ වසා ඇති කවුළු පියන්පත්වලට තට්ටු කරන්නට වූයේ වැසූපියන්පත් විවර කර අලුත් ලෝකය දෙස බලන්නට යැයි ආරාධනා කරන්නාක් මෙනි.

කැලුම් පොරොන්දුවූ පරිදි එදින රාත්‍රියේම අම්මට සහ අප්පච්චිට හිමායා පිළිබඳ යෝජනාව ඉදිරිපත් කළේ ය. සිතා සිටි පරිදි මෙන්ම සාමාන්‍යයෙන් මෙවැනි තරුණියක් කරකාර බඳින්නට විමසන ඕනෑම ප්‍රකෘති තරුණයෙකුට ලැබෙන සමාජ සම්මත පිළිතුරවූ සම්පූර්ණ විරෝධය ප්‍රකාශ වුණි. බොහෝ දෙමව්පියන් දෙපා නොව ඇඟිලි පුරුකක් හෝ අඩුනම් අකමැති ය. අප්පච්චි මවට වඩා නම්‍යශීලී අයෙකු වුවද මෙහිදී ඔහු ද කැමතිකරවා ගැනීම ඉබ්බෙකුගෙන් පිහාටු ඉල්ලන්නාක් මෙනි.

අම්මා සාමාන්‍යයෙන් බල්ලාට පූසා කිවුවිට එය කිසිදා වෙනස් නොකරන ආකාරයේ කෙනෙකි. හිමායා පිළිබඳ පැවසූ විට ඇය සුදු



Scanned by CamScanner

වීසල් මෙන් අධික ශක්තියකින් සහ බලයකින් ක්‍රියාකරන්නට වූවා ය. එය සැනින් ගිනි ඇවිලුණ බට කැලේකට සමාන කළ නොහැකි තරම් උද්වේගකරවිය. දුක් අඳෝනා, බැනුම්, තර්ජන අතර කඳුළුද දැස්වලින් ගලා යන්නට විය. දෙමව්පියන්ගේ හිත්වලට දැනුන දරාගැනීමට අපහසු වේදනාවේ දිග පළල කැලුම් යහමින් හඳුනාගත්ත ද අසරණ හිමායා පිළිබඳ ආදරය ඒ සියල්ලට ඉදිරියෙන්වූ බැවින් ගත් තීරණය ආපසු නොහැරවීමට කැලුම් අදිටන් කරගත්තේ ය. කැලුම් සිතුවේ යළු නොවන්නට හිමායා මනමාලිය කරගැනීමට කිසිවකු ලොවෙහිම නොමැති බවයි.

"මේක පොඩීට කිව්වානම් කොහොම හරි අම්මටයි අප්පච්චිටයි කියලා මොනවාහරි දෙයක් කරගන්න බැරි වෙන එකක් නෑ."

කැලුම් නෙතුම් හරහා තම යෝජනාව සම්මත කරගැනීමට කල්පනා කළේ ය.

අඹ එලගන්න තුරු සිටිය හැකි වුවද පැසී ඉදෙන තුරු බලාසිටීමට නොහැකි මෙන්ම හිමායා පිළිබඳ ආදරය බොහෝකල් සිතේ තබාගෙන සිට දෙමව්පියන්ට පැවසූ පසු ඉක්මනින් කැමැත්ත ගැනීමට කොතරම් හදිස්සිදැයි කිවහොත් ගැටුමේ උණුසුම යැමටත් පෙර එදින රාත්‍රියේම නෙතුම්ට ඇමතුමක් ගත්තේ ය.

"පොඩී... වැඩක ද ඉන්නෙ..."

"නෑ..... ලොකු කියන්න.... ඇයි හදිස්සියක් ද?"

"පොඩී මම ඔයාගෙන් ලොකු උදව්වක් ගන්න මෙ ඨම කතා කළේ... අම්මා කතා කළාද?"

"නෑ ලොකු..... කාටහරි අසනීපයක් හෙම නෙවෙයිනෙ..."

"නෑ... නෑ... එහෙම එකක් නෙවෙයි.... මේකයි වැඩේ.. මම කෙටියෙන් කියන්නංකො... ලස්සන කෙල්ලෙක් ඉන්නවා. මම අම්මලාගෙන් ඇහුවා. දෙන්නම කොහොමටවත් කැමති නෑ..."

"මට තියෙන පාට් එක මොකක් ද?..."





"ඔයාට තියෙන්නෙ අම්මලට පොසිටිව් අයිඩියා එකක් දෙන එක... හැබැයි පොඩී.... මේ ගෑනු ළමයා මාර ලස්සනයි... ඉගෙන ගෙනත් තියනවා.. සල්ලිත් තියනවා.. පවුලෙ එකම ළමයා.."

"එහෙනම් තව මොනව ද?"

"නෑ පොඩී.... එයාට..... කකුල් දෙකක් නෑ...."

"ම්... එහෙම ද?.... කොහොමද ඔයාට සෙට් වුණේ....."

"ඒක දිග කතාවක් පස්සෙ කියන්නම්."

දෙපා නොමැති බවත් කැලුම් පෙර දිනපොතේ ලියමින් ආදරය කර තිබුණේත් දැන් විවාහවීමට යන්නේත් තමාද පණමෙන් ආදරය කළ, කරන තරුණියට බව දැනගැනීමට තිබූ තවත් අවස්ථාවක් නෙතුම්ට අහිමිවුණි.

"මේක අපි හිතන තරම් ලේසි නෑ ලොකු...... ප්‍රයි කියන්නෙ වෙන් තවුසන්ඩ් ප්‍රයි එකක්වත් දීලා බලන්න ඕනෙ...."

"පොඩීගෙ අයිඩියා එක මොකක් ද?"

"මට නං මාර දුකයි..... මමත් ඔයාවගේ දුක්ගන්නාරාල කෙනෙක් තමයි.. පාරෙ ඉන්න පූස් පැටවුන්ගෙ බලුපැටවුන්ගෙ දුක්ගන්න මට ඕක මොකක් ද?.... මම ඔයාගෙම මල්ලිනෙ... මම කැමතියි ලොකු... මම ඕන දේකට ඉන්නවා... ඒ ළමයට කකුල් දෙකක් දෙනවා ඇරෙන්ඩ ඕන දේකට මේ පොඩී.... අයියා වෙනුවෙන් පෙරට...."

"ගොඩක් සතුටුයි පොඩී... මට දැන් බය ටිකක් අඩුවුණා... මේ... අම්මලාට කියලා බලනව ද?"

"හැබැයි ලොකු.... මට ආපහු ගෙදර එන්න පුළුවන් වෙයි නේද?"

"අම්මලා ඔයාට බනින්නෙ නෑ... ඔයා තුන්වෙනි පාර්ශවේ වගේ ඉන්න.. මැදිහත් බවක් පෙන්වලා මට වැඩි බර දෙන්න... අපේ රටේ යුද්දෙට පහුගිය කාලෙ සාමය අරගෙන ආපු කට්ටිය වගේ.... "

"ඒ කියන්නෙ අයියා ආදරේ කරන්නෙ හිමායට නෙවෙයි, හිමායා බෑ කියන්න ඇති. දැන් මට හිමායට ඇත්ත කියලා එයාට ළං වෙන්න



Scanned by CamScanner

පුළුවන් අද ම කෝල් එකක් දෙන්න ඕන'' කැලුම්ගේ ඇමතුමට ඇහුම්කන් දෙමින් නෙතුම් කල්පනා කරන්නට වූයේ හිතට දැනුන හදිස්සිය නිසාවෙනි.

''පොඩී අහගෙන ද ඉන්නෙ... හෙලෝ..'' මොහොතක් නිහඬව සිටි නෙතුම්ගෙන් කැලුම් විමසුවේ ය.

''ලොකු මම අහගෙන හිටියෙ... මම කල්පනා කළේ මෙච්චර කෙල්ලො ඉද්දි මල්සරා ලොකුට ආබාධිත කෙල්ලෙක්ව ම සෙට් කළානෙ..'' නෙතුම් විහිළුවක් කළේ ය.

''එහෙම කියන්න එපා පොඩී.... ඔයත් මාස ගාණක් හරි රෝද පුටුවක ගියා නේද?.. දැනුන නේද කකුල් දෙකෙන් ඇවිදින්න තියන ආසාව.....''

''මම විහිළුවට කිව්වෙ ලොකු..... මම කැමතියි..''

''මෙකයි පොඩී මට ඒ කෙල්ලව බඳින්න ම ඕනෙ... මම ඊයෙ අම්මටයි අප්පච්චිටයිත් කිව්වා.''

''ලොකු මේ කියන්නෙ විහිළුවක් නෙවෙයිනේද?..... මට අම්මගෙ මූණ මැවිලා පේනවා.''

''මෙක සීරියස් වැඩක් පොඩී... අම්මගෙ සීමාව පැනලා ඉන්නෙ, බට කැලේ පරාදයි. පොඩීට තියෙන්නෙ මේ ගින්න හෙමින් සැරේ නිවන්න..... වතුර කොච්චර ඕනවෙයිද කියන්න බෑ.. හැබැයි නිවන්න ඕනෙ...''

''ම්... මට බැරිවෙන එකක් නෑ... අම්ම මට දෙහි නෙවෙයි. ජම්බෝල ගෙඩි දූසිමක්ම කපයි ලොකු.....'' නෙතුම් සිනාසෙමින් පැවසුවේ ය.

''පොඩී දැන් ගන්නවද?...''

''අනේ නෑ ලොකු.... මම හෙට කියන්නං....... අදට ඔහොම කුල් ඩවුන් වෙන්න දෙන්න..''





කැලුම් නෙතුම්ට යෝජනාව ඉදිරිපත් කිරීමට පැවරුව ද තම ගම නොපැවසුවේ පසුව පවසන්නට සිතාගෙන ය. නෙතුම් හදවතින් පිරූ පාරමිතාවක් ඉටුවූවා වැනි හැඟීමක් දැනුන බැවින් කැලුම්ගෙ මනමාලිය ගැන සෙවීමට වඩා හිමායා ගැන සිතේ නිධන්වූ පරණ මතකය ළඟට ගෙන පිරිමදින්නට විය. නෙතුම්ට පොඩි එකෙකු මෙන් ඇත පෙනෙන සුදෝ සුදු හිමේ පිනුම් ගහන්නට තරම් සිතුණි.

නෙතුම් දුරකතනය පසෙකින් තබා දිනපොතේ පිටුවක් පුරා අකුරු කළ ආදර සැමරුම දිග දිගහැර ගත්තේ ය. එහි පහතින් සඳහන් කර තිබූ හිමායාගේ දුරකතන අංකයට ඇමතුමක් ගත්තේ තව මොහොතක් හෝ පමාකිරීමට නොහැකි බැවිනි.

''සමාවන්න ඔබ අමතන මොබිටෙල් ජංගම දුරකතනය ක්‍රියාවිරහිත කර හෝ ආවරණ කලාපයෙන් බැහැරව ඇත. කරුණාකර පසුව අමතන්න''

යනුවෙන් භාෂා ත්‍රිත්වයෙන්ම පටිගත කළ නිවේදනය අවසන්වන තුරුම නෙතුම් අසා සිටියේ හිමායාට ඇමතීමට නොහැකිවීම පිළිබඳ කනගාටුවෙනි.

''දැන් ගොඩක් රෑ වෙලා නිසා ෆෝන් එක ඕෆ් කරලා නිදාගෙන ඇති. හෙට උදේම ගන්න ඕනෙ...'' නෙතුම් ආලෝකය නිවීගිය දුරකතනය දෙස බලාගෙන කල්පනා කළේ ය.

රෑ පුරා නොනිදා පහන් කළ නෙතුම් හැරයාමට අකමැතිවූ නිදි කුමාරිය ඔහුගෙ සියොළඟ දවටී සිට ආපසු යන විට හිමිදිරිය ද පසුවී තිබුණි. නිදිගැට හැරලූ නෙතුම් මොහොතක් දෑස්හැර වටපිට බැලුවේ අවේලාවේ ලද නින්ද ගත සිත මත්කර ඇති බවක් දැනුන නිසා ය. කොට්ටය අසල තිබූ දුරකතනය දුටු සැනින් සියල්ල මතකයට ආවේ ය. එසැනින් හිමායාගේ අංකයට ඇමතුමක් ගත්තේ පෙර රාත්‍රියේ අදහස ඉටු කරගැනීමට ය.

එහෙත් හිමායා දේශනයක් කරමින් සිටි බැවින් නෙතුම්ගෙ ඇමතුම හා සම්බන්ධ නොවුණි. ගත් ඇමතුම් සම්බන්ධ නොවුණු ඇමතුම් විස්සක් ලෙස හිමායගෙ දුරකතන මුහුණතේ සටහන් විය.



Scanned by CamScanner

"හිමායා නොදන්න කෝල්ස්වලට ආන්සර් කරන්නෙ නැතුව ඇති.. මැසේජ් එකක් දැම්මොත් කොහොමත් දකිනවනෙ.."

හිත රිදුණ නෙතුම් ඇදේ හාන්සිවී දුරකතනය අතට ගත්තේ කෙටි පණිවිඩයක් යැවීමට ය.

**"ආදරණීය හිම කුමාරියේ..... ඔයාට මාව අමතක ඇති. ඒත් මේ අවුරුදු හය පුරාවට ම මගේ හිතේ ඔයාව හිටියා. මම ඔයාට ආදරෙයි. හිමායා මම මැරිකරපු කෙනෙක් නෙවෙයි. එදා සිද්ධිය ඇත්ත මම ඔයාට සාක්ෂිත් එක්ක පෙන්වන්නම්. මම ඔයා බලන්න ඒ දවස් විසේම ආවා. අන්තිමේ දී වෙන කෙනෙක් ඔයාට ආදරේ කරනවා කියලා දැනගෙන මම ගොඩක් දුක්වුණා. මම ඇක්සිඩන්ට් වුණෙත් ඒ නිසා. ඒ වගේ දරුණු අනතුරකින් දෛවය මාව බේරන්න ඇත්තෙ කවදා හරි මට ඔයා හමුවෙන නිසාවෙන්න ඇති. මම මෙච්චර ඔයාට ආදරේ කරනවා කියලා ඔයා දන්නෙ නෑ නේද හිමායා. අපේ අයිය ළඟදි මැරිකරනවා කිව්වා. මම ළඟ මාසෙ ලංකාවට එනවා. ඊට පස්සෙ අපි හම්බෙලා විස්තර කතා කරමු. මට ගොඩක් සතුටුයි හිමායා. ජනේලෙන් බලාගෙන ඈත ඉඳලා නෙවෙයි ළඟටම වෙලා ඔයාට ආදරේ කරන්න පුළුවන්.. මට හීනයක් වගේ... මම ඔයාට පස්සෙ කතා කරන්නං.... මම ගොඩක් ආදරෙයි මගේ පුංචි හිම කුමාරියේ..... අවුරුදු හයක් පුරාවට ඔයාට ආදරේ කරන මම... ඩොක්ටර් නෙතුම් දිල්හාර - (ලන්ඩන්)"**

නෙතුම් පිටු ගණනක දිගු පණිවිඩක් දුරකතනයේ සටහන් කළේ පස් වතාවකට පමණ ය. ඒ මොහොතේම අදාල ගාස්තුව අයකරගත් බවත් පණිවිඩය ප්‍රවාහනය කළ බවත් සඳහන් කෙටි පණිවිඩයක් ලැබුණි.

"ඕ...... මිට්.... ඉවරයි... ගිහින් තියෙන්නෙ ලොකුගෙ ෆෝන් එකට... දැන් මොකද කරන්නෙ....." නෙතුම් කලබලය හා හදිස්සිය නිසා පණිවිඩය යවා ඇත්තේ දුරකතනයට අවසන් ඇමතුම ලැබුණු අංකයට ය. එනම් පෙරදින රාත්‍රියෙ කතා කළ කැලුම්ගේ අංකයට ය.

"කමක් නෑ.. දැන්වත් මේක හිමායට යවන්න ඕනෙ..... එක අතකින් අයියා දැන් වෙන කෙල්ලෙක් බඳින්න යන නිසා ඕක එච්චර ගාණක් වෙන එකක් නෑ..... ඒත් දෙන්න ම එක කෙල්ලට ආදරේ කළා කියලා පුංචි ලැජ්ජාවක් දැනෙයි. කොහොමත් ඕක දැක්කත් ලොකු නොදන්නවා





වගේ ඉඳියි. මමත් මොකුත් දන්නෑ වගේ ඉන්නවා. දැන් එයාගෙ ලව් එක ඉවරයිනෙ.."

හිමායාට නෙතුම්ගෙ පණිවිඩය තවමත් දකගැනීමට නොහැකිවූයේ පවත්වමින් සිටි දේශනය අවසන් නොවූ බැවිනි. එහෙත් කැලුම්ගෙ හිත වහා ඇවිලීගියේ පුළුං ගිනි ගත්තාක් මෙනි. කැලුම් ගනිමින් සිටි දිවාආහාරය ද අතර මග නවතා දැමුවේ ය. ඔහුට දැනුනේ මාරක ළිඳකට බැසගෙන උඩබලාගෙන සිටිනවා මෙනි... මනෝ වෛද්‍යවරයෙක් ලෙස දහසකගේ හිත් සුවපත් කර ඇති කැලුම්ගෙ සිතද අවුල්වී ගියේ ය.

"මේ ලෝකෙ මෙච්චර කෙල්ලො ඉද්දි ඇයි පොඩී අපි දෙන්නම එකම කෙල්ලට ආදරේ කළේ....." කැලුම් තම ආසනයට පැමිණ දෑස් පියාගෙන දකුණතින් නළල තෙරපමින් කල්පනා කළේ ය.

හෝරාවෙන් හෝරාව ගත වන අතර තමාට හිමි දෛනික රාජකාරි කාලය අවසන් විය. සේවකයන් ආයතනයේ සේවාවන් සුපුරුදු පරිදි පවත්වාගෙන ගිය අතර කැලුම් වෙනදාට පෙර නිවසට ගියේ ය.

"සුදූ මැණිකෙ.. ලොකු අද කලින් ම එනවා.."

"අපිට කේන්ති ගිහින් ඇති කියලා හිතාගෙන එනවා ඇත්තෙ."

ගේට්ටුවෙන් පැමිණෙන කැලුම්ගේ වාහනය දුටු මව සහ පියා කතා කරන්නට විය. හරමානිස් සීයා ගේට්ටුව වසා සෙමෙන් සෙමෙන් පැමිණෙමින් සිටියේ ය.

"ලොකු අද වේලාසන ඇවිත්" තාත්තා කතා කළද අම්මා නිහඬව බලා සිටියා ය.

"ඔව් අප්පච්චි...."

"ලොකුට තේ එකක් හදන්න සුදූ මැණිකෙ..."

කැලුම් උදෑසන නිවසින් පිටවන විට රැගෙන ගිය මුහුණට වඩා කල්පනාකාරී මෙන්ම කලබල මුහුණක් රැගෙන විත් තිබුණි.



Scanned by CamScanner

"සුදු මැණිකෙ ලොකුගෙ.... මූණ උදේ වගේ නෙවෙයි..."

"අර ළමයා ගැන කල්පනා කරනවා ඇති... ඔය වයසෙදි දුර දිග හිතන්නෑ... ලස්සනට රැවටෙනවා.... අනේ මන්දා මොනවා කරගනීද කියලා. අනිත් එක්කෙනත් පහුගිය කාලෙ වාහනේ හප්ප ගත්තෙ ඔය වගේ කෙහෙල් මලක් හින්දා තමයි.. මම නොකිව්වට... මට තේරුණා ඒ ටිකේම ඔළුව රිදෙනවා කියලා නිදාගෙනමයි හිටියෙ... මේ පාර අනිත් කෙනා මොන නාඩගමක් නටයි ද දන්නෑ.. අන්තිමට අපි එපැයි විඳවන්න...."

"කෝකටත් අපි ලොකු ගැන විමසිල්ලෙන් ඉමු සුදු මැණිකෙ. දරුවගෙ හිත රිදවන්නත් හොඳ නෑ.. අනේ මන්දා උණු හින්දා බොන්නත් බෑ කිරි හින්දා දාන්නත් බෑ."

"ලොකුගෙ නෙවෙයි මගෙත් ඔළුව විකාරයි.."

"සුදු මැණිකෙ කලබල නොවී ඉන්නකො.. කලබල වෙලා කොරොස් කටෙත් අත දාන්න බෑ කියලා කතාවක් තියනවනෙ.."

අම්මයි අප්පච්චියි කුස්සියේ සිට කළ යුත්තේ කුමක්දැයි කල්පනා කරනවිට කැලුම් කාමරයටවී කල්පනා කරන්නට වූයේ වෙනත් ගැටළුවකි. මනෝ වෛද්‍යවරයෙක්වී මෙතෙක් කලක් අනුන්ට උපදෙස් දුන් ඔහු තමා පැටලී සිටින පඹගාලෙන් ගැලවීමට මඟක් සොයන්නට විය. නෙතුම් මෙන්ම හිමායා ද කැලුම්ට තම දෑස් මෙනි.

"පොඩීගෙන් කෝල් කරලා අහන්නත් හිතෙනවා. එයා හිමායට ආදරේ කරන නිසා වෙන්න ඇති මමත් එහෙම කෙනෙක් බඳිනවට කැමති වෙන්න ඇත්තෙ... ඒත් මට කිසිම වෙනසක් පෙන්නුවෙ නැනෙ.... පොඩී මේ අවුරුදු පහ පුරාවට කොච්චර දුක් වෙන්න ඇත්ද? පොඩී ඇක්සිඩන්ට් වෙන්න කලිං ගොඩාක් හිතේ අමාරුවෙන් තමයි හිටියෙ.. මම හිමායට ආදරෙ කරනවා කියලා පොඩී දැනගන්න ඇති. ආ... දවසක් මගේ ඩයරියෙ තිබුණ හිමායගෙ ෆොටෝ එකක් අතුරුදහන් වෙලා තිබුණා. පොඩී දින පොත් බලන්නෙ නෑ. අහම්බෙන්වත් දැක්කද දන්නැනෙ. එතකොට පොඩී ඇක්සිඩන්ට් වෙන්න ඇත්තෙ ඒ හිතේ අමාරුවට.... ඒ වතාවෙ පොඩීගෙ ජීවිතේ





බේරුණේ කොච්චර අවධානමකින් ද තව ටිකක් එහෙ මෙහෙ වුණානං මගේ එක ම මල්ලි මට නැති වෙන්න තිබුණා. පොඩී හැම දෙයක් ම දැනගෙන මට කිසිම තරහක් පෙන්නුවෙ නෑ.. ඒ මට පොඩී ආදරේ නිසා... ඒත්..... හිමායටත් මම ඒවගේ ම ආදරෙයි නෙ..." කැලුම් අහස පොළොව ගැටලන්නට තරම් කල්පනා කළේ ය.

"එදා හිමායා පොඩීගෙ පින්තූර දැකලා කලබල වුණෙත් ඒ නිසා වෙන්න ඇති. කලින් ආදරයක් තිබුණා කියලා කියපු විස්තර පොඩී ගැන වෙන්න ඕනෙ.. ඒ කියන්නෙ පොඩී දන්නෙ නෑ හිමායට කකුල් නෑ කියලා. හිමායා අපි දෙන්නා අයියයි මල්ලියි කියලා දන්නෙත් පින්තූර දැක්කට පස්සෙ... " කැලුම් නොයෙක් දෑ කල්පනා කළේ ය.

හිමායාට නෙතුම්ගේ කෙටි පණිවිඩය කියවන්නට ලැබුණේ සවස ය. හිමායාගෙ දෑසින් ගැලූ කඳුළු දුරකතන මුහුණත තෙමාලූයේ ය. ඇයට දැනුනෙ ගැඹුරු ගඟක් මැද ඒදණ්ඩක එහා මෙයා යා නොහැකිව අසරණව නැතිගෙන සිටින්නාක් මෙනි.

"මම දන්නෙ නැති වුණාට නෙතුම් මට මෙච්චර ආදරේ කරල ද? මට කකුල් නෑ කියලා නෙතුම් දන්නවද?... සමහරවිට ඩොක්ටර් මෙත්සර කියන්න ඇති... එහෙම දැනගෙනත් මට මෙච්චර ආදරේ කළාද, කැලුම් වගේම නෙතුම් ගොඩාක් හොඳ කෙනෙක් වෙන්න ඇති. එතකොට එයා ඇක්සිඩන්ට් වෙලා තියෙන්නෙත් මම හින්දා. ඒත් කැලුම් කසාද බඳින්න හදන්නෙ මම කියලා නෙතුම් තවම දන්නෑ... දෙයියනේ ඒක දැනගන්න දවසට එයා දරාගන්නෙ කොහොම ද? එතකොට කැලුම්ට මොනවා හිතෙයි ද?... මේක ගිනි ගොඩක්...." වෘත්තියෙන් කථිකාචාර්යවරියක් වුවද හිමායා මේ මොහොතේ අපූරු අහඹු ද්විත්ව ආදර ගැටළුවකට මුහුණදී සිටින සාමාන්‍ය තරුණියකි.

කැලුම්ගේ සිතට දැනෙන වේදනාවට සමාන දුකක් හිමායාගේ හදවතට දැනෙන්නට විය. කුමක් සිදුවන්නේ ද යන්න සිතාගැනීමටවත් නොහැකි ය.

"හොඳම වැඩේ දෙන්නම අත ඇරලා පැත්තකට වෙලා ඉන්න ඕනෙ.. එතකොට කාටවත් දුකක් නෑ.." හිමායා එලෙස ද කල්පනා කළා ය.



Scanned by CamScanner

"අම්මට මම නෙතුම් ගැන මොකවත් කියලා තිබුණෙ නැති නිසා මේ කිසිම දෙයක් කියන්න විදිහක් නෑ... මට පිස්සු වගේ..." හිමායා සියලු වැඩ පසෙකින් තබා කල්පනා කරන්නට විය.

කැලුම් හිමායට හෝ හිමායා කැලුම්ට තවම ඇමතුමක් හෝ නොගෙන සිටියේ සිත්වල හටගත් හදිසි ව්‍යාකූල බව නිසා ය. දෙදෙනාම එකම ගැටළුවට පිළිතුරු සොයන බව එකිනෙකා නොදැන සිටියහ.

දින කිහිපයකින් හිමායාගේ නිවසට යෑමට නොහැකි වුවද කැලුම් එදින සවස නෙතුම්ගේ මිතුරන් දෙදෙනා හමුවීමට යෑමට තීරණය කළේ ය.

"පොඩීගෙ හැමදේකට ම උදව් කරන මේ දෙන්නා අනිවාර්යයෙන් ම මේ ගැන දැනගෙන ඉන්න ඕන.. මම හිමායට ආදරේ කරන බව අඟවන්නෙ නැතිව විස්තර අහන්න ඕනෙ." දෙදෙනාම එකවර මුණ ගැසීමට අවැසි බැවින් කැලුම් රෝහලට පැමිණියේ ය. රාජකාරියේ අවසන් හෝරාව ගෙවෙමින් පවතින බැවින් දුරකතන ඇමතුමක් දී තවත් මොහොතක් රඳවා ගැනීමට ද කල්පනා කළේ ය.

වැරදීමකින් කැලුම්ට පළමුවත්, හිමායට දෙවනුවත් දුන්න තොරතුර නෙතුම් දැනුවත්වම තෙවනුව දැනුම්දී තිබුණේ සාලින්ද සහ මෙත්සර දෙදෙනාට ය. හිමායට සහ කැලුම්ට එකම විස්තරය ගිය අතර මිතුරන්ට එය සංශෝධනය කර යවා තිබුණි.

ලංකාවට පැමිණි පසු අනිවාර්යයෙන් ම හිමායා හමුවී කතාබහ කර විවාහ වන බව නෙතුම් සතුටින් මෙන්ම දැඩි බලාපොරොත්තුවෙන් සඳහන් කර තිබුණි. දෙපා නොමැති හිමායා පිළිබඳ සියල්ල දැනසිටි මිතුරන්ට නෙතුම්ට සතුටක් වූ තොරතුර සතුටක් නොවුණි. දුරකතන ඇමතුම ලැබුණු මොහොතේ සිට දෙදෙනා ම කල්පනා කරන්නට වූයේ නෙතුම් ගැන ය.

දෙදෙනා වටවී කතා කරන්නේ පොඩී ගැන බව කෝරිඩෝව දිගේ ඇවිදගෙන එමින් සිටි කැලුම් නොදත්තේ ය.





"මල්ලි.... මෙත්සර......" කැලුම් දුරසිට ම කතාකරගෙන පැමිණියේ ඔවුන් කතා බහක පසුවූ බැවිනි.

"ආ.... කැලුම් අයියෙ...... අපි මේ කතා කර කර හිටියෙ නෙතුම් ගැන..."

"ආ.. ඇත්ත ද අපේ පොඩී මොකද කියන්නෙ..."

"ලබන මාසෙ එනවා කියලා කිව්වා. අයියා ළඟදි මැරි කරනවා කියලා කිව්වා. මං හිතන්නෙ නෙතුම්ටත් ළඟදි මැරි කරන්න හිතිලා වගේ."

"පොඩී මොනාහරි කිව්ව ද මල්ලි"

"එහෙමම කිව්වෙත් නෑ..... කළින් ගෑනු ළමයෙක් හිටියා. ඒක ආයෙත් අලුත් වෙලා වගේ.."

"මටත් එහෙම තොරතුරක් හම්බුණා. කාටහරි යවන්න ගිය මැසේජ් එකක් වැරදිලා මගේ ෆෝන් එකට ඇවිත් තිබුණා."

"අපි වැඩි විස්තරයක් දන්නෙ නෑ... අයියෙ..... නෙතුම්ගෙන් අහල කියන්නං"

"නෑ.. නෑ...... මම දුෂ්ටයෙක් වෙන්න නෙවෙයි හදන්නෙ.. මම පොඩීට උදව් කරන්න අහන්නෙ...."

මුලින් කැලුම්ට විස්තර කියන්න අදි මදි කළ සාලින්ද සහ මෙත්සර කැලුම්ගේ ඉල්ලීම ඉවත දැමිය නොහැකි බැවින් නෙතුම්ගෙ සියලු විස්තර පැවසූහ. කැලුම් හිමායා හඳුනන බව නොපැවසුවේ ය.

"එතකොට මල්ලි අපේ පොඩී දන්නෙ නැද්ද ඒ ළමයට ඇවිදින්න බෑ කියලා."

"නෑ අයියෙ... අපි කළින් විස්තර හොයලා බැලුවා. එතකොට හිමායා මෙච්චර ප්‍රසිද්ධ නෑ.. දැන් අවුරුදු තුනහමාරකට විතර කළින් .....ඊට පස්සෙ අපි දැන ගත්තා හිමායා ආබාධිතයි කියලා. අපි නෙතුම්ට ඒ වගක් කිව්වෙ නෑ.... දුක හිතෙයි කියලා."

"පොඩී හිමායට ගොඩාක් ආදරේ කළාලු නේද?"



Scanned by CamScanner

''ඔව් අයියෙ එයා ඒ දවස්වල පිස්සුවෙන් වගේ හිටියෙ අපි පුළුවන් හැම විදිහකට ම හිත හැදුවා. ඇක්සිඩන්ට් එකටත් මොකක්හරි හේතුවක් තියනවා.''

''මම මේ කිසිම දෙයක් කලිං දැනගෙන හිටියෙ නැහෙ,''

''ඇයි කැලුම් අයියෙ...''

''නෑ.. එහෙනම් මම පොඩ්ඩට කොහොම හරි උදව් කරනවා,''

''දැන් මේ අපි කතා වුණේ නෙතුම්ට කියන්නෙ කොහොම ද හිමායා ආබාධිතයි කියලා. දැන් ආයෙත් අහස උසට බලාපොරොත්තු තියාගෙන ඉන්නෙ.''

''මම මේ ප්‍රශ්න විසඳන්නම් මල්ලි... එයා මට වැරදිලා එවපු මැසේජ් එකෙන් ම මම එයාව කතාවට අල්ලගන්නං... මට ඉන්නෙ මල්ලි විතරයි. මල්ලිට ඉන්නෙත් මම විතරයි..''

''අයියෙ අපිත් ඕන දේකට ඉන්නවා.''

''ඔව් මල්ලි ඔය දෙන්න මෙච්චර කාලයක් උදව් කළා වගේ.. මේ වෙලාවෙදිත් උදව් කරන්න.''

''අනිවාර්යයෙන් ම''

''ඕන වෙලාවක ඕන දෙයක් කියන්න අයියෙ...''

''මම තව ගමනක් යන ගමන් ආවේ ගිහින් එන්නං මල්ලි.''

''හොඳයි අයියෙ..''

කැලුම් හිමායගෙ ගෙදර යෑමට පිටත්ව ගියේ ය. නිමාලි මේ වනවිට විස්තර දැනගෙන සිටියා ය. කැලුම්ගෙ සිතට පුංචි ලැජ්ජාවක් දැනුණේ ගේට්ටුවෙන් වාහනය ඇතුල් කරද්දී ය. වෙනදා ගේට්ටුව පසු කරන්නේ වෛද්‍යවරයා හෝ හිතමිතුරා ලෙස ය. අද යන්නේ බෑනා සහ පෙම්වතා ලෙසිනි. හැන්දෑවේ හය හමාරත් පසුවී තිබූ බැවින් නිමාලි සහ හිමායා නිවසේ සිටියහ. වෙනදා දොරින් සාමාන්‍ය ලෙස ඇවිද යන දෙපාවලට ගෙතුළට යෑමට නුහුරු බවක් දැනුණි.





''හිමායා......... හිමායා....''

''ආ.... ඩොක්ටර් වාඩි වෙන්න....'' කැලුම්ගේ ලැජ්ජාව උතුරා බිමට වැටෙන තරමට විය. ගෙතුළින් ඇවිද ආවේ හිමායාගේ අම්මා වූ නිමාලි ය. වෙනදා දකින හිමායාගේ රුව පෙනෙන්නට නොවී ය. කැලුම් පුටුවක වාඩිවෙන අතර ටීපෝ එක මත වූ පත්තරය අතට ගන්නට වූයේ කියවන්නට නොව හිතෙහි වූ ලැජ්ජාව වසා ගන්නට ය. නිමාලි වෙනසක් නොපෙන්වා කතාබහ කරන්නට වූ බැවින් කැලුම්ගේ ලැජ්ජාව ටිකෙන් ටික වාෂ්පවී ගියේ ය.

''ඉතිං ඩොක්ටර් ගොඩාක් දවසකින් නේද? මොකද මේ පැත්තෙ ආවෙ නැත්තෙ...''

''මේ ටිකේ ගොඩක් වැඩ තිබුණා අම්මා..''

''වැඩ ද එහෙම නැත්නං ලැජ්ජාවට ද?''

''දෙකම තමයි.....'' නිමාලි කතාව පටන්ගත්ත බැවින් කැලුම් ලැජ්ජාව අතහැර දැමුවේ ය.

''දෝණි මට විස්තරේ ඔක්කොම කිව්වා. ඇත්ත ම කිව්වොත් ඩොක්ටර් මට තාම මේක හීනයක් වගේ... ඇත්තට ම ඩොක්ටර් එහෙම කිව්වද?, මට අදහා ගන්නත් බෑ...''

''ඔව් අම්මා..... මම හිමායට ආදරෙයි...''

''ඉතිං ඩොක්ටර් ඔයා වගේ කෙනෙකුට අපේ දෝණිට වැඩිය හොඳ කෙනෙක් මැරි කරන්න පුළුවන්.....''

''ඔව් අම්මා.. මට අපෙ අම්මයි අප්පච්චියි කිව්වෙත් ඔය කතාව ඒත්... මට හොඳ කෙනා හිමායා... සමහර විට අපේ අම්මලාට වෙන කෙනෙක් හොඳ ඇති. ඒ වුණාට මම කැමති හිමායට...''

''කතාව ඇත්ත ඩොක්ටර් ඒත්.........''

''හිමායා කිව්වා වගේ අම්මත් කියන්න යන්නෙ හිමායට කකුල් දෙකක් නෑ කියන කතාව නම් ඉතුරු ටික කියන්න එපා.''

''එහෙම කිව්වට ඩොක්ටර් මේක ලොකු අභියෝගයක්......''



Scanned by CamScanner

"මට තේරෙනවා. මේ ලෝකෙ හිමායා වගේ අය භාරගන්න කැමති නැත්තෙ ඒ අභියෝග භාරගන්න භය වගේ ම අකමැති නිසා. මට ඒ හැම අභියෝගයක් ම භාරගන්න පුළුවන්... අම්මෙ... මම ඩොක්ටර් කෙනෙක්...... මම මනස වගේ ම අනිත් හැම දෙයක්ම දන්නවා."

"මම අකමැති නෑ... මට තියන ප්‍රශ්නෙ අනාගතේ ගැන.."

"බය වෙන්න එපා අම්මෙ..... මම අම්මට අද පොරොන්දු වෙනවා. මම හිමායා ජීවිතේ මේ දක්වා ඉහලට උස්සලා තිබ්බා වගේ මින් ඉදිරියටත් ආදරෙන් බලාගන්නවා කියලා."

නිමාලි කැලුම් සමඟ පැය තුනක් පමණ කතා කළා ය. එහෙත් හිමායා පෙනෙන්නටවත් නැත.

"අම්මා... ඇයි හිමායා පේන්න නැත්තෙ"

" දෝණි ඔළුව රිදෙනවා කියලා නිදි. ඉන්න මම ඇහැරවන්නම්..."

"එපා අම්මා දූන් මම යන්න ඕනෙ...." සුදු ආච්චිඅම්මා කතාව අතරෙදි ගෙනත් දුන් කිරිතේ එකේ අන්තිම හරිය ලොකු උගුරකින් අවසන් කළ නෙතුම් කෝප්පය පීරිසියෙන් තැබුවේ ය.

"ඩොක්ටර් කෝකටත් තව ටිකක් හිතලා බලන්න...." නිමාලි පිටවී යාමට සැරසෙන කැලුම්ට පැවසුවා ය.

"මම මේක අද ඊයෙ නෙවෙයි දූන් අවුරුදු තුනක් විතර හිතල ගත්ත තීරණයක්.." කැලුම් නිමාලිගෙ දෑස් දෙස බලමින් පැවසුවේ ය.

කැලුම් එක ගැටළුවක් ලිහාගෙන සිත සැහැල්ලු කරගෙන ගෙදර ගියේ ය. දූන් ඇත්තේ දෙමව්පියන්ගේ කැමැත්ත ගැනීම ය. කැලුම්ගේ සිත නූල් බෝල දහයක් එකට පැටලී ඇති ලෙසකි.

හිමායා පසු දිනවලදී කැලුම්ට මුණ ගැසී බොහෝ වෙලා කතා බහ කරමින් සිටිය ද නෙතුම් පිළිබඳ තොරතුර රහසක් ලෙස රැකගත්තා ය. කැලුම්ට එම පණිවිඩය වැරදීමකින් ලැබුණු බව හිමායා නොදැන සිටි අතර කැලුම් ද කිසිවිටෙක එය නොදැන්වූයේ ය.





කොතරම් කටකාරකම් පැවසුව ද නෙතුම්ට දුරකතනයෙන් කැලුම්ගෙ ගැටලුව කතා කිරීමට ශක්තියක් නොවූයෙන් දීර්ඝ ලිපියක් ලියා අම්මාගෙ නමට එවූවේ ය.

එතැන් පටන් කැලුම්ට දෙමව්පියන් කැමැත්ත ලබා දුන්නේ නොදී බැරි කමට ය. කපන්න බැරි අත ඉඹින්නාක් මෙනි.

එම ලිපිය පිළිබඳ හෝ විවාහ යෝජනාව පිළිබඳ කිසිවක් දුරකතනයකින් හෝ ලිපියකින් අම්මා ඉන් පසු මතක් නොකර සිටියේ නෙතුම් මැතක පැමිණෙන නිසාත්, කැලුම්ගේ විවාහයට සියයට සියයක් කැමති නොවන නිසාත් ය.

"පොඩී... උදව්වට ස්තූතියි නෙවෙයි ගොඩාක් පිං..."

"ආ.... පිං විතරක් දීලා නම් මදි...."

"හරි මම පොඩීට ගොඩා...ක් වටින තෑග්ගක් දෙන්නම්කො..."

"අන්න එහෙම එන්න..."

"මේ.. මම අහන්න හිටියෙ පොඩීගෙන්.... මේ වගේ කෙනෙක් ඔයාට කසාද බඳින්න මුණ ගැහුණොත් මොකද කරන්නෙ..."

"අපොයි.... මමත් අයියා වගේම තමයි.. එහෙනම් අයියට කියලා අම්මයි තාත්තයි කැමති කරගෙන සඳ කිඳුරියක් වගේ කැන්දගෙන එනවා.. මමත් අයියගෙම මල්ලිනෙ...."

"ම්.. පොඩී.. හොඳයිනෙ... එහෙම තමයි ඉන්න ඕනෙ... පොඩීට එහෙම කෙනෙක් හිටියොත් කියන්න මම ඕන උදව්වක් කරනවා.."

කැලුම් විහිළුවෙන් තහළුවෙන් නෙතුම්ගේ සිතැඟි ද කෙබඳුද යන්න දැනගත්තේ ය.

කැලුම් දක්ෂ මනෝ වෛද්‍යවරයකුගේ භූමිකාව සිතින් කයින් වචනයෙන් නිරූපනය කරමින් සියලු ගැටළුවලට එකින් එක පිළිතුරු සකසාගෙන මංගල උළෙලට දින නියම කරගත්තේ ය. පිරිසකගේ සිත් සතුටින් පිරෙන අතර පිරිසකගේ සිත් වේදනාවෙන් කනස්සල්ලෙන් පිරුණි.



Scanned by CamScanner

සියලු ගැටලු සමහන් කරගත් කැලුම් සැහැල්ලුවෙන් සියල්ල සැලසුම් කළ අතර හිතේ රහස් පුරවාගත් හිමායා නිතරම වේදනාවෙන් ගතකළා ය. මේ අතර නිමාලි තම දියණියගේ නොසිතූ නොපැතූ විවාහ මංගල්‍යයට සූදානම් වූවා ය. අකමැති වුවද අම්මා සහ අප්පච්චි ද කැලුම් වෙනුවෙන් කළ යුතු දෑ ඉටු කළහ.

නෙතුම් ලංකාවට පැමිණීමට පෙරුම්පුරමින් බලාසිටියේ ය. ඒ තම සහෝදරයාගේ විවාහ මංගල්‍යය සහ අවුරුදු පහක් හදවතින් හීන මැවූ තම පැරණි තරුණිය "හිම කුමාරි" මුණ ගැසී පෙම්වතිය ලෙස උසස් කොට, ආදර අත්දරයක් ගොඩනගා ගන්නට ය.

නෙතුම්ගේ සිතේවූ සතුට වැඩිකමට මනාලියට වටිනා සපත්තු දෙකක් ද එවා තිබුණි. කැලුම් එය හිමායාට නොදෙන ලද්දේ සිත පෑරෙන බැවිණි.

මනමාලිය හැඩ කිරීමට අවශ්‍ය සියලු ඇඳුම් ආයිත්තම් සහ විසිතුරු මල් ආදිය නෙතුම් මාසයකට පෙර කැලුම් වෙත එවා තිබුණි. සපත්තු දෙක හැර අනෙත් සියලු දෑ නෙතුම් එවන ලද බව සඳහන් කරමින් හිමායාට බාරදෙන ලදි.

එවිට හිමායගෙ පපුවට පිහියෙන් ඇන්නා මෙන් වේදනාවක් දැනෙන්නට විය. විවාහ මංගල්‍යය දිනයේ නෙතුම්ට මුහුණ දෙන්නේ කෙලෙසකදැයි හිමායා දිවා රෑ කල්පනා කරන්නට වූවා ය. හැංගි හැංගි වෙස් බැන්දද නටන්නට වන්නේ එළිපිට ය.

විවාහ උත්සවය සූදානම් කර තිබුණේ වෙරළ ආසන්නයේ තිබුණු ස්ටාර් පැලස් යන සුවිසල් මැදුරේ ය. එදින හිමිදිරියේ පටන් ඇතුළත සහ පිටත සියලු ස්ථාන මංගල සිරියෙන් බැබළෙන්නට විය. මුහුද පෙනෙන මානයේ බැවින් නැගී විසිරෙන සුදු රළ පෙළෙහි රුව මෙන්ම හඬ ද හොඳින් පෙනෙන්නට විය. උඩ විසිවන රළ රැළි දකින විට සිතෙන්නේ අරුම පුදුම විවාහ මංගල උළෙල නැරඹීට ඇත සිට ඉස්සී ඉස්සී බලන ආකාරයෙනි.

මනාලිය සහ මනාලයා පැමිණෙන තුරු තේජවන්ත මඟුල් පෝරුව සැදී පැහැදී සිටින්නේ ය. ගොක් කොළවලින් සහ නෙළුම් මල්වලින් එය නිමවා තිබුණි. මලින් පිරීගිය මංගල අසුන මනාල





යුවල වඩා හිඳුවාගන්නට සූදානමෙනි. සියලු සැරසිලි දේශීය අමුද්‍රව්‍යවලින් මෙන්ම පැරණි සිරිත් විරිත්වලට මුල්තැන දෙමින් සූදානම් කර තිබුණි.

හිමායා ලංකාවේ ප්‍රසිද්ධ කලාකාරියක් මෙන්ම විශ්වවිද්‍යාල ඇඳුරුවරියක් ද වන නිසා ඇරයුම් ලද සුවිශේෂී අමුත්තන් පැමිණි සිටියහ. කලාකරුවන්, විශ්වවිද්‍යාල ඇඳුරන් මෙන්ම ඇරයුම් ලද මිතුරන් සහ නෑදෑයන් විශාල පිරිසක් සහභාගීවී පුල පුලා බලාසිටින්නේ ඔවුන්ට මේ අවස්ථාව ජීවිතයේ කලාතුරකින් දකගන්නට ලැබෙන අවස්ථාවක් බැවිණි. එමෙන්ම මෙය ලෝකයේම දුලබ සිදුවීමකි.

දුලබ සහ ආදර්ශමත් සිදුවීමක් බැවින් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය අනාරාධිතවම පැමිණ සිටියහ. ඔවුන් ද තම කැමරා ආම්පන්න ස්ථාන ගත කරගෙන සිටින්නේ හිමායාගේ සොඳුරු රුව සහ මනාල යුවලගේ අපූරු ඡායාරූප පිටපත් කරගන්නට ය.

සිනා පිටාර ගලන මුහුණු අතර නිමාලි, සුදු ආච්චිඅම්මා මෙන්ම කැලුම්ගේ මව, පියා, හරමානිස් සීයා ඇතුළු පිරිස විය.

උදේ පාන්දර ලංකාවට පය තැබූ නෙතුම්ටද මුල් ඇඳුම් ආයිත්තම් වලින් හැඩවෙන්නට සිදුවුණි. සාලින්ද සහ මෙත්සරද මුල් ඇඳුමින් හැඩගැන්වීය. මේ වනවිට කැලුම් මුල් ඇඳුම ඇඳ සිටි අතර මල් කුමාරවරුද කිහිප දෙනෙක් විය. හිමායා මනමාලිය ලෙස සැරසී මල්කුමාරියන් පිරිවරාගෙන සිටින්නී ය. දෙපා අහිමි වුවද ඇය සුරගනක් මෙන් රූසිරි ගෙන තිබුණේ ය.

මුහුදු පතුලේ ඇති බෙල්ලන්ගේ සහ සිප්පි කටුවල ආකෘතියට විසිතුරු ලෙස සරසන ලද කච්චිචිය රුවල් ඔරුවක සිරිගන්නට විය. රන්වන් ඔසරියක් හැඳ නළල් පට සහ මාල හත පැළඳි හිමායාගේ හිස පිච්ච පොහොට්ටු වලින් සහ අලංකාර මල් කිනිති වලින් සරසා තිබුණි. උකුලෙහි වූ නෙළුම් කැකුලින් හා වෙනත් විසිතුරු මලින් සැකසුණු මල් කළඹ හිමායාගේ රූ සිරු වැඩි කරන්නට විය.

සිහින් ගී නාදය සවන්පත් කරා ගෙන යන වාද්‍ය වෘන්දය සුමිහිරි ගී තාල වැයූහ. හිතමිතුරන් නෑදෑයන් එක්වී බලාසිටින්නට වූයේ



Scanned by CamScanner

කිඳුරඟන පරදන හිමායාගේ රූ සිරියයි. ඇතමෙකුට තවමත් හිමායා ආබාධිත බව රහසකි.

ඔරලෝසුවේ වෙලාව සඳහන් වූ පරිදි තව විනාඩි පහකින් රෙජිස්ටාර්තුමිය ඉදිරියේ අත්සන් කරන්නට නියමිත ය. හිමායා ඉදිරිපිට සකසා තිබූ මේසය ඒ සඳහා සූදානම් විය. කැලුම් පෙරටු කොටගත් නෙතුම්, මෙත්සර සහ සාලින්ද මුල් ඇඳුමින් සැරසී පැමිණියේ පෙරහැරේ යන පෘෂ්ඨීමත් ඇතුන් මෙන් තේජවන්ත ගමනකිනි.

හිමායාගේ පපුව වෙව්ලන්නට විය. දෑසට ඉනූ කඳුළු අමාරුවෙන් සඟවා ගත්තේ දූන් දූන් නෙතුම් තමා හඳුනා ගනිතැයි සිතමිනි.

හිමායා ඇස්වල කඳුළු පුරවා බලාසිටියේ නෙතුම් මේ අවස්ථාවේ කෙසේ හැසිරෙයි ද යන්න ය. තමා හිමායා බවත් තමාගේ ම අයියා සමඟ විවාහ වන බවත් නෙතුම්ට දැනගැනීමට වැලැක්වීමට නොහැකි බැවින් අනිවාර්ය අනතුරකට මුහුණ දෙන්නට බලාසිටින්නකු මෙන් මොහොතකට නිරුත්තර වූවා ය.

''පොඩී.... එන්න මෙහාට...''කැලුම් තමාට පිටුපසින් සිටි මල්ලිගෙ අතින් අල්ලාගෙන හිමායා පෙනෙන ලෙස ඇතින් සිටගත්තේ ය.

''ඇයි ලොකු....''

''පොඩී.... අර ඉන්නෙ හිමායා... ඔයා අවුරුදු පහක් ආදරෙ කරපු හිමායා.. මෙයා අයිති මට නෙවෙයි ඔයාට..... එක දෙයක් තියනවා.. මම කලින් කිව්වා වගේ හිමායට කකුල් දෙකම නෑ...... ඔයා කැමතිද කියලා විතරක් මට කියන්න?''

හිමායාට කියන්නේ කුමක්දැයි නොඇසෙන අතර තමා ගැන කිසිවක් කියන බව වැටහුණේ නෙතුම් සහ කැලුම් දෙදෙනාම තමා දෙස බලා සිටින බැවිනි.

''එතකොට... එතකොට.... අ..... අ...... අයියත් හිමායට ද ආදරේ කළේ.... අයියට දුක නැද්ද?...මම ඊයෙ හවස දන්නවා මම ආදරේ කරපු හිමායට කකුල් නෑ කියලා.... ඒත් මම ඒ හිමායට ආදරෙයි...... ඉතිං අයියෙ...''





නෙතුම්ට දැනුනේ සුරංගනා කතාවක චරිත නිරූපනයක් ලෙසිනි. නෙතුම්ගේ පපුව සතුටින් පුදුමයෙන් පිරී ගියේ ය. ඔහුට දැනුනේ දෙවියන් දෝතට තෑග්ගක් දුන්විට ලැබෙන සතුටට සමාන බවකි.

''මට අදහාගන්නවත් බෑ ලොකු.. ඔයා විහිළුවක්ද කරන්නෙ මේ....''

''නෑ පොඩී.. මේ ඉන්නෙ ඔයාගෙ හිමායා.... කථිකාචාර්ය, ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පිනිය, කිවිඳිය, ලේඛිකාව හිමායා නෙත්සරණි දොඩම්ලන්ද.''

කැලුම් හිතේ දුක සිනාහවකින් පුරවගෙන හිමාය ගැන විස්තර පැවසුවේ ය.

සද්ධන්ත පොතක් ගෙන රෙජිස්ටාර්තුමිය කඩිමුඩියේ පැමිණියේ නැකත් වේලාව ආසන්නවී තිබූ බැවිනි. නැකත් වෙලාව ළංවිය.

''කෝ.... මනමාල මහත්තයත් මෙහාට එන්න....'' ඇගේ ගැඹුරු ලයාන්විත හඬත් සමඟ සියලු දෙනාම වාඩි වී සිටි අසුන්වලින් නැගිට්ටාහ.

''හිමායා... මේ නෙතුම් දිල්හාර, මගෙ මල්ලි ඔයාව අයිති මට නෙවෙයි මල්ලිට, පොඩී... මේ ඔයා මෙච්චර දවසක් හොයපු හිමායා.. එන්න මෙතනින් වාඩිවෙන්න..'' කැලුම් හිමායා වාඩිවී සිටි මංගල අසුන වෙත නෙතුම් කැඳවාගෙන ගොස් දෙදෙනා මුණ ගැස්සුවේ ය.

හිමායා සහ නෙතුම් දෙදෙනා ඇහිපිල්ලම් නොගසා බලාසිටියහ. ඒ සමඟම නෙතුම් කැලුම්ව සිප වැළඳගත්තේ ය. තිදෙනාගේම දෑස් කඳුළින් තෙමීගියහ. නෙතුම් හිමායා දෙස මොහොතක් බලාසිට අත අල්ලාගත්තේ ය. වටේට බලාගෙන සිටි පිරිස සිදුවන්නට යන දෙය වටහාගැනීමට නොහැකිව පුදුමයෙන් බලාසිටියහ. රෙජිස්ටාර්තුමිය පනස් වසරක රාජකාරි ජීවිතේ පළමු අත්දැකීම යැයි පවසමින් විවාහය ලියාපදිංචි කිරීමට මනාල යුවල ලවා දිව්රුම් ප්‍රකාශය කියවන්නට වූවාය. මෙලෙස කැලුම් තම මල්ලී වෙනුවෙන් තමා පණමෙන් ආදරය කළ තරුණිය නීත්‍යානුකූලවම බාරදුන්නේ ය.



Scanned by CamScanner

ඒ අතර කැලුම් වෙනුවෙන් හිමායාගේ දෑසින් කඳුළු ගලා යන්නට විය. නෙතුම් තම ආදරණීය බිරිඳගේ දෑසින් ගලන කඳුළින් තෙමෙන දෙකොපුල් සුමුදුවට පිසදැමුවේ ය.

විනාඩි කිහිපයකින් පෝරුවේ චාරිත්‍ර පටන් ගැනීමට නියමිත නිසා  පවුලේ අයට කැලුම්ගෙ තීරණයෙ හරි වැරදි කතා කරන්නට ඉඩක් නොලැබුණි. තනිවම පෝරුවේ සිටගන්නට අසමත් හිමායා වෙනුවෙන් සරසන ලද පුටුවක් තබා තිබුණි. කැලුම් පෝරුව ආසන්නයේ සිටගෙන සිටියේ ය.

මංගල බෙර හා සක් හඬ මධ්‍යයේ පොරුවේ චාරිත්‍ර ආරම්භවී ජයමංගල ගාථා, සෙත් පැතීම් සහ සෙසු චාරිත්‍ර අවසන් වූයේ ය.

"හිමායා අද ඉඳලා ඔයා මගේ නෑනා නෙවෙයි... මගේ ම නංගි.... පොඩී.... හිමායව ආදරෙන් බලාගන්න... ඔය දෙන්නම වෙනුවෙන් මගේ ජීවිත කාලෙම තෑගි කරනවා. ඔය දෙන්නගෙ හෙවණැල්ල වගේ ඉන්නවා කියලා මතක තියා ගන්න." කැලුම් මනාල යුවල පෝරුවෙන් බැසීමට පෙර දෑත් අල්ලාගෙන පොරොන්දු වූයේ ය.

නෙතුම්ගේ පපුව රිදුම් දෙන්නට වූ අතර නෙත් කඳුළින් තෙමුණි. හිමායගෙ ඇස්වලින් ගලාගිය කඳුළු පොරුවෙ බිම අතුරන ලද බුලත් කොළ මතට වැටුණි.

කැලුම්ගෙ මුහුණ දෙස තවත් බලාසිටීමට නොහැකිවූ හිරු තම මුහුණ රක්ත වර්ණ වලාසළුවකින් පටලවාගෙන අවේලාවේ ම අහසින් බැස නොපෙනී ගියේ ය. සුපුරුදු සැන්දෑ දිය කෙළි කෙළින්නට හිරු පැමිණෙන තුරු සිඳු ළඳ සුදු රළ රැළි සළු පළඳා අවරගිරටවී බලා බලාසිටින්නී ය.

නෑදෑ හිත මිතුරන් අහඹු මනාල යුවලට සුභ පතා පිටව ගියහ. සතුට, සිනාව, කඳුළ, වේදනාව සහ පුදුමය පිරුණු ලොව අරුම පුදුම මංගල සාදයක පළමු දිනය අවසන් වුණේ ලොවට ම උණුසුම් පුවතක් තිළිණ කරමිනි.

වසර ගණනාවකින් අහඹු ලෙස හමුවූ නෙතුම්ට සහ හිමායාට සුභ පතන්නට රෑ කළුවර සීතල රැගෙන හතර වටින් පැමිණියේ ය.





සඳ නොපැමිණි ගුවන පුරා තරු පොකුරු පොකුරු තොරණ බැඳ මඳ ආලෝකය දුන්හ. අඬ අඳුරේ පැමිණි මඳ සුළඟ සමන්පිච්ච, සේපාලිකා සමඟ වෙරළු මල් සුවඳ කවුළුව අතරින් තෑගි කොට එහි නොරැඳී පිටව ගියේ ය. දශක තුනකටත් වැඩි කාලයක් නෙතුම් සමඟ සෑම රාත්‍රියකම යහන් ගතවූ සොඳුරු නිදි කුමරිය සඳ කිඳුරියට කිරුළ පළඳා තුටු සිතින් රෝස මල් පෙති විසුල සුදෝ සුදු මංගල යහනෙන් බැස ගියා ය.

- නිමි -



Scanned by CamScanner